

දිවයින
ඉරිද සංග්‍රහය

ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 2

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

අතහැරීම 2

ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

දිවයින ඉරිදා සංග්‍රහයේ
ලිපි මාලාවක් ඇසුරිනි

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමු මුද්‍රණය - 2012 සැප්තැම්බර් - විසිඑක්වන මුද්‍රණය - 2014 අප්‍රේල්
විසිදෙවන මුද්‍රණය - 2014 මැයි
විසිතුන්වන මුද්‍රණය - 2014 ජුනි
විසිහතරවන මුද්‍රණය - 2014 ජූලි
විසිපස්වන මුද්‍රණය - 2014 අගෝස්තු
විසිහයවන මුද්‍රණය - 2014 සැප්තැම්බර්
විසිහත්වන මුද්‍රණය - 2014 ඔක්තෝබර්
විසිඅටවන මුද්‍රණය - 2014 නොවැම්බර්
විසිනමවන මුද්‍රණය - 2014 දෙසැම්බර්
තිස්වන මුද්‍රණය - 2015 ජනවාරි
තිස්එක්වන මුද්‍රණය - 2015 මාර්තු
තිස්දෙවන මුද්‍රණය - 2015 මැයි
තිස්තුන්වන මුද්‍රණය - 2015 අගෝස්තු

ISBN 978-955-1118-07-5

පොත ලබාගත හැකි ස්ථාන
දිවයින පුරා ප්‍රධාන පොත් අලෙවි සැල්

විමසීම් - 071 2 199 900
(කාර්යාල වේලාවන් හීදී පමණක් ඇමතීමට කාරුණිකවන්න)

ඡායරූප
වාසල සේනාරත්න

මුද්‍රණය සහ බෙදාහැරීම
ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ, හෝමාගම

මේ ලිපි මාලාව ලියූ ස්වාමීන් වහන්සේ මේ වන විට කොහි වැඩසිටිනවාදැයි මම නොදනිමි. එහෙත් උන්වහන්සේ මේ පිං බිමේ කුමක් හෝ ගැඹුරු වනගැබක අලි, කොටි, වලසුන් මැද ඒක විහාරීව දහම් සුව විඳිමින් සිටිතැයි මම විශ්වාස කරමි. මේ ඝෝර කටුක සංසාරයේ භිය දැක මේ ආත්මයේදීම සසර දුකින් එතෙරවීම අදිටන් කරගනිමින් සෘජුව නිවන් මගේ ගමන් කළ උන්වහන්සේ ලබා ඇති මග ඵල ගැන කියන්නට තරම් මම සමතෙක් නොවෙමි. එහෙත් උන්වහන්සේ වැඩිය යුතු බවුන් වඩන උතුමකු බව කියන්නට මම නොපැකිලෙමි. තම අවබෝධය මෙන්ම අත්දැකීම්ද උන්වහන්සේ සතුවූ සටහන් පොත් කිහිපයක සංස්කරණය නොකළ සටහන් ලෙසින් මා අතට පත්කළ උන්වහන්සේ නොපෙනී ගියහ. එහෙත් ඒ සටහන් කෙතරම් දාර්ශනිකද. ගැඹුරුද. ආශ්චර්යමත්ද. නිවන් මගට පිළිපන් ගිහි පැවිදි උභය පාර්ශ්වයටම මෙය අගනා පූජාවක් වනු ඇතැයි මගේ පුහුදුන් සිත කියයි. මේ සියල්ල ඔබ වෙත ඉදිරිපත් වුවද ඒවා ලියූ උන්වහන්සේගේ නාමය හෙළි නොකරන සේ කරන ලද ඇයැදුමක්ද විය. කර්තෘ අඥාත වුවද මේ සියල්ල ඔබ හැමගේ යහපතට හේතුවනු නිසැකය. ඒ නිසාම මා ලද ඒ අතිශයින් අගනා දහම් පඬුර පොතක් ලෙසින් ඔබ අතට පත්කිරීමට මට ඉඩ දුන මැනවි!

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
සියදුක, මේ ආත්මභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරගත් . වීර්ය වඩන්
[illegible] ඔබ [illegible] "දහම"
[illegible] [illegible] [illegible] වචනක්
[illegible] අනිත්‍යතා ස්වභාවය
[illegible] [illegible], [illegible] [illegible]
[illegible] [illegible]
තව [illegible] [illegible] [illegible]
තව [illegible] [illegible] [illegible] [illegible] ගන්නවා.
[illegible] [illegible] [illegible] [illegible] [illegible]
ඔබ නොකල [illegible]
ඔබ නොගැලවේ.
[illegible] [illegible]
[illegible] [illegible] [illegible]
[illegible] [illegible] දකින.
මෙහි සඳහන් [illegible] [illegible]
ඔබ [illegible] [illegible] වේවා.
තව තවත් [illegible] [illegible] ගන්නවා.

(පිංවත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියූවකි.)

පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නොගැසූ තැනක් වේද? අත් නොවිඳි අත්දැකීමක් වේද්ද? ඒ සා තැන්හී කරක් ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමුද? අප හැමදාම කැරකුනේ එකම තැනක් වටාය. විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ.... වැනි එකම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ....යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කළ්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත්ද, ඒ කළ්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

-ඉන්ද්‍රජිත්

පටුන

බුදුරජුන්ගෙන්ම කමටහන් ලබාගන්න	01
රීකන්ඩිෂන් කරනු වෙනුවට අවබෝධයෙන් දකිමු මේ කය	08
කය දුවවා වැඩක් වේද සිත නතර කරනු බැරි නම්	17
ආචාර වෙඩිමුර නැති යුද වීරයා වන්න	23
බ්‍රොයිලර් ජීවිතය 1	28
බ්‍රොයිලර් ජීවිතය 2 සෑම තරාතිරකම පාලකයන් වෙත කරුණාවෙනි!	34
සයුරු සැපේ වේ මේ සා දෝසා	40
ප්‍රේත ලෝකයේ මනාලිය	48
දැවෙන සමක්-නිවෙන මගක්	54
නිල මැස්සයි ඔබයි දෙන්නම දැන් සමයි	60
කුළියට ගත් එළිය කුමට	66
මේ ලොව පිරිසිඳුම තාක්ෂණයයි	70
අනේ ඔබත් එවන් පාලකයකු වේ නම්..	75
අභියෝගය අවබෝධයක් කරගන්න	86
ගමන ඉවරත් නොමැති, යන ගමනකුක් නොමැති තුන් කලටම වහල් නිති, ඔබත් ඔරලෝසු කටුවක්ද?	89
නාලාගිරි අදත් වඩියි	94
මේ කැඩපතින් ඔබේ මුහුණත් බලන්න	99

යක්ෂයා නොව ධර්මය දකින්න 106

හොඳ තැන් සොයමින් යනවා වෙනුවට සෑම තැනම ඔබ සොඳින් සිටිනු මැන 111

සිහියෙන් බලන්න, දහම ඔබ අසලමය 114

අපායේ උපතක් 117

ආශාවේ වියරුව-කැමැත්තේ මර ලතෝනිය 120

සයනයේ ප්‍රේතිය 122

සංසාරයක් පුරා වැරදුණු තැන... 124

කොහොමද...? ක්‍රෝධයේ අස්වැන්න 132

මිය ගිය ඥාතියාට ඔබ සැබවින්ම හිතවත්ද 137

අවසාන මෙහෙයුම 141

බුදුරජුන්ගෙන්ම කමටහන් ලබාගන්න

සම්බුද්ධ ශාසනයක් මුණගැසී තිබෙන මෙවැනි දුර්ලභ අවස්ථාවක, ගිහි පැවිදි අපි වඩාත් උත්සාහගන්නේ ශාසනය ආරක්ෂා කරගැනීමට සහ ශාසනයේ බර කරගසා ගැනීමටය.

පිරිත්, ධර්ම දේශනා, දානමය පිංකම්, විහාර නඩත්තුව, සංවර්ධනය, දහම් පාසල්, ආගමික උත්සව, සමාජ සේවා කටයුතු නිසා දවසේ නිදි නොලබා අවිවේකයෙන් සිටින විට ඔබට දැනෙන වෙහෙස ඔබ දකින්නේ ශාසනයේ බර කරගසා ගැනීම නිසා ඇතිවෙන වෙහෙසක් ලෙසය. මෙය වැරදි අර්ථකථනයකි.

සම්බුද්ධ ශාසනය යනු ඔබට බරක් දැනෙන දෙයක් විය නොහැක. එය ඔබව බරෙන් නිදහස් කරන, සැනසිල්ල ලබාදෙන දෙයකි. අපි අදිටන් කරගතයුත්තේ ශාසනයේ බර දැරීමට නොව, ශාසනයේ සැහැල්ලුව දැරීමටය. ශාසන ප්‍රතිපදාවේ යෙදෙන විට ඔබට වෙහෙසක් බරක් දැනේ නම් ඔබ, ඔබ ඉදිරියේම ප්‍රශ්නාර්ථයක් තබාගත යුතුය. මග නොමග ගැන සිතීමට ඔබ නිහතමානී විය යුතුය. එහෙත් ඔබ සොයන්නේ ඔබේ ජීවිතයට සැපයක් නම්, සතුටක් නම්, ඔබට වෙහෙස මෙන්ම බර දැනෙනු ඇත. මන්ද ඔබ නැති යමක් සොයන නිසාය. අපි බෞද්ධයන් විය යුත්තේද, පැවිදි විය යුත්තේද ශාසනයේ සැහැල්ලුව දැරීම සඳහාය. ශාසන ප්‍රතිපදාවේ යෙදීමේදී අපට බරක්, වෙහෙසක් දැනේ නම් එය අපට අවශ්‍ය නොමැත.

ගිහි පැවිදි අප නිවැරදි ලෙස ආමිස ප්‍රතිපදාවේ යෙදෙන විට, ලොව්තුරු බුදුසමිඳුන්ට මහේශාක්‍ය ලීලාවෙන් ආමිසයෙන් පූජා පවත්වන විට, එහි ආනිසංශ වශයෙන් පූජා පවත්වන්නාට සිව්පසය ගලාගෙන එන්නේය. එය ආශ්චර්යයක් නොවේ. බුදු බලය, සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඔබ තුළ ඇති ශ්‍රද්ධාව හේතුවෙන් ඔබට ලැබෙන දිට්ඨධම්මවේදනීය කුසල විපාකයකි. මෙම සෞභාග්‍යය සමාජයේ අපට නිතර දකින්න පුළුවන්. නමුත් කුසල විපාකයක් වශයෙන් සෞභාග්‍යය ලැබෙන විට අප පටලවා ගන්නවා. ඔබට මේ සෞභාග්‍යයේ විපාකය ලැබෙන්නේ, ලොව්තුරා බුදු සමිඳුන් කෙරෙහි තව තවත් ශ්‍රද්ධාව වඩවාගෙන, උන්වහන්සේ දේශනා කළ ශීල සමාධි ප්‍රඥා මාර්ගයේ ඉදිරියටම විශ්වාසයෙන් වඩින්න. සෞභාග්‍යය තුළින් ඔබට විශ්වාසයක් ලබාදෙන්නේ මේ දෙය කළොත් මේ දෙය ලැබෙනවා කීම පිණිසයි. එවිට ඔබ දක්ෂ විය යුතුයි. ආමිසයෙන් ප්‍රතිපත්තියට නැඹුරු වෙන්න. නමුත් අප සෞභාග්‍යය බදාගැනීමට ආමිසය තුළ සිරවෙනවා. එවිට තව තවත් සිව්පසය ගලාගෙන එනවා. අවසානයේ එම සිව්පසය විසින් අපව ග්‍රහණයකර ගන්නවා. එවිට ඔබ ශීල, සමාධි, ප්‍රඥා නිවන් මගේ ඉදිරියට නොයා, ඔබ සැපයි කියා සිතූ තැන නවාතැන් ගන්නවා. පදිංචි වෙනවා. මෙහි වැරැද්දක් ඔබට පෙනෙන්නේ නැහැ. ඔබ දැන් සෞභාග්‍යය ලැබීමෙන් මත්වෙලා. ඔබට දුර පෙනෙන්නේ නැහැ. ඔබ දකින්නේ ළඟ පමණයි. ඈත තිබෙන ප්‍රඥා මාර්ගය ඔබට පෙනෙන්නේ නැහැ. මොකද ඔබ පසුපසටයි ගමන් කරන්නේ. ආලෝකයට පිටුපාමින්, අඳුරේ අතපතගාමින් අපි මොනවද මේ සොයන්නේ. නැති සතුටක්, සෞභාග්‍යයක් සොයනවා. ඔබ සොයමින් යන සතුට, සෞභාග්‍යයේ මිම්ම, සීමාව, සෑහීම, නොසෑහීම තිබෙන්නේ ඔබ ළඟමය. මේවායේ තීරකයා, විනිශ්චයකරුවා ඔබේ ඇතිවෙමින් නැතිවන සිතමය. එහෙත් ඔබ ලෝකය තුළ කිසිදා හමුනොවන සතුට සොයනවා. සැප සොයනවා.

ඔබට ලැබීමටත්, අතහැරීමටත් දෙකටම මඟ කියන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති ශ්‍රද්ධාවයි. ඔබ මෙහිදී දක්ෂ වෙන්න අවශ්‍යයි. කුමකටද? ලැබීම අතහැර ඔබට සිව්පසය ලාභ සත්කාර ලබාදීමට මඟ පෙන්වූ ලොව්තුරා බුදු සමිඳුන් දැකීමට. ලොව්තුරා බුදුසමිඳුන් උන්වහන්සේව දකින්නට, ඔබට අවස්ථාව සලසාදී තිබියදී, ඔබ නැති සතුටක් සොයමින්, නිදිමරා වෙහෙසෙනවා. විඩාවෙන් අවිවේකයෙන් සිටින ඔබ ඔබෙන් අසන්න, මේ මොහොතේ ඔබ සොයන්නේ එම නැති සතුටම නේද? කියලා.

සියලුම මනුෂ්‍යයන් විසිහතර පැයේම වෙහෙසෙන්නේ කුමක් සඳහාද? ඔවුන් ඒ වෙහෙසෙන්නේ අයිති කරගැනීම සඳහාය. වැඩිකර ගැනීම සඳහාය. මොනවා අයිතිකර ගැනීම සඳහාද? සැප, සතුට, වගකීම්, නායකත්වය වැඩිකර ගැනීමටය. අයිතිකර ගැනීමටය.

මිනිසා පමණක් නොව, තිරිසන් සතාද අරගල කරන්නේ, වෙහෙසෙන්නේ, සැරිසරන්නේ සැප සෙවීම සඳහාය. දෙවියෝද දිව්‍ය ලෝකවල බැසගෙන දිව්‍ය සැප, දිව්‍ය ඕජාව විඳින්නේ සැපයට ඇති කැමැත්ත නිසාය. සැපය නිත්‍ය යැයි ගෙන සැප පසුපසම හඹායෑම නිසා ඔවුන් නිරතුරුවම රැස්කරන්නේ ද තණ්හාවමය. තණ්හාව තුළින් ජනිතවන්නේ ද අකුසලයක්මය. සත්ත්වයන්ට සැප සෙවීම සඳහා යන මේ අසාර්ථක ගමනේදී තමන් නොදැනුවත්වම සතර අපායට වැටී අනන්ත දුක් විඳිමින් සැරි සැරීමට සිදුවනු ඇත. බ්‍රහ්ම ලෝකවල ජීවත්වන මිථ්‍යා දෘෂ්ටික, තෙරුවන් සරණ නොගිය බ්‍රහ්මයෝද නැවත සතර අපායට වැටී දුක් විඳීමේ ස්වභාවය ඇත. බ්‍රහ්ම ලෝකවල සිටින සම්‍යක්දෘෂ්ටික බ්‍රහ්මයන් හැර අන් සියලු සත්ත්වයන්ට සැපය සොයා යන ගමනේදී අත්වනුයේ එකම ඉරණමකි.

දිව්‍ය සැප කෙටිය. සතර අපායේ දුක ඉතා දීර්ඝය. දිව්‍ය ලෝකයේ දෙවියන් නිරතුරුවම අනන්ත කාම සම්පත් විඳිමින්, එම කාම සම්පත්වලට තව තවත් ලොල් වෙමින්, අධික ආශාවෙන් කාමය පසුපස හඹායෑම නිසාත්, නිරතුරුව තණ්හාව වැඩීම නිසාත් අකුසල රැස්කර ගනී. මේ හේතුවෙන් දිව්‍ය සැප ඉක්මනින් පිරිහී යයි. දෙවියන් නැවත සතර අපායට වැටීමේ ඉඩකඩ ඉතාම වැඩිය. එහෙයින් දිව්‍ය සැප කෙටිය. සතර අපායේ ජීවත්වන සත්ත්වයා, ඔහු විඳින දුක නිසාම නිරතුරුව වෛරය, ක්‍රෝධය සහිතව ජීවත් වේ. එතුළින් සෑම මොහොතකම එම සත්ත්වයන් රැස්කරන්නේ අකුසලයක්මය. මේ හේතුවෙන් අකුසල් වැඩිවී, මේ සත්ත්වයා දුකෙන් දුකටම පත්වේ. සතර අපායේ කොටස්කරුවන් බවටම පත්වේ. බ්‍රහ්ම ලෝකයේ ජීවත්වන බ්‍රහ්මයා ද තමා විඳින සමාධි සැපය අනිත්‍ය යැයි දකින මොහොතේම අරිහත්වයට පත්වීමට හැකියාව තිබියදී, සමාධි සැපය නිත්‍ය යැයි දකිමින් එහි සතුට සොයන නිසා, අරිහත්වයට තමා විසින්ම දොරගුළු දමාගනී.

බ්‍රහ්ම ලෝකයේ, බ්‍රහ්ම තලවල මිථ්‍යාදෘෂ්ටික බ්‍රහ්මයන්ද ඇත. ඒ අය මිනිස් ජීවිතවලදී ශීලය, සමාධිය උපරිම මට්ටමින් වැඩීම නිසා බ්‍රහ්ම සැප ලබයි. නමුත් සම්මා සම්බුද්ධ ශාසනය තුළ තෙරුවන් සරණ නොගිය පිරිසකි.

බෞද්ධයන් නොවේ. මේ බ්‍රහ්මයන් ප්‍රඥාව වඩවාගෙන නොමැත. ඔවුන් සිටින්නේ අවිද්‍යාව තුළය. එවැනි බ්‍රහ්මයන් නැවත සතර අපායට වැටේ. එහෙත් ශීලය, සමාධිය උපරිම මට්ටමින් වැඩීමේ ආනිසංස නිසා ඒ අයට කල්ප ගණන් බ්‍රහ්ම සැප ලැබිය හැකිය. කවදා හෝ දවසක තෙරුවන් මුණගැසී, තෙරුවන් සරණ ගොස්, ප්‍රඥාව වැඩී, සෝවාන් ඵලයට පත්ව, බ්‍රහ්ම ලෝකය තුළම නිවීමේ මඟට පත්වීමට මේ අයට හැකියාව ඇත. එතෙක් ඔවුන්ද නැති සතුටක් ලෝකය තුළ සොයන පිරිසක්මය. ඒ අය මිනිස් ජීවිතවලදී අතහැරීම පුරුදුකොට ඇත. එහෙත් ඔවුන් අතහැරීම පුරුදුකොට ඇත්තේ ප්‍රඥාව නිසා නොව සමාධි සැපයට ඇති ලොල්වීම, තෘෂ්ණාව නිසාය. සියලුම සැප අතහැරියත් සමාධි සැපය නිත්‍ය බවට ඇති විශ්වාසය නිසාය.

සැප සොයන සියලු සත්ත්වයෝ මේ යන්නේ කිසිදා තෘප්තිමත් නොවන ගමනකය. ඔබේ කුටිය දෙස බලන්න. එහි සුවපහසු පුටු, මේස, ඇඳ, ඇතිරිලි, පා පිස්නා, පලස්, රේඩියෝ, ආහාර පාන, කිරි පිටි, බෙහෙත් තිබෙනවාද? මේ සියල්ල තිබෙන්නේ තමන්ගේ ආත්ම ගරුත්වය, සැප සඳහාය. ඒ කියන්නේ නිරතුරුවම ඔබ සිටින්නේ දෙවැනියෙක් සමඟමයි. හුදෙකලාව නම් නොවේ. ඔබම සිතන්න, තුන් සිවුරත් පාත්‍රයත් කියන සීමාවෙන් කොච්චර දුරස්වද ඔබ ඉන්නේ. එපමණටම තණ්හාව ඔබේ හුදෙකලාව මකන හිතවතා වෙලා.

සක්විති රජ පදවියද, රාජ රාජ මහාමාත්‍ය පදවි ද සංසාරයේ ලබා ඇති අපි, එම රාජශ්‍රීය තළුමරමින් රස විඳ ඇති අපි, වර්තමානයේදී අනවබෝධය නිසා නොවිඳපු රස, සැප සොයමින් තරගයක යෙදී සිටිමු. සංසාරයේ ඔබ සක්විති රජ පදවිය ලද මොහොතේදී ද එම සක්විති රජ පදවියෙන් චුතවන මොහොතේදී ද, ඔබ එම සැපයෙන් සෑහීමකට පත්නොවුණි. ඒ නිසාම තණ්හාවෙන් ගැටෙමින් ඔබ නැවත නැවත සසර සැප සොයන ගමනටම වැටුණි. මේ ඔබ යන්නේ එම මාර්ගයේය. මේ මාර්ගයට ඔබව දැම්මේ අන් කිසිවෙකු නොව, අවිද්‍යාවෙන් පිරි ඔබේ සිතමය. කෑදර, ගුණමකු, අවිචාරමත්, පංචකාමය සොයාගෙන අයාලේ යන ඔබගේ ඇතිවෙමින් නැතිවෙන සිතමය. මේ කෑදරකම නිසාම ඔබව රැගෙන පැමිණි දුර තව රැගෙන යෑමට නියමිත දුර, ඉලක්කම්වලින් ප්‍රකාශ කළ නොහැක. ඔබ කව්රුන් වුවද ඔබ මේ වෙහෙසෙන්නේ සැප සෙවීම සඳහා නොවේද? ඔබ මේ පොත අතට ගත්තේද ඔය සිත ඔබට අණ කළ නිසා නේද? ඒ සිත දැන් තිබෙනවාද? එය අනිත්‍ය වී ගොසිනි. ඒ සිත ඔබට අයිති දෙයක්

නොවෙයි නේද? ඔබට ආගන්තුකයෙක් නේද? එහෙත් අතීතයේ යම් මොහොතක එම සිත නිත්‍ය යැයි සිතා, ඔබේ යැයි සිතා, සිත ක්‍රියාත්මක කළා නේද? ඒ තුළින් ඔබ කුසලයක් හෝ අකුසලයක් රැස් කළා නේද? මේ දෙකම ඔබට රැගෙන යන්නේ භවයට නේද? එසේ නම් අනිත්‍ය වශයෙන් නොදකින සෑම සිතක්ම ඔබව සංසාරයට රැගෙන යනවා නේද?

ඔබ නිවන් අරමුණු කරා යන නිවීමේ මෙහෙයුමේ, යම් සන්ධිස්ථානයකදී ඔබගේ ඉදිරියට ලොව්තුරා බුදුසමිඳුන් වඩිනවා. එය ස්ථිරයි. නියතයි. එහෙම උන්වහන්සේ වැඩමකරලා ඔබට නිවන් මගේ ඉතිරි දුර සම්පූර්ණ කරන්න කමටහනක් දෙනවා. එය දෙන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේමයි. උන්වහන්සේ ඔබට දෙන කමටහන තමයි ඇතිවුණ සිත අනිත්‍යයි කියලා දකින්න කියන කමටහන. ශාස්තෲන්වහන්සේ දෙන කමටහනක් නිසා එය දැඩි ලෙස ඔබට දැනෙනවා. අවබෝධ වෙනවා. ඒ මොහොතේම ඔබ ලොව්තුරා බුදුරජාණන් වහන්සේව දකපු සිත අනිත්‍ය වශයෙන් දකිනවා. උන්වහන්සේගේ රූපකාය, උන්වහන්සේගේ කමටහන, මේ සියල්ල අනිත්‍ය වශයෙන් දකිනවා. ඔබට වැඩෙන ප්‍රඥාව තුළ එය එසේ වනවාමයි. මෙහිදී ඔබ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කියලා දකින්නේ ඔබ තුළ වැඩෙන ප්‍රඥාවයි. ප්‍රඥාවත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේත් කියන්නේ දෙකක් නොව එකක්ය යන්න ඔබට මෙහිදී හොඳින් අවබෝධ වනවා. අපි හිතන්නේ නැහැ බුදුරජාණන් වහන්සේත් ප්‍රඥාවත් කියන්නේ එකක් බව. එහෙත් ඔබ නිවීමේ මෙහෙයුමේ ක්‍රියාත්මක භාවයට පත්වීමේදී ඔබට මේ යථාර්ථය අවබෝධ වනවා. අද ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැඩසිටිනවා නම් ඔබට දෙන කමටහනත් ඔය කමටහනම විය යුතුය. 'ඇතිවුණ සිත අනිත්‍ය වශයෙන් දකින්න' එය තණ්හාවෙන් තෙත් කොට ක්‍රියාත්මක භාවයට පත්වීමට ඉඩ නොදෙන්න. ඔබ මෙතෙක් කළේ ද, කරමින් සිටින්නේ ද ඇතිවන සිත තණ්හාවෙන් තෙත්කර ක්‍රියාත්මක භාවයට පත්කිරීමය.

බලන්න ඔබ මොනතරම් වාසනාවන්ත ද කියලා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පිරිණිවී වසර දෙදහස් හයසියයක් ඉක්මගිය ද, ඔබ දක්‍ෂ නම් ඔබට පුළුවන් උන්වහන්සේගෙන් කමටහන් ලබාගන්න. උන්වහන්සේව දකින්න. උන්වහන්සේගෙන් ආරක්‍ෂාව ලබාගන්න. උන්වහන්සේගෙන් සැනසුණු, ධර්ම මාර්ගයේ සැනසීම ලබාගන්න.

අසූහාරදහසක් පහන්ද, මල්ද, හඳුන්කූරුද, පිරිකරද පූජාකර ඔබ දකින්නේ දිව්‍ය, මනුෂ්‍ය සශ්‍රීක සංඥාවන්මය.

එම සංඥා භවගාමීය. එහෙත් ඔබ එම සිත අනිත්‍ය වශයෙන් දැකීමෙන් ඔබ දකින්නේ ධර්මයයි. ඔබ දකින්නේ ලෝකයේ සැබෑ ස්වභාවයයි. හැබැයි ඔබ තුළ තවම එම ශක්තිය මෝදුවී නැතිනම්, ඔබ කළ යුත්තේ ඉහත පිංකම්වල යෙදෙමින්, ඔබ තුළ ඉහත ශක්තිය වර්ධනය කරගැනීමය. එහෙත් ඔබ එකතැන පල්වෙන, එකතැන පදිංචිවෙන බෞද්ධයෙක් නොවිය යුතුය. අත්විඳිමින්, අත්දකිමින්, අවබෝධය කරා යන බෞද්ධයෙක් විය යුතුය. පෘථග්ජන සත්ත්වයා කල්මැරීමට ඉතාමත් ප්‍රියය. අතීතය පුරාවට කළේ ද කල් මැරීමය. බහුතරයක් බෞද්ධයෝ වර්තමානයේදී ද මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ දී උන්වහන්සේගෙන් ධර්මය අසා, නිවන් දැකීමට බලාපොරොත්තු වේ. ප්‍රාර්ථනා කරයි. ඔබ ගිහි හෝ පැවිදි වුව ද මෙසේ ප්‍රාර්ථනා කිරීමේදී ඔබ දකින්නේ මෛත්‍රී බුදුන් නොව, අවිද්‍යාවයි. ඔබ ප්‍රාර්ථනා කරන්නේ අවිද්‍යාවයි. නමුත් මෛත්‍රී බුදුන්ගේ ශාසනයේදී උන්වහන්සේගෙන් ධර්මය අසා නිවන් දකින්න යැයි ඔබට අණකරන ඔබේ සිත අනිත්‍ය බව දැකීමෙන් ඔබ දකින්නේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේමයි. උන්වහන්සේ දේශනා කරන ධර්මයමයි. බලන්න ධර්මයේ ආශ්චර්යය. අද මේ මොහොතේදී ඔබට පුළුවන් මෛත්‍රී බුදුසමිඳුන් විසින් දේශනා කරන ධර්මය දකින්න. අත්විඳින්න. එහෙත් ඔබ තුළ ඇති අවිද්‍යාව නිසා, ඔබ දුක් විඳිමින් කල්ප ගණනක් සසර ඈතට යන්න යනවා. අවිද්‍යාව විසින් සත්ත්වයාව මොනතරම් මුලාකරනවා ද බලන්න. මෛත්‍රී බුදුසමිඳුන්වත්, උන්වහන්සේ දේශනා කරන ධර්මයත් මේ මොහොතේ දකින්න අවස්ථාව තිබියදී, භවයට කෑදර අපේ සිත, අපිව දුකටම ඇදගෙන යනවා. මෛත්‍රී බුදුසමිඳුන්ව පෙන්නන්නම් කියා අපිට අවිද්‍යාව පෙන්වනවා.

ඔබ දක්ෂවෙන්න නිරතුරුවම ඇතිවන සිත අනිත්‍ය වශයෙන් දකින්න. සිත ඔබට අයත් දෙයක් නොවන බව දකින්න. ඔබ ආගන්තුකයෙක් බව දකින්න. සිත ඔබේ දුක් දෙන මිතුරා බව දකින්න. ඔබට මෙසේ දකිද්දී ඔබ තුළ වැඩෙන්නේ සතර සතිපට්ඨානයයි. ඔබ අවබෝධ කරන්නේ පංචඋපාදානස්කන්ධයයි. පටිච්චසමුප්පාදයයි. සප්ත බොජ්ජංග ධර්මතාවයනුයි. ඔබ මේ කිසිවක් සොයා යා යුතු නැත. හැදෑරිය යුතු ද නැත. ඇතිවන සිත අනිත්‍ය වශයෙන් දැකීමේදී ඉහත ධර්මතාවයන් ඔබ තුළ ආයාසයෙන් තොරව වැඩෙනු ඇත. ඔබට අවබෝධවනු ඇත. සිතේ අනිත්‍යභාවය නොදකින්නා, මේ ධර්මතාවයන් සොයාගෙන කමටහන් පංති, දේශනා පසුපස යා යුතුය. ඔහු මේ සොයන්නේ තමා තුළම තිබෙන දෙයකි. සියල්ල සෙවීම අතහැර ඔබ මේ සතර මහා ධාතුන්ගෙන් සකස්වුණ, දෙතිස්

කුණපය ක්‍රියාත්මක භාවයට පත්කරන, ඇතිවී නැතිවී යන සිත ගැන පමණක් සොයන්න. දකින්න. ඒ ඔබ සොයන්නේද, දකින්නේද ධර්මයයි.

ඔබට කතරගමට යෑමට අවශ්‍ය නම් ඔබ කළ යුත්තේ බස් නැවතුමට ගොස් කතරගම බසයකට ගොඩවී, ටිකට්පතක් ලබාගැනීමය. එවිට බසය ඔබව කතරගමට රැගෙනයනු ඇත. කතරගමට යන ගමනේදී ඔබ වටපිටාව හොඳින් නිරීක්ෂණය කරමින් ගියහොත් ඔබට කළුතර බෝ සමිඳුන් ද, ගාල්ල වරාය ද, හම්බන්තොට ලුණු ලේවාය ද, තිස්ස මහසෑ සමිඳුන් ද දැකිය හැකිය. ඔබ බස් රථයට ගොඩ නොවී බස් නැවතුමේ සිටින අයගෙන්, එහෙත් නැතිනම් මාර්ග සිතියමකින් කළුතර බෝ සමිඳුන් ගැන, ලුණු ලේවාය, වරාය, මුහුද ගැන විස්තර තොරතුරු ඒවායේ ස්වභාවය ඇසීමට ගියහොත්, සෙවීමට ගියහොත් ඔබට බසය වැරදී අතරමං වීමට සිදුවනු ඇත. මෙපරිද්දෙන් ඔබ සිත දෙස බලාසිටින්න. එවිට සතර සතිපට්ඨානය ද පටිච්චසමුප්පාදය, පංචඋපාදානස්කන්ධය, සප්ත බොජ්ජංග ධර්මයන් පෙනෙණු ඇත. දකිනු ඇත. අවබෝධය ලබනු ඇත.

මේවා සොයා ටියුෂන් නොයායුතුය.

සිත දෙස බලන්න. සිත යනු අනිත්‍යයයි. ලෝකයයි. සුන්දරත්වයයි. අසුන්දර බවයි. සැපයි. දුකයි. මෛත්‍රීයයි. ක්‍රෝධයයි. භවයයි. නිවීමයි. කොටින්ම සිත යනු ලෝකයේ නිර්මාණකරුවායි.

සිත යනු දුක් ගොඩකි. එහෙත් ඔහු ඔබගේ පරම මිතුරාය. ඔබට සැනසිලි බස් තෙපලන සුරතලාය. හරි මග වසා වැරදි මඟ පෙන්වන වංචාකරුවාය. එසේම ඔබගේ ගැලවුම්කරුවාය. එනිසා අවබෝධයෙන් සිත හඳුනාගන්න. සිත ඔබේ කලණ මිතුරා කරගන්න. එය කළහැක්කේ සිත අතහැරීමෙන්ය. සිත අතහැරීමේදී ලෝකය ද ඔබට මඟහැරෙනු ඇත.

සැප අනිත්‍ය වන බව දුක දන්නා නිසා, සැප අසලම දුක ගැවසෙමින් සිටියි. සැපය දන්නා දෙයත්, දුක දන්නා දෙයත් ඔබ නොදන්නේ, සැපත් දුකත් දෙකම ඇති කළේ ඔබට ආගන්තුක, ඔබට අයිති නැති සිතක් නිසාය. ඔබ සිත ගැන දන්නේ නැහැ. සිත ගැන බලන්නේ නැහැ. දිනපතා කණ්ණාඩි මේසය ළඟට ගිහින් හිස, රැවුල, ඇස, කන, දිව, දත්, මුහුණ, කුරුළෑ, සම බලනවා. අඩුපාඩු තිබුණොත් විටමින් බොනවා. ක්‍රීම් ගානවා. මා තුළ මා බලනවා. ලස්සන කරනවා. නමුත් සිත ගැන බලන්නේ නැහැ. ඔබ, සැප සොයන සිත, ලස්සන සොයන සිත දෙස ප්‍රඥාවේ කැඩපතින් බලන්න. ඔබ දකින්නේ ඔබව නොව, මහා වේගයක් පමණක්ය.

ඊකන්ඩිෂන් කරනු වෙනුවට අවබෝධයෙන් දකිමු මේ කය

ඔබ රටේ තොටේ සංචාරය කළොත් ඔබට හැම තැනකම දකින්න ලැබෙන දෙයක් තමයි රූපලාවණ්‍ය ආයතන. අතීතයේ අපි ගමක නගරයක ඇති බාබර් සාප්පුවක් මිස මෙවැනි ආයතන දැක නැහැ. රූපය වර්ණවත් කරන රූපලාවණ්‍ය ආයතන, ගුවන් විදුලි ආයතනවල, රූපවාහිනී සේවාවල රූපලාවණ්‍ය වැඩසටහන් ඔබගේ රූපය වර්ණවත් කිරීම සඳහා, ප්‍රභාශ්වර කිරීම සඳහා මොනතරම් වැඩසටහන් කරනවාද.? මේවා මෙහෙයවන හැඩකාර පිංවත් නෝනා මහත්වරුන් මොනතරම් ආත්ම අභිමානයකින්ද මේ රූපයට උරුම ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදිය මුදවපු කිරිවලින්, යෝගට්වලින්, පිපිඤ්ඤා, කැරට්, බිත්තර සුදු මදවලින්, ක්‍රීම්, ජෙල්, ඩයි වර්ගවලින් පරාජයට පත්කරන්න උත්සාහගන්නේ. ශරීරයේ දෙතිස් කුණපයම ලස්සන කරන්න, රැළිවැටීම නවත්වන්න, කාන්තිමත් කරන්න, ඇති රෝම නැතිකරන්න, නැති රෝම ඇති කරන්න, සුදු කෙස් කළු කරන්න, කළු කෙස් නා නා වර්ණ ගන්වන්න......

බලන්නකෝ, ආශ්චර්යමත් ක්‍රියාන්විතයක් මේක.

මේ ක්‍රියාන්විතයෙන් රූපයේ හැඩගන්වලා, ඔපවත් කරලා, මෝස්තර විලාසිතා, විසිතුරු මාල, වළලු, මුදු පළන්දලා මේ කය අංගසම්පූර්ණ කරලා ගත්තහම මොනතරම් හැඩද? මෙවැනි හැඩකාර පිංවත් නෝනා මහත්වරුන් වයස් භේදයකින් තොරව වර්තමානයේ වැහි වැහැලා. මේ අය

'රීකන්ඩිෂන්' කරපු තම කය දරාගෙන මහත් අභිමානයෙන් යුතුව කාලය ගතකළත් ඔබ දන්නවාද ඒ අය මොනතරම් බියකින් ද ජීවත්වෙන්නේ කියලා. තමා කෘත්‍රිමව සකස්කරගත් ශරීර ස්වභාවය, හැඩය, වර්ණය අහිමිවේය කියලා. මේ අහිමිවීම වැළැක්වීම සඳහා මොනතරම් මේ අය දුක් විඳිනවද? මහන්සි ගන්නවද.? ඒ වෙහෙස නේද දිනෙන් දින ඉහළ යන රූපවාහිනී රූපලාවණ්‍ය වැඩසටහන්, රූපලාවණ්‍යාගාර, විලාසිතා, ඇඳුම් මාලිගා, විසිතුරු පළඳනා යන ක්ෂේත්‍රවල දියුණුන්ත වර්ධනය. මේ පිබිදීමට හේතුව ලෝකයා තුළ රූපයටත්, එහි හැඩය, වර්ණය, කාන්තිය, රිද්මය, ලාලිත්‍යය අහිමිවේය, අඩුවේය කියන බිය නිසාම ඇතිවූවකි.

වයස් භේදයකින් තොරව ලෝකයා එහි ගිලනුන් බවට පත්වී ඇත. ඔවුන් මේ සොයන්නේ නැති දෙයකි. අනිත්‍ය බවට පත්වන දෙයකි, එහෙයින් ඔවුනට හිමි දුකම පමණකි. රූපලාවණ්‍යාගාර, රූපලාවණ්‍ය වැඩසටහන්, මුදවපු කිරි, පිපිඤ්ඤා, කැරට්, බිත්තර සුදුමද මේ දුකේ, අවිද්‍යාවේ සංකේතයන්ය. සිහිවටනයන්ය.

යමෙක් මේවායේ සේවාව සොයාගෙන යන්නේ නම් හේ අසරණයෙකි. දුකෙන් මිදීම පිණිස දුක ඇති කළ මාරයාම සොයා යෑමකි. ජාති, ජරා, ව්‍යාධි මරණ දුක නැතිකර ගැනීම පිණිස ජාති, ජරා, ව්‍යාධි මරණ දුකම සොයා යෑමකි. රූපයේ ආශ්වාදය පමණක්ම කථා කරන අවිද්‍යාවේ හඬවල් ඔබව මේ ගාල් කරන්නේ දුකෙන් දුකටමය. දුකෙන් නිවීමට, සැනසීමට නොවේ. ඔබට මේ ජීවිතයේ නිවීම, සැනසීම අවශ්‍ය නම් ඔබ මේ අවිද්‍යාවේ හඬට සවන් නොදිය යුතුයි. එහි වහලෙක්, ගොදුරක් නොවිය යුතුයි.

ධර්ම මාර්ගයේ ගමන් කරන පිංවත් මහත්ම මහත්මීන්, අනන්ත අප්‍රමාණව ඔබට මුණගැසී ඇත. ඒ අය ශරීරය අස්වාභාවික ලෙස හැඩ නොගැන්වූ, ස්වභාවය විකෘති කර නොගත් උදවියයි. සුදුවත් දරාගෙන, බොහොම සංවර ප්‍රසන්න, ශාන්ත ස්වභාවයෙන් සමාජයේ ජීවත් වෙනවා. මේ අය දකපුවහම කෙනෙකුට හිතෙන්න පුළුවන් දිව්‍ය ලෝකයේ දිව්‍ය-දිව්‍යාංගනාවනුත් මේ වගේම ඇතිය කියලා. ඔවුන් ඒ තරමටම ප්‍රසන්න සුන්දර නිසා. ඒ අයගේ රූපලාවණ්‍ය තමයි බුදුගුණ භාවනාව, මෛත්‍රී භාවනාව, දාන ශීල ප්‍රතිපදාව. රූපය කියන්නේ මරණයක්. රූපය කියන්නේ ව්‍යාධියක්, රූපය කියන්නේ ඉපදීමක්, එහෙම දෙයකට මෝස්තර හැඩතල, රිද්ම දමනවා කියන්නේ මරණයකට, ඉපදීමකට, ව්‍යාධියකට මෝස්තර, හැඩතල, රිද්ම දැමීමක්. බලන්න අපි මොනතරම් අදක්ෂද? හැබැයි ඉතින් මේ ගැන පුදුම වෙන්න දෙයක් නැහැ. අවුරුදු 80ක් ජීවත් වෙලා ගෙදර

ආත්තම්මා මිය ගියහම ගෙදර සාලය මැද්දෙ තිබෙන ඇගේ මිනී පෙට්ටිය වටේට පාට පාට විදුලි බුබුලු වැල් දමනවා. අත්තම්මාගේ ඉදුණු අවපැහැ ගැනුණු කොණ්ඩය, රැලි වැටුණු අතපය, ඉදිමුණු මුහුණ ලයිට් එළියට ලස්සනට පේනවා. ගෙදර අය කියනවා, ආච්චි මැරුණත් මුහුණ හරි ලස්සනයි. මුහුණේ සිනා රැල්ලක් තිබෙනවා කියලා. බලන්න අපි ජාති, ජරා, ව්‍යාධි, මරණ ආශ්වාදය කරන හැටි.

සුදුවෙන හිසකෙස්වලට වර්ණ දානවා කියන්නේ, රැළි වැටෙන සමට, ඇහි බැමට, නියපොත්තට රූපලාවණ්‍ය කරනවා කියන්නේ මරණයකට, ව්‍යාධියකට සාත්තු කරනවා කිරීමක්. ඔබ හිතලා බලන්න, පතිකුළයට යන පිංවත් මනාලියක් පෙරවරු 10ට පෝරුවට නගින්න තිබෙනවා නම්, රූපලාවණ්‍ය ශිල්පියා ඇයව හැඩකරන්න ගන්නේ, ඒ කියන්නේ ඇයගේ ජාති, ජරා, ව්‍යාධි, මරණ වහන්න, සඟවන්න, යටගහන්න පටන්ගන්නේ පාන්දර තුනේ හතරේ පටන්. ඒ විතරක් නොවෙයි. පතිනියගේ ශරීරය නිවෙන්නට, ප්‍රසන්න වෙන්න, කාන්තිමත් වෙන්න අවශ්‍ය උපදෙස් පිළිපැදීම ඊට මාසයට පමණ පෙර සිටයි ඇය ආරම්භ කරන්නේ. මොකක්ද මේ උත්සාහය. ජාති, ජරා, ව්‍යාධි, මරණ නොපෙන්වීමේ උත්සාහයයි. හැබැයි මෙතන දී මනාලියට මෛත්‍රිය වැඩීම ගැනත් කියලා දෙනවා. සිත සන්සුන්ව තබාගන්න...

බලන්නකො රූපයේ ආදීනවය සමඟින් ආශ්වාදය තළු මරමින් වමාරන මාරයා මෙතැනදී මෛත්‍රිය ගැනත් කියලා දෙනවා.

මඟුල් ගෙදර අමුත්තෝ මැද්දේ දහවල් කාලය ලංවෙද්දි වෙහෙස, තෙහෙට්ටුව, අවිවේකය, දහඩිය කඳුළු හේතුවෙන් මනාලියගේ සඟවපු ජාති, ජරා, ව්‍යාධි මරණ පවුඩර් දියවෙලා නැවත පෙනෙන්නට පටන් ගන්නවා. නැවත දහවල් කෑමෙන් පස්සේ රූපලාවණ්‍ය ශිල්පියා මනමාලියගේ ජාති, ජරා, ව්‍යාධි මරණ පවුඩර් ක්‍රීම්වලින් වසාදමනවා. හැබැයි ඉතින් පිංවත් මනාලිය මනාල මහත්මයාගේ නිවසට ගියහම, යට ගැසූ ජාති, ජරා, ව්‍යාධි, මරණ ඔක්කොම පේන්න ගන්නවා. මේවා දැකලා මනමාලයා, මනමාලිය කම්පා වෙනවද? නැහැ. ගෙදර ගෙනාපු ජාති, ජරා, ව්‍යාධි, මරණ සැපයක් කොටම ගන්නවා. මා තුළ ඇය ඉන්නවා, ඇය තුළ මා ඉන්නවා කියා සිතා 'අපි ලුණුයි බතුයි කාල හරි ජීවත්වෙමු' යි ගිවිස ගන්නවා. ඒ කියන්නේ මේ දුක අපි සැපයක්ම කරගමුයි කියන එකයි. මගේ ජාති, ජරා, ව්‍යාධි, මරණ ඔබ ගන්න. ඔබේ ජාති, ජරා, ව්‍යාධි, මරණ මට දෙන්න. තියෙන දුක මදිවට අනුන්ගේ දුකත් තමාගේ කරගන්නවා. විවාහය නාමයෙන් සිද්ධවුණේ එක

සැපයක් උදෙසා දුක් ගොඩක් අයිතිකර ගැනීමකි. ඒ කියන්නේ ඇත්තටම ඒ ගෙනාවේ මනාලියක් නොවෙයි. දුකක්. දුකට අයිති දෙයක්.

මේ සියලු දුක් කන්දරාව කුමක් නිසා ද හටගත්තේ. රූපය මගේ කරගැනීම නිසා. මොකක්ද රූපය කියන්නේ?

ඔබ පිංවත් ස්වාමීන් වහන්සේ නමක් වේවා, පිංවත් පුරුෂයෙක්, ස්ත්‍රියක් වේවා ඔබේ කය, උදාහරණයට ගන්න. කුමක් නිසා ද මේ කය පවතින්නේ. ආහාරය නිසාමයි. ජලය, බෙහෙත් නිසාමයි. කුමකින්ද මේ කය සැදී පවතින්නේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතුන්ගේ තද ස්වභාවය, වැගිරෙන ස්වභාවය, උණුසුම් ස්වභාවය, වායු ස්වභාවය. ඉහත ස්වභාවයේ ධාතුන් හතරකින් තමයි මේ කය නිර්මාණය වී තිබෙන්නේ. මේ ධාතුන් වෙන් වෙන් වශයෙන් ශරීරයේ කොතැනකවත් නැහැ. මේක පඨවිය, මේක ආපෝ, තේජෝ, වායෝ කියලා වෙන් වෙන් වශයෙන් ගන්න බැහැ. ඔබට උදාහරණයක් කියන්නම්. ඔබගේ ශරීරයේ තැනකින් මස් කැබැල්ලක් කඩලා ගත්තොත් එම මස් කැබැල්ල තුළ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතුන් සියල්ලම තිබෙනවා. එහි තද ගතිය පඨවි ධාතුව. එහි තිබෙන රුධිරය ආපෝ ධාතුව. එහි තිබෙන උණුසුම තේජෝ ධාතුව, පීඩනය තිබෙනවා, එම නිසා රුධිරය ගලනවා, ඒ වායෝ ධාතුව.

ඒ කියන්නේ මස් කැබැල්ල තුළ ධාතු කොටස් හතරම තිබෙනවා. නමුත් අප සාමාන්‍ය ව්‍යවහාරයේදී මස් කැබැල්ලට කියන්නේ පඨවි ධාතුව කියලයි. ඒ වුණත් දැන් ඔබට වැටහෙනවා ඇති මස් කැබැල්ල තුළ පඨවි ධාතුව පමණක් නොව, එකිනෙකට මුහුවුණු අනෙකුත් ධාතු කොටස් තුනත් තිබුණු බව.

ඔබ මුත්‍රා කෝප්පයක් ගන්න. අපි සාමාන්‍ය ව්‍යවහාරයේදී මුත්‍රා කියන්නේ ආපෝ ධාතුවට, නමුත් මුත්‍රාවල සියුම් කුඩු ස්වභාවයක් තිබෙනවා. ඒ තමයි පඨවිය. උණුසුම් ස්වභාවයක් තිබෙනවා. ඒ තමයි තේජෝ ධාතුව. වැගිරෙන ස්වභාවයක් තිබෙනවා. ඒ තමයි ආපෝ ධාතුව. පෙන බුබුළු නගින ස්වභාවයක් තිබෙනවා. ඒ වායෝ ධාතුව. මේ කියන්නේ මුත්‍රා වල ධාතු කොටස් හතරම අන්තර්ගතව තිබුණ බවයි. ආධ්‍යාත්මික හෝ බාහිර යම් රූපයක් වෙතොත් සෑම රූපයක්ම ස්වභාවය ඉහත පරිදිමය. නමුත් මෙහිදී කථාකරන්නේ ආධ්‍යාත්මික රූපය ගැනය. ඔබගේ කය ගැනය. දැන් ඔබට පැහැදිලිය. කය යනු රූපයකි. රූපය සෑදී තිබුණේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතුන්ගෙනි. මේ ධාතු කොටස් හතර නිතරම වෙනස්

වෙමින් පවතින්නකි. රූපයේ අනිත්‍යභාවය වශයෙන් අපි දකින්නේ මේ වෙනස්වීමයි. ජාති, ජරා, ව්‍යාධි, මරණ වශයෙන් දකින්නේ මේ වෙනස් වීමයි. ලෝකයේ වේගවත්ම ක්‍රියාවලිය රූපයේ අනිත්‍යභාවයට පත්වන වේගයයි. ලෝකය තාක්ෂණික වශයෙන් මොනතරම් දියුණු වුවද, රූපය අනිත්‍යභාවයට පත්වන වේගය දැකීම ජායා රූපයකට ගැනීමට සිතීම පවා මෝඩකමකි. මන්ද ලෝකයේ ප්‍රවේගකාරීම දෙය රූපය අනිත්‍යභාවයට පත්වන වේගය නිසාය. එය මේ මස් ඇහැට දැකිය නොහැකිය. ප්‍රඥාවේ ඇසින් පමණක් දැකිය හැක්කකි. ඒ වේගය යමෙක් ප්‍රඥාවෙන් දකීද, හේ තම කය ද වේගයෙන් අනිත්‍යභාවයට පත්වන රූපයක් සේ දකියි. අවබෝධයෙන්ම කළකිරේ. රූපයෙන් නිදහස් වේ.

රූපයේ අනිත්‍යභාවය අවබෝධ කරගත් භික්ෂුවට තම ප්‍රඥාවේ ඇසින් මහා ගල් කුළක් එක මොහොතකින් අනිත්‍යයෙන් සියුම් භාවයට පත්කොට සුළඟේ පාවී යන වායෝ ධාතුවක් ලෙසින් දැකිය හැකිය. මහා සද්ධන්ත ගල්කුළක් සුළඟේ පාවී යන දූමක් සේ දකිමින් ඒ අවබෝධය ලැබුවේ රූපයේ අනිත්‍යභාවයට පත්වන වේගයේ ප්‍රවේගයයි. මේ අනිත්‍යයේ ප්‍රවේගය දකින්නා රූපයට ඇති කැමැත්තෙන් මිදී නිස්සරණය ලැබීම ඒකාන්තය.

ඉහත ආකාරයෙන් සතර මහා ධාතුන් අනිත්‍යභාවයට පත්වන විට, එකිනෙක සම්බන්ධව පවතින සතර මහා ධාතුන් අතර සියුම් අවකාශ ධාතුවක් සකස් වේ. මේ අවකාශ ධාතුව දැකිය හැක්කේ ප්‍රඥාවෙන් පමණක්මය. මස් ඇසට මේ අවකාශ ධාතුව නොපෙනේ. සාමාන්‍යයෙන් අවකාශ ධාතුව වශයෙන් හඳුන්වනුයේ කන් සිදුර, නාස් සිදුර, නාභිය වැනි අවකාශයන්ය. එහෙත් එය ප්‍රාථමික දැනීමකි. සැබෑ ඇතිවී නැතිවී යන අවකාශ ධාතුව නිර්මාණය වන්නේ එකම විට පවතින්නා වූ සතර මහා ධාතුන්ගේ ප්‍රවේගයෙන් ඇතිවීම නැතිවීම වන විට ඇතිවන හිඩැසය. එම අවකාශය කවදාහරි අපි ප්‍රඥාවේ ඇසින්ම දැකිය යුත්තකි.

ඔබට සරල උදාහරණයක් පෙන්වන්නම්. ඔබ මේසයක් ළඟට යන්න. මේස ලෑල්ලට අඩියක් පමණ උඩින් ඔබේ අත්ල මේස ලෑල්ලට සමාන්තරව තබාගන්න. එක ඇඟිල්ලක් ලෑල්ලට සිරස්ව පහළට යොමු කරන්න. දැන් එම ඇඟිල්ල වේගයෙන් මේස ලෑල්ලට ගැටීමට සලස්වමින් ඉහළට ගන්න. ඉතා වේගයෙන් මෙය කරන්න. ඔබට පෙනේවී හැම මොහොතකම ඔබේ ඇඟිල්ල මේස ලෑල්ලේ වදින බව. නමුත් ඇඟිල්ල ඉහළට යනවිට මේස ලෑල්ලේ වදින්නේ නැහැ. වේගවත් බව නිසා ඔබට මෙය දකින්නට බැහැ.

අවකාශ ධාතුවත් ඔය වගේමයි. සතර මහා ධාතුන්ගේ වේගවත් ඇතිවීම, නැතිවීම නිසා ඇතිවන අවකාශය මස් ඇහැට පෙනෙන්නේ නැහැ.

දැන් ඔබට පැහැදිලියි පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතුන් හතරත්, එම ධාතුන්ගේ වේගවත් වෙනස්වීමත් නිසා හටගන්නා අවකාශ ධාතුවත්.

එහෙම නම් ඔබ මමය, මගේය කියලා හැඬකරන, ලස්සන කරන ඔබ කය අයිති කාටද? ඔබටද? නැහැ. එහි සැබෑ අයිතිකරු තමයි ස්වභාවධර්මය. කොහොමද මේ කය අයිති ස්වභාවධර්මයට යැයි කියන්නේ. මේ කයත්, ස්වභාවධර්මයේම කොටසක් නිසා මේ කය හැදිලා තිබෙන, පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතුන්ගෙන්මයි ස්වභාවධර්මය හැදිලා තිබෙන්නේ.

ඒ කියන්නේ ඉර, හඳ, තරු, වලාකුළු, මහපොළොව, ගස් වැල්, දෙවියා, බ්‍රහ්මයා, නිරිසතා.... මේ සියල්ල හැදිලා තිබෙන්නේ හතර මහා ධාතුන්ගෙන්මයි. දැන් ඔබට වැටහෙනවා ස්වභාවධර්මය හැදිලා තිබෙන්නේ හතර මහා ධාතුන්ගෙන් කියලා. මේ ස්වභාවධර්මයේ සැබෑම අයිතිකාරයා තමයි අනිත්‍යය. දැන් මෙන්න මේ විදිහට ඔබ ඔබේ කය අයිති ස්වභාවධර්මයට කියලා ඔබට ඔප්පුකරගන්න.

ඔබ මෙහෙම සිතන්න. මේ හාමුදුරුවෝ අපවත්වෙනවා. හාමුදුරුවෝ අපවත්වුණහම දායකයෝ මොකද කරන්නේ. හාමුදුරුවන්ගේ සිරුර ආදාහනය කරනවා. ගිනි තියනවා. හාමුදුරුවන්ගේ සිරුර ගිනි ගන්නකොට එම ගිනි දළුවලට ඔබ හාමුදුරුවෝ කියලා කියන්නේ නෑ. ඔබ කියන්නේ තේජෝ ධාතුව කියලා. මේ හාමුදුරුවන්ගේ සිරුර බුර බුරා ගිනි ගනිද්දී, මේ ගින්න ඇවිලෙන්නේ ශරීරයේ තිබෙන තෙල්වලට. සම මතුපිටට තෙල් උනමින් ගිනිගන්නා විට එම තෙල්වලට ඔබ හාමුදුරුවෝ කියලා කියන්නේ නැහැ. ඔබ කියන්නේ ආපෝ ධාතුව කියලා. මේ හාමුදුරුවන්ගේ සිරුර දැවී අහසට නගින දුමට 'හාමුදුරුවෝ' කියන්නේ නැහැ. ඔබ එම දුමට කියන්නේ වායෝ ධාතුව කියලා. හාමුදුරුවන්ගේ සිරුර දැවිලා ඉතිරිවන අළුවලට, ඇට කැබැලිවලට ඔබ හාමුදුරුවෝ කියලා කියන්නේ නැහැ. ඔබ කියන්නේ පඨවි ධාතුව කියලා. ඔන්න එහෙම නම් දකින්න හාමුදුරුවෝ දරාගෙන සිටි කය අයිති කාටද, එම ශරීරය අවසානයේදී එකතුවුනේ කොහාටද? ස්වභාවධර්මයටමයි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ ස්වභාවයටමයි. එහෙනම් හාමුදුරුවන් හැටියටත් ගින්න, තෙල්, දුම, ඇටකටු, අළු වශයෙන් අපි දකින්නෙත් අනිත්‍යභාවයමයි. සතරමහා ධාතුවේ විවිධත්වයයි. ඔබේ ජීවිතයට මෙය ගලපාගෙන

අවබෝධය ලබන්න බලන්න. ස්වභාව ධර්මයට අයිති දෙය, අනිත්‍යයට අයිති දෙය, ගින්නට, දූමට, අළුවලට, තෙලට අයිති දෙය මගේ කරගෙන, අපේ කරගෙන ස්වාමියා, බිරිඳ කරගෙන, අම්මා, තාත්තා කරගෙන දුක් විඳිනා අවාසනාවන්තයෝ අපි. මෙහි වඩා පුදුම විය යුත්තේ මෙය නොවේ. මේ කය මගේ කරගෙන, මේ කය නිසා මොනතරම් අකුසල් අපි රැස්කරගන්නවාද.? මේ කයට ආත්ම ගරුත්වය ලබා දෙන්න, මුල්තැන දෙන්න, කැපී පෙනෙන්න, සැප දෙන්න, සිත කය වචනය කියන තුන් දොරින් මොනතරම් අකුසල් රැස්කරගෙන සතර අපායට වැටුනාද? ඒ වැටුණේ තමාට අයිති නැති ස්වභාවධර්මයට, අනිත්‍යයට අයිති දෙයක්ම මගේ කරගැනීම නිසා නේද.?

මේ කථාවේ මුලින් සඳහන් කළ පිංවත් මනාලියත්, මනාලයත් රූපලාවණ්‍ය සොයා යන පිංවත් පිරිසත් ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මිදීමට යෝගට්, බිත්තර සුදුමද, මුදවපු කිරි, පිපිඤ්ඤා, කැරට් සරණ යන පිංවතුන් හිතන්න උත්සාහ ගන්න, තමන් මේ සරසන්නේ, සැප දෙන්නේ, තමාට අයිති නැති ගින්දරට, දූමට, අළුවලට, තෙල්වලට අයිති දෙයක්මය කියලා. ඒ නිසා ඔබ දක්ෂ වෙන්න ඔය කය රැකගැනීම, පෝෂණය කිරීම උදෙසා අකුසල් සිදු නොකරගන්න. ඇයි ඔබ ගින්දරට, තෙලට, දූම්වලට, අළුවලට අයත් දෙයක් මගේ කරගැනීම නිසා අපාගත වෙන්නේ. ඉහත ස්වභාවය නිතර මෙනෙහිකර අවබෝධය ලබාගැනීමට උත්සාහ ගන්න.

දැන් ඔබ දන්නවා ඔබ ඔය මගේ කරගෙන පෝෂණය කරන්නේ, මුහුණ සෝදවන්නේ, නාවන්නේ, ඇඟ සෝදවන්නේ, බෙහෙත් දෙන්නේ, නායකයා, ඇමැති, සභාපති, ලේකම්, උතුම් මහනායක, උතුම් අනුනායක පදවි ලබාදෙන්නේ ගින්දරට, දූමට, තෙලට, අළුවලට අයිති දෙයකට බව. එහෙම නම් ඔබ ඔය ඔබේ ඇස, කන, නාසය, දිව, හිසකෙස්, නිය, දත්, සම, මස් කියලා දක්කෙත් ගින්දර, දූම, තෙල්, අළු හැටියට දක්කෙත් එකිනෙකට වෙනස් ධාතුවල වෙනස්වීමයි. අනිත්‍යභාවයයි. ඔතනින් ඔය අනිත්‍ය ක්‍රියාවලිය නවතින්නේ නැහැ. සතර මහා ධාතුන්ගෙන්, ඒ කියන්නේ නිය, දත්, මස්, සම් වශයෙන් තිබූ ස්වභාවය අනිත්‍යභාවයට පත්වී ගින්දර, දූම, අළු, තෙල් බවට පත්වූවාසේම මේ ගින්දර, දූම ද, තෙල් ද, අළු ද ජාති, ජරා, ව්‍යාධි, මරණවලට ලක්වීම නිසා අනිත්‍යභාවයට පත්වනවා. මන්ද ඒවාත් සතර මහාධාතුන්ගෙන් සෑදි රූපයක් නිසා.

ඔබගේ ඔය කය ගින්දර, දූම, අළු, තෙල් බවට පත්වූවා සේම ගින්දර ගින්දර ස්වභාවයෙන්ම, දූම දූම ස්වභාවයෙන්ම, තෙල් තෙල් ස්වභාවයෙන්ම, අළු අළු ස්වභාවයෙන්ම පවතින්නේ නැහැ. රූපයේ අනිත්‍යභාවය නිසා ඒවාත්

වෙනස්වෙනවා. මේවා ජලවාෂ්ප බවට, සුළඟ බවට, වලාකුළු බවට, වැස්ස, පින්න, අළු දූවිලි, ජලය බවට, ගස් කොළන් මේවායින් යැපෙන පෝෂණය වන මත්ස්‍යයන් සත්ත්වයන් බවට පත්වෙනවා. එහෙම නම් ඉහත ස්වභාවයට පත්වූයේ ඔබේ කයම නේද? ඔබ රූපලාවණ්‍ය කළ යෝගට්, බිත්තර සුදුමද, පිපිඤ්ඤා, පවුඩර්, ක්‍රීම්වලින් වෛවර්ණ කරපු ඔබගේම ශරීරය නේද?

ඔබ මහපාරේ ගමන් කරන විට ඔබට ඉතා දුගඳ හමන කසල ගොඩක් හමුවුණාය හිතන්න. ඔබ කසල ගොඩ කියන්නේ මොකද්ද? කවදාහරි අතීතයේ දවසක මනුෂ්‍යයෙක්, නැතිනම් තවත් සත්ත්වයෙක්, මගේ කියලා දරාගෙන සිටපු කයක්මයි. ඒ ධාතූන්ගේ වෙනස්වීමමයි. ඒ ශරීරයට අතීතයේ එම පුද්ගලයා රූපලාවණ්‍ය කරන්න ඇති. රන්, රිදී, පළඳවන්න ඇති.

ඔබ ඔය මහා සාගරය දෙස බලන්න. ඔය මහා සාගරයේ තිබෙන සෑම ජල බින්දුවක්ම සත්ත්වයාගේ නෙතින් ගලාගිය කඳුළු, රුධිරය, දහදිය. මේ ශරීරය ගිනි ගනිද්දී ඇතිවූ දුම ජල වාෂ්ප බවට පත්වී ඒවායින් වලාකුළු සෑදී ඇතිවූ වැස්ස. මහා සාගරයේ හැම දිය බිඳක්ම මීට පෙර මනුෂ්‍ය ශරීරයක්මයි. අපි මුහුදු වතුර වශයෙන් දකින්නේ සතර මහා ධාතුවේ විවිධත්වය, රූපයේ අනිත්‍යය. ලෝකයේ සුරූපීම ශිල්පියා හෝ ශිල්පිනිය, ඒ සුරූපීභාවය තිබියදීම මියගියහොත්, ඒ සිරුර පුච්චා දැමුවහොත්, එම කයත් ඔය වැස්සටම, ඔය ජලයටම, ඔය පසටම, ඔය වාතයටම, ඒවායින් වැඩෙන ගහ කොළ, සතා සිව්පාවටම එකතුවෙනවා. එහෙම නම් මේ කයේ වෙනස්වීමේ ස්වභාවයෙන්ම නේද? වැස්ස, හිරුඑළිය, ජලය, වාතය.... කොටින්ම මේ ස්වභාවධර්මය හැදිලා තිබෙන්නේ.

ඔබේ ලේ නෑකම නිසා ඔබ අම්මා, තාත්තා, නංගී, මල්ලී, මාමා, නැන්දා, ආච්චි, සීයා වශයෙන් හඳුන්වනවා වගේම වැස්ස, ජලය මහපොළොව, ගහ, කොළ ඔබේ ලේ ඥාතීන්මයි. ඇයි ඒවාත් අතීතයේ ඔබේ කයින්, මසින්, ලෙයින්, ගින්නෙන්, දුමෙන්, අළුවලින් ඇතිවූ නිසා. බලන්නකො මනුෂ්‍ය කය. ඒ කියන්නේ ඇස, කන, නාසය, ශරීරය කියන ධාතු ස්වභාවය වෙනස්වී වලාකුළු, ජලය, පස්, මහා සාගර, ගහකොළ, කැළිකසළ බවට පත්වුණා. එම ස්වභාවයන් නැවත නැවතත් වෙනස්වෙමින් ආරම්භයක්, අවසානයක් නොපෙනනෙන චක්‍රයක් සේ ඇදීගෙන යනවා. එසේ නම් වැස්ස, වලාකුළු, ගින්දර, මහපොළොව ඔබට අයිති නැහැ වගේම, ඔබේ අම්මා, තාත්තා, සහෝදරයා, ඥාතියා, දරුවා, ඔබට අයිතිද? මේ සියල්ල සතර මහා ධාතූන්ගේ විවිධත්වයයි. මෙ විවිධත්වය ඇතිවූයේ අනිත්‍යභාවය

නිසාමයි. එහෙම නම් මේ කය අයිති සතර මහා ධාතුන්ටයි. සතර මහා ධාතුන් අයිති ස්වභාවධර්මයටයි. ස්වභාවධර්මය අයිති අනිත්‍යයටයි.

අනිත්‍යවූ දෙයක් කුමක් නිසා ඔබ ඔබේ කරගන්නද? ඉහත ස්වභාවය අවබෝධයෙන් වඩන්න, දකින්න, එවිට ඔබට අවබෝධයෙන් කලකිරේවී. මේ රූපය ගැන කලකිරීම නිසා රූපය ඔබට අත හැරේවී. අතහැරීම තුළ ඔබ ලබන්නේ නිදහස්වීමයි. ලෝකයේ උතුම්ම ආර්ය නිදහසයි.

කය දුවවා වැඩක් වේද සිත නතර කරනු බැරි නම්

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කරුණු හතරක් නොදැනීම අවිද්‍යාවය කියලා. මේ කරුණු හතර තමයි දුක, දුක ඇතිවීමට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය. මෙන්න මේ චතුරාර්ය සත්‍යය නොදැනීම නිසා සත්ත්වයා ජාති, ජරා, ව්‍යාධි, මරණ මරණවලට අයත් මේ කය නිරෝගී භාවයට පත්කිරීම උදෙසා අප්‍රමාණ වෙහෙසක් ගන්නවා. රට පුරා තිබෙන ක්‍රීඩාංගණ, කායවර්ධන මධ්‍යස්ථාන, ක්‍රීඩාගාර, මහපාරේ දෙපස ඇති තණතීරුවල, ජනමාධ්‍යවල, පිංවත් නෝනා මහත්වරුන් දුවනවා, ඇවිදිනවා, ව්‍යායාම කරනවා ඔබ දකිනවා ඇති. කුමක් සඳහාද?

ජාති, ජරා, ව්‍යාධි, මරණ වළක්වා ගන්න. ලෝකයේ වේගයෙන්ම දුවන සතා තමයි චීටා. මේ සතුනුත් ළමා කාලයේදී මියයනවා, තරුණ කාලයේදී මියයනවා, මධ්‍යම වයසේදීත් මියයනවා. ජාති ජරා ව්‍යාධි මරණවලට නිරතුරුවම පත්වෙනවා. ලෝකයේ වැඩිම ව්‍යායාම කරන සතා තමයි වඳුරා. එයා හැම නිමේෂයකම අත්තෙන් අත්තට, ගහෙන් ගහට පනිමින් මහා ව්‍යායාමයක යෙදෙනවා. ඒ වඳුරොත් ළමා කාලයේදී, තරුණ කාලයේදී, මධ්‍යම වයසෙදි මැරෙනවා. නිරතුරුවම ජාති, ජරා, ව්‍යාධි, මරණවලට ලක්වෙනවා. මේ නිසා දිවීම තුළින්වත්, ව්‍යායාම තුළින්වත් ජාති, ජරා, ව්‍යාධි, මරණ වලක්වාගන්න බැහැ නේද? අපේ මේ දිවීම නතර කළ දවසටයි අපි ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් අත්මිදෙන්නේ. කාගේ දිවීමද? රූපයට තණ්හාවෙන් දුවන සිත, උපාදානයෙන් අල්ලාගන්නා සිත දිවීමෙන් නතර කළහොත් එතැනයි දුකේ කෙළවර.

මේ දිවීම තුළ, ව්‍යයාම තුළ කුමක්ද සැඟවිලා තියෙන්නේ. අවිද්‍යාවේ වේගයයි. ඔබ මේ දුවන්නේ තව තවත් අවිද්‍යාව දෙසටයි. ලෝකය දෙසටයි. දුක දෙසටයි. ඔබ මේ නිරෝගි කරන්න හදන්නේ ලෙඩට උරුම කයක්. ඔබ ඔය මස්පිඩුවලින් පුරවන්න හදන්නේ ලෙඩට උරුම ඊළිවැටෙන කයක්. දිවීමෙන්, ව්‍යායාමය මඟින් ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මේ කය මුදාගත්ත ලෝකයේ යමෙක් සිටියා? සිටිනවාද? නැහැමයි. මේ කය ජාති, ජරා, ව්‍යාධි, මරණවලට තෝතැන්නක්මයි කියලා දකලා, රූපයට ඇති ඡන්දරාගයෙන් මිදුන තැනැත්තන්මයි දුකෙන් අත්මිදුනේ. නමුත් පෘථග්ජන සත්ත්වයා රූපයේ ආදීනවය, ආදීනවයක් හැටියට නොදකින නිසා ඔහු ජාති, ජාරා, ව්‍යාධි, මරණ හමුවේ කම්පාවෙනවා. සලිතවෙනවා. බිය වෙනවා. මට ලස්සන අහිමිවෙයි, මගේ ලස්සන නැතිවෙයි, මගේ නිරෝගීකම නැතිවෙයි කියලා. ශරීරය කෙට්ටු කෙනා, ශරීරය මහත්කරගෙන සතුටුවෙනවා. ශරීරය මහත කෙනා ශරීරය කෙට්ටු කරගෙන සතුටුවෙනවා. ශරීරයේ මේදය වැඩි කෙනා, මේදය අඩුකරගෙන සතුටු වෙන්න හදනවා. විටමින් ඌනතාව හෙවත් ඒවා අඩුකෙනා විටමින් පාවිච්චි කරලා සතුටුවෙන්න හදනවා. මේ සියල්ල තුළ තිබෙන්නේ කුමක්ද?

වැඩි දෙය අඩුකර ගන්නවා. අඩු දෙය වැඩිකර ගන්නවා. කෙනෙක් අඩු දෙය උපාදාන කරන කොට, තව කෙනෙක් වැඩිදෙය උපාදානය කරගන්නවා. කොතැනද මෙහි සීමාව, කවුද මේ සීමාව තීරණය කරන්නේ. තීරකයා තමයි පෘථග්ජන සිත. අඩුවැඩි කරගනිමින් මරණය කියන සීමා ඉරට අපි සේන්දුවෙලා, අපි ඒ සීමා ඉර පසුකරන්නේ අතෘප්තියෙන්. මොකද ඉහත ස්වභාවයන්ට අප පත්වන්නේ මැරෙයි කියලා හිතලා නොවෙයි. මා තුළ නිරෝගීබව තිබෙනවාය, නිරෝගී බව තුළ මා ඉන්නවාය කියලා ඇති කරගත් උපාදානය නිසා, ඒ උපාදානය කරගත් දෙය බිඳ වැටීමෙන් ඇතිවන අතෘප්තිය, මරණ භය, ගැටීම.....

මෙන්න මේ ගැටීමේදී ඔය ව්‍යායාමවත්, ශරීර ශක්තියවත්, විටමින් සිරප්වත් ඔබේ පිහිටට එන්නේ නැහැ. ඉහත සියල්ල ඔබට උරුමකර දුන්නේ දුකක්මයි. නමුත් ඔබ ජීවිත කාලය තුළදී පුරුදු පුහුණු කළේ කාය ශක්තියේ, ව්‍යායාමයේ, නිත්‍යභාවය නම් ඔබේ මරණ මොහොතේදී එම සංඥාවන් ඔබට ඇතිවුණොත්, අවසාන කැමැත්ත — උපාදානය ඉහත ස්වභාවයන්ට ඇලීගියා නම්, ඔබේ මීලඟ උපත චීටාවෙකුගේ හෝ වැඳිරියකගේ කුසේ වීමට ද පුළුවන්. මන්ද ඔබේ කැමැත්ත පරිදිම, ඔබ උපාදානය කරගත් පරිදිම සුවසේ දිවීමටත්, සුවසේ ව්‍යායාම කිරීමටත් ඔබට ලැබෙන නිසාය.

භික්ෂුවක් සමාධියෙන් පසුවන එක්තරා අවස්ථාවකදී මෙන්න මෙහෙම දර්ශනයක් දැක්කා. ආකාශය තුළ, ඒ කියන්නේ මහපොළොවේ සිට මීටර 200ක් පමණ ඉහළ විසි දෙනෙකුගේ පමණ කණ්ඩායමක්, වැල් පාලම්, ඔන්චිල්ලා වැනි උපකරණ මත ජිම්නාස්ටික් වැනි ක්‍රීඩාවක නිරතවෙනවා. මේ අය කිසිම බියක් නොමැතිව මීටර 200ක් පමණ ඉහළ සිට බොහොම රිද්මයානුකූලව බිමට පතිතවෙනවා. නැවත ඉහළට යනවා. මහා අන්තරාකාරී ක්‍රීඩාවක් ඉතාමත් සුවසේ නොබියව කරනවා. ආකාශයේ දමූ ලණු පාලමක් වැනි දෙයක් මත පිනුම්, කරණම් ගසනවා. මේ අය ප්‍රේත ලෝකයට සම්බන්ධ පිරිසක් නොවේ. මනුෂ්‍ය ස්වභාවයේ හොඳ අඟ පසඟ සහිත සුදු පැහැති දිග සහ කොට කලිසම් වගේම ටී-ෂර්ටවලින් සැරසී සිටි පිරිසක්. භික්ෂුව හඳුනාගත්තේ මේ අය දේව ස්වභාවයේ පිරිසක් හැටියටයි. ඒ අය පෙර මනුෂ්‍ය ජීවිතයේදී උපාදානය කරගත් ක්‍රීඩාව, ව්‍යායාමය මෙතැනදිත් උපාදානය කරගෙන. ඒවාට කැමති පිරිස ඒකරාශී වෙලා. හැබැයි මේ අය සග්‍රික දේව පිරිසක් නොවෙයි. ප්‍රේත ලෝකයට වඩා ටිකක් ඉහළ ස්වභාවයේ දේව කොට්ඨාසයක්. මේ අය තුළ ආලෝකමත් බව, ප්‍රභාශ්වර බව තිබුණේ නැහැ. ගුප්ත ස්වභාවය ඒ අයගේ ස්වරූපයේ තිබුණා. ඔබ යමක් උපාදාන කරගත්තොත් එය මතුභවයටත් ඔබ අරගෙන යන හැටි පැහැදිලියි නේද? හේතුඵල ධර්මයන්ට අනුව විග්‍රහකිරීමක් පමණයි භික්ෂුව මෙහි සඳහන් කළේ. ඔබ වෙනදා වගේම දුවන්න, ව්‍යායාම කරන්න. හැබැයි මගේ කය, මගේ ශක්තිය, මගේ නිරෝගීකම, මගේ ලස්සන, පෞරුෂත්වය, හැඩය නිත්‍යයි කියන දෘෂ්ටීන්ට යට නොවී. ඉහත සියල්ල ඔබේ වසඟයේ පත්වාගැනීමට නොහැකිය යන අවබෝධය තුළ සිටිමින්...

නමුත් මෙය කරන්න ලේසි නැහැ. ඔබේ ඔය මාර සිත නිරතුරුවම මේවායේ නිත්‍යභාවය පැත්තටම ඔබව රැගෙන යනවා. අතීතයේ තිබූ මිථ්‍යාදෘෂ්ටික ශීල ව්‍රතයන්ගෙන් එකක් තමයි ශරීරයට දුක් දීමෙන් සැප ලබාගැනීම කියන දෘෂ්ටිය. නිගන්ඨයන් වැනි පිරිස් ආසන ප්‍රතික්ෂේප කොට, උල් සහිත ස්ථානවල ඇවිදිමින්, නිදාගනිමින් ශරීරයට දුක් දුන්නා. කුමක් උදෙසාද? සැප උදෙසා. අතීත කර්ම ගෙවීම උදෙසා. වර්තමානයේ ඔය දුවන ව්‍යායාම කරන අය දෙස බලපුවහම කෙනෙකුට සිතෙන්න පුළුවන් අතීතයේ නිගන්ඨ දෘෂ්ටියේ නව ප්‍රවේශයක්ද මේ කියලත්. මොකද මේ අයත් අනාගත සැප උදෙසායි මේ දුක් විඳින්නේ. ඔබ මේ දෙතිස් කුණපය කුමන සංඥාවකින් නිත්‍යභාවයෙන් අල්ලාගත්තද ඒ තුළින් ඔබ විඳින්නේ දුකක්මය. ඔබ කොතරම් මහන්සිවී ශරීරයේ මස්පිඩු,

පෙනුම ලස්සන කරගත්තද ඔබට සෙම්ප්‍රතිශ්‍යාවක්, උණක්, අසනීපයක් හැදුනහොත් සතියක් ව්‍යයායාමයෙන් තොරවූ විට ශරීරය නැවතත් 'ජොල් වීමට' පටන් ගනී. හැඩය වෙනස්වී යයි. මොනතරම් දුවලා, ව්‍යායාම කරලා, නිරෝගීව තබාගත්තද හදිසියේ මඟුල් ගෙදරකට, උත්සවයකට, උත්සව කාලය පැමිණියහම ඔන්න නැවතත් සීනි, පිෂ්ඨය, මේදය වැඩිවෙලාය. ඔබ ජාති, ජරා, ව්‍යාධි, මරණ මොන පැත්තෙන් යටගැහුවද ඒවා දිය යට ඇති රබර් බෝලයක් මෙන් ග්‍රහණයෙන් මිදුණු සැනින් නැවත මතුවී එයි.

මේවාට ප්‍රතිකාර කියන පිංවත් වෛද්‍යවරුන්, ව්‍යායාම කරවන මහත්වරුන් ඔබතුමන්ලාට වෛද්‍ය උපදෙස්, ව්‍යායාම උපදෙස් දේවී. ඒ මහත්වරුන් ඔබලාට උපදෙස් දෙන්නේ ඔවුන්ගේ කයත් ඉහත ස්වභාවයේම තිබියදීමය. ඔවුන්ද ඉහත ස්වභාවයෙන් මිදී නැත. ඔවුනට අසනීපයක් වුවහොත් ඔවුන්ද තවත් වෛද්‍යවරයකු වෙතට ගොස් ප්‍රතිකාර ගත යුතුය. එහෙත් මේ අසනීපයට හොඳම ප්‍රතිකාරය වදාළ උත්තමයා තමයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ. මුලින්ම උන්වහන්සේ අනුනට බෙහෙත් කියන්නට පෙර තමන් ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මිදුනාහ. උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට අනුදැන වදාළේ තුන් සිවුරත්, පාත්‍රයත්, උපරිමය ආහාර වේල් දෙකකින් යැපීමත්ය. උන්වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නිතරම දේශනා කළ වදනක් වූයේ දිනකට එක් වේලක් පමණක් වැළඳීම ශරීරයට පුදුමාකාර සැහැල්ලුවක් දනවන බවයි. ඔබ දිව සංවර කරගන්න. රසයට ඇති කැමැත්තෙන් මිදෙන්න. ආහාරයේ අශුභය වඩන්න. එවිට ආයාසයකින් තොරවම ඔබේ කය යම් ප්‍රමාණයකට නිරෝගී වේවි. ප්‍රසන්න වේවි. හැඩවේවී. රසයට ඇති ගිජුභාවය ඔබ අතහැරියොත් ඔබට යම් පමණකට රෝගීබව මග හැරේවී. අතහැරීම තුළ ඇති සැහැල්ලු සුවය අත්විඳීමට ඔබට හැකිවේවි.

ප්‍රඥාවන්ත පුද්ගලයා උත්සාහගන්න ඕනේ දීර්ඝ කාලයක් ආයුෂ විඳින්න නොවේ. හැකිතාක් ඉක්මනින් මේ ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මිදීමටය. නැවත උපතකින් මිදීමටය. එය අර්ථවත් කරගන්න බැරි නම් සසර කෙටිකර ගැනීමටය. මේ දෙකෙන් කොයික කරගත්තත් මා තුළ නිත්‍යවූ නිරෝගී බව, ලස්සන, හැඩය තිබෙනවාය කියන අවිද්‍යාවෙන් මිදෙන්න ඕනේ.

හැබැයි සමහරු මෙන්න මෙහෙමත් ප්‍රකාශ කරනවා. තමන් ව්‍යායාම කළත් අනිත්‍ය වඩමින් තමයි කරන්නේ කියලා. හැබැයි ඉතින් මේ ධර්මයත් මාර ධර්මයක්ම තමයි. හරියට දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝක සැප කෙළවර නිවන් ප්‍රාර්ථනා කරන්න කියලා කියන මාර ධර්මය වගේ. දිව්‍ය

ලෝක, මනුෂ්‍ය ලෝක සැප කෙළවර නිවන ගැන විශ්වාසයක් තියන්න බෑ. මෙය ස්වභාවයන් දෙකක්. දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝක කියන්නේ අල්ලා ගැනීමක්. නිවීම කියන්නේ අතහැරීමක්. අල්ලා ගැනීමක් කෙළවර අතහැරීමක් ගැන විශ්වාසය තැබීම නොවිය හැක්කක්. සංසාරය පුරාවට කල්ප කෝටි ගණනක් අපිව මේ දුර ගමන ඇවිද්දුවේ ඔය මාර වදන් අපි අපේ කරගත් නිසා.

මේ දෙකෙන් එක ස්වභාවයකට අපි එන්න ඕනේ. එක්කෝ අල්ලාගැනීම, එක්කෝ අතහැරීම.

පෘථග්ජන පුදුමාකාර කෑදරකමකිනුයි තමන් කැමති දෙය උපාදානය කරගන්නේ. මනුෂ්‍යයා ජීවිතයේදී මුලින්ම උපාදානය කරගන්නේ මොකක්ද? තම මෑණියන්ගේ ගර්භාෂයයි. මව්කුසයේ ගර්භාෂයේ ඇතිවන ප්‍රතිසන්ධි චිත්තය ළදරුවෙක් වශයෙන් කලල රූපය අල්ලාගෙන වැඩීමේදී මේ ළදරුවා ගර්භාෂය මගේය කියලා අල්ලාගන්නවා. මේ ගර්භාෂය තුළ දරුවා මොනතරම් දුකක්ද විඳින්නේ. බැලුම් බෝලයක් වගේ ආවරණයකට මැදිවෙලා, අතපය වකුටු කරගෙන් සැරව, රුධිරය, මේදය, අසූචි, මූත්‍රා, බොකු බඩවැල්, වමනය, දිරවූ නොදිරවූ ආහාර.... මොනතරම් ජරා ගොඩක් මැද්දෙද? මෑණියන්ගේ කුස තුළ ක්‍රියාත්මක වන වායෝ ධාතුවට හෙවත් වාතයට, තේජෝ ධාතුවට හෙවත් රස්නයට, ආපෝ ධාතුව හෙවත් දියර වර්ගවලින් පීඩනයට ලක්වෙමින්. මේ දරුවා වැඩෙන්නේ මෙවැනි අවිචාරවත් පරිසරයක් මැද මේ දරුවා ගර්භාෂයේ වැඩුනත් ඔහු අකමැත්තෙන් නෙවෙයි ගර්භාෂය තුළ සිටින්නේ. ඔහු දුකක් හැටියට හිතලා නෙමෙයි ගර්භාෂය තුළ සිටින්නේ. මේ දරුවා ගර්භාෂය මගේ කියලා අල්ලාගෙනයි මෙහි පදිංචිවෙලා සිටින්නේ. තණ්හාව නිසා හටගත් උපාදානයේ බලවත් බව නිසා බැසගත් තැන මගේ කියලා අල්ලාගන්නවා. මගේ කරගන්නවා. සැපයක්ම හැටියට දකිනවා. මේ විදිහට නවමාසයක් ඇවෑමෙන් මේ දරුවා ලෝකයට බිහිකරන්න මොන තරම් වෙහෙසක් ගන්න වෙනවද? අම්මා, දරුවාව මේ උපාදානයෙන් ගලවාගන්න මොනතරම් අහිංසක වේදනාවක් විඳිනවාද? මොනතරම් තටමන්න ඕනිද? ශක්තියක් වැයකරන්න ඕනෙද? ඇයි මේ අම්මා මෙතරම් දුකක් විඳින්නේ. දරුවා තමා උපාදානයකරගත්, මගේ කරගත් ගර්භාෂය අතහැරීමට ඇති අකමැත්ත නිසා. එය මගේකර අල්ලාගෙන සිටින නිසා. මගේ තැනින් මිදීමට ඇති අකැමැත්ත නිසා. අවසානයේදී මවත් දරුවත් අතර සටනක් තමයි සිද්ධවෙන්නේ. දරුවා ගර්භාෂය අල්ලාගෙන සිටීමට

ප්‍රයත්න දරනවා. මව දරුවාව එළියට ගන්න ප්‍රයත්නය දරනවා. දරුවා තුළ ගර්භාෂ කුටියට ඇති උපාදානයත්, මවට දරුවා දැකීමට, අයිති කරගැනීමට ඇති උපාදානයත් අතර සටනින් ශක්තිය වැඩි මව දිනනවා. මවට මේ ශක්තිය නොමැතිනම් වෛද්‍යවරයා සැත්කමකින් බලහත්කාරයෙන් දරුවා එළියට ගන්නවා. දරුවා මව්කුස ගර්භාෂකුටිය උපාදාන කරගෙන එහි රැඳෙන්නට හදනවා. අම්මා 'මගේ දරුවාය' යන උපාදානයෙන් දරුවාව දෝතට ගන්න අයිති කරගන්න හදනවා. වෛද්‍යවරයා තම වෘත්තිය උපාදාන කරගෙන දරුවා සැත්කමකින් එළියට ගන්නවා. හෙදිය තම වෘත්තිය උපාදානය කරගෙන දරුවා උපද්‍රව රහිතව ලෝකයට ගන්නට උපකාර කරනවා. මේ සතර දෙනා තුළම ක්‍රියාත්මක වන්නේ උපාදානයමයි. තම තමන් කැමැත්තෙන් අල්ලාගත් දෙය තමයි මේ සැපයක් හැටියට දකින්නේ.

දරුවා මේ විදිහට ලෝකයට බිහිවෙනකොට බෙරිහන් දීගෙන, හඬාගෙන තමයි බිහිවෙන්නේ. මොකක්ද මේ කෑගැසීම, හැඬීම. මගේ තැන, නව මාසයක් මා පදිංචිවී සිටි තැන මට අහිමිවුණාය, අහිමි කළාය යන වේදනාවෙන්, බයෙන්, අසරණ භාවයෙන් තමයි ඔය කෑගහන්නේ. තමාගේ අකැමැත්තෙන් අම්මා සහ වෛද්‍යවරයා එකතුවී උදුරාගත් නිසා තමයි ඔය කෑගසන්නේ. විරෝධය දක්වන්නේ. මගේ තැන අහිමි වුණාය කියලා දරුවා කෑගහනකොට ඒ හඬ අහලා අම්මාට සතුටු සිනා පහළ වෙනවා. සතුටු කඳුළු සලනවා. මට දරුවා ලැබුණා කියලා.

අහිමි වීම නිසා දුකත්, ලැබීම තුළ සතුටත් තමයි දෙදෙනාම විඳින්නේ. හැබැයි මේ විඳීමේ ස්වභාවයන් මොහොතකින් අනිත්‍යභාවයට පත් වෙනවා. මේ දරුවා ගර්භාෂයේ උපාදානයෙන් මිදිලා ලෝකයට බිහිවුණාට පස්සේ මොකද වෙන්නේ. අම්මාගේ උණුසුම, අම්මාගේ පියයුරු උපාදානය කරගන්නවා. ඔන්න දැන් හිටපු තැනට වඩා මෙතන සැප හැටියට දරුවා අල්ලාගන්නවා. මව් උණුසුමත්, පියයුරුත් මගේ තැන හැටියට උපාදානය කරගෙන ඒ දෙක මගේ කියලා ආශ්වාදය කරනවා. ඔන්න දැන් මවගේ උණුසුමෙන්, මවගේ පියයුරුවලින් දරුවා ඉවත්කරන්න හැදුවොත් දරුවා කෑගසනවා. විරෝධය දක්වනවා. මෙන්න බලන්න දැන් මව් උණුසුමත්, පියයුරුත් උපාදාන කරගන්න ස්වභාවය. ගර්භාෂයේ විඳීම අනිත්‍යභාවයට පත්වුණා. තවත් විඳීමක් අල්ලාගත්තා. මේ විඳීමේ ස්වභාවය අනිත්‍යභාවයට පත්වෙමින් ක්‍රමයෙන් තාත්තාව, තොටිල්ල, ළදරු පාසල, පාසල, විශ්ව විද්‍යාලය, රැකියාව, නිවස, බිරිඳ, දරුවා, මුණුපුරා ආදී වශයෙන් එකක් අතහැරෙද්දී තව රූපයක් සැපයි කියලා ක්‍රමානුකූලව මගේ කරගන්නවා.

ආචාර වෙඩිමුර නැති යුද වීරයා වන්න

වර්තමානයේදී ඔබ සුඛෝපභෝගී නිවසක නවීන ගෘහ භාණ්ඩ තබාගෙන සුසිනිඳු ඇඳ ඇතිරිලි, සිනිඳු ඇඳුම් ආයිත්තම් පරිහරණය කරගෙන ජීවත්වුණත්, ලක්ෂ ගණන් වටිනා වාහන, රන් රිදී පාවිච්චි කර ඔය කය කලඑළි කළත්, අතීතයේ දවසක අපි හැමෝම සැරව, රුධිරය, මේදය, අසූචි, මුත්‍රා, බොකු බඩවැල්, වමනය, දිරවූ, නොදිරවූ ආහාර වැනි ජරා ගොඩක් මැද, බැලුම් බෝලයක් වැනි ආවරණයක් මැද වකුටුවී, අප්‍රසන්න අඹිහිරි ගර්භාෂ කුටියක් මගේ කොටගෙන එයට ඇලී, ඉන් මිදීමට අකමැතිව වාසය කරපු කෙනෙක්මයි. මෙවැනි ගර්භාෂ කෝටි කීයක් අතීතයේදී අපි අපේ කරගෙන ඇතිද? අවාසනාව මෙය නොවේ. මෙතරම් ගර්භාෂවලට රිංගාගෙන මහා දුකක්, කැමැත්තෙන් වින්ද අපි වර්තමානයේදී ද උත්සාහ කරන්නේ ඔබේ ගර්භාෂයෙන් එවැනි දුක් විඳින සත්ත්වයෙක් උපද්දවාගැනීමටය. ඔය කැමැත්ත ඔබ තුළ තිබෙන තාක්කල් ගර්භාෂය මගේ කරගත් දරුවන් ද, දරුවන් මගේ කරගත් මවුවරුන්, පියවරුන් ද වීම මිස සසරින් මිදෙන්න නම් බැහැ.

ඔබේ මවුකුසින් දරුවකු ලෝකයට බිහිවුණ සැනින්, ඔබත් ඔබේ ස්වාමිපුරුෂයාත් මුළින්ම මොකද කරන්නේ. නමක් හදනවා, වාසගම, මුලකුරු සමග උප්පැන්න සහතිකය සමගම... ඇයි මේ උප්පැන්න සහතිකය? බයයි මේ දරුවා අහිමි වේය කියලා. වෙන කෙනෙක් අයිති කරගනීය කියලා. ඒ නිසා රජයේ පොතේ නීත්‍යානුකූලව ලියාපදිංචි

කරනවා. ප්‍රශ්නයක් වුණොත් උසාවියට ගිහින්හරි අයිතිකර ගන්නවා කියලා. නමුත් ඔබ සිතන්නේ නැහැ මේ දරුවා කොහේ සිටද ආවේ කියලා. සමහර විට ගිය ජීවිතයේදී මේ දරුවා අන්‍ය ආගමක, අන්‍ය ජාතියක වෙන්න පුළුවන්, යාචකයෙක් වශයෙන් ජීවත්වුණ කෙනෙක් වෙන්නත් පුළුවන්. කුළ වශයෙන් සමාජයේ පීඩනයට පත්වුණ කෙනෙක් වෙන්නත් පුළුවන්. තිරිසන් සතෙක් වෙන්නත් පුළුවන්. ප්‍රේතයෙක් වෙන්නත් පුළුවන්, යක්ෂයෙක් වෙන්නත් පුළුවන්. දෙවියෙක් වෙන්නත් පුළුවන්. බ්‍රහ්මයෙක් වෙන්නත් පුළුවන්. මෙසේ සිටි සත්ත්වයෙක් එතැනින් චුතව මව්කුසේ ප්‍රතිසන්ධිය ඇතිවූවා වෙන්න පුළුවන්. මේ දරුවා පෙර ආත්ම භවයේ ඔබේම අම්මා, තාත්තා, ඥාතියෙක් වෙන්නත් පුළුවන්. ඒත් ඔබ දන්නේ නැහැ ඔබ මේ නළවන්නේ පෙර ආත්මයක ඔබේ අම්මා, තාත්තා, එහෙම නැතිනම් අන්‍ය ආගමක, අන්‍ය ජාතියක කෙනෙක්, ප්‍රේතයෙක්, දෙවියෙක්... කියන සම්මුතියෙන් හැඳින්වුණ සත්ත්වයෙක්ය කියලා. මේ තමයි උපාදානයේ බලවත් බව. නිර්ලජ්ජිත බව. උපාදානයේ හෙළුව, තණ්හාවේ දුහුල් සළුවෙන් අපි වසාගන්නවා.

ඔබ මෙහෙම සිතන්න. ඔබ යුද කාලයේ ක්‍රියාන්විතයේ සේවය කරන හමුදා නිලධාරියෙක්ය කියලා. ඔබ රට, ජාතිය, ආගම, රැකියාව නාමයෙන් යුද්ධ කරනවා. ඔබේ අතින් මිනිසුන් මැරෙනවා. අපි හිතමු ඒ මිය යන මිනිසුන් ද්‍රවිඩ ජාතික නොමඟ ගිය අය කියලා. ඔබට ඒ අය කෙරෙහි අනුකම්පාවක් ඇතිවෙනවා, වේදනාවක් ඇතිවෙනවා. ඒ අයගේ දෙමාපියන් ඥාතියන් කෙරෙහි දුකක් ඇතිවෙනවා. මෙවැනි සිත් පරම්පරාවක් ඔබ තුළ ඇතිවෙමින් නැතිවෙන මොහොතක ඔබද යුදබිමේදී මියයනවා. මෙවැනි මියයායමකදී ඔබ නැවත අම්මා කෙනෙකුගේ කුසේ පිළිසිඳ ගැනීමට ඉඩකඩ ඕනෑ තරම් තියෙනවා. ඒ ආකාරයකට ඔබ තුළ ඇතිවූ උපාදානය නිසා, ඔබ ද්‍රවිඩ මවකගේ කුසේ ප්‍රතිසන්ධිය ලබනවා. දරුවකු ලෙස ලෝකයට බිහිවෙනවා. ඔබ දැන් අලුත් සම්මුතිය තුළ අභිෂේක ලබන්නේ යාපනයේ ද්‍රවිඩ පවුලක ද්‍රවිඩ නමක්, වාසගමක් සහිත ද්‍රවිඩ දරුවෙක් ලෙසයි. එම දරුවා යාපනයේ ලොකු මහත්වී දසවැනි වියට පැමිණියහම ද්‍රවිඩ කණ්ඩායමේ ළමා සොල්දාදුවෙක් වශයෙන් රාජ්‍ය හමුදාවට එරෙහිව සටන් වදිනවා. බලන්න මොනතරම් මුලාවක්ද? වසර 11ක කාලයක් තුළ සිංහල හමුදා නිලධාරියෙක් වශයෙනුත්, ද්‍රවිඩ සොල්දාදුවෙක් ලෙසත් භූමිකා දෙකකට පණදුන්නා. මේ භූමිකාව මෙතැනින් නවතින්නේ නැහැ. නැවත නැවත උපාදානයක් නිසාම භවය කරා යනවා. ඔබ වර්තමාන ජීවිතයේදී මහත් අභිමානයෙන් යුතුව මම සිංහල බෞද්ධයෙක් කියලා

උදම් ඇනුවද ඔබ පෙර ආත්මයේ අන්‍ය ආගමක, අන්‍ය ජාතියක වෙන්න පුළුවන්. මේ ජීවිතයෙන් පසු නැවත ඔබ අන්‍ය ආගමක, අන්‍ය ජාතියක වන මවු කුසක උත්පත්තිය ලබන්න පුළුවන්. නමුත් අපි අල්ලාගත් දේ තුළ 'මම' ඉන්නවාය කියලා දකිනවා. දැන් ඔබට පැහැදිලි වෙන්න ඕනේ කල්ප සියක් කෝටි ගණනක ඈත පටන් අපි මැරෙමින් ඉපදෙමින් පැමිණීමේ ගමනේදී ඔබ මේ ලෝකයේ හැම මනුෂ්‍යයෙකුටම, දෙවියෙකුටම, තිරිසන් සතෙකුටම, ප්‍රේතයෙකුටම, නිරිසතෙකුටම, බ්‍රහ්මයෙකුටම ලේ ඥාතියෙක් වී සිටිය බව. සම්මුතිය තුළ වෙන් වශයෙන් හඳුනාගත්තත් සියලු දෙනාම ඔබේ ලේ ඥාතීන්මයි. නමුත් ලෝකය තවමත් වර්ගවාදීව යුද්ධ කරනවා. ඒ අය දන්නේ නැහැ යුද්ධය තිබෙන්නේ යුද බිමේ නොවේ කියලා. ඒත් ඒ අය හිතනවා යුද්ධය තිබෙන්නේ යුද බිමේය කියලා. නමුත් යුද්ධය තිබෙන්නේ, යුද්ධයේ මූල බීජයන් හටගන්නේ අවිද්‍යා සහගත මනුෂ්‍ය සිතේ. සිතේ තමයි යුද්ධය හටගන්නේ. කුමක් නිසාද? තණ්හාව නිසා හටගන්නා උපාදානය හේතුවෙන්. ඒක නිසා කවුරුහරි හිතනවා නම් ලෝකයේ යුද්ධය නතර කළ හැකිය කියලා, එය මිථ්‍යාවක්මයි. යුද්ධ නතර කරන්න බැහැ. ඉවරකරන්නත් බැහැ. හැබැයි තාවකාලිකව වැඩි බලයෙන් යටපත් කර තබන්න පුළුවන්. එයත් තාවකාලිකයි. යුද්ධය නතර කළ හැක්කේ මිනිසුන් මැරීමෙන්, දෘෂ්ටීන් මැරීමෙන් නොවේ, මිනිසා තුළ අවිද්‍යාව මරා දැමීමෙන් පමණක්මයි. අවිද්‍යාව මියගිය තැන උපදින්නේ විද්‍යාවයි. ඒ කියන්නේ ප්‍රඥාවයි. ප්‍රඥාව යනු ලෝකයේ විශාලම යුද්ධයෙන් ලබනා ජයග්‍රහණයයි. ඒ ජයග්‍රහණයේ ජය ලබන්නා උදෙසා සවුදිය පිරීම්, රාත්‍රී භෝජන සංග්‍රහයන්, ජාතික කොඩි එසවීම්, රතිඤ්ඤා පත්තුකිරීම්, ආචාර වෙඩිමුර නොමැත. ඇයි? ඒ ඔහු යුද්ධය අවසන් කළ කෙනෙකි. ඔහු නැවත රූපයක් මගේ කරගෙන එයට ඇලීමට හෝ ගැටීමට නොයයි. රූපයක් උදෙසා යුද්ධ නොකරයි. රණ්ඩු නොකරයි. ඔහු අවබෝධයෙන් හඳුනනවා රූපයක් යනු අනිත්‍යයක්ය කියලා. ඔහු යුද්ධ භූමිය පමණක් නොවේ. යුද ආයුධ, යුද ආයුධ කර්මාන්ත ශාලා සේම යුද සේනාව ද සුණු විසුණු කොට දමා අවසන්ය. ඔහු මේ සියල්ල විනාශ කොට දැමුවේ ආයුධ පාවිච්චි කර නොවේ. සතිය සිහිය නැමැති ආයුධය පමණක් පාවිච්චි කිරීමෙනි. ඔහු මේ ජයග්‍රහණය ලබාගන්නේ තව තව මායිම් අල්ලා ගැනීමෙන් නොව, අතහැරීමෙන්ය. දැන් ඔබට වැටහෙන්න ඕනේ ගෙදර යුද්ධයත්, ගමේ යුද්ධයත්, රටේ යුද්ධයත් හටගන්නේ කුමක් හෝ උපාදානය කරගත් නිසාය කියලා. උපාදානය කරගත් දෙය අතහරින්න. එවිට යුද්ධය නවතිනවා. ඒත් ඔබ එයට කැමති නැහැ. මොකද ඔබ උපාදානය කරගත්

දෙය මගේය, එය නිත්‍යය කියලා දකින නිසා. ඔබ උපාදානය කරගත් දෙය රට වෙන්න පුළුවන්, ජාතිය, ආගම, ආත්ම ගරුත්වය, රැකියාව, තමාගේ පැවැත්ම, නායකත්වය, මේ අනිත්‍යවූ ධර්මතාවයන් තමයි ඔබේ සකස්වීමට හේතුන් වෙන්නේ.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා තණ්හාව නිසාය උපාදානය සකස්වෙන්නේ කියලා. මේ උපාදානය තමයි ඔබව ජාති, ජරා, ව්‍යාධි මරණ කරා රැගෙන යන්නේ. ඒ නිසා ඔබ ඔය දිවීම, ව්‍යායාම කිරීම, ශරීරය හැදීම මොහොතකට නතර කරලා. එහෙම නැතිනම් ඒවා කරන ගමන් විවේකීව සිතන්න මොකක්ද මේ කය..... මස්, නහර, ඇට, රුධිරය, අසූචි, මුත්‍රා, බොකු බඩවැල්, සෙම්, සොටු... මෙහි හදන්න දෙයක් තිබෙනවාද? මේවායේ මොනවා හදන්නද? ජරාවක්මයි. පිළිකුලක්මයි තිබෙන්නේ. මෙය හදන්න නොවේ තිබෙන්නේ, අතහරින්නයි. ඔබ උදේට කටේ තිබෙන කුණුකෙළ මගේ නොවේ කියලා ඉවතට දමනවා. ඇසේ තිබෙන කබ, ශරීරයේ පිරුණු අසුචි, මුත්‍රා මගේ නොවේ කියලා ඉවතට දමනවා. ශරීරයේ පිරුණු වාතය මගේ නොවේය කියලා එළියට දමනවා. ශරීරයේ පිටවන දහඩිය මගේ නොවේය කියලා පිසදමනවා. අන්න ඒ වගේ ඔබ තුළ තිබෙන්නාවූ, 'මා තුළ සත්ත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවාය. ඔහුව නිරෝගී කරන්න ඕනෑය. ඔහුගේ මස් පිඩු ක්‍රමවත් කරන්න ඕනෑය' කියන අවිද්‍යා සහගත සිත ඔබ ඔබේ නොවේය කියලා ඉවතට දමන්න. මා තුළ 'මම' සිටියි. මා තුළ ආත්මයක් තිබේය යන දෘෂ්ටීන්ගෙන් මිදෙන්න. ඔබට ලැජ්ජා නැතිද, හිරිකිතයක් අපුලක් නැතිද මළ කුණකට, මළ කඳකට අතීතයේ ප්‍රේතයෙකු, තිරිසතකු, තිරිසන් සතකුව ඔබේ කරගන්න. 'මම' කියලා හඳුන්වාගන්න. ඔබට ලැජ්ජයි නේද?

තාමත් ඔබට ලැජ්ජාවක් නොදැනෙන්නේ නම් ඔබ මේ සටහන නැවත නැවත කියවන්න. මේ ඔබ කියවන්නේ ඔබේ රූපයෙන් නිදහස්වීමේ මාර්ගයයි. නිවීමේ මාර්ගයයි. මේ ගැන සිතලා සතුටු නොවී, ඇතිවූ සතුට අනිත්‍ය බවම දකින්න. ඇතිවූ, නැතිව ගිය සිත අනිත්‍ය වශයෙන් දැක නිවීමේ මඟට අවතීර්ණවන්න.

කයේ ස්වභාවය හොඳින් දකින්න. ඔබ දැකලා තිබෙනවාද ලස්සන කුකුළෙක්ව. නා නා වර්ණ පිහාටුවලින් කුකුළා අලංකාරයි. දකින්න ප්‍රිය උපදවන රූපයක් එයට තිබෙනවා. මේ ලස්සන කුකුළාව මස් කඩයට ගෙනිහින් පිහාටු සේරම ගලවලා, සුද්ද කරලා, යකඩ කොක්කක, එහෙම නැතිනම් වීදුරු ශීතරකණයක විකිණීම සඳහා තබා තිබෙනවා ඔබ දැකලා ඇති. උගේ දැන් තිබෙන්නේ සම පමණයි. ලස්සන පිහාටු නැහැ.

දැන් ඔබ ඔබේ කය දෙස බලන්න. ඔබ හුදෙකලාව මනසින් හෝ හැබැහින් ඔබේ කය නිරුවත් කරන්න. කැඩපතක් ඉදිරියේ සිට දකිනවා සේ ඔබේ කය දෙස බලන්න. අර කුකුල් මස් කඬේ එල්ලලා තිබෙන හම ගහපු කුකුළාගේ කයත් ඔබේ කයත් අතර වෙනසක් තිබෙනවාද? ඔබේ කයත් හමගහපු කුකුලෙක් වගේමයි. ඔබ මමත්වයෙන් පිරුණු ඔබේ සිත ලැජ්ජාවට පත්කරන්න. සිත අපහසුවට පත්කරන්න. මාන්නය බිඳ දමන්න. කුකුළාව ලස්සන කළේ උගේ ලස්සන පිහාටු වගේම ඔබවත් ලස්සන කරලා පෙන්වන්නේ ඔබේ ඇඳුම් පැළඳුම්, ආභරණ, සුවඳ විලවුන්. අර කුකුල් කය බාහිර දේවල් විසින් අලංකාර කරනවා. ඔබව යථාර්ථයෙන් ඈත් කරනවා. අවිද්‍යාවෙන් අන්ධ කරනවා මේ වෙළෙඳපොළ කියන්නේ අවිද්‍යාව විකුණන තැනට. වෙළෙඳපොළේ මුදලාලිලා අවිද්‍යාව පැකට් කරලා, බෝතල් කරලා, පෙට්ටි කරලා, ලස්සන ලේබල් අලවලා, රූපවාහිනී දැන්වීම් දමලා, ලොකු බෝඩ් ප්‍රදර්ශනය කරලා, විදුලි බුබුළු දමලා අලෙවි කරනවා. මේ මිනිස්සු උදේ ඉඳලා රෑ වෙනකම් කර්මාන්තශාලාවල, වැඩබිම්වල රැකියා කරන්නේ මේ අවිද්‍යාව මිලදී ගන්න සල්ලි සොයන්නයි. එක පැත්තකින් ඔවුන්ම අවිද්‍යාව නිෂ්පාදනය කරනවා. තව පැත්තකින් ඔවුන්ම අවිද්‍යාව මිළදී ගන්නවා. සමාජයේ ඇති නැති ස්වභාවය මත මේ නිෂ්පාදනයේ සහ මිළදී ගැනීමේ ගුණාත්මක භාවයන් අඩුවැඩි වෙනවා. ලෝකය භාණ්ඩ සහ සේවා අංශයෙන් දියුණුවෙනවා කියන්නේ අවිද්‍යාව දියුණු වෙනවා කියන එකයි. අවිද්‍යාව නිෂ්පාදනය සහ මිළදී ගැනීම ඉහළ යනවා කියන එකයි.

ඔබ දැන් නිවී සැනසිල්ලේ සිතන්න ඔබත් අවිද්‍යාවේ දාසයෙක්ද? පිංවත ඔබ ශරීරයේ නිරෝගී බවට, දිවීමට, ව්‍යායාම කිරීමට වැයකරන කාලය මේ කය අවබෝධ කරගැනීමට වැයකරන්න. ඔබට අයිති නැති ආගන්තුක සිත, ඔබේ යටතට ගන්න. සතිය සිහිය උපද්දවාගන්න. "දුවන්න ව්‍යායාම කරන්න" කියන සිත ඔබ අතහරින්න. එවිට දිවීම, ව්‍යායාම ඔබට අතහැරේවී. දිව සංවරව තබාගෙන නිරෝගී වන්න. නිරෝගී ශරීරයක් ඇති අයෙක් වන්න, එහි අනිත්‍යය දකිමින්ම.

නිරෝගී කය ලෝකයට ප්‍රදර්ශනය කිරීමට නොව, සසර ගමනින් එතෙරවීම සඳහා ප්‍රයෝජනයට ගන්න. නිවීමේ දොරටුවට පිවිසීමට ඔබේ නිරෝගී කය වාහනයක් කරගන්න. ඔබ නැවත වේගයෙන් දුවන චීටාවෙක්, සිරුරට බොහෝ ව්‍යායාම් දෙන වඳුරෙක්, ව්‍යායාම් සරඹ ආදිය උපාදාන කිරීමෙන් ඉපැදුණු අහසේ ජිම්නාස්ටික් කරනා ප්‍රේතයෙක් නොවීමට වග බලා ගන්න.

බ්‍රොයිලර් ජීවිතය

අවිද්‍යාව තමයි ලෝකයේ ක්‍රියාකාරිත්වය. ක්‍රියාකාරීත්වය කියන්නේ ඉපැදීම, පැවැත්ම, විකාශනය, විනාශය, කියන ගලායෑම. වෙනත් වචනවලින් ප්‍රකාශ වුවද මෙහි අර්ථය ජාති, ජරා, ව්‍යාධි, මරණමය. ලෝකයේ ක්‍රියාකාරීත්වය අවිද්‍යාව නම්, ලෝකය දියුණු වෙනවාය කියන්නේ අවිද්‍යාවේ දියුණුවයි. අවිද්‍යාවේ දියුණුව මනින මිනුම් දණ්ඩ වනුයේ වත් පොහොසත්කම්, ලබාගත් දැනුම, උපාධි, දරන තනතුරු. කොටින්ම අයිතිකරගත් දේවල්වල ප්‍රගතිය, විශාලත්වය, ප්‍රමාණය අනුව දියුණුවේ ස්වභාවය තීරණය වෙයි. දේශපාලනඥයකු මනින මිනුම් දණ්ඩ ඔහු ලබාගන්නා මනාප ජන්ද සංඛ්‍යාවයි. වෛද්‍යවරයා මනින මිනුම් දණ්ඩ ඔහු වෙත ගලාඑන රෝගීන් සංඛ්‍යාවයි. පාතාල නායකයා මනින මිනුම් දණ්ඩ ඔහු සතු පිරිවර, ආයුධ ප්‍රමාණය සහ ඔහු කරන විනාශයේ ප්‍රමාණයයි. බුද්ධිමතා මනින මිනුම් දණ්ඩ ඔහු ලබාගත් උපාධි සහතික ප්‍රමාණයයි. තමා කැමති දෙය දැඩි තෘෂ්ණාවකින් අල්ලාගෙන අල්ලාගත් ක්ෂේත්‍රය තුළ ශක්තිමත් භාවයෙන් සියල්ල උපාදානය කරගන්නා පුද්ගලයා යනු දියුණු පුද්ගලයාය. මේ දියුණුව කියන තැනට පැමිණීමට තමයි හැමෝගේම උත්සාහය. වැඩි වැඩියෙන් අයිති කරගන්න. වැඩි වැඩියෙන් අයිති කරගැනීමට යන ගමනේදී හැමෝටම එකම ස්ථානයකට එන්න බැහැ. පුද්ගල ශක්තිමත්භාවය මත, පෙර සංසාරික කුසල්-අකුසල් මත අයිති කරගැනීමේ විවිධත්වයන් පවතිනවා. සමාජය තුළ තිබෙන තරගකාරීත්වය වශයෙන් අප දකින්නේ තමා අයිතිකරගත් දෙය තව වැඩි කරගැනීමට

දරන ප්‍රයත්නයයි. අයිති නොකරගත් දෙය අයිතිකර ගැනීමට යෑමයි. මේ තරගය සඳහා ඔබ අවතීර්ණ වූ විට ඔබට ගොඩාක් අකුසල් සිද්ධ වෙනවා. සමහරවිට ඔබ කර්මාන්ත ශාලාවක්, ව්‍යාපාරයක්, ගොවිපළක් කරන පිංවතෙක් වෙන්න පුළුවන්. ඔබ වැඩි ලාභයක් ලබන්න අවශ්‍ය නම්, තව කෙනෙක්ව ඔබ සීමා කරන්න ඕනේ. ඔබ තව කෙනෙකුගේ දෙයක් ලැබීමක් සීමා කිරීමෙනුයි, කප්පාදු කිරීමෙනුයි ඔබට වැඩි දෙයක් ලබා ගතහැක්කේ. ඒ තුළිනුයි ඔබට අවිද්‍යාවේ මිනුම් දඬුවලින් ''දියුණුයි'' කියන ජය කණුවට එන්න පුළුවන්. භික්ෂුවට අවශ්‍ය වන්නේ පිංවත් ඔබ ඔබේ දියුණුව සඳහා අනික් පුද්ගලයාගේ අයිතිය සීමාකිරීමට යාම තුළ ඔබ අයිතිකරගන්නා අකුසල්වල ප්‍රමාණය ගැන ඔබගේ අවධානය යොමුකිරීමය. එසේ නොමැතිව ඔබට ආර්ථික විද්‍යාව ගැන කියාදීමට නොවේ. භික්ෂුව දන්නා එකම ආර්ථික විද්‍යාව අඩුකිරීමය. අඩුකිරීම තුළින් නැති කිරීමය.

එකතු කිරීම තුළින් රැස්කිරීමත්, රැස්කිරීම තුළින් විනාශයත් ධර්මයේ අර්ථය නොවේ. ලෝකයේ අර්ථය යනු දුකයි. දුක හැර වෙන අර්ථයක් ලෝකයේ නැහැ. ඇයි ලෝකය දුක? තම වසඟයේ පවත්වා ගත හැකි කිසිවක් ලෝකය තුළ නොමැති නිසා.

අවිද්‍යාව විසින් ඔබට පෙන්වන ලෝකයේ දියුණුව යන මිනුම් දඬු අත්කර ගැනීම සඳහා ඔබ යන ගමනේදී සේවකයාගේ, පාක්ෂිකයාගේ නිදහස, වැටුප, අයිතීන් සීමා කිරීමට යෑම නිසා ඔබ නොදැනුවත්වම අයිති කරගන්නා අකුසල් ලෝකය දියුණුවෙන්න දියුණුවෙන්න ප්‍රමාණාත්මකව ඉහළ යයි. ඒවායේ කර්ම විපාකයන් ගෙවීමේ අවස්ථාව ද එයට සාපේක්ෂව ඉහළ යයි. ඔබ තිරිසන් ලෝකය දෙස බලන්න. කිසිම සතකු, පක්ෂියකු, මාළුවකු මුළු රැය පුරා සුවසේ නිදාගැනීමක් නැත. ඔබ නිවසේ රාත්‍රියට සුවසේ නිදාගෙන අළුයම අවදිවේ. මෙවැනි නින්දක් ලබාගැනීමට තිරිසන් ලෝකයේ සත්ත්වයන්ට වාසනාව නොමැත. එම සතුන් ගසක කොළයක්, අත්තක් වැටුනද වෙනත් සතකුගේ ශබ්දයක් ඇසුන ද තිගැස්සී බියෙන් ඇහැරේ. සුවසේ නිදන්නට මේ සත්ත්වයන්ට නොහැක්කේ කර්ම විපාකයක් නිසා විය යුතුය. කළ කර්මය විය යුත්තේ අනුන්ගේ නිදහස සීමාකිරීමයි. අනුන්ව බිය ගැන්වීමයි. තමාගේ බලයෙන් අනුන්ව මැඩපවත්වා තැබීමයි. කොටින්ම නිදහස පැහැරගැනීමයි. එහි විපාකයන් ලෙස මිනිස් ජීවිතයෙන් චුතව තිරිසන් ආත්මයේ ඉපිද එම කර්ම විපාකයන් ගෙවයි. ලෝකයේ ජීවත්වන සත්ත්වයා ඇදීයන්නේ අකුසල් දෙසටමය. තමාට රැස්කරගැනීම සඳහා අනුන්ගෙන් උදුරාගැනීමටය. මේ උදුරාගැනීම කරන්නේ බොහෝම නම්බුකාර ක්‍රමයටය.

ලාභය, ගුණාත්මක භාවය, අතිකාල, ආයතනයේ දියුණුව වැනි ලස්සන වදන්, ලේබල මෙයට අලවා ඇත. සමාජයේ, වෙළෙඳපොලේ පැවැත්ම උදෙසා ඉහත දේවල් අත්‍යවශ්‍යය. ඒ පිළිබඳව තර්කයක් නොමැත. මේවා නැතිකළ නොහැකි ලෝක ස්වභාවයන්ය. එහෙත් මෙහි කථා කරන්නේ අවිචාරයෙන් මේවා අයිති කරගැනීම සම්බන්ධවය. මේවා අවිචාරවත්ව අයිති කරගැනීමට යෑම නිසා මනුෂ්‍යයා අතින් රැස්වන අකුසල් ප්‍රමාණයත්, අකුසල් රැස්කිරීම වැඩිවන්න, වැඩිවන්න අකුසල් විපාකදීමේ ස්වභාවය ද වැඩිවනවා. මේ සත්ත්ව ප්‍රජාවගේ අකුසල් විපාකදීමේ ස්වභාවයේ තියුණු බව ඔබට ලෝකය දෙස බලා වටහාගන්න. අතීතයේ කුකුළෙක් අවුරුද්දක් ජීවත්වුනාට පස්සේ තමයි එම සතාව මසට මැරුවේ. එයා අවුරුද්දක් ජීවිතය වින්දා. ඊට පස්සේ මේ කුකුළාගේ ජීවත්වීමේ අයිතිය ක්‍රමානුකූලව කුකුළාට අහිමිවුණා. මාසෙන් මාසය, ජීවත්වීමේ අයිතිය බ්‍රොයිලර් කුකුළාට අහිමිවෙමින් දැන් බ්‍රොයිලර් කුකුළෙක්ව මාස දෙකකටත් අඩු කලකින් මසට මරණවා. මාස දෙකකටත් අඩු කාලයයි ජීවත්වීමට අයිතිය ලැබෙන්නේ. ඇයි මේ? සත්ත්වයාගේ කර්මය විපාකදීමේ වේගය එන්න එන්න වැඩිවෙනවා.

අතීතයේ වසරකට එක වතාවක් බෙල්ල කපාගෙන මැරුණු කුකුළෙක් වර්තමානයේ වසරකට හය වතාවක් බෙල්ල කපාගෙන මැරෙනවා. ඒ කියන්නේ කර්ම විපාක විඳිනවා. ලෝකය අවිද්‍යාවෙන් දියුණුවට යනකොට මේ බ්‍රොයිලර් කුකුළා සති දෙකකින් මරා මසට ගන්න තාක්‍ෂණයක් ඇතිවේවි. ලෝකය එය තාක්‍ෂණයේ, සත්ත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ දියුණුවක් ආශ්චර්යයක් ලෙස දකීවි. මෙම තාක්‍ෂණය සොයාගත් විද්‍යාඥයන්ට සම්මාන සහතික පිරිනමාවී. හැබැයි ඉතින් කුකුළන්ගේ පැත්තෙන් කර්ම විපාක දීමේ වේගයයි පෙනෙන්නේ. කුකුළා වැඩි වාර ගණනක් මැරුම් කන වාරයක් පාසාම කුකුළාව මැරීමට හවුල්වන මිනිසා ද රැස්කරන ප්‍රාණඝාත අකුසල් ප්‍රමාණය වේගවත් වෙනවා. ඔන්න දැන් ඔබ බලන්න මෙතන දියුණුභාවයට පත්වුනේ කුමක්ද? අවිද්‍යාවයි. සත්ත්වයාගේ දුකයි. කුකුළා මරණ වාර ගණන වැඩි වෙනවා. මිනිසාගේ ප්‍රාණඝාත අකුසල් ප්‍රමාණයත් වැඩිවෙනවා.

සත්ත්ව ලෝකයේ බ්‍රොයිලර් කුකුළෙක් වෙලා ඉපදෙන්නේත්, වෙනත් මසට හදන සතකු ලෙස ඉපදෙන්නේත් කර්ම විපාකයක් නිසාමයි. අපි මොන තරම් අනුකම්පා කරලා මෛත්‍රිය නිසා කුකුල් මස් නොකෑවත් බ්‍රොයිලර් කුකුළාගේ අකුසල් විඳීමේ ස්වභාවය නවත්වන්න අපට බැහැ.

මස් කඩේ මස් සඳහා කුඩුකරලා තිබෙන බ්‍රොයිලර් කුකුළෙක් 'අනේ මේ සතා මරන්න දෙන්න හොඳ නෑ' කියලා සත්ත්ව කරුණාව ඇතිකරගෙන මුදල් ගෙවා එම සතා ගෙදර ගෙනවිත් හැදුවොත් සතා ටික දවසක් ජීවත්වෙලා මැරිලා යනවා. මැරිලා ගිහින් නැවතත් බිත්තරයක් තුළම උපත ලබාවී, බ්‍රොයිලර් කෙනෙක් වෙලාම. ඔබ ඒ සතාව මරණයෙන් බේරුවා කියලා ඒ සතාගේ කර්ම විපාකයෙන් බේරාගන්න බැහැ. සතර අපායේම ඉපදෙමින්, ජීවත්වීමේ කාලය සීමාකර ගනිමින්, මැරුම්කමින් විපාකයන් ගෙවනවා.

ඔබ හිතන්න ඔය කුකුළු ගොවිපළවල, කුකුළ් මස් තොගයට මරන කඩවල, බ්‍රොයිලර් සතුන් මරන මිනිස්සු ඉන්නවා. මේ එක මනුස්සයෙක් දවසකට සතුන් 500ක් විතර බෙල්ල කපා මරා දමනවා. මෙහෙම බලනකොට ඒ මනුස්සයා ජීවිත කාලය තුළ මොන තරම් නම් සතුන් මරන්න ඇතිද? සමහර අන්‍ය ආගම්වල මිනිසුන් සිටිනවා, ඒ අය දිනපතා ආහාර සඳහා කුකුළ්ලු මරණවා. අනුන් මරණ මස ඒ අය පාවිච්චි කරන්නේ නැහැ. මේ විදිහට බලනකොට දිනකට බ්‍රොයිලර් 25,000ක් මරණවා කියලා හිතමුකෝ. ඒ හැම සතෙක්ම මරන්නේ මනුෂ්‍යයෙක්. එහෙම නම් මේ කර්ම විපාකය නිසා මේ මනුෂ්‍යයා මැරිලා ගිහින් දිව්‍ය ලෝකේ උපදිනවාද? නැහැ. බිත්තරයක් ඇතුළේමයි උපදින්නේ. ඇයි? කුකුළ් සංඥාව කැමති නිසා. කර්මය විපාක දීමට අවශ්‍ය නිසා. ගෙවන්නට තිබෙන අකුසල් ප්‍රමාණය වැඩි වෙන්න වැඩි වෙන්න, විපාක දීමේ අවස්ථාවත් වැඩිකරනවා. මේ විපාක දීමේ වැඩිභාවය තමයි වර්තමානයේ මේ සත්ත්ව ලෝකයේ අඩු ආයුෂින් මස් පිණිස සකස්වීමේ තාක්ෂණය ඉදිරියට යන්නේ. හැකි තරම් රසායනිකයන්, ආහාර, බෙහෙත් පොවලා ඉක්මනට ලොකු කරලා ඉක්මනට මරණවා. නැවත උපදින්න. අතීතයේ කරපු මහා අකුසල් කඳු ගෙවීමට අවස්ථාව උදාකරගන්න. ඔබ බ්‍රොයිලර් කුකුළෙක් කියන්නේ අතීතයේ කුකුළ් මරන්නෙක්මයි. ඔය පෘෂ්ඨීමත් එළුවෙක්, ඌරෙක්, හරක් නාම්බෙක් කියන්නේ පෙර ආත්මභාවවල හරක් මරන්නෙක්මයි. ඔවුන් එම මිනිස් ජීවිතවලදී එළුවන්, ඌරන්, හරකුන් දහස් ගණනින් මැරූ අය. ඔබ මරණයට කැපවූ සතෙක් නිදහස් කළා කියලා එම සතා මරණයෙන් මුදවන්න, එම අකුසල් කන්දෙන් මුදවන්න බෑ. ඔවුන් ඒවා ගෙවිය යුතුමයි. ඔබ කළ යුත්තේ සතුන් මරණයෙන් මුදවාගැනීමට යෑම නොවේ. හැකිතාක් ඉක්මනින් මේ විෂම ලෝක ස්වභාවය හඳුනාගෙන නැවත ඔබ කුකුළෙක්, එළුවෙක්, ඌරෙක්, හරකෙක් නොවන්නටය. ඒ කියන්නේ සතර අපායෙන් මිදුණු කෙනෙක් බවට පත්වීමට උත්සාහ කිරීමය.

දිනකට බ්‍රොයිලර් විසිපන්දහස් ගණනින් මරපු මිනිසුන්මයි නැවත බ්‍රොයිලර් කුකුළන් වෙලා උපදින්නේ. ඒ උපදින්නේ මැරුම්කන්නමයි. නිදහසේ මියයන්න නොවේ. නිදහසේ ගේ මිදුලක ඇහිඳගෙන කන්න නොවේ. නිදහසේ හිරු එළියේ, සුළඟේ පහස විඳින්න නොවේ. නිදහසේ තම වර්ගයා සමග සතුටුවෙන්න නොවේ. මේ සත්ත්වයන් කළ කර්මයන් ඔය ගෙවන්නේ. අපේ මෛත්‍රියට, කරුණාවට බැහැ ඒ කර්මයෙන් ඒ අයව මුදවන්න. ආහාර තාක්ෂණයේ දියුණුවෙන් නිපදවන සෑම සොසේජ් එකක් පාසාම මීට් බෝල් එකක් පාසාම, සකස්කළ, සකස් නොකළ මස් කැබැල්ලක් පාසාම එම සතුන් මරාදමපු මිනිසුන්ට නැවත කල්ප ගණන් තිරිසන් ලෝකයේ ඉපදී සොසේජස්, මීට්බෝල්ස් වෙන්න සිදුවෙනවා.

ඔය මසට ඇතිකරන සතුන් ගැන ඔබ හොඳින් නිරීක්ෂණය කරන්න. ඒ සතුන් මැරුම්කන තුරුම සීමිත ඉඩ ප්‍රමාණයකයි ජීවත්වෙන්නේ. ඒ සතුන්ට ඇවිදීමේ ඉඩකට සීමාකරලයි තිබෙන්නේ, ශක්තිය කැලරි වැයවන නිසා මස් බර අඩුවේය කියලා. දැන් අලුත්ම බ්‍රොයිලර් කුකුළන් ඇතිකිරීමේ තාක්ෂණය තමයි විශාල කූඩුවල රාක්ක පෙට්ටි තනා, එම කුඩා පෙට්ටියේ කුකුළා ඇතිකිරීම. කුකුළාගේ ප්‍රමාණයට තැනූ එම පෙට්ටියේ එම සතාගේ හිස එළියට දැමීමට ප්‍රමාණවත් කවුලුවක් තිබෙනවා. මසට ගන්නාතුරු ඒ කුකුළා ජීවත්වෙන්නේ එම පෙට්ටිය ඇතුළේ. පෙට්ටියේ ඇති කුඩා කවුළුව ඉදිරියේ ජලය සහ ආහාර පටියක් තිබෙනවා. පෙට්ටියේ කුඩා කවුළුවෙන් හොට එළියට දමලා, ජලය සහ ආහාර අරගෙන පෙට්ටිය සැපය කරගෙන එයා එහි ජීවත්වෙනවා. මේ ක්‍රමයෙන් මස් බර වැඩිවෙනවලු. මෙම සතා කූඩුවේ සිටියත්, මෙම පෙට්ටියේ සිටියත් මාස එකහමාරෙන් මරා මස් කරනවා. එහෙත් මේ ක්‍රමය යටතේ මේ සතාට එම කෙටි කාලය තුළ ඇවිදීමේ නිදහසත් නැතිවෙලයි මැරුම්කන්න වෙන්නේ. ලෝකයා මේවා හඳුන්වන්නේ තාක්ෂණයේ නව සොයාගැනීම් දියුණු වශයෙන්. මිනිසාට සත්තු මරන්න කියලා යොමුකරන්නෙත් අවිද්‍යා සහගත සිතමයි. එම අකුසල් නිසා මරණින් මතු තිරිසන් ලෝකයේ ඉපදුනහම එම තිරිසන් සතාව ඉක්මනටම ශරීර බර වැඩි කරලා මසට ගන්න ක්‍රමය කියලා දෙන්නෙත් අවිද්‍යා සහගත සිතමයි. ලෝකය දියුණුවෙනකොට සත්ත්වයාගේ අකුසල් ප්‍රමාණය වැඩි වෙනවා. ආයුෂ අඩු වෙනවා. මියයෑමේ වේගය, ඉපදීමේ වේගය වැඩිවෙනවා. තිරිසන් සත්ත්වයකුගේ ඉපදීමේ වාර ගණන වැඩිවෙනවා කියන්නේ එම සතුන් හිස කපාගන්නා වාර ගණන වැඩි වෙනවාය කියන එකයි.

එක්තරා උෟරු ගොවිපලක මස් පිණිස විශාල චීන උෟරන් ඇතිකරන්නේ අඩි හතරේ දිග පළල, භාග බිත්ති බැඳපු කුඩා කුටිවලයි. එම සතුන්ගේ ලෝකය තමයි අර කුඩා කුටිය. ඒ සතුන්ට ඇවිදින්න දෙන්නේ නැහැ. මස් බර අඩුවෙනවාය කියලා. ආහාර ජලය ඖෂධ දෙනවා පමණයි. සමහර උෟරන් ශරීර බර වැඩි නිසා පැත්ත වැටිලයි ඉන්නේ. මස් බර වැඩි නිසා පැත්ත වැටිලා ඉන්න කුකුළෙක්, උෟරෙක්, එළුවෙක්, හරකෙක් දැක්කහම එම සතාගේ අයිතිකරු මොන තරම් සතුටක් ලබනවද? මොකක්ද මේ ලබන සතුට, මතු ආත්ම දහස් ගණනක තමාත් තිරිසන් සතකුව ඉපිද මේ දුක සහතික කරගැනීමේ අවිද්‍යාවේ සතුටයි. මේ මෝඩ සල්ලිකාර මනුෂ්‍යයාගේ ඇස් අවිද්‍යාවෙන් වහලයි තියෙන්නේ. එයා දකින්නේ වැඩි යමක් අයිතිකර ගැනීමේ අවිද්‍යාවේ සිහිනය පමණයි. ඒ සිහින සුන්දර තරමටම, එම සිහිනයෙන් බැංකු ගිණුමේ ඉලක්කම් ගණන වැඩිවන තරමටම, එහි විපාකයත් භයානකය. අවිද්‍යාවෙන් දෑස් අන්ධ වුණු මේ සල්ලිකාර මහත්තයා මොහොතක්වත් සිතන්නේ නැහැ මේ මස් බර වැඩි නිසා පැත්ත වැටිලා ඉන්න තිරිසන් සතා අතීතයේදී ඔහුටත් වඩා සල්ලිකාර මහත්තයෙක්ය කියලා.

බ්‍රොයිලර් ජීවිතය 2
සෑම තරාතිරමකම පාලකයන් වෙත කරුණාවෙනි !

බ්‍රොයිලර් කුකුළන් ඒ දවස් හතලිස් පහක ජීවිත කාලය තුළ කුඩා කූඩුවකට කොටුවී සිට නිසි වයස් වැඩුනු පසු හිස ගසාදැමීමට ලක්වීමේදී අදාළ සත්ත්වයන් කර්ම විපාක දෙකක් ගෙවනවා. එකක් ප්‍රාණඝාත අකුසලය. ඒ හේතුවෙන් හිස ගැසුම් කනවා. අනික් අකුසලය තමන්ගේ දියුණුව උදෙසා අනුන්ගේ ජීවිතය සීමා කිරීමයි. එහි විපාක හැටියට තිරිසන් ලෝකයේ ඉපදුනද, සෙසු තිරිසන් සතුන්ට මෙන් ඇවිදීමේ නිදහසක් නැතිව, කුඩා පෙට්ටියක, කුඩා කූඩුවක ජීවිතය ගෙවනවා මැරුම් කන තුරුම....

මෙන්න මේ දෙවන ස්වභාවය ගැන ඔබ ප්‍රවේශම් වෙන්න ඕනේ. බෞද්ධ ජනතාව සත්ත්ව ඝාතනය කරනවා හුඟාක් අඩුයි. නමුත් මෙහි දෙවැනිව සඳහන් කළ අනුන්ගේ නිදහස සීමාකිරීමේ අකුසලය නම් බෞද්ධ ජනතාව අතින් බොහෝ විට සිද්ධ වෙනවා. බොහොම ධනවත්, ගොඩක් පින්දහම් කරන අයගෙනුත්, සාමාන්‍ය අයගෙනුත් ව්‍යාපාර, වැවිලි කර්මාන්තශාලා හිමියන් අතිනුත් මේ අකුසලය සිදුවීමට හුඟාක් ඉඩකඩ තිබෙනවා. එච්චර අවශ්‍ය නැහැ, තම ගෙදර සේවය කරන වැඩකාර දරුවා නිසා ඔබට මේ අකුසලය සිදුවෙන්න පුළුවන්. නිදහස සීමා කිරීම, වැටුප් අඩුවෙන් දීම, සීමාවකින් තොරව වැඩ ගැනීම. මොනම ආකාරයට හෝ සූරාකෑම බොහොම භයානක දෙයක්. ලෝකය දියුණුවෙන තරමටම මෙම අකුසලය දෝරේ ගලා යමින් මිනිසා අතින් සිදුවෙනවා. මේ අකුසලය නිසා එහි

විපාකයක් හැටියට සත්ත්වයාගේ නිදහස සීමා වෙනවා. කුඩු ජීවිතයකට සත්ත්වයා යොමුවෙනවා. ගමේ නගරයේ අඩියෙන් අඩිය ගෙවල් තැනීම නිසා මිනිසාගේ නිදහස සීමාවෙලා. එදා මනුෂ්‍යයාට තිබුණ ඇවිදීමේ, සෙල්ලම් කිරීමේ නිදහස අද ගෙදරදොරේ නැහැ. පෙට්ටියෙ කුකුළා වගේ අපිත් කොටුවෙලා, කුඩුවෙලා. ලොකු ගෙදරක් හදාගන්නවා. ලොකු තාප්පයක්, ලොකු ගේට්ටුවක් දමාගන්නවා. ගේ ඇතුළේ මැද මිදුලක් හදා ගන්නවා. ඕක තමයි වර්තමානයේ මිදුළ, එළිමහන. අපේ මියගිය ආච්චිලා සීයලා, ඔය වර්තමානයේ නිවසේ මැද මිදුල දැක්කොත් සිනාසේවී. මොකද ඒ තරම් විශාල ගෙමිදුල් ඒ කාලවල ගෙදරකට තිබුණා. වර්තමාන ලෝකය සකස්වෙන්නෙ සත්ත්වයාගේ කර්ම විපාක ගෙවීමට සුදුසු ස්වභාවයෙන්මයි.

වර්තමානයේ බොහොම ගරු ගාම්භීර, නම්බුකාර නිවාස සංකල්පය තමයි තට්ටු විසිපහේ තිහේ තට්ටු නිවාස ක්‍රමය මේ දැවැන්ත නිවාස සංකීර්ණ අහස උසට විරාජමානව වැජඹෙන්නේ හරිම සාඩම්බරයෙන්. එහෙත් අප මේ දකින්නේ අවිද්‍යාවේ බියකරු සතුරාවමය. මේ සතුරා අහස උසට නැඟී සිට ලෝකයාට කියන්නේ, 'ඔබත් මෙතැනට, මේ උසට එන්න' කියාය. ඔබත් ඔබේ තනි තට්ටුව, තට්ටු දෙකට උස්කරගන්න කියලාය. අවිද්‍යාවේ ගඩොලින්, ඔබේ ලෝකය විශාල කරගන්න, උස් කර ගන්න කියාය. අවිද්‍යාවේ මාරයා ඔබට දෙන පණිවුඩයට ලෝකයාගේ ප්‍රතිචාරය පැහැදිලිය. දැන් හැමෝගේම ආශාව, තරගය කොන්ක්‍රීට් වනාන්තර ඉදිකර ඒවා මගේ කර ගැනීමයි.

මේ අති දැවැන්ත නිවාස සංකීර්ණවල ජීවත්වන පිංවත් මහත්වරු අධි සුඛෝපභෝගී ජීවිත ගතකරන, බොහොම ධනවත් අයයි. පෙර සංසාරයේ කරපු මහා කුසල් විපාකයක් නිසාමයි මෙවැනි විශාල නිවාසවල සුඛෝපභෝගී ජීවිත ලැබෙන්නේ. ඒ ගැන තර්කයක් නැහැ. නමුත් මේ කුසල් විපාකය යටින් සියුම් අකුසල් විපාකයක් ක්‍රියාත්මක වෙනවා. අර පෙට්ටිය තුළ වැඩෙන බ්‍රොයිලර් කුකුළාටත් ඇති තරම් කෑම, ජලය, බෙහෙත් ලැබෙනවා. නමුත් ඒ සතාගේ නිදහස සීමාවෙලා. දැන් ඔබ දෙස ඔබ අවංකව බලන්න. ඔබට තේරෙන්නේ නැතිද ඔබ මොන තරම් සුඛෝපභෝගී ජීවිතයක් ගත කළත් ඔබේ නිදහස සීමාවෙලා කියලා. ඔබේ ආච්චිලා, සීයලා ගත කළ නිදහස් ලෝකයට අනුව ඔබේ ජීවිත සීමාවෙලා නේද තිබෙන්නේ? නිදහස් ලෝකය හමුවේ ඔබ පෙට්ටියක් තුළ ජීවත්වන සතෙක් වගේ නේද?

ඔබ උස්මහල් තලයේ සිට ජනේලය හැර පරිසරය දෙස බලන කොට මට පෙනෙන්නේ කුකුළා පෙට්ටියේ කුඩා කවුළුවවෙන් හිස එළියට දමා ලෝකය දෙස බලනවා වගෙයි. ඔබට නිදහස් ලෝකය ස්පර්ශ කරන්න නම්, නිදහසේ හුස්ම ගන්න නම් ඔබ සති අන්තයේ නුවරඑළියට, ගමකට, හෝ අඩුම වශයෙන් විවේකීව ක්‍රීඩාංගණයකටවත් යන්නට ඕනෑය. නැවතත් කියමි, ඔබලා සැබෑම සසර පින්කළ පිරිසක්මය. ඒ පින නිසාමය ඔය සශ්‍රීක භාවය. එහෙත් පෙර ආත්මවල ඔබලා යටතේ සිටි සේවකයන්ගේ නිදහස සීමාකර තමා වැඩි ප්‍රතිලාභ අත්කරගැනීමට යෑම නිසා මෙම අකුසලය ඔබ සිදුකොට ඇත. එම නිසා මේ ජීවිතයේදී ඔබලා යටතේ, ඔබලාගෙන් යැපෙන පිරිස්වලට සාධාරණව සලකන්න. එම හම්බකරන මිල මුදල්වලින් නොමසුරුව දාන, මාන, පිංකම් කරනවා වගේම නොපෙනෙන පැත්ත ගැනත් අවධානය ඇතිකරගන්න. එසේ නොවුනහොත් ඔබ කරනා පිංකම් නිසා මතු සසර කෝටි ගණන් වටිනා නිවාස භාග්‍යය ලැබුනද, එය අර රාක්ක පෙට්ටියේ බ්‍රොයිලර් කුකුළාගේ ජීවිතය වගේ සීමාවෙලා නම් එය අවාසනාවකි.

මේ ලෝකය යමින් පවතින්නේ යායුතු ගමනකි. ලෝකය කවදත් ගියේ මුලාව දෙසටය. අපි කිසිවෙකුට සටන්කොට ලෝකය නිවැරදි කළ නොහැක. නිවැරදි කිරීමට ස්ථිරවූ, නිත්‍යවූ දෙයක් ලෝකය තුළ නොමැත, ස්ථිර නොවන දෙයක් යමෙක් කෙසේ වෙනස් කරන්නද, එය ස්වභාවයෙන්ම වෙනස් වෙමින් පවතී. ඝනභාවයත්, දියර ස්වභාවයත්, උණුසුම් ස්වභාවයත්, වායු ස්වභාවයත් පදමට මුසුව හතරෙන් එකකට සිඳුවා නිර්මාණය වූ රූපයක්, ලෝකය ලෙස අල්වා දීම අවිද්‍යාවේ ස්වභාවයයි.

මිනිසා මේ හති දමාගෙන, බුල්ඩෝසර් දමාගෙන, චිකන් ගුන්යා, සත්ත්ව කුර රෝගය යැයි කියමින් සතුන් ලක්ෂ ගණනින් මරා දමන්නේද මස්, බිත්තර, කිරි, චොකලට්, විනාශ කරන්නේද රූපය ජාති, ජරා, ව්‍යාධි, මරණවලට ලක්වීම මිනිසාට වෙනස්කළ නොහැකි නිසාය. එය ස්වභාවයෙන් පීඩා විඳිය යුතුය. ඔය සතුන් ලක්ෂ ගණනින් විනාශ කරන මිනිසුන් අතින් සිදුවන අකුසල් කර්මයන් ඊළඟ ජීවිතයේදි ගෙවීමට පරිසරය ලෝකය තුළ නිර්මාණය විය යුතුය. මරණ බියෙන් වෛරයෙන්, ක්‍රෝධයෙන් මියයන සතුන්ද, එම අකුසල් නිසා නැවත කර්ම ගෙවීමට අවශ්‍ය ලෙස ලෝකය නිර්මාණය විය යුතුය. නිර්මාපකයා අවිද්‍යාවයි. අවිද්‍යාව ඌරාගේ මස් ඌරාගේ පිටේ තබා කපනවාසේය. හේතුඵල ධර්මයන්ට

අනුව මැරෙන්නටද, මරන්නටද ඔහුගේ කර්ම විපාකයන් විඳීමට අවශ්‍ය මාරාන්තික රෝග, මාරාන්තික යුද්ධ නිර්මාණය කරයි. මේ මාරාන්තික යුද්ධ, මාරාන්තික රෝග නිර්මාණය කරන්නේද අවිද්‍යා සහගත සිත විසින්මය. මාරාන්තික රෝග යනු අහම්බයන් නොවේ. දේව කෝපයන් නොවේ. හේතුඵල ධර්මයන්ය. මේවා ලෝකය අවිද්‍යාවෙන් දියුණුවන්න දියුණුවන්න සත්ත්වයා රැස්කරන්නාවූ අකුසල් විපාකදීමට සකස්වන්නා වූ ලෝක ධර්මතාවයන්ය. එහිදී යුද්ධයක් යනු, මාරාන්තික රෝග යනු අතීතයේ ඔබ කළ කර්ම විපාකයන්ගේ කැඩපතක්මය. ඔබ ඒ කැඩපත දෙස අවිද්‍යාවෙන් තොරව බැලුවොත් ඔබ දකින්නේ පෙර ආත්ම භවවල ඔබ කළ අකුසල්වල ස්වභාවයන්ය. දැන් ඔබට වැටහෙනවාද ලෝකය මේ වන විට ගමන් කරන්නේ මොන දිශාවටද කියලා. ඔබ විසින් ඇතිකළ හේතූන්ට විපාකයන් සකස්වීමට සුදුසු ස්වභාවය දෙසට. පරිසරයක් දෙසට. සෑම සත්ත්වයෙක් තුළින්ම රැස්වෙන්නේ තණ්හාධික චිත්ත පරම්පරාවක් නම්, තරගකාරීත්වය, අයිතිකර ගැනීම නැමැති අවිද්‍යාවේ ශබ්දකෝෂය නම්, එයද මේ නොදැනුවත්වම ඇදී යන්නේ බ්‍රොයිලර් කුකුළකුගේ තත්ත්වයට පත්කරන දිශාවටමය. ඒ තරමටම මිනිසා ජාති, ජරා, ව්‍යාධි, මරණවලට වේගයෙන් ලක්වෙනවාය, ගොදුරුවෙනවාය. තාප්ප, ගේට්ටු දැමූ කූඩුවලට කොටුවෙනවාය. රෝග බිය, මරණ බිය, ජල බිය, යුද බිය වැඩිවෙනවාය. උපතත් මරණයත් අතර කාල පරතරය කෙටිවෙනවාය. නැවත ඉපදීම, මරණය වේගවත් වනවාය. මේ වේගය කියන්නේ දුකයි. හේතුව ඔබ අවිද්‍යාවෙන් තෙත්වූ සිත ඔබව අකුසලයේ යෙදවීමයි. ඵලය ඉපැදීම, මරණය වේගවත්වී දුක පසුපස තරගකාරීව හඹායෑමයි. මේ ස්වභාවය ඔබම නිර්මාණය කරගත් දෙයක්.

මේ ස්වභාවයන් ගැන හිතලා ඔබ බිය ඇති කරගන්න. ඇයි මෙහෙම වෙන්නේ? ජාති, ජරා, ව්‍යාධි, මරණ තිබෙන්නේ විඳවන්නටද, අවබෝධ කරන්නටද?

මේ බුද්ධෝත්පත්ති කාලයක, ඔබ මේ උතුම් මනුෂ්‍යත්වයක් ලැබ උපත ලැබුවේ නැවත සතර අපායේ වැටෙන්නද? ඔබේ අම්මට, තාත්තාට, ඔබේ බිරිඳට, දරුවාට ඔබව බේරන්න බැහැ මේ මහා දුකෙන්.

ඒ නිසා ඔබ දක්ෂවෙන්න. සියල්ලම, සියල්ලන්වම පෝෂණය කරන ගමන්, ඔබ කරන ව්‍යාපාරය, විවාහ ජීවිතය, දෙමාපියන් පෝෂණය කරන ගමන් එම බැඳීම්වලට බාධාවක් නොවන ලෙස මේ දුකෙන් ගැලවෙන්න. ඔබ පැවිදිවෙන්නම අවශ්‍ය නැහැ. ඔබ කය මහණ නොකරාට කමක් නැහැ.

සිත මහණ කරගන්න. පැවිදි කරගන්න. එසේ නොවුනහොත් ඔබත්, ඔබගේ යැයි අල්ලාගත් සියල්ලෝමත් සතර අපායට, දුකට වැටේවී. බ්‍රොයිලර් කෙනෙක් වේවි.

මහා ගමනක්, මහා දුකක්, මහා විනාශයක් වලක්වා ගැනීමට ඔබ කළ යුත්තේ විසිරුණු, සලිත වුණ ඔබ සිතේ ස්වභාවය බොහෝම නිවිසැනසිල්ලේ අවබෝධ කරගැනීමයි. කලබල වෙන්න, ඉක්මන් වෙන්න, යමක් අල්ලාගන්න උත්සාහ ගන්න එපා. අල්ලාගත් දේවල් අනිත්‍ය දකිමින් පරිහරණය කරන්න. ඔබ බිරිඳ සමග නිදන සයනයේ සිටියදීත් ජීවිතය විඳින්න. එහෙත් ඒ විඳීම අනිත්‍යබව දකින්න. නැවත නැවතත්, නැවත නැවතත්, නැවත නැවතත් එකම දේ සිදුවෙන්නේ ඊයේ දවසේ සිදුවූ දෙය අනිත්‍ය නිසා බවද දකින්න. මෙම සටහන තැබුවේ පැවිදි උතුමන් සඳහා නොව ගිහි පිංවතුන් සඳහාය. ඒ නිසා ඔබ ගිහි ජීවිතයේ බැඳීම් සමඟ ජීවත්වෙමින්, දූවා දරුවන්, ව්‍යාපාර, රැකීරක්ෂා නඩත්තු කරමින් නිරතුරුව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, ආර්ය කාන්ත ශීලයක් ලෙස ශීලය ආරක්ෂා කිරීමත්, ඒ කියන්නේ තමා අතින් නොදැනුවත්ව හෝ සිල්පදයක් කැඩුණහොත් ඒ වහාම එම වැරැද්ද නිවැරදි කරගැනීමත්ය. ඒ ආකාරයෙන් අවංකව ශීලයක් ආරක්ෂා කිරීමත්, ඔබ ඇසුරුකරන, ඔබට අයිති සෑම දෙයක්ම අනිත්‍ය වශයෙන් දකිමින්, "මගේ ආච්චි, සීයා, අම්මා, තාත්තා රැස්කරපු, හම්බකරපු හැම දෙයක්ම තියලයි මැරුණේ. කිසිවක් අරගෙන ගියේ නැහැ. ඒ වගේම මේ කිසිවක් මට අයිති නැහැ. මම මේ සියල්ල දාලමයි මියයන්නේ" මේ වගේ ජීවිතයේ අනිත්‍යය දකින්න. අතීතයේ මියගිය ඔබේ පරම්පරාවේ වැඩිහිටියන් සමඟ ඔබේ ජීවිතය සංසන්දනය කරන්න. මෙම සටහනේ තිබෙන බ්‍රොයිලර් කුකුළා, ඌරා, එළුවා, හරකා ගැන නිතර මෙනෙහි කරන්න. ඔබ එවැනි සතෙක් වුවොත් ඔබ විඳින දුක මෙනෙහි කරන්න. අතීත සංසාරයේ ඔබ එවැනි සතුන්වී හිස් ගැසුම් කෑ ස්වභාවය, වේදනාව, මරණ බිය මනසින් දකින්න. මේ විදිහට මාස 3ක් ඔබ ඔබේ සිත පුරුදු පුහුණු කරන්න. ඔබේ ජීවිතය සංකීර්ණ බවෙන් මිදේවී. ඔබට දැනේවී ජීවිතයේ අවබෝධ කරගැනීම පිණිස ගොඩක් දේවල් නොමැති බව. ජීවිතය මහා ගොඩක් ලෙස දැනුනද ඔබට අවබෝධ කරගැනීමට ඇත්තේ එකක් පමණක් බව ඔබට දැනේවී. සිත වේවා, කය වේවා ඒ අනිත්‍යය පමණක්මයි. මේ අවබෝධය, ලෝකයේ අවබෝධය ලැබීමට ඇති දුෂ්කරම ස්වභාවය වුවද, ඔබ තුළ හේතු සහිතව ලෝකය දුකය යන දැක්ම ඇති කරගතහොත්, ඔබට මේ දුක අවබෝධ කරගැනීම දුෂ්කර කාර්යයක් නොවනු ඇත. ඔබත් මේ

මනුෂ්‍ය ජීවිතයේදී ඔය ආකාරයෙන් ගිහි ජීවිත ගත කරමින්, කම් සැප අත්විඳිමින්, සතර අපායෙන් මිදී නැවත බ්‍රොයිලර් කුකුළෙක්, මසට මරන සතෙක් වීමේ වේදනාත්මක අනතුරෙන් ගැලවෙන්න. සතර අපායෙන් මිදෙන්න. ඉහත සටහන් භික්ෂුව හේතුඵල අනුව දකිමින් සටහන් කළා පමණි. එබැවින් වඩාත් වටින්නේ දොස් පරොස් සෙවීම නොව, එවැනි ස්වභාවයක් ලෝකයේ තිබේය යන්න හඳුනාගනිමින් අවබෝධය ලැබීමය. මන්ද මෙහි සඳහන් පෙට්ටියේ ජීවත්වන, බ්‍රොයිලර් සතෙක් අත්විඳින නිදහසේ ස්වභාවයත්, වර්තමාන සුඛෝපභෝගී නිවාස සංකල්පයන් නිසා මිනිසා අත්විඳින නිදහසේ ස්වභාවයත් එකට සංසන්දනය කිරීම කෙනෙකුට ප්‍රශ්නයක් වීමට පුළුවන. ඔබ කෙලෙස්වලින් ගොරෝසුවූ සිතකින් නොව, නිකෙලෙස්, කෙලෙස්වලින් තුනීවූ සිතකින්, සියුම්ව මේ කරුණ දකින්න උත්සාහ ගන්න. පෙර මහා කුසල් සිදුකරගත්තත්, තමන් තුළින් සිදුවූ සියුම් අකුසල් විපාකයක්මයි මෙයට හේතුව විය යුතුව තිබෙන්නේ.

සමහර පිංවත් පිරිස ලක්ෂ ගණන් වියදම් කරමින්, මහා දාන පිංකම්, ශීල පිංකම් කරනවා. නමුත් ඒ අය තම සේවකයන්ට, අඩු වැටුප්, නිදහස සීමාකිරීම් කරනවා. මේ හේතුවෙන් ඒ අය පිංකම් කිරීමේ අනිශංසය නිසා සශ්‍රීක ජීවිතත්, අනුන්ගේ නිදහස සීමා කිරීමේ පාපයට තමාටද මතු සසර, සීමාවන් තුළට කොටුවූ ජීවිත ගෙවන්න සිදුවීම මෙහි කර්ම විපාකයක් වෙන්න පුළුවන්. භික්ෂුව මෙහි කරන සටහන 100%ක් නිවැරදි නොවන්නට පුළුවන්. එහෙත් ඔබ එය 100%ක්ම වැරදි යැයි වටහා ගතහොත් එය ඔබේ අවාසනාවක් වනු ඇත.

හැකි තරම් දානමාන පිංකම් කරනවා වගේම ඔබේ සේවකයන්ටද ස්වාමියකු ලෙස ඔබ නිරතුරුවම අවංක වෙන්න. ඔබ ලබන සතුටින් යම් ප්‍රමාණයක් හෝ ඔබේ සේවකයාද ලබනවා දකින්න ඔබ අවංකව කැමතිවෙන්න. ඔබේ දක්ෂභාවයෙන් ඔබගේ සේවකයාවද ඔබ යහපතේ යොදවන්න. වෛරය, ක්‍රෝධය, සූරාකෑම වැනි ස්වභාවයන්ගෙන් තුනීවූ සිත කුසල් වැඩිමට සශ්‍රීක පොළොවක් බව නිතරම සිතන්න. වැඩෙන කුසල් නිරතුරුවම නිවීම උදෙසා උත්තම පාරමී ධර්මයක් වේවායි දකිමින් නිවීමේ මඟම ශක්තිමත් කිරීමට උත්සහවත් වෙන්න. ව්‍යාපාරික ඔබේ ශබ්දකෝෂයේ "**ලාභය**" යන වචනය වෙනුවට "**බෙදා දීම**", "**නිවීම**" යන වචන ඔබ භාවිතයට ගන්න. එය ඔබ සංසාරයක් පුරාවට නොලැබූ, වර්තමාන ජීවිතයේ ලැබූ ලොකුම ලාභය වනු ඇත. එම ලාභය නැවත ජාති ජරා මරණ ව්‍යාධිවලින් ඔබට කළ අලාභය අවසන් කරනු ඇත.

සයුරු සැපේ වේ මේ සා දෝසා

සතර අපාය කියන වචනය ඇසෙනවිට, එහි සත්ත්වයන් විඳින දුක අසන විට මනුෂ්‍යයා තුළ හටගන්නේ බියක්, තැති ගැනීමක්. මේ තැති ගැනීම, බිය නිසාම සමහරු සතර අපාය කියන වචනය තම මතක කෝෂයෙන් අයින් කර දමනවා. එය තහනම් වචනයක් හැටියට. ඇස්වලට පෙනි පෙනී තිරිසන් ලෝකයේ සත්ත්වයෝ දුක් විඳිනවා දකින කොටත්, මනුෂ්‍යයෝ සිතනවා, 'අපි තිරිසන් ලෝකයේ උපත නොලබනවා' කියලා. මනුෂ්‍යයා එහෙම හිතන්න පුරුදු කළහම මේ සිත නැමැති පාප මිත්‍රයාට, මිත්‍ර ද්‍රෝහියාට හරිම ලේසියි තිරිසන් ලෝකයේ උපතට අවශ්‍ය හේතූන් ඔබ තුළින් සකස් කරන්න. තිරිසන් ලෝකයේ නිසරු උපතකට අවශ්‍ය ගැලපෙන, අකුසල්වලින් සරු ජීවිතයක් මෙලොවදී ඔබට ලබාදෙන්න. සතර අපායෙන් අපේ මස් ඇසට පෙනෙන ලෝකය තමයි තිරිසන් ලෝකය. සතර අපායට අයත් ප්‍රේත, අසුර සහ නිරය දැකීමට නොහැකි වුවත් ඔබට නිරය ගැන, ප්‍රේත ලෝකය ගැන දැනීමක් තිබෙනවා. එහෙත් ඔබට මේ ප්‍රකාශ කරන්නට යන්නේ එතරම් සඳහනක් නොවන සතර අපායට අයත් අසුර ලෝකය ගැනයි.

ඒ අසුර ලෝකයට අපේ අවධානය අඩුයි. එහෙත් ප්‍රේත ලෝකයට සාපේක්ෂව අසුර ලෝකය විශාලත්වයෙන් වැඩි විය යුතුය. ලෝකයේ භූමි ප්‍රමාණයෙන් හතරෙන් තුනක් වසාගෙන පැතිර තිබෙන මහා සාගරය ආශ්‍රිතව තමයි අසුර ලෝකය ස්ථානගත වෙලා තිබෙන්නේ. මේ මහා

සාගරය තමයි අසුරයින්ගේ නිජබිම. සත්ත්වයෙක් මේ අසුර ලෝකයේ උපතක් ලබන්නේ ඇයි?

මහා සාගරයට තිබෙන කැමැත්ත, ඡන්ද රාගය, උපාදානය නිසා මරණයෙන් මතු අසුර ලෝකයේ උපත ලබා මහා සාගරයට බැසගන්නවා.

ඔබ දන්නවා, ශ්‍රී ලංකාවේ මුහුදුකරය කියලා රට වටේ ප්‍රදේශය හඳුන්වනවා. ලෝකයේ අනිකුත් රටවල්වල මුහුදු ආශ්‍රිත ප්‍රදේශ ඔබ මීට ගලපාගන්න. මෙන්න මේ ලෝකයේ මුහුදු ආශ්‍රිතව වෙසෙන ජනයා මුහුද තමන්ගේ ජීවිතය කරගෙනයි ජීවත් වන්නේ. ඒ අය නිවසින් එළියට බැස්සත්, ජනේලයෙන් එළිය බැලුවත් ඔවුන් දකින්නේ, පෙනෙන්නේ මුහුදයි. මුහුදේ සෝෂාව, සුළඟ, මුහුදු රළ..... මේ අය වැසිකිලියට යන්නෙත් මුහුදට, සෙල්ලම් කරන්නේ, විනෝද වෙන්නේ මුහුදු වෙරළේ. නැතිනම් මහ මුහුදේ. ඒ අයගේ ජීවිතයම මහ මුහුදයි. මේ මුහුද ආශ්‍රිත මිනිස්සු යැපෙන්නේ ධීවර කර්මාන්තයෙන්. අපේ රටේ පමණක් නොවේ. මුළු ලෝකයේම සමහරු උදේ ඉඳන් රාත්‍රී වනතුරු, බිලී පිති දමාගෙන මාළු අල්ලනවා. තවත් සමහරු ජීවිතය ගැනත් නොසිතා මුහුද මගේ කරගෙන, මගේ ආත්මය කරගෙන කුඩා තෙප්පමකින් මහ මුහුදේ මාළු දැල් එලනවා. සමහරු සවස තම බෝට්ටුවලින් මුහුදු ගියහම ආපසු ගොඩබිමට පැමිණෙන්නේ පසුදා අළුයම. තවත් සමහරු බහුදින ධීවර යාත්‍රාවලින් මුහුදු ගියහම ආපසු පැමිණෙන්නේ සති, මාස ගණනාවකින්. තවත් සමහරු නැව්වලින් මුහුදු ගිහින් මසුන් අල්ලා ටින් වලට අසුරා තවත් මාස ගණනක ගමනක යෙදෙනවා.ඒ තමයි පුළුල්ම තාක්ෂණය.

මේ හැම ධීවර කාර්මික මහත්මයෙක්ම මහ මුහුද උපාදානය කරගත් අයයි. මේ අයගේ ජීවිතයත් මහ මුහුදයි. බිරිඳත් දරුවනුත් මහ මුහුදයි. සතුටත් බලාපොරොත්තුවත් මහ මුහුදයි. සාගරය ඔවුන්ගේ ආත්මයයි. මේ ආත්මය තුළින් තමන්ට සැප ලැබේයැයි ඔවුන් බලාපොරොත්තු වෙනවා. මේ ආකාරයෙන් ඔවුන් මහා සාගරය උපාදාන කරගෙන ගොඩබිමට රැගෙන පැමිණෙන්නේ ප්‍රාණඝාතයේ අස්වැන්නයි. ප්‍රාණඝාතයේ අස්වැන්න යනු ඔවුන් ගොඩබිමට ගෙනෙන මරා දැමූ මසුන් ටොන් ගණනයි. කුඩා මසුන් පමණක් නොවේ. කැස්බෑවුන්, විශාල මෝරුන්, තල්මසුන්, මුහුදු කුඩැල්ලන්, පොකිරිස්සන්... මේවා තමයි මුහුද උපාදානය කරගත් මිනිසුන්ගේ ප්‍රාණඝාතයේ අස්වැන්න.

ලෝකයේ තවත් පිරිසක් සිටිනවා, ඒ අය මහා සාගරය උපාදානය කරගන්නේ වෙනත් සංඥාවකින්. ඒ අය විනෝදය උදෙසා, සතුට උදෙසා,

විවේකය උදෙසා, ක්‍රීඩාව උදෙසා, අධ්‍යාපනය උදෙසා මහා සාගරය උපාදානය කරගන්නවා. අපි මේ අයට කියනවා දෙස්, විදෙස් සංචාරකයන් කියලා. සුන්දර මුහුදු වෙරළ තිබෙන රටවල ඉතාමත් දියුණු ආකාරයෙන් පැතිරුණු ව්‍යාපාරයක් මේක. සංචාරයකයන් සැතපුම් දස දහස් ගණනක් දුර කතර ගෙවාගෙන රට රටවල සංචාරයට යනවා. මාලදිවයින කියන රටට වසරකට ලක්ෂ ගණනක සංචාරකයන් පිරිසක් පැමිණෙනවා. කුමකටද? මහා සාගරය උපාදානය කරගන්න. අපේ රටත් එහෙමමයි. ලෝකයේ කොහේ පිහිටියත් සංචාරක හෝටලයක මහා සාගරයට මුහුණදාපු කාමර ගොඩබිමට මුහුණදාපු කාමරවලට වඩා මිලෙන් අධිකයි. මෙය සංචාරකයන් මුහුද උපාදානය කරපු නිසා ඇතිවූවක්. මේ අය මුහුදේ නාමින්, කිමිදෙමින්, ඔරු බෝට්ටු පදිමින්, නොයෙකුත් ජල ක්‍රීඩා කරමින් මහා සාගරය තුළ සතුට සොයනවා. වෙරළේ මහා අවකාශ්ටකයේ හිරු එළිය තපිනවා. මුහුද ඒ අයගේ ජීවිතයේ කොටසක් වගේ. ලුණු වතුර, ලවන ස්වභාවය ඒ අය ස්පර්ශ කරන්නේ දැඩි කැමැත්තකින්. තණ්හාවකින්. අපේ රටේ සුන්දර සංචාරක මුහුදු තීරයේදී මේ ස්වභාවය ඔබට දකින්න පුළුවන්. ඒ අයගේ ජීවිතයම මහ මුහුදයි. ඒ අයගේ ආහාරය මහ මුහුදයි. ඒ අයගේ ඇස ඉල්ලන්නේ මුහුදේ සුන්දරත්වයයි. කන ඉල්ලන්නේ රළ පෙරළෙන ඝෝෂාවයි. නාසය ඉල්ලන්නේ පිළී ගඳයි. දිව ඉල්ලන්නේ මුහුදු ආහාරයන්ගේ රසයයි. ශරීරය ඉල්ලන්නේ මුහුදු ජලයේ ලවන ස්වභාවයයි. මනස ඉල්ලන්නේ ඉහත සියල්ල තව මදි, "තව මදි" කියන ඉල්ලීමයි. කය නැමැති ගුහාවේ සැඟවී සිටින සිත නැමැති ඔබගේ පාප මිත්‍රයා ඔබව මේ මුළා කරන්නේ මුහුද මගේ ආත්මයයි. සැපයයි. ලෝකයයි කියාය.

තව පිරිසක් ලෝකයේ සිටිනවා. ඒ අය මහ මුහුදේ විශාල මගී සහ භාණ්ඩ ප්‍රවාහන නැව්වල සේවකයන් සහ සංචාරකයන්. නැව්වලට සංඥා ලබාදෙන ප්‍රදීපාගාර සේවකයන්. තවත් බටහිර රටවල පිරිසක් සිටිනවා ඔවුන් සිය රැකියාවෙන් විශ්‍රාම ලබන විට හිමිවන සියළු දීමනා එකතුකර කුඩා රුවල් නැවක් මිලටගෙන රටින් රටට තොටින් තොටට යාත්‍රා කරමින් ජීවිතයේ ඉතිරි කාලය ගෙවා දමනවා. මේ සියළු ආකාරවල අය ගොඩබිමකට පය නොතබා එක දිගට මාස ගණන් යාත්‍රාකිරීම තුළයි ජීවත්වන්නේ. ඔවුන් විනෝද වෙනවා, සතුටු වෙනවා. හොඳට කනවා, හොඳට බොනවා, තමා සිටින්නේ මහා සාගරය මැද සිර කුටියකයි කියලා ඒ අයට තේරෙන්නේ නැහැ. මහ මුහුද කෙරෙහි තිබෙන තණ්හාවේ ස්වභාවය නිසා මේ සිර කුටිය ඒ අය දකින්නේ සිහින මාලිගාවක් හැටියට. අපි හරියටම නොදන්න නමුත් අහලා තිබෙන විදිහට මේ අය නැව ගිලුනත් බැන් චූන් ගහනවලු

සැපයි, සැපයි කියලා. මහා සාගරයේ මැරුණත් සැපයි කියන සංඥාවෙන්. මේ අයගේ ජීවිතය කියන්නේ මත්වීම, ඉන්ද්‍රියන් පිනවීම පමණමයි. මේ අය මුහුද මගේ කරගෙන, මුහුද ආත්මය කරගෙන, ඒ ආත්මය තුළ සැප ඇතැයි සොයනවා.

ලෝකයේ තවත් පිරිසක් සිටිනවා. ඒ අය තමයි කිමිඳුම්කරුවන්. ගවේශකයන්. ඒ අයත් මුහුද තුළ සැප සොයනවා. සම්පත් සොයනවා. ඔක්සිජන් ටැංකියක් කරේ එල්ලාගෙන එහි බර දරාගෙන, ගැඹුරු බියකරු මුහුදේ කිමිදෙමින්, ඒවා සැප හැටියට දකිමින් මුහුදේ සැඟවුණු අසිරිය, ධනය, නොපෙනෙන ලෝකය සොයනවා. මේ අයට මුහුදේ ළවණ ස්වභාවය, මුහුදු ගැඹුරේ බියකරු ස්වභාවය බොහොම සුළු දෙයක්. මොකද මහ මුහුද කෙරෙහි තිබෙන්නා වූ උපාදානය ඊට වඩා බලවත් නිසා. මේ පිරිසත් මුහුද ආත්මය කොට දකිමින් එහි සැප සොයන පිරිසක්මයි. මහා මුහුද ආශ්‍රිතව වෙසෙන කෝටි ප්‍රකෝටි ගණනක් මත්ස්‍යයන්, කැස්බෑවන්, ලිහිණියන් වැනි පක්ෂීන්... මේ අයත් මුහුද උපාදානය කරගත් පිරිසක්මයි. මේ අය තම පංචේන්ද්‍රිය පිනවන්නේ මහා මුහුදෙන් ලබාගන්නා ආහාරයෙන්. ඒ අයගේ ජීවිතය මහ මුහුදයි. මේ සෑම සතෙකුම මහ මුහුද තුළ සැප සොයනවා. මහ මුහුද මගේය කියලා දකිනවා. මහ මුහුද මගේ ආත්මය හැටියට දකිනවා.

ඉහත සටහන් කරපු ආකාරයෙන් ධීවර කර්මාන්තය නිසා, අධ්‍යාපනික, ගවේෂණාත්මක සහ ජීවත්වීම උදෙසා මුහුද උපාදනය කරගත් මනුෂ්‍යයින් වගේම තිරිසන් සතුනුත් ගණනින් මහා විශාල සංඛ්‍යාවක්. මෙන්න මේ මුහුද උපාදානය කරගත්, මුහුද මගේ කරගත්, මුහුද තුළ සැප සොයන ඉහත සත්ත්වයන් කවදා හරි දවසක මැරෙන මොහොතේ, තමා ජීවත් වන කාලයේදී තණ්හාවෙන් බැඳී සිටි මහා සාගරය කෙරෙහි කැමැත්තක්, උපාදානයක්, ඡන්ද රාගයක්, මතුවුනා නම් ඔහු අසුර ලෝකයේ ඉපදීමට ඇති ඉඩ ඉතාමත් වැඩියි. මේ වගේ සාගරය උපාදානය කර ජීවත් වෙලා අසුර ලෝකයට බැස ගත්තට පස්සේ එම අසුරයන්ට පුළුවන් මහා සාගරය මගේ කර ගෙන ජීවත්වෙන්න. සාගරය කළඹන්න, පිහිනන්න, කිමිදෙන්න. ඒ ඔහු අපේක්ෂා කළ කැමැත්ත අල්ලාගැනීම නිසා ඒ අසුරයා අසුර ජීවිතය දුකක් කොට දකින්නේ නැහැ. මොකද එයා පෙර මනුෂ්‍ය ජීවිතයෙදිත් මුහුද ජලය, එහි ළවණ ස්වභාවය, හිරු රශ්මිය, මුහුදු සුළඟ, බියකරු බව දුකක් හැටියට දැක්කේ නැහැ. උතුම් මනුෂ්‍ය ජීවිතයක් ලැබී තිබෙද්දිත් ඉහත කරුණු සැපක් කර ගත්ත කෙනා අසුර ලෝකය කියන

සතර අපායට වැටුනහම එම ස්වභාවය දුකක් හැටියට දකියිද? නැහැ. ඔහු ලැබූ මහා සැපක් හැටියටයි එය දකින්නේ.

පුංචි දරුවෙක් තමන්ගේ මුත්‍රා අසුචි සමග සෙල්ලම් කරනවා වගේ, අසුරයොත් මහා සාගරයේ සෑම දුක්ඛ දෝමනස්සයක්ම මහා සැපයක් කොටගෙන ප්‍රීතිවෙනවා. මහා සාගරයේ ආධිපත්‍යය පතුරවනවා. මහා සාගරයේ අයිතිය, ප්‍රදේශ වෙනුවෙන් ගැටෙනවා. සටන්කරනවා. මනුෂ්‍යයෝ "මේ මුහුදු ප්‍රදේශය අපේ, වෙන අයට මෙහි මසුන් අල්ලන්න බැහැ. මේ වෙරළ අපේ හෝටලයේ. වෙන අයට මෙහි එන්න බැහැ" වැනි අසුර සංඥාවල බැසගෙන සිටින නිසා අසුර ලෝකයේදි ඒ දේවල් වඩා පුළුල්ව සිද්ධවෙනවා.

ඔබ හිතන්න කිමිදුම්කරුවෙකු යම් සේද මහ මුහුද තුළ ක්‍රියා කරන්නේ කියලා. ඔහු දිය මතුපිටත් පිහිනනවා. දිය යටත් කිමිදෙනවා. ගැඹුරු දියෙත් කිමිදෙනවා. මෙන්න මේ කිමිදුම්කරුවා වගේ අසුරයොත් මහසයුරේ කිමිදෙමින් පංචකාමය විඳිනවා. මුහුද වෙනුවෙන් තම වර්ගයා සමඟ සටන් වදිනවා. මුහුදේ සැප සොයනවා. එය තමයි අසුර ලෝකයේ ස්වභාවය. මාළුවෙක් යම්සේද මුහුදු දිය සැපයි කියමින් එහි වාසය කරන්නේ. පිහිනමින්, කිමිදෙමින්, හැඩතල මවමින්, සතුටු වෙමින්.... මාළුවාට එය සැපයක් වුවද එය තිරිසන් ලෝකයයි. තව කුඩා මාළු සිය දහස් ගණනින් ආහාරයට ගනිමින් තව කර්ම රැස්කරන එකයි, මාළුවා කරන්නේ. අවසානයේදි කාගේ හරි දැලකට අසුවෙලා ජීවිතය පුජාකරනවා. අසුරයන් තෘෂ්ණාවෙන් මහ සාගරය අල්ලාගෙන මුහුද බෙදාගැනීමට අයිති කර ගැනීමට වෛරය, ක්‍රෝධය, තණ්හාව වඩමින් අවසානයේ විනාශවෙලා තව තව දුකින් දුකට වැටෙනවා.

භික්ෂුවක් සමාධියෙන් පසුවනවිට මහා සාගරයේ මුහුදු ජලය මත කිමිදෙමින්, සතුටුවන සත්ත්වයින් කිහිප දෙනෙක් දුටුවා. භික්ෂුව මේ අයව හඳුනාගනු ලැබුවේ අසුරයින් හැටියටයි. හැබැයි මේ අසුරයන් කිහිපදෙනා බොහොම තේජාන්විත, පිරුණු මනුෂ්‍ය ස්වභාවයේ ශරීරයක් සහිත බොහොම ශක්තිමත් පිරිසක්. මේ අය තනිකරම කිරි පැහැයෙන් යුක්තයි. මනුෂ්‍ය හිසට වඩා ලොකු හිසක් ඔවුනට තිබුණා. මේ අසුරයන් ඉතා ප්‍රීතියෙන් ජලයේ කිමිදෙමින්, ජලය මතුපිටට එමින් විනෝද වුනා. මේ සියල්ලෙන් පෙනෙන්නේ භික්ෂුවට දර්ශනය වූ අසුරයන් කිහිප දෙනා අසුර නායකයන් බවයි. මොකද ඒ අය අසුර ලෝකයේ ජීවත්වුණත් දුක් විඳින බවක් පෙනුණේ නැහැ. ඒ අයගේ සියුම් කයේ පිරුණු ස්වභාවයේ විරූපී බවක් පෙනුනේ නැහැ.

සමහර විට මේ දෙය වෙන්නේ මෙන්න මේ විදිහට කියලා භික්‍ෂුව අනුමාන කරනවා. ඒත් නිවැරදිවම කියන්න නම් දන්නේ නහැ.

ඔය මුහුදට ආසා කරන කෝටිපති ව්‍යාපරිකයින්, සංචාරකයින් ඉන්නවා. මේ අය ගොඩාක් සමාජ සේවය, දාන මාන වැනි ක්‍රියාවල යෙදෙනවා. මේවා තුළින් ඔවුන් තුළ කුසල් වැඩෙනවා. නමුත් මේ කෝටිපතියන් මැරෙන මොහොතේ ඔවුන් තුළ ඇතිවන්නේ ඉහත සමාජ සේවා, අනුනට කළ උපකාර පිළිබඳ මතකය නොවෙයි. සාගරය කෙරෙහි උපාදානයක්. 'අනේ මට නැවත මුහුදු සැප අහිමිවේය' කියා බියක්. ඒ සැපය කෙරෙහි ආශාවක්.

අනෙක මේ සමහරක් කෝටිපතියන්, සංචාරකයන් මිත්‍යාදෘෂ්ටිකයන් වීම නිසා, පිං පව් පිළිබඳව විශ්වාසයක් නොමැති නිසා දානයේ ආනිසංශ පරලොවදී ලැබෙතැයි විශ්වාසයක් නොමැති නිසා ඒ අයට මේවා මතක් වෙන්නේ නැහැ. මතකයට එන්නේ තමන් කරපු, තමන් කැමති වූ දෙය පිළිබඳ අල්ලාගැනීමක්. මේ හේතුව නිසා මේ අය මරණින් මතු තමන් කැමති වූ මහ මුහුදේම අසුරයෙක් ලෙස උපත ලබන්න බොහෝ ඉඩක් තිබෙනවා. මෙන්න මේ අය අසුර ලෝකයේදී භික්‍ෂුවට දර්ශනය වූ පරිදි තේජාන්විත පෞරුෂත්වයෙන් යුත් අසුර නායකයින්, ප්‍රාදේශීය නායකයන් වශයෙන් උපත ලබන්නත් ඉඩ තිබෙනවා.

ඔබ මෙහෙම සිතන්න. එක ධීවර මුදලාලි කෙනෙක් ඉන්නවා ඔහු අදහන්නේ ක්‍රිස්තියානි ආගම. එහෙම නැතිනම් මුස්ලිම් ආගම. ඒ ගැන කිසිම ගැටළුවක් නැහැ. ඒ එම මහත්වරුන්ගේ නිදහසයි. එවැනි ආගම් භක්තිකයෙක්ට ධීවර කර්මාන්තය ප්‍රතික්ෂේප කර්මාන්තයක් වෙන්නේ නැහැ කියලා භික්‍ෂුවක් හිතනවා. වැරදි නම් සමාවෙන්න ඕනේ. නමුත් බුදු දහම පැත්තෙන් ධීවර කර්මාන්තය ප්‍රතික්ෂේප කර්මාන්තයක්. අපි මෙහෙම හිතමු. ඔය ධීවර මුදලාලිට ට්‍රොලර් යාත්‍රා දහයක් තිබෙනවා කියාලා. දිනපතා හොඳින් කාලගුණය පවතිනකොට මේ යාත්‍රා දියඹට ගොස් විශාල මාළු අස්වැන්නක් ගොඩබිමට ගෙනෙනවා. මේ අස්වැන්න තමයි බෞද්ධ ජනතාවත් ආහාරයට ගන්නේ. ස්වාමීන්වහන්සේලාට පූජා කළොත් වළඳන්නේ. ඉහත එක යාත්‍රාවකින් මාළු දහස් ගණන් මරලා ගොඩට ගෙනෙන්නේ. එතකොට දිනකට යාත්‍රා දහයකින් මොන තරම් මාළු කන්දරාවක මරා දමනවාද? එතකොට මේ මුදලාලිලා ජීවිත කාලය තුළ මොන තරම් මාළු කන්දරාවක් මරා දැමීමට හවුල් වෙනවාද? මේ මුදලාලි උදයට මුහුදු වෙරළට ඇවිත් සතුටුවෙන්නේ මාළු අස්වැන්න දැකලා.

බලලා. අස්වැන්න වැඩි වෙන්න වැඩිවෙන්න මුදලාලිගේ, සේවකයන්ගේ, සතුට, සිනහව, බලාපොරොත්තු වැඩිවෙනවා. සමහරදාට මැරුණු මාළුන්ගේ කුස තුළ ලෝකයට බිහි නොවූ නමුත් ජීවී පැටවුන් කෝටි ගණනක් ඉන්න පුළුවන්. මෙම මාළු පැටවුත් මැරෙනවා. මෙවැනි පිරිස් ජීවිත කාලයක් පුරාවට රැස්කර ගන්නා අකුසල් ප්‍රමාණය ඉලක්කම්වලින් ප්‍රකාශ කරන්න බැහැ. මෙවැනි අකුසල් නිසාත් බොහෝම දුර්වල, විරූපී අසුරයින් වශයෙන් වගේම මුහුදු පතුළේ ගල් ප්‍රේතයින් වශයෙන්ද ඉපැදීමේ ප්‍රවණතාව ඉතාමත් වැඩිය. මුහුදු පතුළේ සිටින මේ ගල් ප්‍රේතයින් ගලක්, කොරල් පරයක්, මුහුදු ශාකයක් වශයෙනුයි සිටිනුයේ. මේ ප්‍රේතයන් පහළ වෙන්නේ ගල තුළයි, කොරල් පරය තුළයි. විශාල මුහුදු ශාක නිධි තුළයි. මේවා තමන්ගේ නිවාස කරගෙන, භවන කරගෙන මේ අය ජීවත්වෙනවා. තමා තණ්හාවෙන් අල්ලාගත් මුහුද මුර කරන්නේ, බලාගන්නේ 'මගේ' සංඥාවෙන් අයිතියේ තබාගෙන සිටින්නේ මේ නිවස තුළ සිටයි. මේ ගල් ප්‍රේතයින් දිනකට දෙතුන් වරක් හිස ගලෙන් මතුකොට මුහුදේ වටපිටාව හොඳින්, තෘෂ්ණාවෙන් නිරීක්ෂණය කරනවා. කවුරු හරි ඇවිත්ද, වෙනත් කෙනෙක් අයිති කරගෙනද කියලා. මුහුද පතුලේ ඇති ධන නිධාන, ගිලුන නැව්, මත්ස්‍ය සම්පත බලලා නැවත එයා ගල්වෙනවා. මිනිස්සු මේ ධන නිධාන ගන්න එහෙම නැතිනම්, නිරීක්ෂණය කරන්න මුහුදු පතුලට ගියොත්, ඔන්න මේ අය පීඩා කරනවා. බිය කරනවා. ඕවාට තමයි මිනිස්සු හොල්මන් කියන්නේ. මේ හේතුන් නිසා වෛරය, ක්‍රෝධය, තෘෂ්ණාව තව තව වැඩි වෙනවා. මේ සත්ත්වයින් තවත් දුකෙන් දුකටම යනවා. අසුර ලෝකයෙන් ප්‍රේත ලෝකයට, ප්‍රේත ලෝකයෙන් නිරයට වැටී කල්ප ගණන් දුක් විඳිනවා.

දැන් ඔබ සිතන්න. ඔබත් මහා සාගරය ජීවිකාව උදෙසා, විනෝදය උදෙසා, අල්ලාගත්, තෘෂ්ණාවෙන් උපාදානය කරගත් අයෙක් නම් මහා සාගරයේ ප්‍රාණඝාත අස්වැන්න ගොඩබිමට ගෙනෙන අයෙක් නම්, සතර අපායට අයත්වන අසුර ලෝකයේ ස්වභාවයත්, අසුර ලෝකයේ ප්‍රතිසන්ධියකට අවශ්‍ය කරන හේතුන් ගැනත් අවධානය යොමු කරන්න. අසුර ලෝකයේ ප්‍රතිසන්ධියක් ලැබුවොත් ඔබට කල්ප ගණනාවකින් ගොඩ ඒමට නොහැකි බව දකින්න. ලවණ රසයට ඇති අනවශ්‍ය ආසාවන්ගෙන් මිදෙන්න. බියකරු මහ මුහුදට ඇති තෘෂ්ණාවෙන් මිදෙන්න. එසේ නොවුණහොත් ඔබට, ඔබ කැමති වූ පරිදිම කල්ප ගණනක් ලුණු රසයත්, ලවණ ජලයත්, පිළී ගඳත්, ගැඹුරු නොගැඹුරු සයුරත්, එහි ඇති ධන නිධානත් ඔබේ කරගෙන ජීවත් වෙන්න පුළුවන්. ඔබට අයිති නැති, ඔබගේ වසඟයේ

පවත්වා ගැනීමට නොහැකි දෙයක් ඔබට දුක පිණිසම හේතුවන දෙයක් අවිද්‍යාව නිසා ඔබේ කරගෙන, සැපයක් කරගෙන දුක් විඳින්න ඔබට සිදුවේවි. මහා සාගරයට කැමති වන හැම මොහොතකම ඔබ අසුර ලෝකයට යෑමට මඟ එළිපෙහෙළි කරගන්නවා වීම නොවැලැක්විය හැකි කරුණකි. මහා සාගරයට ඇති කැමැත්තෙන්, තෘෂ්ණාවෙන් මිදී අසුර ලෝකයට යන මාර්ගය ඔබ වසා දමන්න. ලැබූ මනුෂ්‍ය ජීවිතය සතර අපායෙන් මුදවාගෙන ඔබත් ලොව්තුරු සුවය අත්විඳින්න.

මහා සාගරයේ ඇති බියකරු බව බියකරු බවක්ම ලෙසින් දකින්න. මහා සාගරයේ ඇති පාළුව, සෙවනක් නොමැති හිරු රශ්මිය, ලවණ ස්වභාවය, පිළිකුලක් සේම දකින්න. ඒවා ඔබේ කර නොගන්න. මහා සාගරය සත්ත්වයාට අකුසලයේ අස්වැන්න පමණක්ම උරුමකොට දෙන ඒ අකුසල් හේතුවෙන් අසුර ලෝකයේ දුකම උරුම කරදෙන 'මාර සාගරයක්' ලෙස දකින්නට ඔබ දක්ෂ වෙන්න. මහා සාගරයට ඇති කැමැත්තෙන් මිදී අසුර ලෝකයෙන් මිදෙන්න.

ප්‍රේත ලෝකයේ මනාලිය

තරුණියකගේ ජීවිතයේ සුන්දරම බලාපොරොත්තුව මොකක්ද කියල ඇසුවොත් දෙවරක් නොසිතාම ලැබෙන පිළිතුර තමයි විවාහය. තරුණියකගේ මනෝරාජ්‍යය තුළ හොඳ පවුල් පසුබිමක්, හොඳ මනාලයෙක්, ලොකු විවාහ උත්සවයක්, පෝරුව චාරිත්‍ර... මේවාට තිබෙන්නේ ලොකු කැමත්තක්. මෙවැනි සුන්දර බලාපොරොත්තු, ජීවිතය සමග බැඳුණු බලාපොරොත්තු, ජීවිතය ජීවත්කරපු බලාපොරොත්තු... විවාහය යනු ජීවිතයයි, ජීවිතය යනු විවාහයයි, විවාහය මගේ ආත්මයයි කියල තබාගෙන තිබෙන බලාපොරොත්තු බිඳුණු විටදි, දෙදරා ගිය විටදි, අහිමිවී ගිය විටදි, තවෙකෙකු විසින් බිඳ දැමුවිටදි අහිංසක යුවතියකගේ සිතේ ඇතිවෙන පීඩනය කොතෙක්ද? එම බලාපොරොත්තු අහිංසක යුවතියකගේ සිතේ ඇතිකොට එය විනාශකොට දැමූ විටදි, සුන්දරම සිහිනය මරාදැමූ විටදි, ඇය තුළ කුමන මනෝභාවයන් ඇතිවෙයිද? මෙවැනි මනෝභාවයන් තුළදි ඇය මිය ගියහොත්, දිවි නසාගතහොත්, මරා දැමුවහොත්, ඇයට පරලොවදි කුමක්වෙයිද? ඔබ සිතනවා ද ඇය තම ආත්මය කරගත්ත බලාපොරොත්තුව ඇයට අතහැරී සිත නිරුද්ධවෙයි කියල? ඇය ගොඩනැගූ සිහින මාළිගා, එකතු කළ රන්රිදී ආභරණ, තැන්පත් කරගත් වැටුප් මුදල්, තෝරාගත් මගුල් සාරි.... මේ සියල්ල උදෙසා ඒවා අරමුණු කොටගත් තෘෂ්ණාව, උපාදානය ඇයට අතහැරී සිත නිරුද්ධ වෙයි කියල? එය නොවන දෙයක්මයි. එහෙම නම් කුමක්ද සිද්ධවෙන්න පුලුවන්.

භික්ෂුවක් සමාධිය තුළ සිටින විට මෙවැනි දර්ශනයක් දැකගත හැකිවිය. මෙය ප්‍රේත ලෝකයේ ප්‍රේතියකගේ දර්ශනයකි. හැසිරීමේ රටාවකි. ඇය කර්ම විපාක ගෙවන දර්ශනයකි. තමන් අල්ලාගත් උපාදානයේ බලවත් බව නිසා ඇය විඳිනා දුකේ ස්වභාවයකි. ප්‍රේතිය වයස අවුරුදු විසි පහක පමණ තරුණියකි. ඇය සැරසී සිටියේ මඟුල් දවසට මනාලියක් පළඳින සුදු සාරියක් සහිත මඟුල් ඇඳුමකිනි. ඇය ඉතාමත් කලු පැහැති, කිසිදු ප්‍රසන්න භාවයක් නොපෙනෙන, ගුප්ත මුහුණක් සහිත මනාලියකි. ඇය මනාලියක්සේ හැඳ පැළඳගෙන ඇවිද්දත් ඇය ඇවිදින මළමිනියක් වගේය. මළමිනියක මුහුණේ ස්වභාවය ඇයට තිබිණි. මනුෂ්‍ය ලෝකයේදී තරුණියක් මිය ගියහම ඇයගේ සිරුර පෙට්ටියේ බහා තැන්පත් කරන්නේ ඇයව මනාලියක් සේ හැඩගන්වාය. එහෙත් එම දේහය දින දෙකක් පමණ ගතවෙන විට කළුපැහැ ගැන්වේ. ඉහත ප්‍රේත මනාලියගේ ස්වභාවයද එසේමය. ඇය මනාලියක් සේ සැරසී මල් පොකුරක්ද අතැතිව ප්‍රේත ලෝකයේ ඇවිදින්නීය. නමුත් ප්‍රේතියගේ කය සියුම් ස්වභාවයෙන් යුක්ත නිසා ඔබගේ මස් ඇසට නොපෙනෙයි. සමාධිමත් සිතට ඇයගේ සියුම් කය දර්ශනය වෙයි. භික්ෂුවට ඇය දර්ශනයවන මොහොතේ ඇය සිටියේ මනුෂ්‍ය ලෝකයේ මඟුල් ගෙදරක වැනි ස්වභාවයේ ස්ථානයකය. සමහරවිට එය හෝටලයක උත්සව ශාලාවක් වීමටද පුළුවන. එහෙත් එය ඉහළ ස්වභාවයේ මඟුල් උත්සවයකි. භික්ෂුවට හැඟී ගියේ ප්‍රේතිය තමාව කවුරුන් හෝ විවාහ කරගනීයයි විශ්වාසයෙන්, විවාහයට දැඩි කැමත්තෙන් ඇවිදින බවයි. ප්‍රේත මනාලියට විවාහවීමට දැඩි උවමනාවක් තිබෙන බව පෙනිණි. ඇය මඟුල් ශාලාවේ වාඩිවී සිටින අමුත්තන් අතර ඉඳගනිමින් ශාලාවේ ඇවිදිමින් සිටිනවා භික්ෂුවට දර්ශනය විය. ඇය හරිම අවාසනාවන්තියකි. මනුෂ්‍ය ලෝකයේදී තබාගත් විවාහය පිළිබඳ බලාපොරොත්තුව ප්‍රේත ලෝකයේදීද ඇයට අතහැරී නොමැත. භික්ෂුවට හඳුනාගැනීමට ලැබුණේ මේ ප්‍රේත මනාලිය අර විවාහ උත්සවයට ඇවිත් සිටි පිරිමින්ව තමන් සමඟ විවාහය සඳහා බලාපොරොත්තු වන බවයි. මෙය ප්‍රේතියගේ උපාදානය පිළිබඳ අභිංසකත්වය කියාපාන දුක්මුසු අවස්ථාවකි. ප්‍රේත ලෝකයේ සිටියද උපාදානයේ බලවත් බව නිසා හෝ ඇයගේ කර්ම විපාකය නිසා ඇය විවාහයට බලාපොරොත්තු වන්නේ මනුෂ්‍ය පුතෙක් වීමටද පුළුවන. මෙම කර්ම විපාකය ඇයට ලැබුණේ සමහරවිට අනුන්ගේ විවාහයක් කේලමක් කියා, බොරු කියා, වංචාකොට කඩාකප්පල් කිරීම නිසාද විය හැකිය. එසේත් නොමැතිනම් තමාගේ විවාහ සිහිනය තවෙකෙක් මරාදැමූ නිසාද විය හැකිය. කොටින්ම ඇයට

මෙම විරූපී ස්වභාවය ලැබුනේ මැරෙන මොහොතේදී මෙන්ම ජීවත්ව සිටියදී වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව වැඩීම නිසා බව නම් සක්සුදක් සේ පැහැදිලිය. තමා මියයන මොහොතේ තමාගේ විවාහය විනාශ කළ අය කෙරෙහි වෛරය ක්‍රෝධය ඇති කරගත් නිසා ඔහු කෙරෙහි වෛරයෙන් සියදිවි නසාගත් නිසා මියගිය පසු විරූපී ප්‍රේතියක් වුවාද විය හැකියි.

කෙසේ හෝ ඇය මනාලියක් වීමේ සිහිනය දරාගෙන මඟුල් සාරියකින් හැට්ටයකින් සැරසීගෙන සුදෝ සුදුවට මල් කලඹක් අතින් ගෙන තවමත් ප්‍රේත ලෝකයේ සරන්නීය. ප්‍රේත ලෝකයේ සරන මේ ප්‍රේත මනාලියට සහකරුවෙක් සොයන්නීය. ඇය කළු පැහැතිය, උස අඩි 5' 5'' පමණි, ආගම මිථ්‍යාදෘෂ්ටිකය, ජාතිය ප්‍රේත ජාතියයි, කුලය සතර අපායයි. ඔබ කැමති නම් ඇයට සහකරු වීමට ඇය කළා සේම අකුසල කර්ම සිදුකොට ප්‍රේත ලෝකයේදී ඇයව හමුවන්න. ඔබ ඇයට මඟුල් සාරි, මල් කලඹ සෙවිය යුතු නැත. මන්ද ඇය ඒවා හැඳ පැළඳගෙනම ක්ෂණික විවාහයක් බලාපොරොත්තුවෙන් ප්‍රේත ලෝකයේ සරන්නීය. මනුෂ්‍ය ලෝකයේ සිදු වුවාසේ නොව, විශ්වාසය අගේ කොට සලකයි. අවිද්‍යාවෙන් අන්ධ, කාමයෙන් බරිත මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයෙකු ඉහත යෝජනාවටද කැමති වුවහොත් භික්ෂුව පුදුම වන්නේ නැත. පුදුම වන්නේ මෙයට කිසිවෙකු කැමති නොවුනහොත්ය.

දැන් ඔබට පැහැදිලිද මනමාලියෝ ඉන්නෙ මනුෂ්‍ය ලෝකයේ විතරක් නොවේය කියලා? සුදු මඟුල් සාරියක් හැට්ටයක් ඇඳගෙන සුදු මල් කලඹක් අතැතිව ප්‍රේත ලෝකයේ සරන මේ මනාලිය මනුෂ්‍ය අපට කියන්නේ හොඳ පාඩමක්, දුර්ලභ පාඩමක්, ඇඟ කිළිපොලා යන පාඩමක්. මනුෂ්‍ය දියණියක් මඟුල් ඇඳුම අඳින්නේ ජීවිතයේදී එකම දවසයි. ඒත් ප්‍රේත ලෝකයේදී ඇය කල්ප ගණනක් මඟුල් ඇඳුම ඇඟලාගෙනම ඇයගේ කර්ම විපාකය නිසා සහකරුවෙක් නොමැතිව දුක් විඳිනවා. මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍ය දුවෙක්, පුතෙක් විවාහයක් හරි නොගියොත් විවාහය ප්‍රමාද වුණොත් අවුරුදු හැටක් ජීවත්වෙලා මැරිල යයි. ඒත් මේ ප්‍රේත මනාලියට තව කල්ප ගණනක් මඟුල් ඇඳුම දරාගෙනම මනමාලයෙක් සොයා යන්න සිද්ධ වේවි. එයාගේ කර්ම විපාකය නිසා එයාට කවදාකවත් මනමාලයෙක් ලැබෙන්නෙ නැහැ. මේ හේතුවෙන් ඇය තුළ වැඩෙන්නේ තව තව වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, රාගය, කාමයයි. මේවා දරුණු අකුසල් ධර්මයන්මයි. මෙන්න මේ අකුසල් නිසා ඇය තව තව විරූපීභාවයට පත්වෙමින්, ගැටෙමින් අවසානයේ නිරයේ ගිනිදළු මතටම වැටෙනවා. බලන්නකො අනුන් කළ දෙයක් නිසා

වෛරකරලා, ක්‍රෝධ කරලා, ඊර්ෂ්‍යා කරල අනුන් නිසා ප්‍රේත ලෝකයේ දුක් විඳිනා දියණිය. අනුන් බලාපොරොත්තු නැතිකළා කියල අනුන් ඔබේ සිහින බිඳ දැම්ම කියල ඔබ ඒ අයට වෛර කරන්න, ක්‍රෝධ කරන්න යන්න එපා. මොකද බලාපොරොත්තු ඔබට අයිති නැති නිසා. ඔබට අයිති නැති බලාපොරොත්තුවක්, ඔබේ වසඟයේ නොපවතින බලාපොරොත්තුවක් ඔබේ කරගෙන ඔබ ඇයි දුක් විඳින්නේ. බලාපොරොත්තු තමයි අපව ජීවත් කරවන්නේ. එක බලාපොරොත්තුවක් බිඳ වැටෙනකොට තව බලාපොරොත්තුවක් ඇතිවෙනවා. බලාපොරොත්තු තමයි ජීවිතය. අපි බලාපොරොත්තු පස්සේ දුවනවා, ඒවා අපේ කරගෙන. අපිට වැටහෙන්නේ නැහැ බලාපොරොත්තුව මිරිඟුවක් කියලා. බලාපොරොත්තුව කියන මිරිඟුව පස්සේ දුවලා අර ප්‍රේත මනාලියට වෙලා තිබෙන අලකලංචිය ඔබ දැක්කා නේද?

සති අන්ත පුවත්පත්වල සෑම භාෂාවකින්ම මංගල යෝජනා කී දාහක් පළවෙනවද, සෑම භාෂාවකින්ම. මිනිස්සු වන්දනාවේ ගිහිල්ල, රැකියාවට ගිහිල්ල, දුම්රියේ, බස් රථයේ මොන තරම් බැඳීම් ඇති කරගන්නවද? මේ බැඳීම්වල මොනතරම් වංචාසහගත දේවල් සැඟවිලා තිබෙනවාද? ප්‍රෝඩාවන්, මුළා කිරීම්, නොමග යැවීම් තිබෙනවාද? තමාගේ කැමැත්ත උදෙසා, තමාගේ සැප උදෙසා, තමාගේ පැවැත්ම උදෙසා මිනිසා මේ නොමඟ යැවීම් කරන්නේ හරිම කැමැත්තෙන්.

මේ මගේම සහෝදරියක්, මේ මගේම සහෝදරයෙක් කියන හැඟීම සමාජයට නැහැ. මේ හේතුව නිසාම සමාජය වෛරයෙන්, ක්‍රෝධයෙන් පිරිලා. කඳුළින් තෙමී ගිය විවාහ සහතිකය ගිණි අවුළුවාගෙන එම ගින්නෙන්ම තමුන් දැවී යන්නේ, මේ ක්‍රෝධය නිසාමයි. මඟුල් සාරිය බාල්කය මතට දමා, මඟුල් සාරියම ගෙලට තොණ්ඩුවක් වී මියයන්නේ මේ වෛරය, ක්‍රෝධය නිසාමයි. ඔබ බුද්ධිමත් වන්න. ඔබේ සතුට උදෙසා තවකෙක් වෛරයෙන් ක්‍රෝධයෙන් විනාශ නොකරන්න. අහිංසකයින්ගේ අහිංසකභාවය ඔබ ඔබේ අවිචාරමත් බවේ ගොදුරක් කර නොගන්න. අහිංසක ඔබද මෙවැනි අවිචාරමත් අයෙකුගෙන් පීඩාවට පත්වුවද, ඔහු නිසා ඔබ වෛර ක්‍රෝධය ඇතිකර නොගන්න. ඔබ එක දුකක් නිසා දුක් ගොඩක උරුමක්කාරයෙක්, උරුමක්කාරියෙක් නොවන්න. ඔබ තවම ප්‍රමාද නැහැ. ඔබට තවම වෙලාව තිබෙනවා නිවැරදි වෙන්න. නිවැරදි තැනට එන්න. එහෙත් අර ප්‍රේත ලෝකයේ ප්‍රේත මනමාලිය නම් දැන් ප්‍රමාදයි. ඇයට දැන් සරණක් නැහැ. අහිංසකාවිය දුකෙන් දුකටම යනවා. ඇයට

නිවැරදි වෙන්න දූන් කිසිම අවස්ථාවක් නැහැ. අනේ මේ අහිංසකාවිය මිය යන මොහොතේ සිතට ආපු වෛරය ක්‍රෝධය අනිත්‍යයයි කියලා දකගත්තා නම්, මේ සිත මගේ නොවේය කියලා දකගත්තා නම්, එවැනි දැනීමක් නොමැතිවූ නිසා මැරෙන මොහොතේ සියළු සත්ත්වයෝ සුවපත්වේවා, නිදුක්වේවා, නිරෝගී වේවා කියලා හිතුවානම්... එසේත් නැතිනම් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ බුදු ගුණයක් සිහියට නගා ගත්තා නම්, බුදු රුව සිහියට නගා ගත්තා නම්, එසේත් නැතිනම් කසාවත් චීවරයක් දමාගත් භික්ෂුවක් මතකයට නගාගත්තා නම් දෙවියනේ! ඔය ප්‍රේත දුකෙන් ඇය ගැලවිලා. හිමිවන්නේ සුගතියක්මයි. බලන්නකෝ සතියයි සිහියයි ඇයට නොතිබුණ නිසා, ඇය සද්ධර්මය ශ්‍රවණය නොකළ නිසා, බුදු ගුණ නොවැඩූ නිසා, මෛත්‍රිය නොවැඩූ නිසා ඇයගේ පිහිටට ආවේ වෛරයයි, ක්‍රෝධයයි. කැමැත්ත පිළිබඳ උපාදානයයි. යහපත අත හැරුණු කල අල්ලාගන්නේ අයහපතමයි.

භික්ෂුව මේ සටහන ලියන මොහොතේ වැඩ සිටින්නේ කැළෑබද ආරණ්‍යයක. එම ආරණ්‍යයේ දන්පිරිසට දානය උයන්නට ලොකු ශාලාවක් හදලා තිබෙනවා. අලුත් ශාලාවක්. සුදු තීන්ත ගාලා හරි වෙහෙස මහන්සිවෙලා දායකයෝ මෙය හදලා තිබෙන්නේ. සිමෙන්ති කොට්ටයක් කැලය මැද්දෙන් කිලෝමීටර දෙකක් පමණ ඔසවාගෙන ඇවිත් මේ අලුතින් හදපු ශාලාවේ සුදු බිත්ති සියල්ලේම දුරකථන අංක ලියලා. එම අංක යටින් පිරිමි ගැහැණු අයගේ නම ලියලා. මේ නම ධන (+) තව නමක් ලියලා, ගෙදර ලිපිනයත් ලියලා, වාහනයේ අංකයත් ලියලා, පිස්සන් කොටුවේ කාමරයකවත් මෙහෙම ලියලා නැතිව ඇති. මොනවද අපි මේ දාන උයන ශාලාවේ බිත්ති පුරා දකින්නේ. මනුෂ්‍යයාගේ කාමයේ ආශ්වාදය විඳින ස්වභාවය, මෙය විකෘතියක්. නිශ්චල නොවූ, තැන්පත් නොවූ, විසිරුණු සිතක කැඩපතක්. පිංවත් දරුවනේ ඔබලා තරුණ කාලයේදීම මේ මඟ එළිපෙහෙලි කර ගන්නේ යහපතට නම් නොවේ, අයහපතටමයි. අඟුරු කැබලිවලින් සුදු බිත්තියේ ඔබ මේ තබන සටහන්, මේ ප්‍රවේශය අනාගතයේදී ඔබව බලාපොරොත්තු කඩවීම නිසා වෛරයෙන් ක්‍රෝධයෙන් පිරී ගිය සිතකින් ප්‍රේත ලෝකයට වැටුන ප්‍රේත මනාලියට අත්වූ දුක්ඛිත ඉරණමටම පත් කරවනු ඇත. එහෙයින් ඔබ ප්‍රවේශම් වෙන්න. කාමය අනතුරු සහිතයි. කාම බලාපොරොත්තු බිඳ වැටෙන මොහොතේ ඒ හිස්තැන පුරවන්නේ වෛරය සහ ක්‍රෝධය විසින්මය. ඒවා කාමයේ ආදීනවයන්ය. කාමය උදෙසා ඔබේ බලාපොරොත්තු ඔබ අල්ලා ගත්තද, බිඳවැටුණද එහි ප්‍රතිඵලයය ක්‍රෝධයයි. වෛරයයි. එහෙයින් ඔබ කළ

යුත්තේ අවබෝධයෙන් අතහැරීමයි. ක්‍රමයෙන් ඒ අතහැරීම පුහුණුවීමයි. ජීවිතයට හුරුකරවීමයි. සතර අපායට නොවැටෙනවාය කියන විශ්වාසය ජීවිතයට පුරුදු කිරීමයි. වෛරයේ ක්‍රෝධයේ සිතුවිල්ල වෙනුවට මෛත්‍රී සිතිවිලි නිතර මෙනෙහි කිරීමයි. තම ප්‍රතිවාදියාගේ රුව වෙනුවට, තමා දුකට පත්කළ පුද්ගලයාගේ රුව වෙනුවට ඔබ ලොව්තුරා බුදු සමිඳුන්ගේ රුව ගුණ සිහි කිරීමයි. ධර්ම රත්නයේ, සංඝ රත්තනයේ අනන්ත වූ ගුණ සිහිකිරීමයි. මෙනෙහි කිරීමයි. සතර අපායේ දුක වෙනුවට, සුගතියක උපතක් ලබා ගැනීමට ඔබට ඔබ අනුකම්පා සහගත වීමයි. ඔබ මිස වෙන කව්රුන් ඔබට අනුකම්පා කරන්නද?

දැවෙන සමක් - නිවෙන මගක්

ඔබගේ සම කියන්නෙ මොන තරම් සුන්දර ලස්සන දෙයක්ද. සත්ත්වයා තුළ කාමයේ ආශ්වාදය උදෙසා ඉතා සංවේදී 'මෙවලමක්' සම. දේශගුණික කලාපයන් අනුව සමේ පැහැය වෙනස් වෙනවා. සමහරුන්ගේ සම සුදුයි, රතුපාටයි, කහ පාටයි, රෝස පාටයි, කළු පාටයි, තළෙළුයි. මේ විවිධ වර්ගයෙන් යුත් සම ප්‍රභාෂ්වරව පවතින්නේ තරුණ කාලයේදියි. අපි සම දකින්නේ සම හැටියටමයි. ඉන් එහා දැක්මක් අපට නැහැ. මගේ සම රතුවෙලා, ඉදිමිලා, මගේ සම කළු වෙලා, මගේ සම පැළිල, මගේ සමේ බිබිලි, තුවාල, අළුහම්, කබර දමලා, මගේ සම පිච්චිලා කියන වචන අපි නිතර භාවිතා කරනව. සම මගේ කියල විතරයි අපි දන්නෙ. කය නැමති ජරාව පිරවූ මාරයාගේ තෑගි පාර්සලය, අපේම කැමැත්ත මත සකස් කරගත් තෑගි පාර්සලය ලස්සනට හිත වශීවන ආකාරයට සිනිඳු සියුමැලි ලෙස පාර්සල් කර තිබෙන්නෙ සමෙන්. සමේ ඇතිවෙන ඉහත සඳහන් කළ බිබිලි, පැළීම් ... කියන්නෙ කිපීම් සහ උරණවීම්. ඇයි මේ උරණවෙන්නේ. කිපෙන්නේ. හේතූන් නිසා ඇතිවෙන්නාවූ ඵලයක් තමයි මේ උරණවීම්, කිපීම්. සම, තමන්ට එරෙහි ස්වභාවයන් හේතුවෙන් ප්‍රතික්‍රියා දක්වනවා. සම යනුවෙන් අප ආමන්ත්‍රණය කරන පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතූන් එකිනෙක ගැටෙනවා, කිපෙනවා. තද ස්වභාවය, දියර ස්වභාවය, උෂ්ණ ස්වභාවය, වායු ස්වභාවය ආදිය කිපෙන්නාගේ ස්වරූපය අනුව තුවාල, ගෙඩි ආදිය දියර වශයෙන්, උෂ්ණය වශයෙන්, වායුව වශයෙන් පිටට දමනවා.

ඔබේ ඔය ලස්සන සමට උණුවතුර වැටුනොත් සමට මොකද වෙන්නේ. සම රතු වෙනවා, සම පුපුරු දමනවා. මේවා තේජෝ ධාතුවෙ ක්‍රියාකාරිත්වය. සමෙන් දුම, රස්නය පිටවෙනවා. බුබුළු මතුවෙනවා. මේවා වායෝ ධාතුවේ ක්‍රියාකාරිත්වය. සමේ දිය බුබුළු තුවාල හටගන්නවා. මේවා පඨවි ධාතුවේ ක්‍රියාකාරිත්වය. දිය බුබුළුවල දිය පිරෙනවා. තුවාලවලින් සැරව ගලනවා. මේවා ආපෝ ධාතුවේ ක්‍රියාකාරිත්වය. ධාතුන් හතරම එකටමයි පවතින්නේ. නමුත් මෙහි වෙන් වශයෙන් දැක්වූවේ වැඩි ප්‍රතිශතයක් තිබෙන ධාතුව නිසා. දිය බුබුලෙ වැඩි ප්‍රතිශතයක් තිබෙන්නේ ආපෝ ධාතුව. බලන්න ඔබේ ලස්සන සමට උණුවතුර ටිකක් වැටුණු සැනින් සම ආකාර ගණනාවකින් ප්‍රතික්‍රියා දැක්වුවා. කාටද පුළුවන් මේ ප්‍රතික්‍රියාව ඇතිවෙන්න එපා කියල නවත්වන්න. කාටවත්ම බැහැ. ඇයි? සම මගේ නොවන නිසා. සතර මහා ධාතුන් නිරතුරුවම වෙනස්වන ස්වභාවයෙන් යුක්ත නිසා. සම නැමති රූපය පඨවි ධාතුව වැඩි ප්‍රතිශතයක් තිබෙන ස්වභාවයක්. උණුවතුර කියන්නෙ තේජෝ ධාතුව වැඩි ස්වභාවයක්. දෙදෙනා අතර සමබරතාවය නැතිවුන නිසා දෙදෙනා ගැටෙනවා. කිපෙනවා. මේ ගැටීම තමයි පිළිස්සුම වශයෙන් අපි දකින්නේ. සම කියන පඨවි ධාතුව ක්ෂණයකින් දිය බුබුලු, සැරව, තුවාල, බවට වෙනස් වුනා. එක විනාඩි දහයක් යන්නේ නැහැ මේ වෙනස සිද්ධවෙන්න. රූපය වෙනස් වීමේ වේගයයි අපි මේ දකින්නේ. දිය බුබුළු, සැරව, තුවාල බවට පත් වුයේ සමයි. නමුත් අපි කවුරුවත් දිය බුබුළට, සැරවට, තුවාලයට සම කියල කියන්නෙ නැහැ. අප ලෝකය අපට උගන්වපු සම්මුති නාමයනුයි භාවිතා කරන්නෙ. මේ සම්මුතිය නිසා යථාර්ථයෙන් අපේ අවබෝධය වසා දමනවා. අපිට හිතන්න ඉඩ දෙන්නෙ නැහැ. හිතන්න ප්‍රවේශයක් ලබාදෙන්නේ නැහැ. උණුවතුර වැටීමට පෙර තිබූ සුන්දර සම, උණුවතුර වැටුණු සැනින් දියබුබුළක්, තුවාලයක්, සැරව බවට වෙනස් වීමට බලපෑ වේගය මොකක්ද කියල හඳුනාගන්න. ඒ සම දිය බුබුළ, තුවාලය, සැරව වශයෙන් දකින්න ඔබේ ඔය මස් ඇහැ දන්නෙ නැහැ, දක්ෂ නැහැ.

ඔබ මේ දකින දෙය, රූපය අනිත්‍යභාවයට පත්වන වේගය වශයෙන්ම දකින්න. එය ඔබ සිතට පැහැදිලි කර දෙන්න. ඔබ මේ දකින්නේ ලෝකයෙන් නිවී යාමට අවශ්‍ය කමටහනක් බව අවබෝධ කරගන්න. මේ ඔබ දකින්නෙ උතුම් සම්බුද්ධ දේශනාව බව අවබෝධ කරගන්න.

අපි මේ දැක්කෙ රූපය ගැන. දැන් අපි බලමු වේදනාව ගැන හිතලා.

සම උණුවතුරෙන් පිළිස්සෙනකොට ඔබට මොනතරම් දැවිල්ලක් පිච්චීමක් දැනුණද? ඔබ හඬයි, ඔබ කෑගසයි, දුකට පත්වෙයි, වෛද්‍යවරුන් සොයාගෙන යයි, රෝහල් ගතවෙයි. දැන් ඔබ හිතන්න සමට උණුවතුර වැටීමට මොහතකට පෙර ඔබ මොනතරම් සතුටින්ද සැහැල්ලුවෙන්ද සිටියේ. ඔබ හිනාවෙලා, ඔබේ ලස්සන සම ගැන වශී වෙලා ඔබ සිටියේ. නමුත් උණු වතුර ටික සමට වැටෙන මොහොතේම, තප්පරයක් ගියේ නැහැ වේදනාවේ අනිත්‍යය භාවය ඔබට දැනුන. සතුට වෙනුවට දුක, සැහැල්ලුව වෙනුවට වේදනාව, පිච්චීම දැනුනා. බිය දැනුනා. තප්පරයක් ගියේ නැහැ. විඳීමේ අනිත්‍යභාවය ඔබට දැනුනා, ඔබ දැක්කා. එහෙත් මෙය විඳීමේ අනිත්‍යභාවය වශයෙන් අවබෝධකොට ගන්න ඔබ දක්ෂ වෙන්නෙ නැහැ. ඔබ දකින්නේ මේක මගේ කර්මය, මේක මගේ වෙලාව, නොසැලකිල්ල, වතුර උණුකල ලිපේ වරද, උණු වතුර භාජනයේ වරද... වැරදිකාරයෝ ගොඩයි. එයා ඊළඟට උත්සාහ ගන්නෙ උණු වතුරෙන්, ගින්දරෙන් ප්‍රවේසම් වන්න. වේදනාවේ අනිත්‍යභාවය මේකයි කියල දැකලා, සැප වේදනාවක සිට දුක් වේදනාවක් ඇතිවීමට ගතවන කාලය තප්පරයකටත් වඩා අඩුය යන්න අවබෝධය ලබන්නෙ නැහැ. මේ විඳීම උරුමවුයේ මගේ නොවන ශරීරයක් සමක් මගේ කරගැනීම නිසාය කියල දකින්න දක්ෂ නැහැ. ඔබගේ සම පිළිස්සීමට පෙරාතුව තිබූ සැප වේදනාව සමට උණුවතුර වැටීමෙන් පසුව ඔබට දැනුණ දැඩි දුක් වේදනාව, වේදනාවේ අනිත්‍යභාවය පිළිබඳව උතුම්ම කමටහනක් බව දකින්න ඔබ දක්ෂ නැහැ. මේ වේදනාව ඇතිවුනේ ස්පර්ශය නිසාය කියන හේතුව දකින්න ඔබ උත්සහ ගත්තේ නැහැ. ශරීරය කියන අධ්‍යාත්මික රූපයත්, උණුවතුර කියන බාහිර රූපයත්, විඥාණයත් ස්පර්ශය වීම නිසා මේ විඳීමේ ස්වභාවය සකස්වුනාය කියලා ඔබ දකින්නේ නැහැ.

ඔබගේ සමට උණුවතුර වැටුණ මොහොතේම දැනුණා වූ උණුවතුර වැටුණාය කියන හඳුනා ගැනීම තත්පරයකින් වෙනස්වී පිළිස්සුනාය කියන හඳුනා ගැනීම ඇතිවෙනවා. එය අනිත්‍යවී දැවිල්ලය කියන හඳුනා ගැනීම, එය අනිත්‍යවී සම රතුපාට වෙලාය කියන හඳුනා ගැනීම ඇතිවෙනවා. එය අනිත්‍ය වී සහ ඉදිමුණාය කියන හඳුනාගැනීම ඇතිවෙනවා. එය අනිත්‍යවී සමෙහි දිය බුබුළු දැම්මාය කියන හඳුනා ගැනීම ඇතිවෙනවා. එයද අනිත්‍යය වී පිළිස්සුන සමට ඇල්වතුර, ගිතෙල්, බටර්, බෙහෙත් දැම්මාය කියන හඳුනා ගැනීම ඇතිවෙනවා. ඒවාද අනිත්‍යභාවයට පත්වී වෛද්‍යවරයා, රෝහල, බෙහෙත්, තුවාල සැරව මේ ආදී වශයෙන් පැය කාලක් ඇතුළත මොන තරම් හඳුනා ගැනීම් ඇතිවී නැතිවී ගියාද? මේ ඇතිව,

නැතිව ගියේ හඳුනාගැනීම්. එක හඳුනා ගැනීමක් අනිත්‍ය වී යන්නේ තව හඳුනා ගැනීමක් සකස් කරවමින්. ඔබට වේලාවක් දෙන්නේ නැහැ අවබෝධයක් ලබන්නට. මේ තමයි හඳුනාගැනීම අනිත්‍යභාවයට පත්වන වේගය. ඉහත හඳුනාගැනීම් සියල්ලම පැය කාලක් ඇතුළත ඇතිවෙලා නැතිවෙලා ඉවරයි.

ඔන්න ඊළඟට චේතනාවන් ගැන බලමු. හඳුනාගැනීම කියන හේතුව නිසයි චේතනාව සකස් වෙන්නේ, 'අනේ මගේ සම පිච්චුනේ අහවලා නිසා. අහවලා තමයි වතුර මගේ සමට වත්කළේ. ඔහු ලිපේ ගල් වැරදි විදිහට තිබ්බ නිසයි, ඔහු උණු වතුර භාජනය අතහැරිය නිසයි මාව පිච්චුනේ. ඔහු උවමනාවෙන්මයි මාව පිච්චුවේ. ඔහුට තේ හදන්න, කෑම හදන්න, උපස්ථාන කරන්න ගිය නිසයි මාව පිච්චුනේ. මට උණුවතුර වැටුණේ. මම සනීපවෙලා එයාටත් හොඳ වැඩක් කරන්නම්...' මේ ආකාරයට ඔබ පිළිස්සුනාට පසුව චේතනාවන් ඇති කරගන්නවා. මේ චේතනාවල තිබෙන්නේ වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, පළිගැනීම..

එසේ නැතිනම් ඔබ මෙසේ සිතනවා. 'අනේ මම අනුන්ට උපස්ථානයක් කරන්න ගිහිල්ලා, අනුන්ට තේ හදන්න, කෑම හදන්න ගිහිල්ලා මාව පිළිස්සුනේ. මේක ලොකු පිනක්. මට දිව්‍ය මනුෂ්‍ය සැප ලැබෙයි. මට මිනිස්සු ප්‍රසංශා කරයි. මගේ ගුණවත් භාවයට මිනිස්සු ගරුකරයි. අනේ මම පිළිස්සුණු වේලාවේ මිනිස්සු මට ගොඩක් උදව් කළා. එයාලා ළඟ නොසිටියා නම් මීට වඩා මාව පිච්චෙනවා. අනේ මාව පිච්චුන වේලාවේ අහවල්ලු ගොඩක් මගේ දුක සැප බැලුවා. දෙවියන් මට උදව්කළා'

මේ විදිහේ කුසල් චේතනාවන් ඇති කරගන්නවා. මේ දෙආකාරයේම චේතනාවන්ගෙන් ඇතිවුනේ කුසල් සහ අකුසල් සංස්කාරයන්මයි. එසේ නොමැති නම් ඔබ ඔබේ සම පිළිස්සීම ගැන උපේක්ෂා සහගත වෙන්න පුළුවන්. 'මොනවා කරන්නද වෙච්චි දේ වුණා. දැන් ඉතින් පරෙස්සම් වෙන්න ඕනේ. උණු වතුරෙන් ගින්දරින් ඈත් වෙලා ඉන්න ඕනේ. පිච්චුණු තුවාල කැළල් ටික ඉක්මනින් හොඳ කර ගන්න ඕනේ. එසේ නොවුණහොත් සම කැතවේවී'

එයා උපේක්ෂාවෙන් යුතුව නැවත මෙවැනි දෙයක් නොවන්න ඇතිවූ තුවාල කැළල් නොමැතිව සනීප කරගන්න උත්සාහ ගන්නවා. තරමක් අඩු ස්වභාවයෙන් වුව, මේ උපේක්ෂාව තුළ තිබෙන්නේත් ඇලීම, ගැටීමමයි. එසේ නොමැතිව අවබෝධය නොවේ. එයා උත්සාහ ගන්නේ එයාගේ

කය උණුවතුරින් ආරක්‍ෂා කරගන්න. තුවාල කැළැල් මකාගන්න. මේ ආකාරයෙන් එකිනෙකට වෙනස්වූ චේතනාවන්ගෙන් ඔබ මොකක්ද දකින්නේ. චේතනාවේ අනිත්‍යභාවයයි. අනිත්‍යභාවයේ වේගයයි. මේ අනිත්‍යභාවයට පත්වන චේතනාවන් ඔබට කුසල් අකුසල් කර්ම රැස්කරලා දීලයි අනිත්‍යවී යන්නේ. මේ කර්ම විපාකයන් හේතුවෙන්, නැවත ප්‍රතිසන්ධියකට, ඉපදීමකට, නැවත නාම රූපයකට බැසගැනීමට අවශ්‍ය විඥාණයන් සකස් වෙනවා.

දැන් ඔබ බලන්නකෝ ඔබේ ඔය ලස්සන සමට උණුවතුර ටිකක් වැටුණු මොහොතේ තවත් ඉපදීමකට, කයකට බැස ගැනීමට අවශ්‍ය සාධක ඔබ සකස් කරගන්නවා. ඒ ඔබේ අදක්‍ෂභාවය නිසයි. නමුත් ඔබ ස්පර්ශය නිසා හටගත් වේදනාව අනිත්‍ය බව දුටුවා නම් මේ වේදනාව අනිත්‍ය බව හඳුනාගත්තා නම්, මේ නාම රූප දෙකෙන් මිදීමට, නිරෝධයට මාර්ගය සකස් කරගන්න ඔබට තිබුණා. ඒත් ඔබ ස්පර්ශය අනිත්‍යයි කියලා දකින්න දක්‍ෂ වුනේ නැහැ. මුලින්ම ශරීරයට ස්පර්ශ වුනේ උණු වතුර. ඊළඟට ඇල් ජලය. බටර්, ගිතෙල්, බිත්තර සාරු, කෝමාරිකා ඉස්ම, බටහිර ඖෂධ..... වෛද්‍යවරයාගේ, හෙද සොයුරියගේ, උපස්ථායකයාගේ දෑතේ ස්පර්ශය. මෙවැනි එකිනෙකට වෙන්වූ ස්පර්ශයන් නිසයි ඔබ සැප, දුක්, උපේක්‍ෂා විඳීම් ලැබුවේ. සැප, දුක්, උපේක්‍ෂා ලෙසින් විඳීම් වෙනස් වූයේ ස්පර්ශයේ අනිත්‍යභාවය නිසාමයි. වේදනාවද අනිත්‍ය භාවයට පත්වන නිසයි. සිනිඳු දෑතක් තුවාලය පිරිමදින විට දැනෙන සැප වේදනාව, එම සිනිඳු දෑතින්ම දැවිල්ල බෙහෙත් තුවාලයට දැමූවිට, දුක් වේදනාවක් බවට පත්වෙනවා. හේතුව ස්පර්ශයේ අනිත්‍යභාවයයි. මේ සටහන භික්‍ෂුවක් ලැබූ අත්දැකීමක් හේතුවෙනුයි සටහන් කළේ.

මේ සටහන තබන දිනයේ උදේ වරුවේ තමන්ගේ කළ්‍යාණ මිත්‍ර ස්වාමීන්වහන්සේ නමක් රෝගී වීම නිසා පැන් පහසු වීම පිණිස ලොකු භාජනයකට උණු වතුර සකස්කර තිබුණා. භාජනය ලොකුයි. එහි කට ළඟට පිරෙන්න උතුරන උණු පැන් පිරිලයි තිබුණේ. භික්‍ෂූන් වහන්සේලා දෙනමක් මේ උතුරන පැන් හැලිය ඒ භාජනයේ රවුම් ආධාරක දෙකෙන් ඔසවා, ගිලන් ස්වාමීන්වහන්සේ පැන් පහසුවෙන ඊට යාබද ස්ථානයකට ඔසවාගෙන ගියා. ඒ මොහොතේ එක් භික්‍ෂුවක් උණු පැන් හැලිය ඔසවාගෙන යමින් සිටි ආධාරකය (හැඬලය) ගැලවී, උණු පැන් හැලිය එම භික්‍ෂුවගේ දෙපා මතට හැලුනා. එම භික්‍ෂුව පිළිස්සීම නිසා ඉවත්වෙන්න උත්සාහ කළත්, උණුවතුර අවට විසිරී තිබීම නිසා නැවත නැවත පා තබන්ට සිද්ධ වුනේ උණු ජලය මතටමයි. ඒ වන විටත් බුබුළු නංවමින් උතුරමින් තිබූ උණු ජලය දෙපා මතට වැටෙද්දී කෙනෙකුට සිතන්න

පුළුවන් දෙපා දිය බුබුළුවලින් පිරේවී කියලා. ඒත් එක දිය බුබුළක්වත් ආවේ නැහැ. නමුත් දෙපා තද රතුපාට වුණා. ඉදිමුණා. ඒ වුනත් පසුවදා එයද නැතිව ගියා.

සැබැවින්ම මෙතැනදී ආශ්චර්යයක් සිද්ධවෙලා තියෙනවා. ඔය සිදුවීම වෙන්න විනාඩි දහයකට විතර පෙරාතුව එම භික්ෂුව දැකලා තිබෙනවා ඔය ස්ථානයේ දිව්‍ය ආලෝකයක් මතුවී නැතිව යනවා. මේ දිව්‍ය ආලෝක සංඥාව විසින් භික්ෂුවට පෙන්නුම් කරලා තිබෙන්නේ මේ ස්ථානයෙන් ඉවත්ව යන්න කියලා. ඒත් තමන් කළ්‍යාණ මිත්‍ර ස්වාමීන් වහන්සේ නමකට කරන උපස්ථානයක් නිසා, මෙතැනින් යායුතු යැයි තමන්ට ඇතිවූ සිත එම භික්ෂුව විසින් අනිත්‍ය වශයෙන් දැක අතහැරලා. ඇයි දන්නවද දෙවියන් ආලෝකයක් වශයෙන් පෙනී සිටියේ. පිංවත් දෙවියන් දුටුවා මෙම ස්ථානයේ දැඩි අමනුෂ්‍ය බලවේගයක් ක්‍රියාත්මකවන බව. ඒ ක්‍රියාත්මක වූ මාර අමනුෂ්‍ය බලවේගය තම කුරිරු අරමුණ කෙසේ හෝ ඉටුකර ගත්තා. ඒ උණු වතුර හැලියේ හැඬලය කඩා දමා බුබුලු දමන උණු වතුර භික්ෂුවගේ දෙපා මතට දැමීමෙන්. ඒ ක්ෂණයෙන් අර දිව්‍ය බලවේගය ක්‍රියාත්මකවී එම උතුරන උණුපැන් යම් පමණකට සිසිල් කළා සේම භික්ෂුවගේ අතහැරීමේ පුරුද්ද නිසා නටන උණු වතුරත් භික්ෂුවගේ සිත අත හැරීම ඉදිරියේ පරාජයට පත්වුනා. මේවා එම භික්ෂුවගේ ජයග්‍රහණයන් නොවේ. ධර්මයේ ජයග්‍රහණයක්. ධර්මයේ ආශ්චර්යයක්. හැබැයි ඉහතින් සටහන් කළේ භික්ෂුව අනුමාන කළ දෙයක්. එය වැරදි වෙන්නත් පුළුවන්. කෙසේ වෙතත් භික්ෂුවගේ දෙපා මතට උණු වතුර වැටී පිළිස්සුනේ තමන් සසර කළ කර්ම බලයක් නිසාමයි. ඒක නම් නොවෙන්න විදිහක් නැහැ. අපිම කරපු දෙයක් තමයි අපට සිද්ධවෙන්නේ. මෙවැනි සිද්ධිවලින් අපිට තව එක දෙයක් පැහැදිලි වෙනවා. කැළෑවල, ආරණ්‍යවල නිවන් මඟ වඩන, සැබෑ ලෙසම අත හැරීම තුළ ප්‍රතිපදාව වඩන භික්ෂූන්ගේ ආරක්ෂාව උදෙසා කැලෑ තුළදී මිථ්‍යාදෘෂ්ටික බලවේග සමග සම්‍යක්දෘෂ්ටික බලවේග ගැටෙනවා. සම්‍යක්දෘෂ්ටික බලවේග නිතරම පෙනී සිටින්නේ, මිථ්‍යාදෘෂ්ටික, පිනට අකමැති, කුරිරු බලවේග වලින් භික්ෂූන් ආරක්ෂා කරගැනීමටය. මේ කුරිරු බලවේග භික්ෂූන්ට යම් කරදරයක්, විපතක් අත්වැරැද්දක් වෙනතුරුම බලාගෙන සිටිනවා, ඒ අත්වැරැද්ද මහා විනාශයක් බවට පත්කරන්න. එහෙත් මේ පාපකාරී බලවේග, භික්ෂූන්ගේ සිත අත හැරීමේ ක්‍රියාවලිය ඉදිරියේ පසු නොබලාම පලායනවා. නැවත නැවත පීඩාකරනවා. අත හැරීමේ ක්‍රියාවලිය ඉදිරියේ සම්‍යක්දෘෂ්ටික බලවේග භික්ෂූන්ගේ ආරක්ෂාව උදෙසා නිරතුරුව පෙනී සිටිනවා. උපකාර කරනවා. දෙවියන්ද සතුටු වෙනවා. අනුමෝදන් වෙනවා.

නිල මැස්සයි ඔබයි දෙන්නම දැන් සමයි

"මම" කියන්නේ මොන තරම් පුංචි වචනයක්ද. එක වගේම අකුරු දෙකයි. මේ පුංචි අකුරු දෙක සත්ත්වයාට මොන තරම් දුක් ගොන්නක් උරුම කර දීමට හේතු වෙලා තියෙනවාද. ඔබ අදක්ෂ වුවහොත් තව කොතෙක් නම් දුක් මතුවට ඔබට උරුමකොට දේවිද?

මැරෙමින්, ඉපදෙමින්, කැඩෙමින්, බිඳෙමින්, ඇතිවෙමින්, නැතිවෙමින් මේ පැමිණි දුර කොපමණක්ද? මම කියන බීජයෙන් ලැබුණු අස්වැන්න තමයි ජාති, ජරා, ව්‍යාධි, මරණ. මම වගා කරමින් අස්වැන්න නෙලනවා අපි. මේක මහා අසත්පුරුෂ වගාවක්. අලාබදායක වගාවක්. ලැබෙන අස්වැන්න ජාති, ජරා, ව්‍යාධි, මරණමයි. ඒ කියන්නෙ දුකයි. 'මම' කියන කෙනාට, 'මගේ' කියන කෙනාට කවල, පොවල, පෝෂණය කරල, තාන්නමාන්න, කීර්ති ප්‍රශංසා ලබාදීලා. පුම්බල, ගරු ගාම්භීර කරල...

මේවායෙන් ලැබෙන අස්වැන්න තමයි දුක. මේ දුක ඔබ පසුපසින් සෙවනැල්ලක් සේ පන්නනකොට ඔන්න රෝහල්, ඖෂධ, ජ්‍යෝතිෂය, දේවාල, බෝධි පූජා හොයාගෙන අපි යනවා. ඉවරයක් නැහැ. මේවා දිනෙන් දින ජනප්‍රිය වෙනවා. පෝලිම් දිග වෙනවා. 'මම' කියන බර පොදිය හිස මත තබා ගෙන ඒ බර නිසාම හෙම්බත්ව, බරෙන් නිදහස් වෙන්න හදනවා. පුලුවන්ද එය ඔබට කරන්න? බැහැමයි. මොකද තමාමයි මේ බර පොදිය කරේ තබා ගෙන සිටින්නේ. තමාගේ කැමැත්තෙන්මයි. අනුන් බලෙන් පටවපු දෙයක් නොවේ. මම කැමැත්තෙන් මම පටවාගත්

බර පොදියයි. ගොනෙක් මත, බූරුවෙක් මත, බර පටවන්නේ අනුන්. ඒත් මේ බර ඔබම පටවාගත් බරක්. මගේ ඇස, කණ, දිව, නාසය, ශරීරය, මනස මගේ කරගත්තාට පසුව ඒවාට ස්පර්ශවන බාහිර රූපත් මගේ වෙනවාමයි. මට අයිති නැති අධ්‍යාත්මික ආයතන හය මගේ කරගත්තා වෙනුවට මට අයිති නැති බාහිර රූපත් මගේ කරගන්නවා. මගේ අම්මා, තාත්තා, බිරිඳ, දරුවා, සහෝදරයා, මගේ නිවස, රැකියාව, ව්‍යාපාරය, වාහනය.... මොන බරක්ද මේ ඔබ දරාගෙන සිටින්නේ. තව තවත් වැඩිකර ගන්න හදන්නේ.

මොකක්ද මේ ඇහැ කියන්නේ. ඔබ සිතාගෙන සිටින්නේ හරිම සුන්දර මටසිළුටු දෙයක්ය කියලා. ඒකයි ඔබ ඇස්දෙකට පණ වගේ ආදරය කරන්නේ. ඇස සැපයක් කොට දකින්නේ. ඇස නිසා සැප ලැබෙතැයි සිතන්නේ. මොකක්ද මේ ඇහැ? ඔබ මනසින් ඔබේ එක ඇසක්, ඔබේම ඇඟිලි තුඩුවලින් ගලවා උගුල්ලා ඔබේ දෑතට ගන්න. ඇසේ සුන්දරත්වය, අසිරිය ඔබට දූන් පෙනෙනවාද? මස් ගොඩක්, ලොඳ ගොඩක්, හරියට සුදු හම රඹුටන් මදයක් වගේ, රතුපාට මසට ඇලිලා ලේ නහර එල්ලෙනවා. ලේ, සැරව, කඳුලු ගලනවා. ඔබට මේ සුන්දර ඇස අතේ තබාගන්නවත් අප්‍රුලක් දනේවී. ඔබට ඔබේම ඇස දුගඳ බව වැටහේවී. පිළිකුළක් බවට පත්වේවී. මොහොතින් මොහොත ඔබේ අත්ල මත තිබෙන ඇස ගඳ ගහනවා. කුණු වෙනවා, නිල මැස්සන් වහනවා. ඔබට දූන් දූනෙන්න ඕනි, අනේ මේ ඇස නම් මගේ නොවේය කියලා. මේ ඇස තුළ මම නැහැය කියලා. මේ ඇස තුළ ආත්මයක් නැහැය කියලා. මේ ඇස අයිති කුණු මස්වලට, දුගඳට, නිල මැස්සන්ට, ලේ, නහර, කඳුළු, කබවලට කියල ඔබට තේරෙන්න ඕනේ. ලෝකයේ ජනප්‍රියම නළුවෙක් නිළියක් තමන්ගේ මනස්කාන්ත ඇස් දෙක නිසා ලෝකයේ කෝටි ප්‍රකෝටි ගණන් ප්‍රේක්ෂකයන් පිස්සු වට්ටනවා, කාමයෙන් රාගයෙන් මත්කරනවා. මේ ඇස් වලට වශී වුණු ප්‍රේක්ෂකයන් එක සතියකදී කෝටි ගණනක් මේ ඇස්වල රසය ලබන්න, ආශ්වාදය විඳින්න සිනමා ශාලාවලට, රූපවාහිනියට එකතු වෙනවා. ඒ සුරූපී නිළියකගේ, නළුවකුගේ ලස්සන ඇස්දෙකත් ඉහත ස්වභාවයමයි. ඒ සුන්දර පිංවත් නළුවෙක්, නිළියක් සංසාරික කුසලයක් මතුවෙලා තුණුරුවන් සරණ ගිහිල්ලා, ධර්මය අවබෝධ වෙලා, මා නිසා මගේ රූපය නිසා රාගයෙන්, කාමයෙන් අන්ධ භාවයට පත්වුණ ඇස් ඇති රසිකයන්ට මගේ රූපයේ සැබෑ ස්වභාවය ගැන දැනුවත් කරන්න අවශ්‍යයි කියලා, තමාට ප්‍රියකළ රසිකයන් කෝටි ගණනක් යම් ස්ථානයකට කැඳවලා, 'ඔබලා මේ තරම් කාලයක් රාගයෙන්, කාමයෙන්, ආදරයෙන් බැඳුණ මේ ඇස් දෙක

මගේ නොවෙයි, එයි සැබෑ සුන්දරත්වය දැන් ඔබලා දැකගන්න කියලා ඒ ඇස් දෙක තම ඇඟිලි තුඩුවලින් උගුල්ලා රසිකයන්ට දිගු කළොත් එකම රසිකයෙක්වත් ඔය මස් ගුලිය, ලොඳ ගුලිය, ලේ, නහර, කඳුලු, කබ ගුලිය තම අතට තබා දකින්නවත් කැමති වෙන්නේ නම් නැහැමයි. කුණුවෙන මස් ලොඳය තමයි අහවලාගේ ඇස් දෙක කියලා අපි ආදරය කළේ කියන හැඟීමෙන් තමන්ම ලැජ්ජාවට පත්වේවි. ඔබ ඔය එළවළු මාළු ගන්න වෙළඳ පොලේ තිබෙනවා හරක් මස් විකුණන මස් කඩ. හරක් මස් විකුණන විට එම මස් අයිති සතාගේ හිස මස් කඩේ ප්‍රදර්ශනයට තබා තිබෙනවා. වර්තමානයේ එය එසේ වෙනවාද කියන්න භික්ෂුව නිවැරදිවම දන්නේ නැහැ. ඒ මරණයට පත්කළ ගවයාගේ හිස කොටසේ තිබෙන ඇස් දෙක ඔබ බලන්න. එය මහා අනුවේදනීය දර්ශනයක්. ඇස විශාල වෙලා, කළු ඉංගිරියාව උඩ ගිහිල්ලා, ඇස ඉදිමිලා, කඳුලු පිරිලා, ඒ කඳුලු මිදිලා. ඔබ මේ සතාගේ ඇස් දෙක උගුල්ලා ඔබේ අතට ගත්තත්, අර සුන්දර පින්වත් නළුවාගේ, නිළියගේ ස්වභාවයමයි. වෙනස තිබෙන්නේ ලොකු කුඩා බව පමණකි. දැන් ඔබට තේරෙනවාද ඇස කියන්නේ කුමක්ද කියලා. මේ ඇස තදභාවයෙන්, දියර ස්වභාවයෙන්, වායු ස්වභාවයෙන්, උණුසුම් ස්වභාවයෙන් සෑදුණු රූපයක් පමණක්ම බවයි. තද ස්වභාවයෙන් තමයි මේ ඇස හැඩ ගන්වලා තිබෙන්නේ. දියර ස්වභාවයෙන් තමයි ඇසේ කාන්තිය, දීප්තිය ඇති කරලා තිබෙන්නේ. වායු ස්වභාවයෙන් තමයි ඇස පුම්බලා තබා තිබෙන්නේ. උණුසුම තමයි ඇස ප්‍රකෘතිමත්ව තබා තිබෙන්නේ. උණුසුම අනිත්‍ය භාවයට පත්වෙන මොහොතේම ඇස විකෘති වෙනවා, කුණු වෙනවා, නරක් වෙනවා, ලෙඩ වෙනවා, ඇසේ නගන එනවා, සුද එනවා, කබ කඳුළු එනවා, සැරව ලේ එනවා.

ඇස මැරි මැරී උපදින රූපයක්. එම රූපයේ ජාති, ජරා, ව්‍යාධි, මරණ තමයි ඉහත සඳහන් කළේ. මේවා දකිනවිට අපි කම්පා වෙනවා. දුක් වෙනවා. වෛද්‍යවරු සොයාගෙන යනවා. ඇයි? මේ ඇස් දෙකේ දුකින් මිදෙන්න. ඇස උපදින තාක්කල්ම ඔබට ඇසේ ඇතිවන ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මිදෙන්න බැහැ. ඇස කියන්නේ මස් ගොඩක්. ඒක කුණු වෙනවා. වැගිරෙනවා. ගඳ ගහනවා. එය මසේ ස්වභාවයයි. යමෙක් මසට ආදරය කරනවා නම් ඔහු කුණුවීමට, දුර්ගන්ධයට, වැගිරීමට කැමති වෙන්න ඕනේ. දැන් ඔබට තව තවත් වැටහෙන්න ඕනේ ඇස කියන්නේ මොකක්ද කියලා.

මස් ගොඩක්, ලේ නහර ගොඩක්. මෙහි හැඩගන්වන්න, පරෙස්සම් කරන්න, නලවන්න දෙයක් නැහැ. පඨවියේ සියුම් භාවය, වායෝ ධාතුවේ පිරුණු බව විසින් ආපෝ ධාතුවේ දිළිසෙන දිය ස්වභාවය විසින් තේජෝ ධාතුවේ උණුසුම, ප්‍රකෘතිමත්භාවය විසින් ලස්සනට හැඩගන්වලා දිගැටි, රවුම්, සියුම්ව ඉපදුනු රූපයක් ඇස.

මේ කුණු ඇස නිසා ඔබ මොනතරම් රූප මගේ කරගත්තාද? ඔබ විවාහක නම් ඔබ සිතන්න යම් දවසක ඔබ ඔය ඇසෙන් රූපයක් දැක්කා. ඔබම නිශ්චය කළා එය ලස්සනයි, සුන්දරයි කියලා. රූපය නිසා සකස්වුණු සිත් පරම්පරාව, 'එයා ලස්සනයි, එයා හැඩයි, එයා මට ගැලපෙනවා. එයා උසයි, කොණ්ඩෙ දිගයි.....' අන්න ඔබ ඒ රූපයට බැඳෙනවා. ඔබ ඒ රූපය අයිති කරගන්න කැමති වෙනවා. ඇස නිසා හටගන්නාවූ කැමැත්තට ඔබ ඇලෙනවා. තණ්හාවක් ඇතිකරගන්නවා. ඇයගේ රූපය මගේ කරගන්න හදනවා. දැන් මොකක්ද මේ මගේ කරගන්න හදන්නේ. ඇස නිසා හට ගත්තාවූ කැමැත්ත. දැන් ඇස කියන්නේ මොකක්ද? අර ඇඟිලි තුඩුවලින් උගුල්ලලා ඔබේ අත්ලට ගත් මස් ගුලියයි. ඒ ඇස නිසා ඔබ දැන් අයිතිකරගන්න යන්නේ කාවද? තවත් රූපයක්. ඒ කියන්නේ තවත් කුණුවෙන මස් ගොඩක්. ඇසේ ස්වභාවයත්, ඇස කැමතිවූ රූපයේ ස්වභාවයත් යන දෙකම කුණුවෙන මසට, කුණුවෙන ලෙයට, ජාති, ජරා, ව්‍යාධි, මරණවලට අයිති දෙයක්මයි. මෙහෙම දෙයක් තමයි ඔබ නැකත් බලලා, පෝරුවට නැගලා, දෑඟිලි බැඳලා, ජයමංගල ගාථා කියලා භාර ගන්නේ. මගේ කර ගන්නේ. මගේ කරගැනීමේ තෘෂ්ණාවේ බලවත් භාවය නිසා ඔබ සෑහීමකට පත්වුනේ නැහැ. ඉහත චාරිත්‍රවලින් පමණක් ඇය ඔබේ කරගැනීම ගැන. ඔබ තුළ බියක් ඇතිවුණා, ඇය ඔබට අහිමිවේය කියලා. ඇයව ඔබගෙන් කවුරුහරි උදුරගනී කියලා. ඇය ඔබව අතහැරලා යාවී කියලා. ඒ නිසා ඔබ ඇයව රජයේ ලියාපදිංචි පොතේ ලියලා, සාක්ෂිකාරයෝ දෙදෙනෙක් සමඟ අත්සන් කරලයි අරගෙන එන්නේ. ඇය අහිමිවේය කියන උපාදානයේ බලවත්කම නිසා ඇයගේ අයිතිය ශක්තිමත් කරන්න ඕනේ, නිත්‍යානුකූල කරගන්න ඕනේ, කව්රුහරි මෙයාව මගෙන් උදුරාගත්තොත් මට උසාවි ගිහින් හරි මෙයාව ලබාගන්න පුළුවන්. නීතිය ඉදිරියේ බැඳුණු නිසා මෙයා මාව දාලා යන්නේ නැහැ......

කොහොම බැඳීමක්ද බැඳගත්තේ, අල්ලාගත්තේ, උපාදානය කර ගත්තේ?

මස් ඇසක් නිසා, තවත් මස් ගොඩකට කරගත්ත බැඳීමක්......

ඇසේ කැමැත්ත නිසා තමන් තවත් බරක් කරට ගත්තා. මේ බර වැඩී කියලා, මේ ඇතිය කියලා සෑහිමකට පත්වෙනවාද? නැහැ. සෑහීමක් නැහැ. සංසාරයක් පුරාවට ගොන්නු වෙලා, බූරුවෝ වෙලා, අලි ඇතුන් වෙලා ඇද්ද බරත් සමග ගනිද්දී, ප්‍රේතයො, නිරිසතුන්, තිරිසන් සතුන් වෙලා වින්ද දුක් සමග ගනිද්දී, දෙවියෝ මනුෂ්‍යයො වෙලා මගේ කොටගත් රූප ජාති, ජරා, ව්‍යාධි, මරණ සමග ගනිද්දි, අනේ මේ සහේට ගත්ත බිරිඳ, සැමියා මොන බරක්ද කියලයි ඔබට දැනෙන්නෙ. මේ රූපය ඔබට තවත් සතර අපායක, මනුෂ්‍ය, දිව්‍ය ලෝකයක දුක සහ බර දැරීමට උරුමයක් සකස් කර දෙන කෙනෙක්ය කියල දකින්නෙ නැහැ. මේ අයට මේ බර මදි. මේ සැහැල්ලුව දරාගන්න බැහැ. සංසාරයේ ඇද්ද බර සමග සසඳන කොට ඕන්න දෙන්නාට හිතෙනවා අනේ අපේ ජීවිතේ කිසි පිරිච්ච බවක් නැහැ, පාළුයි වගේ. බලන්නකො අපේ ලොකු අක්කල, ලොකු අයියල දරුවො එක්ක කොච්චර සන්තෝෂයෙන්ද ඉන්නෙ කියලා. බර වැඩිවෙන වැඩිවෙන තරමටයි ඒගොල්ලෝ ජීවිතයේ පිරිච්ච බවක් දකින්නෙ. දැන් මේ ජීවිතයේ පිරිච්ච බවක් ඇති කරගන්න හදන්නේ. ඒ අය බරට කියන්නේ, දුකට කියන්නේ පිරුණු බව කියලා. බරක් දුකක් නැතිනම් පාළුයි කියලා. මොනතරම් සානුකම්පිත වචන පබැඳුම්ද. මේ මාරයාගේ ශබ්ද කෝෂයේ වචන හරිම සුන්දරයි. තාරුණ්‍යයේ හදවත් මේ වචනවලට හරිම ලෙන්ගතුයි. මේ වචන ලෝදියෙන් හින්දපු චතුමධුරක් වගෙයි. පැහැය, රසය, ගුණය සියල්ලම තිබෙනවා. හැබැයි අනුභව කළොත් පිච්චෙනවාමයි. දුකට පත්වෙනවාමයි. මේ පිච්චිල්ල සත්ත්වයාට නම් ගාණක් නැහැ. මොකද 'මම' හැදිලා තිබෙන්නේ තේජෝ ධාතුවක් උපයෝගී වීමෙන් නිසා. ඔය ගින්න, ඔය පිච්චීම ජීවිතයේම කොටසක්, සාමාජිකයෙක්. අනවබෝධය නිසා ගින්නත්, උණුසුමත් මගේ කර ගන්නවා. මවකගේ උණුසුම, පියකුගේ උණුසුම, බිරිඳගේ, සැමියාගේ උණුසුම, දරුවාගේ උණසුම, පෙම්වතාගේ, පෙම්වතියගේ උණුසුම යන මේ උණුසුමෙන් රත්වෙන්න 'මම' හරිම රුසියෙක්. රූපය නිර්මාණය වෙන්න දායකවුණ තේජෝ ධාතුව මගේ කර ගන්නවා. මගේ වසඟයේ පවත්වා ගත හැකි දෙයක් හැටියට ගන්නවා. දකින්නේ නැහැ, දන්නේ නැහැ මේ රූපයේ විඥාණය පහව ගියාට පස්සේ මේ 'මම' මළකඳක් වෙනවා කියලා. ඇතිවෙමින් නැතිවෙමින් ගලාගෙන පැමිණි රූපය 'මම' තුළ බැස ගත්තාවූ විඥාණය පහව යනකොට තේජෝ ධාතුව පහව යනවා. ඒ කියන්නේ උණුසුම නැතිවෙලා යනවා. පරිප්පු ව්‍යාංජනයක් රත් නොකළොත් පසුවදා උදයට එය පිළුණු වෙනවා වගේ රූපයෙන් තේජෝ ධාතුව තුනී වෙනකොට මේ රූපය කුණු වෙනවා, පිළුණු වෙනවා. උණුසුම

නැති නිසා. පඨවි, ආපෝ, වායෝ ධාතූන් අධි ක්‍රියාකාරිත්වයට පත්වෙනවා. වායෝ ධාතුව විසින් පඨවිය ඉදිමීමට පත්කරනවා. ආපෝ ධාතුව විසින් පඨවිය කුණු කරනවා. මොන හිරිකිතියක්ද, මොන අපුලක්ද?

මේ ගාම්භීර 'මම' කුණුවෙන, ඉදිමෙන, මළකුණ ඔබමයි. ඔබේ මව, පියා, සැමියා, බිරිඳ, දරුවා, පෙම්වතා, පෙම්වතියමයි.

හැබැයි උණුසුම දැන් නැහැ. තිබෙන්නේ සීතලක්, දුගඳක් පමණයි. ඔබ ඔහුගේ ඇයගේ උණුසුමට ප්‍රියකළා සේ දැන් එම මළ කුණේ සීතලට, දුගඳට ප්‍රියකරන, එය උපාදානය කරගත් පිරිසකුත් සිටිනවා. එම ස්වභාවයම මගේ කරගන්න පිරිසකුත් සිටිනවා. ඒ තමයි නිල මැස්සෝ. ඔබ උණුසුම් කය සැපයක් කරගත්තා. නිල මැස්සෝ ශීතල කය සැපයක් කරගෙන එයට ලොල් වෙනවා. ජීවත්ව සිටියදී ඔබ මගේ කරගත් මව, පියා, බිරිඳ, සැමියා, දරුවා, පෙම්වතා, පෙම්වතියගේ ඇස, කණ, නාසය, දිව, ශරීරය සැපයක් කරගත්තා සේම එම රූපය මළ කඳක් බවට පත්වුණ මොහොතේ ඒ ඇස, කණ, නාසය, දිව, ශරීරයම කබරයින්, නරියන් වැනි කුණු මසට ලොල් සතුන් තළු මර මරා, වමාර වමාරා රස බලනවා. සැපයක් කොට ගන්නවා. රූපය ඔබ නුවනින් දකින්න. ඔබ කර තිබෙන්නේ අර තිරිසන් සතුන් කළ දෙයම නේද?

තිරිසන් සතුන් කන මස් කැබැල්ලක් පාසා, හැපෙන මස් කට්ටක් පාසා, කුස පිරෙන මොහොතක් පාසා, දුගඳ හමන මස් කැබැල්ලක් පාසා පිනවූයේ, පිනවුනේ තිරිසන් සතාගේ ඇස, දිව, කන, ශරීරය, නාසයමයි. ඔහු හෝ ඇය ජීවත්ව සිටියදී ඔබත් කළේ ඔහුගෙන් හෝ ඇයගෙන් ඔය ටික පිනවීම පමණමයි. බලනකොට ජීව මසට ලොල්වූ ඔබත්, අර කුණු මසට ලොල්වූ තිරිසන් සතාත් අතර ඇති වෙනස කුමක්ද? දැන් අපි හිතන්න ඕනේ අපි අර තිරිසන් සතාගේ, මසට ලොල් වූ සතාගේ ස්වභාවයෙන් ඉදිරියට යන්න ඕනෙ කියාලා. තේජෝ ධාතුවෙන් උණුසුම් කරපු 'මම- මගේ' කියන මස අපි රස බලනවා. රූපය අපි රස බලනවා. ආපෝ ධාතුවෙන් සීතල කරපු මළකුණ තිරිසන් සතා රස බලනවා. වෙනස එපමණයි. රූපය අනිත්‍ය බව දකින්න. රූපය තුළ මම නැහැ කියලා දකින්න. ඇස නිසා දුකට පත් නොවන්න. ප්‍රඥාවේ ඇසෙන් ඔබ විඳින දුක දකින්න. ඇස නිසා, ආයතන හය නිසා ලෝකයේම බර ඔසවාගෙන යන අදක්ෂයෙක් නොවෙන්න. මෝහයේ සළුපිලිවලින් සුන්දර ලෙස ආවරණය කර ඇති ආයතන හය වගේම බාහිර රූපයනුත් නිරතුරුව ප්‍රඥාවෙන් නිරුවත් කර බලන්න. ලැජ්ජා වෙන්න එපා, බිය වෙන්න එපා. එහෙම වෙන්න නියත වශයෙන්ම ඔතන සත්වයෙක් පුද්ගලයෙක් නැහැමයි.

කුලියට ගත් එළිය කුමට

අපි කතාවට කියනවා, මනුෂ්‍යයා ආලෝකයට කැමතියි එහෙත් අඳුරට අකමැතියි කියලා. නමුත් ඒක එහෙම වෙන්න බැහැ. ආලෝකයට කැමති මනුෂ්‍යයා නිදි ඇඳට, නිදි පැදුරට ගියහම තම කැමැත්තෙන්ම විදුලි පහන් නිවාදමා අඳුර මගේ කර ගන්නවා. අඳුරට කැමති වෙනවා. ආලෝකය අනිත්‍ය භාවයට පත්වී, අඳුර ඇතිවෙනවා වගේම මිනිසා මේ ස්වභාවයන් දෙකටම ඇලෙන්නේ තම සිතුවිලිද අනිත්‍ය භාවයට පත්වන නිසා. ආලෝකයට කැමතිවූ සිත අනිත්‍ය භාවයට පත්වී, අඳුරට කැමතිවූ සිත ඇතිවෙනවා. කල්ප ගණන් අපි දිව්‍ය ලෝකවල, මනුෂ්‍ය ලෝකයේ, සතර අපායේ ආලෝකයත් අඳුරත් අතර දෝලනය වෙමින් ගලාගෙන පැමිණි ගමනක් මේක. මේ නිසා මේ දෙයාකාරයේ කැමැත්ත තවමත් අපට තිබෙනවා. නමුත් මනුෂ්‍යයා අඳුරට වඩා ආලෝකයට කැමතියි. ඒ නිසාමයි විදුලි බලාගාර, තාප බලාගාර ආදී බල ශක්ති මූලයන් සොයමින් ප්‍රවර්ධනය කරන්නේ. මේ ස්වභාවයන්ගෙන් මිනිසා ලබාගන්නා ආලෝකය මිනිසා කුලියට ගත් දෙයක්. තමා අඳුරින් මිදෙන්න, තෙල්වලින් ජලයෙන්, ගල් අඟුරුවලින් නිපදවූ ආලෝකය කුලියට, මිලට ගන්නවා. ඒ කියන්නේ තෙල්වලින්, ජලයෙන්, තාපයෙන්, ආලෝකය ලබාගැනීමට මිනිසා මහත් අභිමානයෙන් උදම් අනන තාක්ෂණයෙන් මිනිසාට හැකියාව ලැබුණත් ඔබ තවම දක්ෂ නැහැ තම සිත තුළින් ආලෝකය නිපදවාගෙන, ප්‍රඥාවේ ආලෝකයෙන් ලෝකය දකින්න. ඔබ ආලෝකය 'ආලෝකය' විදිහටත්, අඳුර 'අඳුර' හැටියටත් විදුලිය 'විදුලිය'

හැටියටත්, ජලය 'ජලය' හැටියටත් මිස හේතුඵල ධර්මතාවයන් අනුව මේවා දකින්න උත්සාහ ගන්නේ නැහැ. ජලය නැමැති ආපෝ ධාතුව උපයෝගී කර ගෙන, එහි ඇති පඨවි ධාතුවත්, වායෝ ධාතුවත් ආධාර කර ගෙන විදුලිය නැමැති තේජෝ ධාතුව නිපදවනවා. ආලෝකය වශයෙන් අපි දකින්නේ ජලය සහ විදුලිබලයේ අනිත්‍යතාවයයි. ඒ කියන්නේ රූපයේ අනිත්‍යතාවයයි. ගල් අඟුරු නැමැති පඨවි ධාතුව උපයෝගීකරගෙන එහි ඇති වායෝ සහ තේජෝ ධාතුව ආධාර කරගෙන විදුලිය නිපදවනවා. විදුලිය තුළින් ආලෝකය නිපදවනවා. ගල් අඟුරු තාපය, විදුලිය, ආලෝකය වශයෙන් අපි දක්කේ රූපයේ වෙනස්වීමයි. රූපය වෙනස්වීමේ ප්‍රවේගයයි. රූපය තුළ ඇති මස් ඇසට නොපෙනෙන සතර මහා ධාතුන්ගේ වේගවත් ක්‍රියාකාරීත්වයයි. වෙනස්වීමයි. මේ ක්‍රියාකාරීත්වය වෙනස්වීම ඔබ ඔබේ ජීවිතයට ගලපා ගන්න. මේ ශරීරය නැමැති රූපය, ක්‍රියාකාරීත්වයට පත්කරන සිත නැමැති ශක්ති විශේෂයෙන් ප්‍රභාශ්වර ප්‍රඥාවේ ආලෝකය උපදවා ගැනීමට උත්සාහවත් වන්න. ඔබ පිරිනිවී යනතෙක්ම අනිත්‍ය භාවයට පත්නොවන ප්‍රඥාවේ ආලෝකය ඇති කර ගැනීමට ඔබට තාප බලාගාර, විදුලි බලාගාර ගොඩනැගීමට අවශ්‍ය නොමැත. කෝටි ප්‍රකෝටි ගණන් ධනස්කන්ධය අවශ්‍ය නොමැත. සිමෙන්ති, ලෝහ, ගල් අඟුරු, ජලය, ඩීසල් ටොන් ගණනින් අවශ්‍ය නොමැත. ඉංජිනේරු උපාධි සහතිකයක් අවශ්‍ය නොමැත. වෝල්ට් 33000ට බිය විය යුතු නැත. අවශ්‍ය වන්නේ සිමෙන්ති, ගල් අඟුරු, ජලය ආදිය නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වන රූපයන් බව අවබෝධ කර ගැනීමයි. මේ සියළු රූපයන් එකිනෙකට වෙනස්වූ ප්‍රතිශතයෙන් යුත් සතර මහා ධාතුන්ගෙන් නිර්මාණයවූ ස්වභාවයන් බව අවබෝධ කර ගැනීමය. එවිට ඔබට මමය, මගේය, අනුන්ය, අනුන්ගේය යන සත්ත්ව පුද්ගල සංඥාවන් ඉවත්ව යනු ඇත. ඔබ තුළද, අනුන් තුළද සත්ත්වයෙක් පුද්ගලයෙක් නොමැති බව අවබෝධයෙන් දකිනවිට, රාගය ද්වේශය කුමක් නිසා පවතින්නද? කවුරුන් නිසා පවතින්නද? මෝහය විසින් සංසාරයක් පුරාවට කරන ලද මහා නොමඟ යැවීම අවසන් වුනු කල්හී, පහව යන්නේ අවිද්‍යාවේ අඳුරයි. අවිද්‍යාවේ අඳුර පහවීමත් සමඟ ඔබ ලබන නිදහස, සැහැල්ලුව, නිවීම මෙතෙක් ඔබ දරා සිටි රාග, ද්වේශ, මෝහ බර සැහැල්ලු වීමේ, නිරෝධය වීමේ නිදහසයි. සලකුණ කුදු නොතබා, රාග ද්වේශ මෝහ ඇතිවන සිත සමඟ නිරෝධයවී යන්නේ රූපයේ අනිත්‍යභාවය මිස සත්ත්ව පුද්ගල සංඥාවක් තමන් තුළ හටනොගන්නා නිසාමය. සතිය සහ සිහියෙන් යුතුව රූපය දෙස බැලීමේදී ඔබ අවබෝධයෙන් ලබන ප්‍රඥාවේ ආලෝකය අනිත්‍ය වන දෙයක් නම්

නොවේ. තමා පිරිනිවීයනතෙක්ම ප්‍රඥාවේ ආලෝකය ඔබේ ඇතිවන නැතිවන සිතේ ආලෝකය වනු ඇත. ලෝකයේ පවතින අනිත්‍යභාවයට පත් නොවන ප්‍රඥාවේ ආලෝකය ගැන මේ සටහන භික්ෂුව තැබුවේ එක් වනවාසී භික්ෂුවක් දුටු දර්ශනීය ආලෝක සංදර්ශනයක් ගැන ඔබව දැනුවත් කරන්නටය. ඒ තුළින් ඔබටත් මේ නිවන් මඟ වැඩීමට ශක්තිය, උනන්දුව ත්‍රිව්‍ර කිරීමටය. මේ ආලෝක සංදර්ශනය ප්‍රඥාවේ ආලෝකයක් නම් නොවේ. අනිත්‍යයට අයිති ආලෝක සංදර්ශනයකි. ප්‍රඥාවේ ආලෝකය වෙනුවෙන්, එයට උපහාර වශයෙන් දෙවියන් දක්වන්නට යෙදුණු අතිශය රමණීය ආලෝක පූජාවකි.

වේලාව එක්තරා හිමිදිරි උදෑසනක පහ පසුවී විනාඩි පහලොවක් පමණය. භික්ෂූන් වහන්සේ නමක් උතුරු ප්‍රදේශයට මුහුණලාගෙන තම කුටියේ සිට දාන ශාලාවට වඩිමින් සිටියහ. ක්ෂණයෙන් උතුරු දෙස ආකාසයෙන් සුදු පැහැති, කිරි පැහැති විශාල ආලෝක ධාරාවක් භික්ෂුව ඉදිරියට පැමිණ එම ආලෝක ගුලි ඇතිවෙමින් නැතිවෙමින් විනාඩි දෙක තුනක පමණ කාලයක් සංදර්ශනයක් පැවැත්වීය. මෙම ආලෝක සංදර්ශනය ඉහත භික්ෂුව මුල්වරට දුටුවකි. සියල්ල සිදු වූයේ ආකාශය තුළදීය. ආලෝක ගුලි වශයෙන්, රේඛා වශයෙන් ඉතා වේගවත් සංදර්ශන විලාසයක් භික්ෂුව දුටුවේය. මේ චමත්කාර, ආශ්චර්යය දෙස භික්ෂුව මොහොතක් නැවතී බලා සිටියදී සංදර්ශනය තවත් ප්‍රවේගකාරී විය. එවිට භික්ෂුව නියත වශයෙන්ම මෙය දෙවියන්ගේ ආලෝක සංදර්ශනයක් බව අවබෝධ කර ගෙන දෙවියන්ට කෘතගුණ දැක්වීම පිණිස අනිත්‍ය සංඥාව ගැන ධර්ම දේශනයක් ඉතා කෙටියෙන් කරන ලදි.

'මේ ආලෝකය අනිත්‍යයි. ඔය දිව්‍ය ශ්‍රීයත් අනිත්‍යයි. ඔය ඔබලා අත් විඳින දිව්‍ය සතුටත් අනිත්‍යයි. ඔය දිව්‍ය ඇස, කණ, නාසය, දිව, ශරීරය, මනස අනිත්‍යයි. ඔය ආශ්වාදයට ඇලෙන්න එපා. ඔබලාගේ ඔය අනිත්‍යවූ ආලෝකයෙන්, නිත්‍ය වූ ආලෝකයට පූජා පැවැත්වීම නෙවෙයි ඔබ කළ යුත්තේ. ඒ නිත්‍ය වූ ආලෝකයේ උරුමක්කරුවන් වීමයි'

ඔය අත්දැකීම එතැනින් අහවර වුනා. සියල්ල සිදුවී අවසන්වීමට විනාඩි තුනක් පමණ යන්න ඇති. දිව්‍ය ආලෝකය දෙවියාට ලැබෙන්නේ පින නිසා. ඔය පින අහවර වෙලා යද්දී ඔය ආලෝකය අහවර වෙලා යනවා. ඒ නිසා ඔබ ආලෝකයට ලොල් වෙන්න එපා. ආලෝකය කියන්නෙත් රූපයක්මයි. තේජෝ ධාතුවේ ප්‍රතිශතය වැඩි ආලෝකයේ ස්වභාවය අනිත්‍යයයි. පිං අහවර වෙලා දෙවියන්ගේ දිව්‍ය ආලෝකය අවසන්

වෙනකොට ඔය දෙවිවරුන් ද හඬනවා, ශෝක වෙනවා, දුක් වෙනවා. අනිත්‍යවූ ආලෝකයට ලොල් වීමෙන් දුක පමණයි උරුමවන්නේ. ඒ නිසා ඔබ සතර මහා ධාතුන්ගෙන් සැදි ආලෝකය, රූපයේ අනිත්‍ය බව දකිමින් අතහරින්න. ආලෝකයේ අනිත්‍යභාවය අඳුර බවත්, අඳුරේ අනිත්‍ය භාවය ආලෝකය බවත් දකිමින්, අඳුරත් ආලෝකයත් අත හරිමින් පිරිනිවී යන තෙක්ම නිත්‍යභාවයේ පවතින ප්‍රඥාවේ ආලෝකය ඔබ තුළ ඇති කර ගන්න. ප්‍රඥාවේ ආලෝකයෙන් ප්‍රභාශ්වර වූ සිතෙන් ලෝකය දෙස බලන්න. එවිට ඔබට නිරතුරුවම අනිත්‍යභාවයට පත්වන රූපයන් මිස සත්ත්වයෙක් පුද්ගලයෙක් හමු නොවනු ඇත. සත්ත්වයෙක් පුද්ගලයෙක් නොමැති කල, රාගය ද්වේශය කුමක් සඳහා, කා සඳහා පවතින්නද? ඒවා නිරෝධය වී යනු ඇත. රාග, ද්වේශ, මෝහයන්ගෙන් නිරුද්ධ වූ සිත හරියටම සුදු පිරුවටයක් සේමය. කිසිඳු කිලුටු බවක් නොමැති සුදු පිරුවටය නිරතුරුව ප්‍රභාශ්වරය. ආලෝකමත්ය. රාග ද්වේශ මෝහයන්ගෙන් නිරෝධය වූ සුදු පිරුවටයක් වැනි සිතක් නැවත කිලිටි වන ස්වභාවයේ නොපවතී. මන්ද කිලුටු වීමට නිත්‍යවූ, ස්ථිර වූ, 'මගේ' යැයි සිතක් නොමැති හෙයිනි. ඒ බව තමා අවබෝධයෙන් හඳුනාගත් බැවිනි. මා තුළ මම නැතැයි ප්‍රත්‍යක්‍ෂකොට දක්නා ලද හෙයිනි.

මේ ලොව පිරිසිඳුම තාක්‍ෂණයයි

තාක්ෂණයෙන් දියුණුවට පත්වූ ලෝකයා 'තාක්ෂණය නිසා ලෝකය විශ්ව ගම්මානයක්වී, ලෝකයේ පාලනය මිනිසා විසින් සිදු කරනවා' යන විශ්වාසයට පැමිණ ඇත. මේ මායාව තුළ ලෝකයා මොන තරම් මුලාවට පත්වී ඇතිදැයි යන්න ගැන ඔබට අවබෝධයක් ලබාගත හැක්කේ ධර්මය අවබෝධ කර ගැනීමෙන්මය. ලෝකයා සතුටුවන, ලෝකයා ජීවත්වන, ලෝකයා පාලනය කරන ඊනියා තාක්‍ෂණය, ක්‍රියාත්මක වන්නේ බල ශක්තිය මඟිනි. බල ශක්තිය හිඟවුණු දිනයක, බල ශක්තිය නැතිවුණු දිනයක තාක්‍ෂණයේ පිහිටෙන් ජීවත්වන ලෝකයා පත්වන්නේ මහා අර්බුධයකටය. තාක්‍ෂණය යනු අවිද්‍යාවයි. තාක්‍ෂණය යනු අස්වාභාවිකත්වයයි. එවන්වූ තාක්‍ෂණයෙන් පරිපූර්ණවන ලෝකය, අධ්‍යාත්මික වශයෙන් පිරිහීම ලෝක ස්වභාවයයි. තාක්‍ෂණයේ දියුණුව යනු අවිද්‍යාවේ දියුණුවයි. වර්තමානයේ ලෝකය දෙස බැලීමේදී අපි දකින්නේ අවිද්‍යාවෙන් ඉතිරීයන තාක්‍ෂණයෙන් දියුණු ලෝකයකි. ලෝකයේ ගුණාත්මක බව, දියුණුව මනින මිනුම් දණ්ඩ තාක්‍ෂණයයි. බල ශක්තිය නැතිවුණු දවසක ඇණහිටින තාක්‍ෂණයක්, ස්වාභාවික කාලගුණික දේශගුණික තත්ත්වයකදී ඇණහිටින තාක්‍ෂණයක්, දේවත්වයෙන් සලකන ඊනියා දියුණුවකින් මුලාවූ ලෝකයාට, ලොව්තුරු බුදුරජාණන්වහන්සේ මීට වසර දෙදහස් පන්සියයකට පෙර දේශනා කොට වදාළ ධර්මය විසින් අන්ධ භාවයේ වෙලීසිටින ඔවුන්ගේ ළදරු බව හෙළිකරවනු ලබයි. ලෝකය තාක්‍ෂණයෙන් පිරීයාම යනු සතර අපායද පිරීයාමයි. තාක්‍ෂණ අවිද්‍යාවෙන් මුලාවන සත්ත්වයා ගාල් කරන වෙබ් අඩවිය සතර අපායයි.

ලෝකයේ සැබෑ තාක්ෂණය දකින්න නම්, ස්පර්ශ කරන්න නම් ඔබ දැකිය යුත්තේ ලොව්තුරා ධර්මයයි. එය බල ශක්තිය නැතිවුන දිනයක අතරමං වන, අක්‍රියවන තාක්ෂණයක් නොවේ. පොඩ්ඩ වැරදුණු විට මහා විනාශයන් වන තාක්‍ෂණයක් නොවේ. අතුරු ආබාධ ඇතිවන තාක්‍ෂණයක් නොවේ. එය ඉතාම පිරිසිදු තාක්‍ෂණයයි.

ලෝකයේ තාක්‍ෂණයෙන් දියුණුම ආයතනය මොකද්ද කියා ඇසුවොත් ඔබ කියාවී ඇමරිකාවේ නාසා ආයතනය කියලා. නමුත් ඔබ වැරදියි. ලෝකයේ අවිද්‍යාවෙන් තොර, ස්වභාවිකත්වයෙන් පිරිපුන්, දියුණුම තාක්‍ෂණය තිබෙන්නේ නිවන් මඟ වඩන භික්‍ෂුව තුළය. අරිහත් උතුමන් තුළය. එම භික්‍ෂුව එම තාක්‍ෂණයේ උපරිම ඵලය, උපරිම සීමාව දකින්නේ නිවන් අවසාන මෙහෙයුමේදීය. ඒ තාක්‍ෂණ පාරාදීසයකි. සැබෑම විශ්ව ගම්මානය ඔබ දකින්නේ මෙහිදීය. මෙම තාක්‍ෂණය, බලශක්තියෙන් ක්‍රියාත්මක වන 'රූකඩ තාක්‍ෂණයක්' නොවේ. එය ක්‍රියාත්මක වන්නේ ඔබගේ නිර්වාණ ප්‍රඥාව මගිනි. මෙහිදී ඔබ දකින ලෝකය ඇමරිකාවේ නාසා ආයතනයට කල්ප ගණනාවක් සිය තාක්‍ෂණය දියුණු කරමින් ගියද දැකිය නොහැකිය. ඔවුන්ගේ ලෝකය ප්‍රාථමික ළදරු පන්තියකි. ඔබ නොදැනුවත්කම නිසා එහි සිරකරුවන්ව සිටියි.

නිවන් මඟ වඩන භික්‍ෂුව අවසන් නිවීමේ මෙහෙයුමේදී සඳ, අඟහරු හෝ වෙනත් ග්‍රහලෝක නොව, දිව්‍යලෝකයද, බ්‍රහ්ම ලෝකයද ඇතුළුව මුළු තුන් ලෝකයම දකිමින් අවබෝධය ලබයි. මේවාට බල ශක්තිය අවශ්‍ය නොවේ. නිවන් මඟ වඩනා භික්‍ෂුවට තම සමාධිය උපරිම මට්ටමකදී කිසිදු බලශක්තියකින් තොරව මහා ඝණ අන්ධකාර රාත්‍රියකදී තම කුටිය ආලෝකමත්කර දැකිය හැකිය. නිවන් මඟ අවසාන මෙහෙයුමේදී ඔබට ඔබගේම ප්‍රඥාව විසින්, ඔබ පැමිණි සංසාර ගමනේ ඈත දුරක් දක්වා පෙන්වනු ඇත. මෙය හරියටම රූපවාහිනිය ඉදිරිපිට රූප දකිනවා සේය. එකක් පසුපස එකක් පැමිණේ. ඔබට ඇත්තේ දකින රූප ඔස්සේ සංසාරයේ බය දැකීම පමණකි. සංසාරයේ ස්වභාවය දැකීම පමණකි. එතැනදී දිව්‍ය ලෝකවල ඉපිද ඔබ විඳින ලද සැප සම්පත් ඔබ දකිනු ඇත. ප්‍රේත ලෝකවල ඉපිද සෙම් සොටු රස කර කර කමින් ගත කළ ස්වභාවයන් ඔබ දකිනු ඇත. මනුෂ්‍ය ලෝකයේ ඉපිද ඔබ විඳි කාම සම්පත්ද, දුක් වේදනාවන් ද ඔබ දකිනු ඇත. ඔබ යුද්ධයෙන්, සතුරන්ගෙන් මැරුම් කනවා, වේදනා විඳිනවා, අබ්බගාතයන් වනවා, අන්ධයෙක් බිහිරි පුද්ගලයෙක් මෙන්ම අංගවිකලව ගතකළ ජීවිත පෙනෙනු ඇත. තිරිසන් ලෝකවල ඉපිද

හරකුන්, ඌරන්, කුකුළන්, එළුවන්, මත්ස්‍යයින් ලෙස අනුන්ගේ අහරකට ඔබව මරාගෙන කනවා ඔබ දකිනු ඇත. මරණ වේදනාවෙන් ඔබ ලතෝනි දෙනවා ඔබට පෙනෙණු ඇත. මෙලෙස සංසාරයේ භය, සංසාරයේ දුර, සංසාරයේ ගැඹුර සිනමාපටයක් ඔස්සේ මෙන් ඔබට දර්ශනය වනු ඇත.

මේවා ඔබට පහළවන ඥාණයන්ය. ඔබට මේ ඥාණයන් පහළ වන්නේ, අවබෝධ වන්නේ ජීවිතයේ එක් අවස්ථාවක පමණකි. ඉන් පසුව ඔබට එම ඥාණය ආවර්ජනය කළ හැක. එනම් නැවත නැවත මෙනෙහි කළ හැක. මන්ද ඔබ එම සසර ස්වභාවය අවබෝධකර ඇති නිසාය. බලන්න, ලොව්තුරා බුදු සමිඳුන් දේශනා කළ තාක්‍ෂණය. එකම එක බල ශක්තියක්වත් නොමැතිව, එකම එක බොත්තමක්වත් තද නොකොට, කැමරා ශිල්පීන් ශබ්දාගාර නොමැතිව, කල්ප ගණනක් ඈත සසර ඔබට දකින්න පුළුවන්. ඒත් බලන්න අපි මොනතරම් දුර්වලද කියලා. මෙවැනි උතුම් ධර්මයක් තියාගෙන අපි ධර්මය ඉගෙන ගන්න වෙබ් අඩවියේ පිටු පෙරලනවා. ධර්මය සුරකින්න තාක්‍ෂණයේ පිහිට සොයනවා. ලොකුම අවාසනාව, ධර්මය පිළිගැනීමට, තාක්‍ෂණය සමඟ ගලපා එමගින් ධර්මය සනාථ කිරීමට යෑමයි. අවිද්‍යාවක මහත......

නවීන තාක්‍ෂණය මිනිසාගේ ආයු කාලය දීර්ඝ කර ගැනීමට, සෞඛ්‍ය තත්ත්වය නැංවීමට, අධ්‍යාපනය ගුණාත්මක භාවයට පත් කිරීමට උපකාරවී ඇති බව ඔබට සිතෙන්න පුළුවන්. මෙම භික්‍ෂුවද එය අනුමත කරනවා. එහෙත් ඔබ තාක්‍ෂණික ලෝකයේ වැඩිපුර පැයක් ජීවත් වෙනවා කියන්නේ, වැඩිපුර පැයක් දුක් විඳිනවා කියන එකයි. ඔබ වැඩිදුර යමක් ඉගෙන ගන්නවා කියන්නේ, වැඩිපුර අවිද්‍යාව ඉගෙන ගන්නවා කියන එකයි. ඔබ මොන ආගමකට අයත් වුවද හිතට එකඟව දකින්න. ඔබව ලෙඩ කරන රෝග කාරකයත්, ඔබේ ලෙඩේ සුව කරන ඖෂධයත්, ඔබව මරා දමන මරුවාත් යන තුන්දෙනාම නවීන තාක්‍ෂණයයි. ඔබ සැබෑ තාක්‍ෂණය හඳුනාගෙන රෝගයත්, රෝගකාරකයත්, මරුවාත් යන තිදෙනාම පරාජයකර ලොව්තුරා තාක්‍ෂණයේ සැබෑ හිමිකරුවෙක් වන්න. බල ශක්තියෙන් තොරව ලෝකය දිනන්න. දකින්න.

ලෝකය තාක්‍ෂණික අතින් දියුණු වෙන්න දියුණු වෙන්න ලෝකය අධ්‍යාත්මික අතින් පිරිහෙනවා. අධ්‍යාත්මික අතින් පිරිහෙන ලෝකය විසින් ලොව ස්වභාවය, ස්වභාවධර්මය තමන් යටතට, තමන්ගේ පාලනය යටතට ගන්න හදනවා. මේ තරගයෙන් කවදාහරි දවසක ලෝකයා අන්ත පරාජයකට පත් වෙනවා. එම පරාජය ලෝකයා ලබන්නේ මහා

විනාශයකුත් සමඟමයි. එම මහා විනාශය වන තෙක් නිරතුරුවම අතුරු විනාශයන් ලෝකයේ සිදුවනවා. ලෝකයේ ස්වභාවය වෙනස් කළහැකි ජගතෙක් මෙතෙක් තුන් ලෝකයේම පහළවී නැහැ. අනාගතයේදිත් එය එසේමයි. අවිද්‍යාවෙන් පෙළෙන සත්ත්වයා සිතනවා ලෝකයේ ස්වභාවය තමන්ට වෙනස් කළ හැකිය, පාලනය කළ හැකිය කියලා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලාටවත් බැහැ ලෝකයේ ස්වභාවය වෙනස් කරන්න. උන්වහන්සේලාට පුළුවන් ලෝකයේ ස්වභාවය අවබෝධයෙන් හඳුනාගෙන ලෝකයෙන් එතෙරවන්නයි. පාලනය නොකළහැකි ලෝකයේ ස්වභාවය පාලනය කළ හැකි තම සිතෙන් අවබෝධ කර ගන්නයි. කුමක්ද උන්වහන්සේලා අවබෝධ කර ගත්තේ?

ආයාසයක් ගෙන ලෝකයේ වෙනස්කළ යුතු කිසිම දෙයක් නොමැති බවයි. මන්ද නිරන්තරයෙන්ම, ආයාසයකින් තොරවම ලෝකය වෙනස්වන හෙයිනි. මහ පොළොවද, අවකාශයද, අභ්‍යාවකාශයද ඔබට ජය ගත හැක්කේ ඒවා වෙනස් කිරීමෙන් නොව, නිරතුරුවම ඒවා වෙනස්වන බව අවබෝධ කර ගැනීමෙන්ය. ලෝකයේ ස්වභාවය වෙනස් කිරීමට යන්නාට හමුවනුයේ අවිද්‍යාවය. ලෝකය නිරතුරුවම වෙනස්වන ස්වභාවයෙන් යුක්ත බව අවබෝධයෙන් දකින්නාට හමුවනුයේ විද්‍යාවය.

ලෝකයේ සැබෑම විද්‍යාඥයා ලොව්තුරා බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේගේ සැබෑ ශ්‍රාවක පුතුනුවන්ය. උන්වහන්සේලා මොන තරම් තාක්‍ෂණයෙන් දියුණුද කියනවා නම්, උන්වහන්සේලාට ඇස් පියාගත් සැනින් මුළු ලෝකයම නිරුද්ධ කොට දැකිය හැකිය. විශ්වය යනු මහා වේගයකට හසුවුන හිස් අවකාශයක් පමණක් බව උන්වහන්සේලා දනියි. මෙම වේගය මොන තරම් ප්‍රවේගකාරීද කියනවා නම්, එම වේගය තුළ දකින්නේ හිස් බව පමණක්මය. ඒ හිස් බව තුළ අයිති කර ගැනීමට, වෙනස් කිරීමට, දියුණු කිරීමට, සංවර්ධනය කිරීමට, අලුතින් සොයා ගැනීමට කිසිවක්ම නැත. තාක්‍ෂණයෙන් ලෝකය ජයගන්නට වෙර දරන ලෝකයාද, එම වේගයේ රූකඩ පමණක්මය. ලොව ප්‍රවේග කාරීම වේගය රූපය අනිත්‍යභාවයට පත්වන වේගයයි. එය අවිද්‍යාව සොයායන විද්‍යාඥයින්ට දැකිය නොහැක්කකි. එය දැකිය හැක්කේ විද්‍යාව සොයාගිය බුදු පුතුන්ට පමණක්මය. විද්‍යාඥයන්ද බුදු පුතකු වීමට දක්‍ෂ වුවහොත් ඔවුන්ටද මේ සැබෑ විද්‍යාවේ හිමිකරුවන් විය හැකිය. මෙය කාගේවත් බූදලයක් නොවේ. මේ ලෝකයේ ස්වභාවයයි. ඔබටද මටද එහි හිමිකරුවන් විය හැකිය. ලොව්තුරා බුදු රජාණන්වහන්සේ අප කෙරෙහි

අනුකම්පාවෙන්, මහා කරුණාවෙන් මේ මඟ හෙළිකළ ශාස්තෘන් වහන්සේය. තුන් සිවුරත් පාත්‍රයත් දරමින්, කැළයේ හුදෙකලා කුටියක, ආරණ්‍යයක වැඩ සිටින බුදු පුතුන් ලෝකය විනිවිද දකින, ලෝකය කම්පා කරවන, ලෝකයට නොගැටෙන ලෝකය ඉක්මවා ගිය සැබෑම විද්‍යාඥයන්ය. බල ශක්තියෙන් තොරව ලෝකය දකින උතුමන්ය. උන් වහන්සේලා සතියෙන් සිහියෙන් යුතුව ස්වභාවධර්මය දෙස ප්‍රඥාවේ ඇසින් බලමින් ධර්ම විනය දෙක ආරක්‍ෂා කර ගනිමින් අවබෝධය ලබන උතුමන්ය. මේවා හේතු ඵල ධර්මයන්ය. සතිය සිහිය හේතුවෙන් විනය නැමැති ඵලයද, ස්වභාවධර්මයේ යථා ස්වභාවය මෙන්ම එහි අනිත්‍ය බවද දැකීමෙන් ධර්මය නැමැති ඵලයද ඔබට අවබෝධවනු ඇත. සතිය සිහිය නැතිවීමෙන් අවිචාරයද, ස්වභාව ධර්මය නිත්‍යභාවයෙන් ගතහොත් අධර්මයද යන ඵලයන් ඔබට ලැබෙනු ඇත. ඔබේ දක්‍ෂතාවය මත කැමති මාවතක් තෝරා ගැනීමට ඔබට නිදහස ඇත.

අනේ ඔබ එවන් පාලකයකු වේ නම්...

පාලකයෙක් වෙන්න අපි මොන තරම් කැමතිද? පංති කාමරයක වේවා, වැඩබිමක, ආයතනයක, පන්සලක, ගමක, නගරයක, රටක පාලකයා, නායකයා වෙන්න අකමැති කෙනෙක් නොමැත. ඔබ ඔබෙන් අහල බලන්නකෝ නායකයෙක් වෙන්න ඔබ අකමැතිද කියලා. ඔබ දැනටමත් නායකයෙක් වෙන්න පුළුවන්. මිනිසා තරග කරන්නේද, සටන් වදින්නේද, අනුනට කැපිලි කෙටිලි දමන්නේද නායකත්වයට පාර සකස් කර ගැනීමටය. නැතිනම් නායකත්වය ආරක්‍ෂා කරගැනීමටය.

වෛරය, ක්‍රෝධය, සැකය නායකත්වය සොයා යන ගමනේ අතුරු ඵලයක්ය. නායකත්වය සෙවීම මිනිසාට පමණක් උරුම දෙයක් නොවේ. සෑම සත්ත්වයෙකුටම පොදුය. සත්ත්වයා මහා අකුසල් ප්‍රමාණයක් රැස් කරගන්නේ මේ නායකත්වයට ඇති ගිජුභාවය නිසාය. මෙවැනි අකුසල් රැස්කරමින් ඔබ මේ පාලනය කිරීමට යන්නේ කවුරුන්වද? අනුන්මය. අනුන්ව පාලනය කිරීමට යන ඔබ මොහොතක්වත් සිතුවාද තමාට තමාවත් පාලනය කර ගැනීමට නොහැකි ලෝකයක තමාට අනුන්ව පාලනය කිරීමට නොහැකි බව. කවුද ඔබට මේ අවබෝධය ලැබීම වලක්වන්නේ. තණ්හාවයි. අනන්ත අප්‍රමාණ අකුසල් සිදු කරගනිමින්, විවිධ සටකපට උපක්‍රම යොදමින්, මුසා බස් දොඩවමින්, නැතිගුණ පෙන්වමින් ඔබද පාලනය මුවහත් කරගන්නවා.

බලය උදෙසා මොනතරම් ගහ මරා ගන්නවාද, පාවා දීම් කරනවාද, කුළල් කා ගන්නවාද, අනුනට මඩ ගසනවාද? බලයට ඇති කෑදරකම, ගිජු බව නිසාම තළු මරමින් ඉහත චර්යාවන් සිදු කිරීම බලය ලබා ගැනීමට කළ යුතු චාරිත්‍රයක් බවට පත්වෙලා. මේ හැම දෙයම මේ අය සතුටින්මයි කරන්නේ. තිබෙන සැප ආරක්ෂා කරගන්න, ඇති සැප වැඩිකරගන්න, නැති සැප ඇතිකර ගන්න ලෝකය පස්සෙ දුවනවා. දුක් විඳිමින් සැප සොයනවා. වර්තමානයේ සොයන සැප ලැබිලා නැහැ. ඒ නිසා අනාගතය තුළ සොයනවා. ඔවුන් දන්නෙ නැහැ අනාගතය කියල කියන්නෙ වර්තමානයටමයි කියලා. වර්තමානයමයි අතීතය වූවේත් කියලා. මේ අයට හති දැනෙන්නෙ නැහැ. විඩාවක්, නිදිමතක් දැනෙන්නෙ නැහැ. සැප සෙවීමට, ආරක්ෂා කරගැනීමට, වැඩිකර ගැනීමට ඇති තණ්හාව නිසා.

තණ්හාව කියන්නේ හොඳ දක්ෂ මැහුම්කාරියක්. ඇය විසිහතර පැයේම ඉඳිකටුවයි, නූලයි අත තබාගෙනයි සිටිනුයේ. ඉන්ද්‍රියයන්ට ඵස්සය වන හැම කැමැත්තක්ම තද මැස්මකින් මසන්න. දක්ෂ මැහුම්කාරියගේ මේ වෙලීම කල්ප ගණනාවකට කැඩෙන්නේ නැහැ. කැමැත්තෙන්ම සසර බන්ධනවලට කොටු වෙන සත්ත්වයාට, මේ තණ්හාවේ මැහුම්කාරිය අත දිග හැර උදව් කරනවා. කුමක් සඳහාද? ඔබව භවය සමඟ බන්ධන්න, උපාදානය කරවන්න. අපිට හිතෙනවා ලෝකයේ දක්ෂම මැහුම් මහන දරුවෝ ඉන්නේ කටුනායක පැත්තේ කියලා. ඒත් ඒක මුලාවක්. ඒ අය මහන මැහුම් අවුරුද්දකින්, දෙකකින් නැතිනම් පහකින් දිරලා යනවා. ගැලවිලා යනවා. ඒත් තණ්හාවේ මැහුම්කාරිය මහන මැහුම, ගසන වෙළුම කල්ප ගණනාවකට කැඩෙන්නේ නැහැ. ඇයට විඩාවක්, නිදිමතක්, වෙහෙසක් නැහැ. හැම තත්පරයකම ඔබ ඉදිරියේ ඇය සීරුවෙන් සිටිනවා. ඔබට ඵස්සය වන සැම රූපයක් සමඟම ඔබව වේදනාව විඳීමට සලස්වනවා. ඇලීම් ගැටීම්, උපේක්ෂා වශයෙන්.

ඔබ කවදා හරි නිවීම ලබන්නේ තණ්හාවේ මැහුම්කාරිය හඳුනාගෙන ඇයගෙන් මිදුනු දාටය. එතෙක් ඔබ කුසල් අකුසල් පිරුණු මඟක නායකයින්ද, පාලකයින්ද වීමේ දොළදුක සංසිඳුවා ගැනීමට අකුසල්ම කර ගසා ගනිමින් ගමන් කරයි.

තිරිසන් ලෝකයේ සතුන් සහ පක්ෂීන් දෙස ඔබ හොඳින් බලන්න. ඔය තිරිසන් සතුන් කිසිවෙක් රාත්‍රියට හෝ දවාලට එක දිගට පැයක් නිදාගන්නේ නැහැ. ඒ සතුන්ට නිදාගන්න වාසනාවක් නැහැ. පිනක් නැහැ. ගසක අත්තක් සෙලවුනොත්, කොළයක් වැටුනොත්, තවත්

සතෙකුගේ හඬක් ඇසුනොත්..... මේ ආකාරයට නිරතුරුව බියට පත්වී නින්ද කැඩෙනවා. තිරිසන් සතුන් මුළු රැයම නිදාගන්නේ බයෙන්. මෙය අහම්බයක් නොවේ. කර්ම විපාකයක්මයි. කර්මය තමයි පෙර ජාතිවල මිනිස් ආත්මවල ඉපැදිලා ලොකු කුඩා පාලකයෝ වෙන්න ගිහින් කරපු අකුසල්. මිනිස්සු බියගන්වලා, පීඩනයට පත් කරලා, මුලා කරලා, අතීත භව වල කරපු අකුසල් මරණින් මතු විපාක දෙන්නේ ඔය විදිහට. ලොකු කුඩා පාලකයන්, නායකයන් මිය ගිය පසු පාංශකූල පොළේදී අනුශාසනා, දේශනා, ගුණ කථා, බැනර, ශෝක ප්‍රකාශ, සැරසිලිවලින් ඔවුන්ව නිවන් දැක්වුවද සැබෑ යාථාර්ථය කටුකය. ඔබ හොඳින් නිරීක්ෂණය කර බලන්න. තිරිසන් සත්ත්ව ප්‍රජාවේ නායකත්වය වෙනුවෙන් එම සතුන් වියරුවෙන් ගැටෙන හැටි. වියරුව, මරාගනිමින් නායකත්වයට සටන්වදින විලාසය. මේ සියල්ල එම සතුන්ගේ සංසාරික හුරුපුරුදුය.

ශ්‍රී සද්ධර්මය පවතින අවස්ථාවක, වාසනාවන්ත මනුෂ්‍ය විලාසයක් ලබා, නායකත්වයට ඇති ගිජුභාවය නිසා, අනන්ත අප්‍රමාණ අකුසල් සිදුකර තිරිසන් ආත්මයක් ලැබූ පසු, නැවත නම් කල්ප ගණනාවකට සුගතිගාමී ජීවිතයක් නම් ලැබිය නොහැකිය. මන්ද තිරිසන් සත්ත්ව ප්‍රජාව තුළ ඇති වෛරය නිසා දුකෙන් දුක කරාම, තිරිසන් ලෝකයෙන් නිරය කරාම ඇදී යාම එම ස්වභාවය නිසාය. බලන්නකො මේ තරම් වටිනා මනුෂ්‍ය ජීවිතයක් ලබපු ඔබ, අනුන්ව පාලනය කරන්න ගිහිල්ලා කල්ප ගණන් අපා දුක් විඳින සත්ත්වයන් බවට පත්වෙනවා. මොන තරම් අවාසනාවක්ද.

හැබැයි සමහරු ඉන්නවා, පෙර පිං නිසාම ආයාසයකින් තොරවම නායකත්වය, ප්‍රධානත්වය ලැබෙනා අය. ඒ අය බඳා ගැනීමකින්, තෘෂ්ණාවකින් තොරවම නායකත්වය දරනවා. බහුතරයේ අකමැත්තෙන් නායකත්වය අතහරිනවා. ඔහු තමන්ට ලැබූ අවස්ථාව නිසා කුසලයක් රැස්කර ගන්න දක්ෂ වෙනවා. ඔබම සිතන්න. ඔබ බදාගත්තොත් ඔබට උරුමවන්නේ සතර අපායමය. ඔබ අත හැරියොත්, මධ්‍යස්ථ වුවොත් ඔබට සුගතිය උරුම වෙනවා.

මේ ලෝකයේ සැබෑම ශ්‍රේෂ්ඨම පාලකයා තමයි, මෙලොව තමාට පාලනය කිරීමට තරම් දෙයක් නොමැති බව දකින තැනැත්තා. ඔහු ඉන්නේ සම්මා සම්බුද්ධ ශාසනයක පමණයි. ඒ තමයි අරිහත් උත්තමයා. උන්වහන්සේ තමා තුළ තමා නැතැයි දකිනවා. මම තුළ සත්ත්වයෙක් පුද්ගලයෙක් නැතැයි දකිනවා. කුමක්ද එහෙනම් මෙතැන තිබෙන්නේ. වේගයක්.

ඇතිවෙමින් නැතිවෙන රූපයක් සහ සිතක් පමණක් බව දකිනවා. එස්සය නිසා හටගන්නා වේදනාව සත්ත්වයාව ක්‍රියාකාරීත්වයට පත් කරනවා. ඇති වුනාවූ එස්සයද, වේදනාවද අනිත්‍ය බව උන්වහන්සේ අවබෝධයෙන් දකිනවා. පාලනය කිරීමට යමක් නොමැති තැන පාලකයෙක් අවශ්‍ය නැහැ. දැන් බලන්න පාලනය කිරීමට කිසිවක්ම නොමැති තැනක, පාලකයෝ වෙන්න ගිහිල්ලා මිනිස්සු මොන තරම් මෝහයකද වෙලී සිටින්නේ. අනේ දෙවියනේ අවිද්‍යාව මොන තරම් අසාධාරණයක්ද මේ සත්ත්වයාට කරන්නේ.

පාලකයන්, ප්‍රධානීන්, නායකයන් වෙන්න වෙර දරන ඔබට ලෝකයේ ශ්‍රේෂ්ඨම පාලකයා වෙන්න මඟක් තියෙනවා. ඔබ මේ මඟ දිනා ගත්තොත් එම ජයග්‍රහණය නැවැත උදුරාගන්න මේ තුන්ලෝකයේම කිසිවෙකුටත් බැහැ. ඔබට කරන්න තිබෙන්නේ සුළුදෙයයි.

'සිතේ පාලනයෙන් ඔබ මිදෙන්න. සිත පමණක් ඔබේ පාලනයට යටත් කරගන්න'

මෙතෙක් කල් ඔබ ක්‍රියාත්මක වූයේ ඔබට අයිති නැති සිත ඔබට අණකළ මග ඔස්සේය. ඔබ මේ මොහොතේම ඔබේ සිතට නියෝග කරන්න. 'දැඩිව' නියෝග කරන්න.

'සිත ඔබ මෙතුවක් කාලයක් ඔබට අවශ්‍ය ආකාරයට මාව ක්‍රියාත්මක කළා. සතර අපායට, දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝකවල ගාල් කළා. කල්ප ගණන් සංසාරයේ ඇවිද්දුවා. මෙතුවක් කල් මම අවිද්‍යාව නිසා ඔබට රැවටුනා. මින් මතු ඔබ කියන දේ කරන්නේ නැහැ. මම කියන දෙය ඔබ කළ යුතුයි'

ඔබට පුළුවන් නම් මේ තීරණය ක්‍රියාත්මක කරන්න, ඔබ තමයි මේ ලොව ශ්‍රේෂ්ඨතම පාලකයා. ඔබට අයිති නැති, ආගන්තුක සිතක්, ඔබව භවයේ සිරකරුවෙක් කරගෙන සිටින අසාධාරණයෙන් ඔබව මුදාගන්නා ශ්‍රේෂ්ඨම පාලකයා ඔබ වෙනවා.

ඔය ඇතිවන නැතිවන සිත ඔබේ පාලනයට ගතහොත්, ඔබට පුළුවන්කම ලැබෙනවා මුළු විශ්වයේම පාලනය ඔබ අතට ගන්න. රටක්, නගරයක්, ගමක්, ආයතනයක්, පන්සලක්, ආරණ්‍යයක් නොවේ මුළු විශ්වයම. ඔබේ නිවන් මෙහෙයුමේදි සමාධියේ උපරිම තලයකට පැමිණෙන විටක, ප්‍රඥාව විසින් මුළු විශ්වයම අනිත්‍යභාවයේ වේගයෙන් සියුම් කොට ඔබ ඔබේ දෝතට ගන්නවා. රූපය අනිත්‍යභාවයට පත්වෙන වේගය තුළින් විශ්වය

යනු තම දෑතට ගතහැකි හිස් දෙයක්ය යන්න ඔබ දකිනවා. ප්‍රඥාවෙන් ඔබ විශ්වය ඔබේ ග්‍රහණයට ගන්නවා. මෙතෙක් විශ්වයේ පාලනයට යටත්වූ ඔබ, විශ්වය යනු අතිද්‍රැවැන්ත වේගයට හසුවන, සතර මහා ධාතුන්ගේ ස්වභාවයක් බව අවබෝධයෙන් දකිනවා. මෙතෙක් විශ්වය ලෙසින් ඔබ දකිමින් සිටියේ එස්සය නිසා හටගන්නා වේදනාවක් බව දකිනවා. ඔබට දැනෙනවා ඔබ ලෝකයෙන් එතෙර වුනාය කියලා. සමාධියේ උපරිම තලයකදී ඔබට වැඩෙන ප්‍රඥාව තුළිනුයි විශ්වයේ පාලනය ඔබට ලබා දෙන්නේ. ඔබ කවදාවත් හිතන්න එපා මොන ධ්‍යානයේදීද ඔබට මේ ඥාණයන් ලැබනේනේ කියලා. එහෙම හිතුවොත් ඒවා කෙළෙස් ධර්මයන්. එසේ වුවහොත් නිවීම ඔබෙන් ඈතට යනවා. මේවා ධර්මයේ ආශ්චර්යයන්. හේතු ඵල ධර්මයන්. හේතුව තමයි සැබෑ මධ්‍යම ප්‍රතිපදාවේ හික්මීම. තුන් සිවුරත් පාත්‍රයත් හැර ඉතිරි සියල්ල අතහැරීම. අත්හැරීමෙන් අර්ථවත් වූ නිවන් මග අවසන් මෙහෙයුමේදී, අත හැරීමේ උපරිමය නිසාම ත්‍රිවිර වන ප්‍රඥාව විසින් ඔබට මේ ගුණයන් ලබාදෙයි. ජීවිතයේ එක් වරක් පමණක් මේ ඥාණ දර්ශනයන් පහළවේ. ඔබට ඒවා නැවත නැවත ආවර්ජනය කර දැකිය හැකිය. එහෙත් දැන් ඔබට මේවා අවශ්‍ය නැත. එය තවත් සිදුවීමක් පමණක්මය. සියල්ල අයිති අනිත්‍යයටය. සිදුවූ එකම දෙය ඔබ ප්‍රමාදයෙන් මිදීම පමණකි. අප්‍රමාදීව කළ යුත්ත කරගත්තා පමණකි.

මනුෂ්‍ය ලෝකයේ අනුන්ගේ පාලකයෝ වෙන්න ගිහින්, සතර අපායට වැටෙන තමන්ගෙ සිත පාලනය කරගෙන ලෝකයෙන්ම එතෙර වෙන්න. ලෝකයම ප්‍රඥාවෙන් සියුම්කර ඔබේ දෑතට ගන්න. සැබෑ පාලකයෙක් වන්න. නැවත ලෝකයට නොඑනා ලෙසින්ම ලෝකයෙන් සහමුලින්ම මිදී යන්න. සැනසිල්ලේ නිවීයන්න. සතියෙන් සිහියෙන් යුතුව, ස්වභාව ධර්මය දෙස බලන්න. එවිට ධර්මයද, විනයද යන දෙකම ඔබ කෙරෙන් ආරක්ෂාවනු ඇත. ධර්මය සහ විනය පත පොතින් සොයා නොයන්න. නමුත් දැනුම ලැබීමට නම් ඔබ පතපොත නිරතුරුව පරිහරණය කරන්න.

මනුෂ්‍යයෙකුට, දෙවියකුට, බ්‍රහ්මයකුට මෙලොවදී අසන්නට ලැබෙන ශ්‍රේෂ්ඨම, උතුම්ම අත්දැකීම කුමක්ද කියලා ඔබ දන්නවාද? මේ කියන්න යන වචන පෙළ විශ්වයේ ඔබට අසන්නට ලැබෙන සුන්දරම වචන පෙළයි. මේ වචන පෙළේ අර්ථය ඉක්මවා ගිය සුන්දරත්වයක් මේ විශ්වයේ කොතැනකවත් නොමැත. මේ වචන පෙළේ සුන්දරත්වයක් ඔබ දකින්න නම් ඔබ නිවන් මග වඩන කෙනෙක්ම වෙන්න ඕනේ. ඔබ තුළ දැන් කුතුහලයක් තිබෙනවා නේද ඒ සුන්දර වචන පෙළ කුමක්ද කියලා දැන ගන්න. ඒ මෙයයි.

'ඔබ සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ල ලැබේවී. ඔබට මේ සියල්ලම ලැබෙද්දී, මේ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද මේ සියල්ල අනිත්‍ය වශයෙන් ඔබ අවබෝධ කර ඇති නිසාය'

ඔබ මෙම වචන පෙළ නිතර නිතර සිහි කරන්න. එවිට ඔබට සිතේවී මේ මඟ ගමන් කරන්න. බලන්න ලෝකයේ සැබෑම යථාර්ථය තියෙන්නේ කොතැනද කියලා. සත්ත්වයා යන්නේ මොන මුලාවක් පසුපසද? සත්ත්වයා සුන්දරයි කියලා දකින්නේ කුමක්ද? පුළුවන් තරම් රැස් කරන්න. ගොඩ ගසාගන්න. අවසානයේ සියල්ලම දමා මැරිලා යන්න. දමලා යන දේවල් මමය, මගේය කියලා රැස් කරන්න ගිහිල්ලා රැස් කරපු අකුසල් නිසා සතර අපායේ බින්න බහින්න.

දරුවන්ට, බිරිඳට රැස්කරලා අකුසල් පුරවාගෙන මැරිලා අපාගත වන්න මිනිසා හරිම දක්ෂයි.

බලන්න....අත්හැරීමත්, රැස්කිරීමත් අහසයි පොළොවයි වගේ වෙනස් සමීකරණ දෙකක්. එතරම් පරතරයක් තිබියදීත් වෙනස ඔබ දකින්නේ නැහැ. ඔබ මුළු විශ්වයේම බර දරාගෙනයි සිටින්නේ. විශ්වයේ බරෙන් ඔබ නිදහස්වන්න. එවිට ඔබ ලොව නිදහස්ම පුද්ගලයා වෙනවා. 'මම, මගේ , අපි, අපේ' කියලා කල්ප කෝටි ගණනක සිට වපුරපු , පුරවපු බර කඳ ඔබ දරාගෙනයි සිටින්නේ. ඔබ තුළ මම මගේ කියලා කෙනෙක් නොමැති බවට ඔබ ප්‍රඥාවෙන් දකින මොහොතේ, මේ බර කඳ ඔබෙන් ගිලිහෙනවා. මේ බර ඔබෙන් ගිලිහී යාමේදී එය ඔබට හොඳින් දැනෙනවා. ඔබට දැනෙනවා, තේරෙනවා මහා වෙනසක් ජීවිතය තුළ සිදුවූ බව. ඔබ නුවණින් බලනවා, මෙනෙහි කරනවා, ඔබ අවබෝධය ලබනවා ඔබ තුළින් රාගය, ද්වේෂය, මෝහය නැතිවී ගිය බව. ඒ කෙළෙස් ධර්මයන් නැති වී ගොස් තිබුණේ ඒවා තිබූ බවට සලකුණ කුදු නොතබාමය. එයයි ආශ්චර්යය ධර්මයේ.

ඔබ සිතන්න අවුරුදු දහස් ගණනක් පැරණි ගසක් තියෙනවා කියලා. ඔබ බුල්ඩෝසර කිහිපයක් යොදලා ඒ ගස මුලින්ම උදුරනවා. ඔබ කොතරම් වෙහෙසගත්තත් ඔබට බෑ දශමයක ප්‍රමාණයේ හෝ මුල් කැබැල්ලක් පොළොවේ නොසිටින ලෙස එම ගස ඉවත්කරන්න. මොන ආකාරයක් යොදා ගස ඉවත්කළද පුංචි මුල් කැබැල්ලක් හෝ පොළොවේ තිබෙනවා. නමුත් නිවන් මග අවසන් මෙහෙයුමේදී භික්ෂුව තුළින් රාගය, ද්වේශය, මෝහය නිවීයන්නේ ඒවා කිසි කලෙකත් භික්ෂුව තුළ තිබූ බවට සලකුණ කුදු නොතබාමය. ඉතිරි නොකරය.

එවිට ඔබට දැනෙනවා ඔබ මෙතෙක් දරාගෙන සිටි බර ඔබට අයිති දෙයක් නොව, ලෝකයට අයිති දෙයක් බව. තමන්ට අයත් නැති බරක් තමන්ගේ කර ගනිමින්, කර ගසාගෙන යන මෝහබරිත පෘථග්ජන තත්ත්වයෙන් ඔබ මිදීම ගැන ඔබට සතුටක් දැනෙන්නේ නැහැ. දැනෙන්නේ කළ යුත්ත කර ගත්තාය කියන හැඟීමයි. ඔබ මෙහිදී ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. මොකද ඔබ ජයග්‍රහණයෙක් නොවේ ලැබුවේ. දිනුම් කනුවක් නොවේ ඔබ පසුකළේ. තව කෙනෙක් පරාජය කළා නොවේ. ඔබ පළවෙනියා වුනා නොවේ. මේ ලෝකයේ ස්වභාවය, යථාර්ථය හඳුනාගත්තා, අවබෝධ කර ගත්තා පමණක්මය.

ලෝකයේ මෙම විජයග්‍රහණය, ජයග්‍රහණය සමරනු නොලබන, ලොව ශ්‍රේෂ්ඨම, නිහතමානීකම දෝරේ ගලායන ජයග්‍රහණයයි.

ඔබ මෙහිදී කිසිවක් ලබා නැත. සියල්ල අතහැරුණා පමණමය. එය ජයග්‍රහණයක් නොව නිදහස්වීමකි. එහෙත් ඔබ බර දරාගෙන සිටින ලෝකයා අතර, ඔවුන්ගේ සිව්පසය ලබමින්, යැපෙමින්, ලෝකයේ බරෙන් සැහැල්ලුවන නිදහස 'නිදහසේ' අත් දකිනු ඇත. ඔබ ලබන ඒ උතුම් නිදහස ඔබට මිස වෙනත් බාහිර කෙනෙකුට නොදැනෙනු ඇත. මන්ද මනුෂ්‍යයා දරාගෙන සිටින බර නිසා, අනුන්ගේ සැහැල්ලුවද, නිදහසද ඔහු, ඔහුට බරක් කරගන්නා බැවිනි. බර දරාගත් මිනිසුන් අනුන්ගේ සැහැල්ලුව, තමන්ට බරක් කරගැනීම පෘථග්ජන සිරිතය. මේ ස්වභාවය නිසා සත්ත්වයා නොදැනුවත්ව කරගන්නා අකුසල් ප්‍රමාණය අති විශාලය.

ලෝකයේ බරෙන් ඔබ නිදහස් වන්න. නිදහසේ සැහැල්ලු බව ගැන ඔබ ලෝකයාට කියාදෙන්න. ලෝකයත්, සිතේ ස්වභාවයත් අනිත්‍ය පමණක්ම බව දකින්න. සිත අනිත්‍ය බව අවබෝධකර ගන්න. එවිට ආයාසයකින් තොරවම ලෝකයේ ස්වභාවය ඔබට අවබෝධ වේවී. සිත අත හැරුණ විට, ඔබට ලෝකයද අත හැරෙනු ඇත.

ඇත් සවිය පරදන අතහැරීමේ අවිය

නිවන් මග වඩනා භික්ෂුවකට හුදෙකලාවේ උපරිමය ලැබිය හැක්කේ වනය තුළදීය. ගොදුරු ගමෙන් කිලෝ මීටර් එකක්, දෙකක් හෝ තුනක් ඈතින්, දිය අගලක් සමීපයේ ඇති කුටියක වන හුදෙකලාව වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම හුදෙකලාවයි. රක්ෂිත තුළ ඇති හුදෙකලා කුටිවලට යන අඩිපාර අලි ඇතුන් ගමන් කරන අලිමංකඩයි. එහෙයින් මෙවැනි කුටි අසල රාත්‍රියට නිතර අලින් ගැවසේ. වනයේ අලි ඇතුනුත් නිවන් මග වඩන භික්ෂුවත් අතර ඇත්තේ පුදුමාකර සබඳතාවකි. අලි ඇතුන් භික්ෂුවගේ ඉව, සුවඳ හඳුනන්නාසේය. දෙගොල්ලන්ම දෙගොල්ලන්ට හිංසා පීඩා කර නොගනිති. නිදහසට ගරු කරති. නමුත් කැලයේ ආධිපත්‍යය මෙන්ම අලිමංකඩවල ආධිපත්‍යය පෙන්වීම අලින්ගේ සිරිතය. මෙවැනි අවස්ථාවල වනගත භික්ෂූන් මෛත්‍රිය වඩමින්, බුදුගුණ වඩමින්, අංගුලිමාල පිරිත-නාලාගිරි ගාථාව වැනි ආරක්ෂක විධි අනුගමනය කරමින් ඇතිවිය හැකි උපද්‍රවයන්ගෙන් මිදෙයි. ඉහත භාවිතයන් එක් එක් භික්ෂුවගේ අවබෝධය මත වෙනස්ය. නිරතුරුවම කැලයට ඇතුළුවන විට අප කරන්නේ නපුරු සතුන් මුණ නොගැසේවා යන්න, තමාගේ ආධ්‍යාත්මික ශක්තිය උපයෝගී කරගනිමින් අධිෂ්ඨානය කිරීමයි. ඔබ ඉහළ අධ්‍යාත්මික ශක්තියකින් පරිපූර්ණ නම්, ඔබට අනිවාර්යයෙන්ම නපුරු සතුන් මඟහැරී යනු ඇත. මේවා හේතු ඵල ධර්මයන්ය. ආශ්චර්යයන් නොවේ. හේතුව, තමා තුළ ඇති ආධ්‍යාත්මික ශක්තියයි. සමහර විට ඔබ වඩින අඩි පාරේ, ඒ මොහොතේ කඩා දැමූ අතු කොළ පාර පුරා වැටී ඇත. ඒ මොහොතේ දැමූ

අලි බෙටි ඇත. අලි ගඳ තදින් නහයට දැනෙනු ඇත. එහෙත් ඔබට අලින් මඟහැරී ගොස් ඇත. ඔබ දක්ෂ විය යුත්තේ මෙවැනි ක්‍රමයකට නපුරු සතුන් මඟ හැර යෑමටය. අත්හැරීම තුළින් ඔබ ලබන්නාවූ අධ්‍යාත්මික ශක්තිය අති ප්‍රබලය. එවැනි ශක්තියකින් ඔබ අධිෂ්ඨාන කළහොත්, ඔබට නොතේරුනද පොළොවද, පරිසරයද, නපුරු සතුන්ද කම්පාවට පත්වෙයි. එය ධර්මයේ බලයයි. තිරිසන් ලෝකයේ සතුන්ගෙන් ධර්මයේ බලය හොඳින් දැනෙන සතුන් අලි ඇතුන්ය. ඒ අයට තෙරුවන්ගේ ඉව හොඳින් දැනේ. එය අනන්ත කාලයක් පාරම්පරිකව, වනයේ වැඩ සිටින ධර්ම අවබෝධය ලැබූ භික්ෂූන් සමඟ ගැවසීමෙන් එම සතුන් ලැබූ ආභාෂයයි. වනවාසී භික්ෂූන් දස දහස් ගණනින් අතීතයේ වනයේ වැඩ සිටියේය. අලි ඇතුන්ද එම පරිසරයේම කොටසකි. එහෙයින් අලි ඇතුන් භික්ෂුවගේ ගුණ සුවඳ හොඳින් හඳුනයි.

ඇතුන්ගේ කුංචනාදය කුමන හේතුවක් නිසා කරන්නේ දැයි මේ භික්ෂුව නොදනී. නමුත් එය සුභ නිමිත්තකි. කුංචනාදය කරන ඇතුන් තුළ ඒ මොහොතේ ඇත්තේ ගාම්භීරත්වය, පෞරුෂත්වය, අදීනත්වය, නායකත්වය වැනි චේතනාය. භික්ෂුව වැඩ සිටි කුටිය සමීපයට රාත්‍රී යාමයේ පැමිණි තනි අලියෙක්, කුටියේ පිටුපස එක් කොනක සිට මහා හඬින් කුංචනාද කළේය. තවත් මොහොතකින් එම අලියා කුටියේ අනික් කොනට ගොස් දෙවැනි වතාවටද මහා ශබ්දයකින් කුංචනාද කළේය. මීට පෙර අලි ඇතුන් කුංචනාද කරනවා භික්ෂුව අසා නොතිබුණු නිසා භික්ෂුව සිතුවේ අලියා කේන්තියෙන් වියරු වැටී කෑගසන බවයි. කුංචනාදය මහා හඬකින් හක් පිඹින්නා ස්වරූපයෙන් කෙරෙන්නකි. සිහින් පිඹීමකින් පටන් ගන්නා හඬ ක්‍රමයෙන් වැඩිවී මහා දෝංකාරයකින් අවසන්වේ. ප්‍රදේශයම දෝංකාර දෙයි. කුංචනාදය පටන්ගෙන අවසන්වීමට තප්පර ගණනාවක් ගතවේ. අවසන් වේගවත් හඬට ප්‍රදේශයම සලිතවෙයි. තවමත් කුංචනාදය යනු එයදැයි කියන්නට භික්ෂුව නොදනී. එහෙත් එය කුංචනාදය යැයි අනුමාන කරමි.

අලියා මහා රාත්‍රියේ මෙලෙස දෙවරක් කුංචනාද පවත්වද්දී භික්ෂුව සිටියේ දොර ජනෙල් නොමැති, පරිසරයට නිරාවරණය වූ වනයේ කුටියකය. ඉදිරිපස බිත්තිය නොමැති නිසා ලණුවක එල්ලන ලද පරණ සිවුරකින් ඉදිරිපස ආවරණය කර තිබුණි. සැබැවින්ම භික්ෂුව සිතුවේ අලියා වියරු වැටී ඇති බවකි. අලියා වේගයෙන් කුටිය සමීපයේ සැරිසරන හඬ භික්ෂුවට හොඳින් ඇසේ. කොටින්ම අලියා කලබල ස්වභාවයක් දැක්වීය. රාත්‍රී ඝණ අඳුර සහ නිහඬභාවය නිසා අලියාගේ හැසිරීමේ ස්වභාවය

හොඳින් භික්ෂුවට දැනේ. දැන් මේ ජවනිකාවට පැය භාගයක් පමණ ගොස්ය. මෙවැනි විටක දක්ෂ භික්ෂුවකට කළ හැක්කේ එකම එක දෙයකි. භික්ෂුවට මෙම සිදුවීම අභියෝගයකි. එහෙත් එම අභියෝගය ජයග්‍රහණයකට හරවා ගැනීමට එය ආශිර්වාදයක් කරගැනීමට භික්ෂුව දක්ෂ විය යුතුය. භික්ෂුව කලබල වූ අලියා ගැන සිතීම අතහැර, මේ සිතත් මේ කයත් මගේ නොවේ යැයි අතහැරදමා කොට්ටයට හිස තබා ගත්තේය. සිත අතහැරදැමූ නිසා කයේ කිසිම ක්‍රියාකාරීත්වයක් නොමැත. ලොව ශ්‍රේෂ්ඨම අතහැරීම භික්ෂුව අධිෂ්ඨාන කරන මොහොතේම පරිසරය මහ පොළෙවා කම්පාවනු ඇත. දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝකවලට ද මේ අත හැරීම දැනෙනු ඇත. එහි දිව්‍ය, බ්‍රහ්ම වැසියන්ද සිදුවූයේ කුමක්දැයි බලනු ඇත.

'ඔබ සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ලම ලැබේවී' කියන්නේ මේ නිසාය. ඔබ සියල්ල අත්හල මොහොතේ ඔබට විශ්වය කම්පා කරවන්න පුළුවන්. එය ඔබට තවත් සිදුවීමක් පමණකි. හපන්කමක් හෝ ආඩම්බරකමක් නොවේ. ඔබ විශ්වාස කරන්න. භික්ෂුව තම සිත අතහැරදැමූ මොහොතේ එතෙක් පැය භාගයකට වැඩි කාලයක් කුටිය අසල කලබල ස්වරූපයෙන් හැසිරුණු තනි අලියා ආගිය අතක් සොයාගැනීමට නොහැකිවිය. තනි අලියා අතුරුදහන්වී පැය දෙකකට පමණ පසුව නැවත එම අලිමංකඩ ඔස්සේම වනය තුළට නිහඬව යනවා ඇසිණි. භික්ෂුවගේ අත හැරීමේ ශක්තියේ බලය තනියාටද දැණුනි.

ඉහත සිද්ධිය වන විට භික්ෂුව කරණීය මෙත්ත සූත්‍රය හැර වෙන කිසිම සූත්‍රයක් කට පාඩමින් නොදැන සිටියේය. පිරිත් පොතක්ද භාවිතා නොකළේය. සැබෑම මධ්‍යම ප්‍රතිපදාව අර්ථ ගන්වන තුන් සිවුරත්, පාත්‍රයත් පමණක් කුටියේ තිබුණි. බලන්න නිවන් මඟ වැඩිය යුතු භික්ෂුවක් මේ ජීවිතය තුළදීම නිවීම සාක්ෂාත් කරගැනීමට යායුතු මඟ. කැලය තුළට වඩින විටම ජීවිතය අතහැරලා. 'කැලයේ අලි ඇතුළු නපුරු සතුන් සිටිනවා. ජීවිතයට අනතුරක් වෙයි. කැලයේ යක්කු යක්ෂණියෝ ඉන්නවා. ඒ අය බියගන්වාවී, කරදර කරාවී, ආරක්ෂාවකට පිරිත් පොතක් ගෙනියන්න ඕනි. කන්ද පිරිත දැනගන්න ඕනෙ'. මෙවැනි සංඥා ඔබට තිබෙන්න බැහැ. මේ සංඥා ඔබට තිබෙනවා නම්, ඔබ කැලයට හුදෙකලාවෙන්න යන්නත් එපා. ඔබ ශක්තිමත් වනතුරු ඉවසන්න. මඟ වැඩූ කල්‍යාණ මිත්‍රයෙක්ගෙන් උපදෙස් ගන්න. ඔබ කැලයට යා යුත්තේ 'මම අතහැරීමට' මිස 'මම ආරක්ෂා කරගැනීමට නොවේ.

ඔබ තුළ අයෝමය ආත්ම ශක්තියක් තිබෙන්නෙ ඕනේ. එම ශක්තිය ඔබට දෙන්නේ ඔබේ පරිපූර්ණවූ ශීලය සහ සමාධිය තුළින්. නමුත් ඔබ මේ වන විට ශීලය සමාධිය කරගසා ගෙන සිටින්නේ නැහැ. ඒවත් බිමින් තබනවා. මොකද ඒවායේ ස්වභාවයත් අනිත්‍ය නිසා. දැන් ඔබට වැඩෙන්නේ ප්‍රඥාවයි. ඔබට වැඩෙන ප්‍රඥාව ඔබ දකින අලියාද, යක්ෂයෝද, යක්ෂණියෝද ඇසෙන ශබ්ද සහ දෝංකාරද, ඔබට පෙනෙන දෙවියෝද බ්‍රහ්මයෝද ඔබ දකිනුයේ රූපයක් පමණක්ම බවයි. රූපයේ ස්වභාවය අනිත්‍ය යි. භික්ෂුවද, අලියාද, කැලයද නිරතුරුවම වෙනස්වන සතර මහා ධාතූන්ගේ නිර්මාණයෝය. අපි භික්ෂුව, අලියා, කැලය වශයෙන් දකින්නේ එකිනෙකට වෙනස් සතර මහා ධාතූන්ය. මේ සියල්ල අනිත්‍ය භාවයේ රූකඩයෝය. එහි යමෙක් හඳුන්වන සම්මුතියක් තිබුණද ඒ තුළ සත්ත්වයෙක් පුද්ගලයෙක් නැතිබව ඔබ දනී. එහි ඇත්තේ අනිත්‍ය පමණකි. නැතිදෙයකට ඇලීම, ගැටීම, උපේක්ෂා සහගතවීම දැන් ඔබෙන් ගිළිහී ගොස්ය. ඔබ දුටු දේ දුටු බවත්, ඇසුණ දේ ඇසුණ බවත් පමණයි දකින්නේ. ඒවා ගැන සිතන්න දෙයක් නැහැ. මොකද ඒවා අනිත්‍යයට අයිති නිසා.

අභියෝගය අවබෝධයක් කරගන්න

මෙම ආත්මභාවයේදීම නිවීම උදෙසා වනවාසීව මග වඩන භික්ෂුව කැලයට ඇතුළු වීමේදීම උපද්‍රවයන් මඟ හැරේවායි අධිෂ්ඨානය කළද, සද්ධර්මයෙන් ඈත්වූ මිනිසුන්ගේ සාමාජීය, පාරිසරික විකෘති භාවයන් නිසා ඔබ ඉදිරියට අභියෝගයක් පැමිණිය හැකිය.

සතුන්ට අයත් කැලෑ මායිම් බිම් මිනිසුන් වගාවන් සඳහා යොදා ගැනීම, සතුන්ට වෙඩි තැබීම නිසා තුවාල ලත් සතුන්, දඩයම් කිරීම, අලි වෙඩි පත්තු කිරීම, මරු වැල් ඇටවීම වැනි හේතූන් නිසා බියට පත් සතුන් සමහර අවස්ථාවල කැලය තුළ විකෘති, කලබලකාරී ලෙස හැසිරෙති.

මේවා පාලනය කිරීමට ධර්මයට නොහැකිය. මොකද මේවා ලෝකයේ ස්වභාවය හෙයිනි. එහෙත් අත්හැරීමේ තිබෙන මහානුභාවය නිසාම මෙවැනි විකෘති සතුන් පවා භික්ෂුවගෙන් මග හැරෙනවා.

දිනක් භික්ෂුවක් කැලෑබද ගුරු පාරක පිණ්ඩපාතය වඩිනවා. මෙම කැලයේ නිතරම හැසිරෙන තනි අලියෙක් සිටිනවා. මෙම තනියා මීට මාස කිහිපයකට පෙර ගොවියන් දෙදෙනෙක් මරා දැමූ සතෙක්. වෙන අලින් මේ පෙදෙසේ නැහැ. මේ තනියා පමණයි කැලයේ සිටින්නේ. ඒ නිසා මෙයා සැරයි.

භික්ෂුව උදය කාලයේ කැලය මැදින් ගුරු පාරේ පිණ්ඩපාතේ වඩිනවිට පෙනෙනවා, පාර පුරා අතු කඩා දමලා, ගස් පතුරු ගහලා පාරට දමලා

හරියට උවමනාවෙන්ම පාර අපවිත්‍ර කරලා වගේ. තනියා කේන්ති ගිය ස්වභාවයෙන්ම හැසිරී ඇති බව හොඳටම පැහැදිලියි. භික්ෂුව හොඳින්ම දන්නවා දූන් ඉදිරියේ තනියා ඉන්නවා කියලා. වේලාව පෙරවරු 6.30ට ඇති. අලි ගඳත් දැනෙනවා. ගුරුපාර මඩ කරලා. පෙරදා රාත්‍රියේ වැස්ස තිබුණා. ඔබ දන්නවාද මේ වෙලාවේ භික්ෂුව මොකද කළේ කියලා. හැබැයි තවම භික්ෂුවට තනියා මුණගැසුනේ නැහැ. භික්ෂුවත් පැමිණි විලසින්ම ඉදිරියට වඩිනවා. ගමට යන්න එපැයි පිණ්ඩපාතය සොයාගන්න. ගමට යෑමට කිලෝ මීටර 2ක් පමණ දුරක් තිබෙනවා. භික්ෂුව ඉදිරියටම වඩිනවා. තනියා මග දිගටම අතු කඩා දමලා, පොත්ත අනුභව කරන්න ගස් පතුරු ගහලා. භික්ෂුව මොහොතක් නවතිනවා. කුමක් සඳහාද? තමා ඉදිරියේ ඇති අභියෝගය ජයග්‍රහණයකට පරිවර්තනය කරගන්න. භික්ෂුව මනසින් දකිනවා, තනියා තමන් ඉදිරියට වියරුවෙන් එනවා. ඇවිත් හොඬවැලෙන් භික්ෂුව අඹරවලා ගන්නවා. අරගෙන තනියා වියරුවෙන්ම භික්ෂුවව පොළොවේ ගසනවා. භික්ෂුවගේ හිසට තනියා තම ඉදිරි පාදය තබා පාගනවා. හිස කුඩුවෙනවා. මේ සියල්ල භික්ෂුව මනසිනුයි දකින්නේ. භික්ෂුව දැනෙන වේදනාව තමාට අයත් දෙයක් නොවන බව දකිනවා. කුඩුවෙන බිඳෙන කය තමාට අයත් නැති බව දකිනවා. භික්ෂුව දකිනවා තම අවසාන හුස්ම පොද ශරීරයෙන් පිට වෙනවා. භික්ෂුව නුවනින් බලනවා ඇතිවූ අවසාන සිත නැවත ප්‍රතිසන්ධියක් සහිත සිතක්ද කියලා. භික්ෂුව දකිනවා අවසන් සිතේ කිසිම උපාදානයක්, තණ්හාවක්, කැමැත්තක් නැතිය කියලා. භික්ෂුව අවබෝධ කරගන්නවා කැමැත්තක්, තණ්හාවක් නොමැති නම් නැවත උපාදානයක්, බැස ගැනීමක් නොමැති බව. බලන්න නිවන් මඟ වඩන භික්ෂුවක් ජීවිතයට අභියෝගයක සෙවනැල්ල වැටුණු මොහොතකදී තමා විසින්ම ජීවිතය මරා දැමීමට සලස්වලා අවබෝධය ලබලා නැවැත ජීවිතයට සේන්දු වුනා. බලන්න ලොව්තුරු ධර්මයේ විශිෂ්ඨ බව. අතහැරීමේ ආශ්චර්යය.

දස දහස් ගණනින් මහ රහතන් වහන්සේලා අතීතයේ බිහිවූයේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මෙවැනි කමටහන් බුදු පුතුන්ට දුන් නිසාය. මෙම සිදුවීමේදී භික්ෂුව තුළ වැඩුනේ සතර සතිපට්ඨානයයි.

මෙවැනි සිදුවීම් භික්ෂුව ඉදිරියට එන ආශිර්වාදයන්ය. ඔබ දක්ෂ විය යුතුයි ඔබේ නිවීම උදෙසා මේවා ගලපා ගැනීමට.

තනි අලියාට පමණක් නොව අනිකුත් අභියෝගවලදීත්.....

භික්ෂුවගේ දක්ෂ භාවය නිසාම අභියෝගය ඉදිරියේ ජීවිතය අතහැරෙන කොට, ඉදිරියේ අනිවාර්යෙන්ම ඇතැයි කියලා අනුමාන කළ තනියා දකින්න සිටියේ නැත. තනියාට භික්ෂුවගේ ඉව දැනෙන සීමාවේ ඉන්න බැහැ. එයාට දැනෙනවා භික්ෂුවගේ අත හැරීමෙන් කම්පාවන ලෝක ස්වභාවය. සියල්ල ඔබ අත හරින්න. එවිට ඔබට මේ සියල්ල ලැබෙනවා. එහෙත් මේ සියල්ල ඔබට ලැබෙන විට මේ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද මේ සියල්ල අනිත්‍යබව ඔබ අවබෝධයෙන් දකිනවා. ඔබද ඔබේ වාසනාවන්ත භික්ෂු ජීවිතය ඉදිරියට අභියෝග පතිත වන විට පළා නොයන්න, බිය නොවන්න. යටත් නොවන්න. පිරිත් පොත අතට නොගන්න. බුදු ගුණ නොසිතන්න. ඔබත් අභියෝගයත්, ප්‍රතිඵලයත් ඔබේ නොවේ යැයි දකින්න. එවිට ඔබ දකින්නේ සැබෑම බුදු ගුණයයි.

ඔබේ ජීවිතය ඔබම ලෙඩ කරන්න, අංශභාග රෝගියෙක් කරන්න, පිළිකා, ලියුකේමියා, වකුගඩු රෝගියෙක් කරන්න. මග තොටේදී ඔබව වාහනයකට යටවී ශරීරය කුඩුවෙනවා දකින්න. ඔබ වයසට ගිහින් ලෙඩ ඇඳේ අබ්බගාතයෙක් ලෙස දුක් විඳිනවා දකින්න. ඔබට සලකන්නට කෙනෙක් නොමැතිව අසූචි මළ-මුත්‍රා මත ඔබ වැටී සිටිනා හැටි දකින්න. ඔබ මනසින් මිය යන්න.

ඔබේ සිතේ ස්වභාවය අධ්‍යයනය කරන්න. මේ සියලු කමටහන් තුළින් ඔබ තුළ වැඩෙන්නේ සතර සතිපට්ඨානය බව අවබෝධයෙන් දකින්න. මරණය මනසින් අත් දකිමින්, අත් විඳිමින් නැවත උපාදානයක් නැති අවසානයක් කරා යෑමට සිත පුහුණු කරන්න. අභියෝගය අවබෝධයක් කර ගන්න. ඔබද නිවන් මගට අවතීර්ණ වන්න. නිර්වින්දන, අලි වෙඩි, ඇත් ගොව්වන්, හෙන්ඩුව නොමැතිව සද්ධන්ත කුළයේ අලි ඇතුන් දමනය වන ආශ්චර්යමත් ධර්මයේ උරුමක්කරුවෙක් වෙන්න. හැබැයි ඒ අලි දමනය කිරීමට නම් නොවේ. අලි දමනය කිරීමට ඔබ තුළ ඇතිවන සිත හා කැමැත්ත දමනය කර ගැනීමටය. කැමැත්ත අතහැර දැමීමටය. කැමැත්ත යනු ඔබට අයත් දෙයක් නොවන බව දකින්න. අනිත්‍යභාවයට පත්වන සිත ඔබට දෙන අනිත්‍ය වූ නියෝගයක් පමණක්ම ලෙසින් එය දකින්න. සිත අත හැරුණු කල, කැමැත්තද ඔබට අතහැරෙනු ඇත. මේ මොහොතේත් ඔබ යම් කැමැත්තකින් පසුවෙනවා නම් ඔබ සියුම්ව නිරීක්ෂණය කර බලන්න. ඔබේ අනිත්‍ය භාවයට පත්වන, ඔබට අයිති නැති සිත නේද ඒ කැමැත්තට ඔබව පොළඹවන්නේ. භවය කරා ඔබව කැඳවා ගෙන යන අවිචාරවත් සිත අවබෝධයෙන් හඳුනාගෙන කැමැත්තෙන් මිදෙන්න.

ගමන ඉවරත් නොමැති
යන ගමනකුත් නොමැති
තුන් කලට වහල් නිති
ඔබත් ඔරලෝසු කටුවක්ද?

ඔබ මොහොතක් සිතන්න. අපි අවිද්‍යාව නිසා මොන තරම් වැරදි දෘෂ්ටිවල ඉන්නවාද කියලා. ඔබට සිතෙන්නේම 'දැන් ශාසනයෙන් වසර දෙදහස් පන්සීයක් ගෙවිලා අවසන්, දැන් ශාසනය අතුරුදහන් වන යුගය, ධර්මය අවබෝධ කර ගැනීමට මේ වකවානුවේ නොහැකියි. පිනක් දහමක් කරගෙන, පාරමී සම්පූර්ණ කර ගැනීමයි කළ යුත්තේ කියලා.

මේ සියළුම දෘෂ්ටීන් අවිද්‍යාව නිසා ඇතිවන ඒවාය. සමාජය දෙස බැලීමේදී අපි දකින්නේ විකෘති ස්වභාවයන්ය. අනාගතයේදී ඇතිවන විකෘති ස්වභාවය ගැන කොසොල් රජතුමාගේ සිහින විස්තර කිරීමේදී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මනාව පෙන්වා දී ඇත. වර්තමානයේ අපි කවි බණ, විරිදු බණ, කාලීන බණ, දෙපිට කැපෙන වචන යොදන බණ ආදිය අසන්නෙමු. අනාගතයේදී අපට සිංදුවෙන් බණ කියන ස්වභාවය දැකිය හැකිය. ස්වාමීන් වහන්සේ ධර්මාසනයේ සිට ධර්ම ගීතය ගායනා කරන විට ඒ අසළ සිටින සංගීත කණ්ඩායම එම ධර්ම ගීතයට සංගීතය සපයනු ඇත. මේවා ජනතාව අතර, විශේෂයෙන්ම තරුණ පරපුර අතර, ඉතා ජනප්‍රිය භාවයට පත්වේ. ජනතාව, තරුණ පරපුර ධර්මයට යොමු කිරීම සඳහා පාලකයන්ද, මාධ්‍යයද තව තවත් ධර්ම ගීත ප්‍රචලිත කරනු ඇත. මේවාට ඔබ කලබල විය යුතු නැත. මේවා ලෝකයේ ස්වභාවයන්ය. අපි කලබල විය යුත්තේ මෙසේ නොවුන හොත්ය.

අපි කළ යුත්තේ ලෝකයේ මෙම ස්වභාවය හඳුනාගෙන ලෝකයෙන් මිදී යෑමට වෙර දැරීමය. ලෝකයේ ස්වභාවය අපට වෙනස් කළ නොහැකිය. ඔබ මේවාට ගැටුන හොත් ඔබ ගැටෙන්නේ ධර්මය සමඟය. ලෝක ස්වභාවය සමඟය. අප කළ යුත්තේ ගැටීම නොව අවබෝධ කරගැනීමය. ඔබ අතීතයද, අනාගතයද අත හැරිය යුතුය. වර්තමානය තුළ පමණක් ජීවත් විය යුතුය. නිවන් මඟ වඩන්නා යනු වර්තමානය තුළ ජීවත් වෙන්නාය. හෙටක් ගැන බලාපොරොත්තුවක්, ඊයේ ගැන පසුතැවීමක් ඔහුට නැත. වර්තමානය තුළද ඔහු දැකිය යුත්තේ මොහොතකින් අතීතයට යන, මොහොතකට පෙර අනාගතය වූයේ වර්තමානය බවයි. එසේ නම් වර්තමානයද මායාවකි, මුලාවකි. එය නිරතුරුවම වෙනස් වෙයි. කාලය වෙනස්වීම අවබෝධයෙන් දකින්නා කාල සටහන්වලින් ඉවත්වේ. කාලසටහන් පාවිච්චි කළ හැක්කේ එකිනෙකට වෙනස් විෂයන්ටය. එහෙත් විශ්වය තුළ ඇත්තේ එකම විෂයකි. එකම පාඩමකි. එය නම් අනිත්‍යයයි.

ඔබ ජීවත්වන්නේ ද අනිත්‍යය තුළය. එහෙත් ඔබ එය නොදනී. අනිත්‍ය භාවය නිසා ඇතිවන දුක නැති කරගැනීම සඳහා ඔබ වෙහෙසේ. ඔබ තුළ ඇති තරගකාරීත්වයද, වේගයද, අනිත්‍යභාවය නිසා ඇතිවන දුක අවසන් කර ගැනීම සඳහා ඔබ ගන්නා ව්‍යායාමයේ ප්‍රතිඵලයකි. ජීවත්වීම යනුවෙන් ඔබ කරන්නේ ඔය කාර්යයයි. අබෞද්ධ පිංවතුන්ටද, සියළු සත්ත්වයාටමද මෙය පොදුය. ඔබ සිනාසෙන්නේ සතුටට යැයි ඔබට සිතෙනු ඇත. නැත. ඔබ සිනාසෙන්නේ දුක නැති කර ගැනීම සඳහාය. ඔබ ආහාර ගන්නේ කය පිනවා ගැනීමට නොව කුසගිනි දුක නැති කර ගැනීමටය. ඔබ ඖෂධ ගන්නේ ශරීරය සතුටු කිරීමට නොව මරණයෙන් බේරීමටය. ඔබ ශරීරයේ සුවඳ-විලවුන් තවරාගන්නේ ශරීරයෙන් හමන දුගඳ දුරු කර ගැනීමටය. ඔබ හිසකෙස් කළු කර ගන්නේද සුදු හිසකෙස් නිසා ඇතිවන දුක නැති කර ගැනීමටය. බලන්නකෝ 'මම, මගේ' යැයි ඔබ ගොඩ ගසා ගෙන සිටින දුක් කන්දක විශාලත්වය.

හොඳයි ඔබ මෙහෙම සිතන්නකෝ. ඔබ පන්සලට ගිහින් බුදුන් වඳින්නේ අපායට, දුකට වැටෙයි කියලා බයට. එතැනදී ඔබ මොකද කරන්නේ. දිව්‍යලෝක, මනුෂ්‍ය ලෝක ප්‍රාර්ථනා කරනවා. බලන්න ඔබ දුකේ සිටිමින් දුකම ප්‍රාර්ථනා කරනවා. මනුෂ්‍ය ලෝකයේ ජීවත්වෙමින් එම දුකම ප්‍රාර්ථනා කරනවා. අනිත්‍ය භාවයට පත්වෙන දිව්‍ය ලෝක දුකම ප්‍රාර්ථනා කරනවා. පිංකම් කරලා දුකම ප්‍රාර්ථනා කරනවා. පෘථග්ජන සත්ත්වයා අග මුල පැටලුණ නූල් බෝලයක් වගේයැයි ලොව්තුරා බුදුසම්දුන් දේශනා

කළේ මේ නිසාය. හැබැයි ඔබ නිවී සැනසිල්ලේ වීර්යයෙන් සතියෙන් මේ නූල් බෝලයේ පැටලුම ලිහා ගතහොත්, ඔබට එහි අගක් මුලක් මැදක් හොඳට දකින්න පුළුවන්. ලෙහා ගන්න පුළුවන්කම තිබීයදීමයි ඔබ මේ පැටලී සිටින්නේ. ඔබ මේ නූල් බෝලයේ පැටලිල්ල ලිහාගත හොත් ඔබ නූල් බෝලය නැවත බදා ගන්නේ නම් නැහැ. මොකද ඔබ අවබෝධයෙන් දන්නවා නූල් බෝලය පැටලුම් ස්වභාවයෙන් යුක්ත බව. මේ පැටලුම ලිහාගන්න ඔබට කාලය ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඔබට නිහතමානීකම තිබෙන්න ඕනේ. නිවන් මඟ නිවීමේ ශබ්ද කෝෂයේ 'අ' යන්න නිහතමානීකමයි. නිහතමානීකම නොමැති කිසිවෙකුට නිවීමේ ප්‍රතිපදාවේ දශමයක්වත් ඉදිරියට යා නොහැකිය. භික්ෂුව ගිහි කාලයේදී කොතැනින්ද, කවුරුන්ගෙන්ද යමක් ඉගෙන ගැනීමට හැකි.... ඒ සැම දෙනාටම සවන් දුන්නේය. ජාතිය, ආගම, වයස, තරාතිරම, නොබැලුවේය. ගතයුත්ත ගත්තේය. අත්හළයුත්ත අත් හැරියේය. වරක් භික්ෂුව ගිහි කාලයේදී ප්‍රධාන නගරයක ගමන් කරන විට යාචක මනුෂ්‍යයෙක් දැඩි වේදනාවකින් පෙළෙමින්, තම ගුද මාර්ගයෙන් ඉවතට පැමිණි අඟල් හයක් පමණැති ශරීර අවයවයක් ශරීරය තුළට ඔබනවා දුටුවේය. එය අර්ශස් රෝගයේ දරුණු අවස්ථාවකි. මේ යාචක පිංවතාගෙන්ද භික්ෂුව නිවීමට අවශ්‍ය කළමනා සොයා ගත්තේය. කුඩා දරුවෙකුගෙන් ඔබට යමක් ඉගෙනීමට හැකිනම් ඔබ එය ඉගෙනගත යුතුය. එය කළ හැක්කේ නිහතමානීකම තිබුණොත්ය. නිවීමේ මඟ උදෙසා ඔබට මවුකුස පිළිසිඳ වැඩෙන කලල රූපය තුළින් ලැබිය හැකි අවබෝධය, මහා පඬිවරයෙක්ගෙන් ලැබිය නොහැකිය. මන්ද මහා පඬිවරයා පිළිබඳව ඔබට නිවැරදිව අවබෝධය ලබා ගන්නට නම් ඔහුගේ කලල අවස්ථාවට, බිළිඳු අවස්ථාවට යා යුතු හෙයිනි. මේ දැකගැනීමට ඔබ තුළ නිහතමානීකම තිබිය යුතුය.

තමා සිල්වත් බවත්, භාවනාවෙන් ඉහළ තත්ත්වයක සිටින බවත් සිතමින්, මහා සංඝරත්නයට නොවඳින පිංවතුන්ද සිටියි. ධර්මය දැකීමට නම් අවම වශයෙන් ඔහු තුළ තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවක් තිබිය යුතුය. සමහරවිට ශීල, සමාධි, භාවනා මාන්නය නිසා මහා සංඝරත්නය නොවඳින පිංවතුන් සිටින්නේ මිථ්‍යාදෘෂ්ටිකභාවයේ වීමටද ඉඩ ඇත. මේවා නිහතමානී නොවීමේ ප්‍රතිඵලයයි. මහා සංඝරත්නයට නමස්කාර කිරීමට එම පිංවතුන්ට හිස නොනැමෙන්නේ ඒ පිංවතුන්ගේ හිස මාන්නයෙන් බරව ඇති නිසාය. අබුද්ධෝත්පත්ති කාලයේදීත් පසේ බුදුවරු ලොව පහළවී ධර්මය අවබෝධ කරගෙන නිවන් දකිති. උන්වහන්සේලා මනුෂ්‍ය ලෝකයේ මව් කුසක උපත ලබාගන්නේ සංසාරයේ පුරන ලද

පාරමී ශක්තිය අධ්‍යාත්මය තුළ දරාගෙනයි. සංසාරයේ පුරන ලද අනිත්‍ය සංඥාවේ ඉව උන්වහන්සේලාගේ අධ්‍යාත්මය තුළ සැඟවී තිබෙනවා. උන්වහන්සේලා තනිවම, හුදෙකලාවේ වනගතව ධර්මය අවබෝධ කර ගන්නවා. හැබැයි අවබෝධ කරගත් ධර්මය පසේ බුදුවරු විසින් ජනතාවට දේශනා කරන්න යන්නේ නැහැ. ඒ උන්වහන්සේලාට දේශනා කිරීමේ ශක්තිය, අවබෝධය නැති නිසා නොවෙයි. ධර්මය අවබෝධය ලැබුවා කියන්නේ එහි ස්වභාවය දැක්කා කියන එකයි. ධර්මයේ ස්වභාවය දැක්කා නම් එය දේශනා කරන්න බැරිවෙන්න බැහැ. ඔබ පිටකොටුවට ගියා නම් ඔබ දන්නවා බස් නැවතුම, දුම්රිය පළ, බෝ සමිඳුන් කොතැනද සිටින්නේ කියලා. පිටකොටුවේ ස්වභාවය ගැන කියන්න, ඔබට එය කියන්නට බැරිනම් ඔබ නියත වශයෙන්ම පිටකොටුවට ගිහින් නැහැ. පසේ බුදුවරු තමා අවබෝධකරගත් ධර්මය අනුන්ට දේශනා නොකරන්නේ ධර්මය අවබෝධයට තබා, ධර්මයට ගරු කිරීමටවත්, විෂමවූ, පාපකාරී, මිථ්‍යාදෘෂ්ටික අබුද්ධෝත්පාද කාලයකදී කෙනෙකු නොමැතිවීමයි. පසේ බුදුවරු එවැනි කාලයකදී එවැනි මිනිස් සමාජයකට ධර්මය දේශනා කිරීමට ගියහොත් එම සමාජය පසේ බුදුහිමිට 'පිස්සෙක්' යැයි පරිභව කරනු ඇත. පහර දෙනු ඇත. මෙවැනි හේතූන් නිසා මිනිසා රැස්කර ගන්නා අකුසල්වල ප්‍රමාණය උන්වහන්සේලා හොඳින්ම දනියි. ඒ නිසා පසේ බුදුරජාණන්වහන්සේලා වනයේ හුදෙකලාවේ වැඩ සිටිමින් පිරිනිවී යති. උන්වහන්සේලා මිනිසාට දේශනා කිරීමට නොයන්නේ ඔවුන් කෙරෙහි ඇති කරුණාව, මෛත්‍රිය නිසාමය. මෙවැනි විෂම කාලවලදීත් පසේ බුදුවරු ධර්මය අවබෝධ කරගන්නේ නම්, ධර්මය අවබෝධ කර ගැනීමට කාලය ප්‍රශ්නයක් නොවේ. ප්‍රශ්නය ඇත්තේ ධර්මය අවබෝධ කරගැනීමට ඔබ කාලයට බාරදීමයි. කාලය තුළ ඇත්තේද වෙනස්වීම, ගෙවීයාම පමණක්මය. අතීතයද, වර්තමානයද, අනාගතයද නිරතුරුවම වෙනස්වන, අනිත්‍යයට පත්වන ස්වභාවයන්ය. මෙතුවක් කලක් සංසාරයේදී කාලය විසින් ඔබව රවටා ඇත. ඔබව රැවටීමට කාලයට උදව් කළේ අවිද්‍යාවයි. නිත්‍යභාවයේ නැති අනාගතයකට, ධර්මාවබෝධය ලැබීම භාරකරන පෘථග්ජන සත්ත්වයා දිය පිපාසයෙන් මිරිඟුව පසුපස දිවයන මුවෙක් සේ නැති අනාගතයක් පසුපස දිවයයි. ඔහු දිවයන වේගයෙන්ම ඔහු සොයන අනාගතයද අවිද්‍යාව විසින් ඉදිරියට දුවවනු ඇත. මේ අවිද්‍යාවෙන් ඔබ නොමිදුනොත් දිවීමත්, හති දැමීමත්, දුකත් හැර ඔබට අනාගතයක් හමු නොවනු ඇත. කල්ප ගණනක සිට අනාගතයට දිව යමින් හති දමමින් මේ මොහොතේ ඔබ සිටින්නේද එම ස්වභාවයේමය. මේ මොහොතේද ඔබ

නිවන් මග වැඩීම කල් දමා ඇත. සමහරු මෛත්‍රී බුදු සමිඳුන් දැක නිවන් දැකීම පිණිස කල්ප ගණනක් අනාගතයට ගොස් ඇත. නැති අනාගතයක් ඉලක්ක කරමින්, ධර්මය අවබෝධ කර ගැනීමට ඔබ ලැබූ මේ උතුම් අවස්ථාව අපතේ හැරීමකි ඔබ මේ කරමින් සිටින්නේ.

අවබෝධය අතින් ඔබ මෙතැනැයි සිටින්නේ කියලා අධි තක්සේරුවකට එන්න එපා. මොකද ඔබ මෙතැනයි ඉන්නේ කියලා කියන්න ස්ථිර, වෙනස් නොවන තැනක් ලෝකයේ නැහැ. ඔබට, මම මෙතැන සිටිනවාය කියලා රැඳී සිටින්න බැහැ. ඔබට එහෙම සිතෙනවා නම් ඔබ සිටින්නේ අන්තිමයාටයි. ඔබට ප්‍රථමයා වෙන්න නම්, ඔබට දැනෙන්න ඕනේ ඔබ සිටින්නේ අනිත්‍යය තුළයි කියලා. ස්ථිර තැනක් නැති ලෝකයේ ඔබ කළ යුත්තේ ස්ථිර තැන් සෙවීමට නොව අස්ථිර ලෝකයෙන් මිදී යෑමය. කාලය තුළ අතීත, අනාගත වර්තමාන වශයෙන් ස්ථිර යමක් නොමැත. කාලය යනු අනිත්‍යයයි. එනිසා කාලය, වේලාව ඔබ අත හරින්න. එවිට අතීත, අනාගත, වර්තමාන තුන් කාලයම ඔබට අතහැරේවී. ඔබට එසේ දකින්නට බැරි නම් ඔබ සිතන්න, සංසාර ගමන් මගේ ඔබ ගතකරන මේ මොහොත හොඳම කාලය බව. ධර්මය අවබෝධකර ගැනීම පිණිස මෙවැනි කාලයක් තව කල්ප ගණනාවකට ඔබට නොලැබේවි. ඉක්මනින් හිතන්න. වර්තමානය අතීතයට යනවා. අනාගතය වර්තමානය වෙනවා. ඔබ නැති අනාගතයක් දකිමින් දුක සමඟ පෙරටම යනවා. අනාගතය, අනාගතය.... කියලා මාරයා ඔබට ලොකු කැරට් අලයක් දික් කරනවා. දුක සැපක් කරගත්, සැප බලාපොරොත්තුවක් කරගත් අපි මේ යන්නේ නැති අනාගතයක් සොයාගෙනය.

නාලගිරි අදත් වඩියි

නාලාගිරි ඇතා කීවම ඔබට දැනෙන්නේ බියක්. රා පොවල වෙරිමතින් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ඉදිරියට වියරු ස්වභාවයෙන් පැමිණි නාලාගිරි ඇත් රජු ගැන ඔබ හොඳට අහල තිබෙනවා. ඔබ විශ්වාස කරයිද දන්නෙ නැහැ මෙහි සටහන් කරන දෙය. අදත් පුළුවන් අතීතයේ බුදු සමිඳුන් අභියස දණ නැමූ ඒ නාලාගිරි ඇත් රජුව දකින්න. හැබැයි ඔබ නාලාගිරි ඇත් රජුව දකින්න නම් අත හැරීමේ උපරිමය තුළ ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවක් වෙන්න ඕනේ. ඒ කියන්නෙ සැබෑ මධ්‍යම ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවක්.

භික්ෂුවක් බදුල්ල දිස්ත්‍රික්කයට අයත් රක්ෂිතයක ගොදුරු ගමෙන් කිලෝ මීටර් එකහමාරක් පමණ ඈතින් වනයේ හුදකලා කුටියක වැඩ සිටියා. කුටියට වඩින්ට තිබෙන්නේ අලිමංකඩ ඔස්සේය. භික්ෂුව වැඩ සිටිය කුටිය ගෙමිදුලින් තමයි අලිමංකඩ වැටී තිබුනේ. භික්ෂුව මේ කුටියට පැමිණි ප්‍රථම දිනයේම රාත්‍රී දහය වෙන කොට අලි තුන් දෙනෙක් කුටිය පිටිපස පැය භාගයක් පමණ අතු බිඳිමින් ආහාර ගෙන අලිමංකඩ ඔස්සේ ගමට වැදුනා. පසුදා උදෑසන භික්ෂුව පිණ්ඩපාතය සඳහා වඩිනකොට භික්ෂුවට පේනවා ගමේ කුඹුරු කීපයක්ම අලි විනාශ කර තිබීම නිසා මිනිසුන් පත්ව සිටි වේදනාව. භික්ෂුව මේ මොහොත වන විටත් කරණීයමෙත්ත සූත්‍රය හැර වෙන කිසිම සූත්‍රයක් කට පාඩමින් සජ්ජායනා කිරීමට නොදන සිටියේය. පිරිත් පොතක්ද භාවිතා නොකළේය. නිවීම උදෙසා යන ගමනේදී ඒවා

අවශ්‍ය නොවන බව භික්ෂුව දැනසිටියේය. එහෙත් එක්තරා ආරණ්‍යයකදී හමුවූ ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවට නාලාගිරි ගාථාව සහ අංගුලිමාල පිරිත ද, කඳ පිරිත ද ලියා තබාගන්න යැයි කීව නිසා භික්ෂුව තනිරූල් පිටුවක එම ගාථාව ලියා තබා තිබිණි.

එහි නාලාගිරි ගාථාව මෙලෙස සටහන් කොට තිබිණි.

'මා කුඤ්ජර නාග මාසදෝ
දුක්ඛං හි කුඤ්ජර නාග මාසදෝ
නහිනාග හතස්ස කුඤ්ජර සුගති හෝති
ඉතෝ පරං ගතෝ'

ඉහත ගාථාව නිවැරදිදැයි භික්ෂුව තවමත් ස්ථිරව නොදනී. එහෙත් භික්ෂුව භාවිතා කළේ ගාථාවේ ඉහත පද හතර පමණකි. භික්ෂුව ආශ්චර්යයක් බලාපොරොත්තු නොවින. අවශ්‍ය වූයේ තමා වෙනුවෙන් නොව, තමන්ට පිණ්ඩපාතය පූජා කරන දුප්පත් දායකයන් වෙනුවෙන් තාවකාලිකව හෝ යහපතක් කිරීමටයි. ප්‍රතිඵලය කුමක් වේදැයි භික්ෂුව නොසිතුවේය. නොදත්තේය. ඊට අමුතු ආයාසයක්ද, වෙහෙසක්ද නොගත්තේය. දිනකට ඉහත ගාථාව විසිපස් වතාවක් පමණ ශබ්ද නගමින් සජ්ජායනා කළහ. දින දෙකක් මෙසේ ගාථාව සජ්ඣායනය කිරීමේදී.... අරුමයකි! භික්ෂුව සමාධියෙන් පසුවෙද්දී කැළයෙන් මතුවන ඇත් රුවක් පෙණිනි. ඇතෙක් නොව ඔහු ප්‍රතාපවත් ඇත් රජෙකි. දිළිසෙන ප්‍රභාෂ්වර කලු පැහැයෙන් යුත් ශරීරය සාමාන්‍ය ඇතෙකුට වඩා පළලින් යුක්තය. එය හරියට පෙරහැරේ යන ඇතෙකුට ඇඳුම් ආයිත්තම් ඇන්දවූ පසු පළලට පෙනෙනවා සේය. දිග ඇත් දළ යුගළකි. එහි කෙළවර දෙකට රන්වන් කොපු දමා ඇත. හිසේ ඉදිරි කොටස ආභාරණවලින් සරසා ඇත. ඇත් රජුගේ ඇස් දෙකෙන් ඉතා තියුණු දීප්තිමත් සුදු පැහැති ආලෝක ධාරා දෙකක් විහිදේ. එම ආලෝකය ඉතා තියුණුය. ඉහත ගාථාව සජ්ඣායනා කරන විට මෙම ඇත් රුව දිනකට හතර පස් වතාවක් භික්ෂුවට සමාධියේදී දිස්වේ. බලන්න ධර්මයේ ආශ්චර්යය. ඔබ දක්ෂ නම් මීට වසර 2500කට පෙර ජීවත්වූ නාලාගිරි ඇත් රජුවද වර්තමානයේදී දැකිය හැකිය.

මේ ඇත් රජු දර්ශනය වීමත් සමඟම, භික්ෂුව එම කුටියේ වැඩ සිටි මාස දෙක පුරාවට ගමට පැමිණි අලි ගමට තබා, කුටිය අසළටවත් පැමිණියේ නැත. භික්ෂුව කුටිය අතහැර ගිය පසු කුමක් වූවාද යන්න භික්ෂුව නොදනී. මෙය භික්ෂුවගේ ආශ්චර්යයක් නොව, ධර්මයේ ආශ්චර්යයකි. අත හැරීමේ ක්‍රියාවලියේ ආශ්චර්යයකි.

මෙහිදී සිදුවන දෙය පුදුමාකාරය. භික්ෂුවට මේ දිව්‍ය ඇත් රජු සමාධියේදී පෙනෙනවා සේම, අලින්ටද මේ ඇත්රජු දර්ශනය වේ. ඇත්රජුගේ තේජස් දැස්වලින් විහිදෙන ප්‍රභාශ්වර ආලෝක ධාරා දෙක නිසා කැලේ අලි බියට පත්වේ. සද්ධන්ත කුළයේ ඇතෙකු දැක පළායන අලින් සේ ඉහත ගාථාව භාවිතා කිරීමේදී, සජ්ඣායනා කිරීමේදී අලි මඟහැර යන්නේ නාලාගිරි ඇත් රජු දිව්‍ය ආත්මභාවයක සිට බුදු අණින් යුත් ඉහත ගාථාවෙන් කරන ආරාධනයත් සමඟ වඩින නිසාය. ලොව්තුරා බුදු සමිඳුන් අභියස දණ ගැසූ නාලාගිරි ඇත් රජු, බුද්ධ අණින් මේ මොහොතේද අර්ථවත්ව, නිවැරදිව නිවන් මඟ වඩනා බුදු පුතුන් ආරක්ෂා කිරීමට පෙනී සිටියි. බුදු පුතුන්ගේ අණට දර්ශනය වේ. හැබැයි ගාථාව සජ්ඣායනා කළ පමණින් එය කළ නොහැක. ගාථාව භාවිතා කරන්නා තුළ අත හැරීම උපරිමයෙන් තිබිය යුතුය. ඉහත කුටිය පරිහරණය කරන විට භික්ෂුවට තුන් සිවුරත්, පාත්‍රයත් හැර අන් දෙයක් එහි නොතිබුණි. අතහැරීමේ උපරිමය තුළ නාළාගිරි ගාථාවේ සාර්ථකත්වය ඔබත් අත්විඳින්න.

භික්ෂුව මේ ලියන මොහොතේද ඉහත ගාථාව නිවැරදි දැයි නොදත්තේය. ඒ එම ගාථාවද භික්ෂුව අතහැර දැමූ නිසාය. එහි නිවැරදි භාවය සෙවීමට, එහි පද අඩුදැයි සෙවීමට උන්වහන්සේට මේ මොහොතේද අවශ්‍ය නොවේ. එය අත හැරීමේ ස්වභාවයේ උපරිමයයි. භික්ෂුව මෙම ගාථාවේ නිවැරදි භාවය සෙවීමට ගියා නම් උන්වහන්සේට මේ ගාථාවෙන් ප්‍රාතිහාර්යයක් දැකිය නොහැක. මන්ද එසේ නම් උන්වහන්සේ ගාථාව තුළ නිත්‍ය භාවයක් දකින නිසාය. සමහර විට මේ කියවන ඔබට ගාථාවේ පද අඩු බවට, වැරදි ඇති බවට විචිකිච්චාවක් ඇතිවිය හැකිය. එය අතහැරීමේ ස්වභාවය නොවේ. අල්ලා ගැනීමේ ස්වභාවයයි.

ඔබ යමක් සොයන්නේ නම් සෙවීමට නිත්‍ය යමක් තිබිය යුතුය. වැරදි සොය සොයා සිටීම දුර්වලතාවයකි. ලැබුණ දේ ගලපා ගැනීමට ඔබ දක්ෂ විය යුතුය. ගාථාව, පිරිත යනු අනිත්‍ය පද පෙළකි. එම අනිත්‍ය දකිමින් එය භාවිතා කිරීම ප්‍රතිඵලදායකය. භික්ෂුව දන්නා නිවීමේ ප්‍රතිපදාව මෙයයි. එහෙත් ඔබ ආමිසය තුළ බුදුරජාණන් වහන්සේට පූජා පවත්වන පිංවතෙකු නම් ගාථා පිරිත්වල අර්ථ වශයෙන් දැක සජ්ඣායනා කිරීම අත්‍යවශ්‍යය. ප්‍රතිඵලදායකය. ලෞකික ජීවිතය යහපත්ව හැඩගස්වා ගැනීමට උපකාරී වේ. ඉහත මාර්ග දෙක ඔබ පටලවා නොගන්න.

ලොව්තුරා බුදු සමිඳුන් නාලාගිරි හස්තිරාජයාට දේශනා කළ ඉහත ගාථාව, උපරිම මට්ටමින් ප්‍රතිඵල පෙන්වූ අවස්ථාවක් ලෙස භික්ෂුව ඉහත අවස්ථාව

දකියි. බුදුරජාණන් වහන්සේ යම් අරමුණකින් ඉහත ගාථාව නාලාගිරි හස්තියාට දේශනා කළාද, ඉන් ප්‍රතිඵල ලැබුවාද, භික්ෂුවටත් එය එසේම සිදුවිය. බුදු වදනේ ආශ්චර්යය මෙයයි. සත්‍යතාවය මෙයයි. එය අත්විඳිය හැක්කේ අතහැරීම තුළම පමණි. භික්ෂුව ඔබට නැවතත් කියයි. ඔබේ අවබෝධය සඳහාම....

භික්ෂුව ඉහත කුටියේ වැඩ සිටින මාස දෙකක කාලය තුළදී හුණු මිශ්‍ර දොලේ ජලය පාවිච්චි කිරීම නිසා මුත්‍රා මාර්ගයේ ආබාධවලින්ද, ආහාර මඳකම නිසා ලේවල සීනි හිඟවීමේ ක්ලාන්තයෙන්ද පීඩා වින්දේය. එහෙත් ඒ සෑම පීඩාවක්ම ජයග්‍රහණයක් කරගැනීමට භික්ෂුවට හැකිවිය. එම පීඩාවන් නිවන් මඟට ආශිර්වාදයක් කරගත්තේය. නාලාගිරි හස්ති රාජයා දර්ශනය කරගැනීමද එම ආශිර්වාදයේ ප්‍රතිඵලයකි. ඇති වෙන්නාවූ ස්වභාවික තත්ත්වයන්ට මුහුණ දෙනවා විනා, නිවීම උදෙසා උවමනාවෙන් දුක් විඳිය යුතුය යන වැරදි මතයට ඔබ නොඑන්න. මෙම අර්ථයන් ඔබ වැරදි අයුරින් ක්‍රියාත්මක කළොත් ඔබ මානසික රෝගියෙක් වීමටද ඉඩකඩ ඇත. එහෙයින් ඔබ නිරතුරුවම මඟ වැඩූ කල්‍යාණ මිත්‍රයකුගෙන් ගුරුවරයෙකුගෙන් අවශ්‍ය උපදෙස් ලබාගන්න. ඔබ මෙය කියවා නාලාගිරි හස්තිරාජයා දකින්නට ආශාවෙන්, ඉහත ගාථාව කොතෙක් සජ්ජායනය කළද, ඔබට ප්‍රතිඵල නොලැබෙනු ඇත. ආශාවෙන් අල්ලාගත් තැන ධර්මයේ ප්‍රතිඵල ශූන්‍යවේ. ආශාව අතහැරුණු කල ධර්මයේ ප්‍රතිඵල උදාවේ. ආශාව අතහැරෙන්නේ ප්‍රඥාව වැඩීමෙන් පමණක්මය. ප්‍රඥාව වැඩීමේ ජලය වන්නේද, පොහොර වන්නේද සතර සතිපට්ඨානයයි. සතර සතිපට්ඨානයෙන් ඔබ ලබන ඵලය අනිත්‍යයයි. අනිත්‍යය අවබෝධයෙන් ඔබට ලොව්තුරා බුදු සමිඳුන්වද, නාලාගිරි හස්ති රාජයාවද, ඔබවද, සතර සතිපට්ඨානයද ලෝකයද අතහැරෙනු ඇත.

මේ සියල්ල මෙසේ සිදුවෙද්දී ගම්වැසියන් සිතුවේ භික්ෂුව මන්ත්‍ර ගුරුකම් දන්නවා කියාය. මන්ද භික්ෂුව ගමට වඩින්නට ගත් කාලයේ පටන් අලින් ගම් නොවැදුණු බැවිනි. මිනිසුන්ගේ මේ මතයන් නිවැරදි කිරීමට භික්ෂුවට අවශ්‍ය නොවීය. අනුන්ගේ සිත් තුළ ඇතිවන සිතිවිලි භික්ෂුවට අදාළ නොවේ.

නමුත් මෙසේ ගතවෙද්දී එක් තරුණයෙක් භික්ෂුව මුණගැසීමට පැමිණ තමා හමුදාවට බැඳීමට යන නිසා ආරක්ෂාවට යන්ත්‍රයක් සකස් කරදෙන මෙන් ඉල්ලා සිටියේය. එහිදී භික්ෂුව එම තරුණයාට මෙසේ ප්‍රකාශ කළේය. 'පුතේ, මා දන්නේ එකම ආරක්ෂාවයි. ඒ තමයි තුණුරුවන්ගේ ආරක්ෂාව. වෙන ආරක්ෂාවක් කරන්න මම දන්නේ නැහැ'

ලෝකයේ ඔබව සුරැකෙන ශ්‍රේෂ්ඨම ආරක්‍ෂාව මොකක්ද කියලා ඔබ දන්නවාද?

ඔබ සියල්ල අතහරින්න. ඔබට ආරක්‍ෂා කරන්න, ආරක්‍ෂා වෙන්න කිසිවක්ම නැහැ. සත්ත්වයෙක් පුද්ගලයෙක් නැති තැනකට කුමන ආරක්‍ෂාවක්ද? කාගෙන් ආරක්‍ෂාවක්ද? කුමක් ආරක්‍ෂා කිරීමක්ද? මෙලොව සුරක්ෂිත එකම පුද්ගලයා ධර්මය අවබෝධකරගත් උත්තමයාය.

පිංවත් අයෙක් වරක් භික්‍ෂුවගෙන් ඇහුවා 'ඇයි ඔබ වහන්සේ පිරිත් කට පාඩමෙන් නොදන්නේ, පිරිත් පොතක් භාවිතා නොකරන්නේ ?' කියලා. එවිට භික්‍ෂුව ලබාදුන් පිළිතුර තමයි, ඔබ භික්‍ෂුවගේ සිත, කය, වචනය ක්‍රියාත්මකවන ස්වරූපය දකින්න. ඒ ඔබ දකින්නේ පිරිවානා පොත් වහන්සේය කියලා. පිරිත් තිබෙන්නේ සජ්ඣායනා කිරීමට, ශ්‍රවණය කිරීමට පමණක් නොවේ. එහි හරය, සාරය, අර්ථය ජීවිතයට එකතු කර ගැනීමටය. ඔබත් දක්‍ෂවෙන්න, ඔබගේ ජීවිතය පිරිත් පොතක් කර ගන්න. එවිට ඔබේ ආරක්‍ෂාවට යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් අවශ්‍ය නොවනු ඇත.

ඉහත කුටියේදී නාලාගිරි ගාථාව භාවිත කළ විට ආශ්චර්යයක් සේ අලින් නැවත කුටිය ප්‍රදේශයට නොපැමිණියද වෙනත් කුටිවලදී නාලාගිරි ගාථාව භාවිතා කළත් අලින්ගේ පැමිණීම නතර නොවූ බවද සටහන් කරමි. භික්‍ෂුව මෙහිදී වටහා ගත්තේ අතීතයේ ජීවත්වුන නාලාගිරි හස්තියා බුදුරජාණන් වහන්සේගේ බුදු අණ පිළිගෙන එහි ආනිසංශය නිසාම මරණින් පසු දිව්‍ය හස්ති රාජයෙක් ලෙස වැඩ සිටින බවයි. මේ දර්ශණයෙන් භික්‍ෂුවට එය සක් සුදක්සේ පැහැදිලි විය. බුදුරජාණන් වහන්සේ සරණ ගිය අකීකරු හස්ති රාජයාගේ සත්‍ය භවගමන අවබෝධ කරගැනීම උදෙසාම මෙන්ම දිව්‍යතලවල දිව්‍ය සතුන්ද වැඩසිටින බව දැනගැනීම උදෙසාම ඉහත ආශ්චර්ය සිදුවූ බවයි. පාරම්පරිකව අලි ඇතුන් භාවිතා කරන කුටි ආශ්‍රිතව ඇති අලිමංකඩ යනු වල් අලින්ගේ නිදහස් අයිති වාසිකමකි. වල් අලින් එම නිදහස වඩාත්ම රාත්‍රි කාලයේදී පමණක් භුක්ති විඳින්නේ කුටිවල වැඩ සිටින ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගේ නිදහසට කිසිදු බාධා කිරීමකින් තොරවය. එහෙයින් නාලාගිරි දිව්‍ය හස්තිරාජයා අත්‍යවශ්‍ය මොහොතේ තම අනන්‍යතාවය පෙන්වීමට භික්‍ෂුවට පෙනී සිටියා මිස නැවත නැවත ඉහත ආකාරයට හැසිරෙමින් කැලයේ නිදහස අභිමිව සිටින අලි ඇතුන්ගේ ඉතිරිවී ඇති නිදහසටද බාධා කිරීමට ඉදිරිපත් නොවනු ඇත.

මේ කැඩපතින් ඔබේ මුහුණත් බලන්න

සත්ත්වයා හිරිකිතයකින් තොරව මොන තරම් අකුසල් සිදුකර ගන්නවාද? මිනිසුන් පංච සීලය පවා කඩ කරමින් පව් සිදුකර ගන්නේ හරියට බලපත්‍රයක් අරගෙන වගේ. මේ අයට මේවා කරන්න ලැජ්ජාවක් බියක් නැහැ. විශේෂයෙන් සත්ත්ව ඝාතනය, කාමය වරදවා හැසිරීම මහා දුක් ගෙනදෙන අකුසල්. හුඟක් වෙලාවට අනෙක් වැරදි සිදුවෙන්නෙත් මේ වැරදි දෙක නිසයි. නියත වශයෙන්ම මේ වැරදිවල යෙදෙන අය ඒවායේ විපාක වශයෙන් ප්‍රේත, භූත ආත්මවල ඉපැදෙනවාමය. මීට අමතරව, තණ්හාව ප්‍රේත ලෝකයට ඉතා හොඳ සුදුසුකමකි. දේපල, අඹු-දරුවන් ගැන ඔබ තුළ ඇති තණ්හාව, ඒවාට ඇති ආශාව අතහැරීමට බැරිකම, ඔබ පිං කළද ප්‍රේත ආත්මවලට වැටීමට අතිශයින්ම හේතුවේ. දිව්‍ය, බ්‍රහ්ම ලෝක සංඥාවන් දැකිය හැක්කේ ප්‍රභාශ්වර ආලෝක සහිතවය. ඒ අය ආලෝකමත්ය. එහෙත් ප්‍රේත ලෝකයේ සංඥා නිරතුරුවම අඳුරුය. විකෘතිය. ගුප්තය. තැතිගත් ස්වභාවයෙන් යුක්තය. කිසිදු ප්‍රේතයකුගේ ස්වරූපයේ සතුටු ස්වභාවයක් දැකිය නොහැකිය. මහා ප්‍රශ්නාර්ථයකට මැදිවී සිටින්නා සේ වික්ෂිප්ත ගුප්ත ස්වරූපයක් දර්ශනය වේ. එකිනෙකාට වෙනස්වූ විකෘති ස්වභාවයන්ගේ මුහුණු ප්‍රේතයන්ට ඇත. මුහුණේ සෑම දශමයක්ම විකෘතිය. සමහර මුහුණු පැතැලිය. දිගය. රවුම්ය. ඇස, කණ, නාස, නළල, හිස ඇත්තේ විකෘති ස්වභාවයන්ගෙන් යුතුවය. ප්‍රේතයා යනු විකෘති නිර්මාණයකි. ප්‍රේතයාට තිබෙන්නේ ඕලාරික කයකි. සමාධිය වඩන්නාට එම ඕලාරික කය සියුම් ඝණ ස්වභාවයෙන් දැකිය හැකිය. ප්‍රේතයාගේ ඕලාරික කය තුළ

මනුෂ්‍යයාට, දෙවියාට, බ්‍රහ්මයාට සේම ආයතන හය පිහිටා ඇත. එහෙයින් ප්‍රේතයාටද සිත් ඇතිවේ. ප්‍රේතයා අනිත්‍යභාවයට පත්වෙන සතර මහා ධාතුන්ගෙන් සකස්වුණ, ඕලාරික කයක්ද, ඇතිවෙමින් නැතිවෙන සිතක්ද ඇති සත්ත්වයෙකි. ප්‍රේත ලෝකයේ ප්‍රේතයෝ සහ ප්‍රේතියෝ දෙකොට්ඨාශයම සිටිති. මේ අය නිරතුරුවම අඳුර සහ ගුප්තභාවය තුළ ජීවත්වන නිසා ඒ අයට නිතරම බය සහ ගැටීම තුළ ජීවත්වීමට සිදුවේ. එය අතීත කර්මයේ ප්‍රතිඵලයකි. බය සහ ගැටීම තුළ නිරතුරුවම ජීවත්වීම නිසා, ප්‍රේතයාගේ සිත වෛරය, ක්‍රෝධය, තණ්හාව වැනි අකුසල් ධර්මයන්ගෙන් පිරී පවතී. ප්‍රේත ලෝකයේ ජීවත්වන සෑම තත්පරයකදීම ඔහු රැස්කරන්නේ අකුසල්ය. කුසල්-අකුසල් ගැන ප්‍රේතයාට හැඟීමක් නොමැත. එය ඔහුගේ කර්මයයි. දිව්‍ය, මිනිස් ආත්මවල ඉපිද, කරගත් කර්මයන් හේතුවෙන් ප්‍රේත ලෝකයට බැසගන්නා ප්‍රේතයන් විවිධ ස්වභාවයන්ගෙන් යුක්තය.

භික්ෂුවට හමුවූ ප්‍රේතයන්ගේ ස්වභාවය හරිම අපූරුය. එක් ප්‍රේතියකගේ මුඛය නොමැත. තොල් එකට ඇලී ගොස්ය. ඒ පෙර සංසාරයේ දන් නොදීම සහ අනුන්ට දන් නොදීමට පෙළඹවීමේ කර්ම විපාක නිසා වියයුතුය. තවත් ප්‍රේතයෙක්ගේ ඇස්වලින් ගින්දර නිකුත්වේ. ඇස් නිරතුරුවම ගිනි ගනී. අනුන්ගේ ජයග්‍රහණ, දියුණුව ඉවසීමට නොහැකිව කළ අකුසල් නිසා මෙසේ වූවා වියහැකිය.

තවත් ප්‍රේතයෙක්ගේ ඇස්වලින් සුදු ආලෝක දෙකක් නිකුත් වේ. බල්බ දෙකක් සේය. අධික තණ්හාව නිසා ප්‍රේත ලෝකයට බැසගත්තද, අනුනට ධර්මය කියාදීම, අධ්‍යාපනය ලබාදීම වැනි හේතූන් නිසා ඇස්වලින් ආලෝකය නිකුත්වනවා වියහැකිය. තවත් අවස්ථාවක විකෘති නොවූ ශරීරයක් සහිත, හිස මුඩුකරන ලද, රවුම් පැහැපත් මුහුණක් සහිත, සිවුරක් දරාගත් භික්ෂු ප්‍රේතයෙක් ආරණ්‍ය බිමකදී දුටුවේය. පෙර ආත්මයේ ඔහු භික්ෂුවක් විය හැකිය. සිවුපසයට අධික තණ්හාව හේතුවෙන් ප්‍රේත ලෝකයට බැසගත්තද, කරන ලද පිං සහ ආමිස පූජාවන් නිසා විකෘති නොවූ ශරීරයක් ලැබුවා විය හැකිය. මෙම ආරණ්‍ය භූමියේදීම සුදු ජාතික ප්‍රේතයෙක් හමුවිය. ඔහු විදේශීය බටහිර ජාතික ස්වරූපයෙන්ම යුක්ත විය. ඔහුද විකෘති ස්වභාවයක් නොමැති ශරීරයක් ඇති ප්‍රේතයෙක් විය. ඔහු සමහරවිට ගිහි භාවයෙන් ආරණ්‍යයේ සිටි විදේශිකයෙක් හෝ මෙම ඉඩම්වල අතීත අයිතිකාර විදේශිකයෙක් වීමට පුළුවන්. එහෙත් එම සුදු ජාතික ප්‍රේතයා කරන ලද පිං හේතුවෙන් විකෘති නොවූ ප්‍රේත ආත්මයක් ලැබුවද අවසාන චුති සිතේ ඇතිවූ තණ්හාව නිසා ප්‍රේත ලෝකයට බැසගත්තා විය හැකිය.

ප්‍රේතයන් නිතරම කපුටන් සේ කණ්ඩායම් වශයෙන් සිටීමට ප්‍රිය කරන පිරිසකි. ඔවුන් දර්ශනය වීමේදී සමහරවිට සිය ගණන් සිනමා පටයක් සේ දර්ශනය වේ.

ප්‍රේත ලෝකයේ මහා අරුමය සත්ත්ව ප්‍රේතයන්ද සිටීමයි. එක් ආරණ්‍ය බිමක භික්ෂුව වැඩ සිටියදී ප්‍රේත හෝ භූත ස්වභාවයේ මී හරකුන් තුන්දෙනෙක් දුටුවේය. තුන්දෙනාගේම පැහැය ලා දුඹුරු පාටය. කිසිදු විකෘති භාවයක් නොමැතිය. සාමාන්‍ය මී හරක් ස්වභාවයේය. එක පේලියට මේ භූත මීහරක් තුන්දෙනා හිස සොලවමින් සිටියහ. මොවුනගේ කටවල් ඇලී තිබිණි. භික්ෂුව මේ ගැන සොයා බලන විට දැනගන්නට ලැබුණේ එම ආරණ්‍ය පිහිටුවීමට පෙර එම ආරණ්‍ය පිහිටි කැළය, මස් සඳහා හොර හරක් සහ මී හරක් මරන ප්‍රසිද්ධ ස්ථානයක්ව තිබූ බවයි. ඒ මීට වසර 50කට පෙරදීය. අතීතයේ හොර හරක් මැරූ මිනිසුන්, ඒ අය කරන ලද ප්‍රාණඝාත අකුසලය නිසා භූත මී හරක් ලෙස උපත ලබා ඇතැයි අනුමාන කළ හැකිය. බලන්නකෝ කර්මය පසුපසින් එන ස්වභාවය. ඔබ ආසා කළ ස්වරූපයෙන්ම කර්මය ඔබට විපාක දෙනවා. භූත මී හරකුන්ගේ කටවල් ඇලී තිබුණේ ඔවුනට ආහාර නොලැබීමටය. එයද කර්මයේ විපාකයකි. ඔය භූත ආත්මයෙන් මිදෙන තෙක් එම භූත මී හරක් නිරාහාරව දුක් විඳී. මේ ආකාරයෙන් භූත කුකුළන්ද, වනගත කුටිවලදී භූත මුවන්ද දර්ශනය වී ඇත. මේ සියල්ලන්ම පෙර මිනිස් ආත්මවල ඉපිද සත්ත්ව ඝාතනය කර හරක්, මී හරක්, කුකුළන්, මුවන් මරා මස් කමින් ජීවත් වූ සතුටු වූ මිනිසුන්ය. ඔවුනට ඔවුන් කළ කර්මයට අනුරූපීව ප්‍රතිසන්ධිය ලැබී ඇත. ඔවුන් විසින් කැමැති කළ දෙය ඔවුනට ලැබී ඇත. තමා කෑමට ආසාකළ මස තමාගේම මස බවට පත්වී ඇත. ප්‍රේත ලෝකයේ ජීවත්වන කිසිවෙක් උරණ නොවිය යුතුය. මන්ද තමන් කැමැති කළ දෙය තමන්ට දැන් ලැබී ඇත.

ප්‍රේතයන්ගේ ලෝකයට වඩා ප්‍රේතියන්ගේ ලෝකය හිරිකිතය. භික්ෂුවට දර්ශනය වූ එක් ප්‍රේතියක් කාමය වරදවා හැසිරීමේ වරදට ප්‍රේත ලෝකයට වැටුණු කුණු ප්‍රේතියක්ය. ඇය කාමය උදෙසා අඩ නිරුවත්ව ජීවත් වේ. ශරීරය හරිම අපුලය. මුහුණ විරූපීය. ශරීරය කුෂ්ඨ පිරී ඇත. බලන්න අප්‍රසන්නය. මිනිස් ස්ත්‍රියකගේ ස්වරූපයෙන්ම අඟපසඟ දර්ශනය වෙයි. පෙර ආත්මයේ කාමයේ වරදවා හැසිරීම නිසා ඇයට ලැබී තිබුණේ, දැකීමට අප්‍රසන්න ශරීර ස්වභාවයක්ය. ඇය කාමය යදිමින්, කාමය සොය සොයා ඇවිදී. ඇයගේ අකුසල් කර්මය නිසා ඇයට කාමය නොලැබේ. ඇය කාමය යදින්නේ එනිසාය. මෙවැනි කාම ප්‍රේතියක් මනුෂ්‍ය ලෝකයේ

ස්ත්‍රියක් ලෙස ජීවත්වීමේදී ලැජ්ජාවක් බියකින් තොරව වරදේ බැඳීමට ක්‍රියා කිරීමේ පාපයෙන් මෙම ප්‍රේත ආත්මය ලැබී ඇත. මිනිස් ලෝකයේ සේම ප්‍රේත ලෝකයේදීද මෙම ප්‍රේතියෝ මහා අකුසල් සිදුකරගනී. මැය මෙම භික්ෂුවගෙන්ද කාමය යැද්දාය. එම සිත ඇයට ඇති වෙද්දීම ඇය පිච්චී ගියාය. නිරයේ ගිනිදැල් මතටම ඇය වැටුණි. භික්ෂුව ඒ බව දනගත්තේ ඇය ලතෝනි දෙමින් අතුරුදන්වූ නිසාය. බලන්න හොඳ සිහි බුද්ධියෙන්. මෙම ප්‍රේතිය මිනිස් ලෝකයේ ඉපදිලා ස්ත්‍රියක් ලෙස කාමය වරදවා හැසිරිලා, ප්‍රේතියක් වෙලා ප්‍රේත ලෝකයේද කාමය වරදවා හැසිරිලා නිරයේ ගිනිදැල් මතට වැටී පිච්චෙනවා. මොන අභාග්‍යයක්ද. මෙය එම ප්‍රේතියගේ කථාව පමණක් නොව ඔබගේද කථාව විය හැකිය.

මේ රටේ මොනතරම් ගණිකා නිවාස තිබෙනවාද? මොන තරම් වැරදි කාම සේවනයන් සිදුවනවාද..... ඔබ එහෙම නොවෙන්න පුළුවන්. නමුත් එහෙම කරන අයගේ අනාගත ප්‍රතිඵල තමාම ලියන විභාගයේ ප්‍රතිඵල තමයි.

නවීන තාක්ෂණික ලෝකයේ මාධ්‍ය මාරයින් අහිංසක ඔබට දිගුකරන ප්‍රේත ලෝකයේ දෑත, ඔබ සිහි බුද්ධියෙන් අතහරින්න. ඔබත් මාධ්‍ය දරුවනුත් සුවසේ සැනසෙන්න.

තවත් අපූරු ප්‍රේතියක් ගැන සටහනක් තබමි. ඇයගේ මුහුණ විරූපී නොමැත. එය බැලුම් බෝලයක් වගේ රවුම්ය. මිටි මහත ප්‍රේතියකි. ඇය පැහැපත්ය. ඇයට බැරලයක ස්වභාවයේ තර ශරීරයක් විය. ඇය සිටියේ ඇඳුමක් ඇඟලාගෙනය. දෑත් දෙපා බරවා රෝගය සැදුනු අයකුගේ මෙන් මහතය. මේවා කර්මයේ විපාකයි. ඇය මෙම භික්ෂුවට දර්ශනය වන මොහොතේ සිටියේ මැද පෙරදිග රැකියාවකට ගොස් එනවිට රැගෙන එන ආකාරයේ විශාල ප්‍රමාණයේ සූට් කේස් එකක් සහ සුවඳ විලවුන් බෝතල් දෙකක් අතේ තබාගෙනය. එක අතක සූට් කේසයද, අනෙක් අතේ කුඩා සුවඳ විලවුන් බෝතල් දෙකද විය. මෙම ප්‍රේතිය සුවඳ විලවුන් බෝතල් දෙක දිගු කරමින් කාමය යදී. 'ඩුබායි' සූට් කේසයද ඇය අතේය. ඇය නියත වශයෙන්ම මනුෂ්‍ය ලෝකයේ ඉපිද, විදේශ රැකියාවකට මැද පෙරදිග ගොස් පැමිණ දැඩි ලෙස කාමය වරදවා හැසිරීමේ අකුසල විපාකයෙන්, මිනිස් ලොව ජීවත් වන විට තිබූ 'මැද පෙරදිග ' සංඥාව සමඟම ප්‍රේතාත්මයක් ලද කාම ප්‍රේතියකි. වර්තමාන සමාජය දෙස බැලීමේදී මේවා සිදුවිය නොහැකි දේවල් යැයි බැහැර කරලිය නොහැක. මෙහි සටහන් තැබුවේ භික්ෂුවක් සමාධිය තුළදී දුටු සත්‍ය සිද්ධීන්ය.

ප්‍රේතයන්ගේ ලෝකය අඳුරුය. බිය, තැතිගැන්ම නිසා කලබලකාරීය. ඔවුනුත් සොයමින් ඇවිදින්නේ කාමයයි. ඔවුන්ද යන්නේ මනුෂ්‍ය ලෝකයේ, දිව්‍ය ලෝකයේ අතීතයේ ජීවත්වීමේදී ඔවුන්ට තිබූ සංඥා විඳීම්, රස වින්දන සඳහාය. එහෙත් ඔවුනට අකුසල් බලය නිසා ලැබෙන්නේ දුකමය. කර්මය සහ විපාකය ඉතා හොඳින් ගැලපෙන ලෙස ලෝකය නිර්මාණය වී ඇත. මනුෂ්‍ය ලෝකයේදී ස්ත්‍රියක් ලෙස කාමය වරදවා හැසිරීමෙන් සතුටුවේ. එහි විපාක ලෙස කාම ප්‍රේතියක්ව ඉපිද, කාම පිපාසය තිබුණද එය සංසිඳුවා ගැනීමට නොහැකිව දුකට පත්වේ. එම නිසාය ප්‍රේතිය සුවඳ විලවුන් දිගුකරමින්, ඩුබායි බෑගය පෙන්වමින් කාමය යදින්නේ කර්මය සහ විපාකය හොඳින් ගැලපෙන නිසාය. නෑනා, මස්සිනා විවාහය වගේය. මේ හැම සිද්ධියකින්ම නැවත නැවත ඔප්පුවන්නේ ලොව්තුරා ධර්මයේ සත්‍යතාවයි.

ඔබද ලොව්තුරා මඟ නිවරුදිව හඳුනාගන්න. ඔබ සියල්ල අතහරින්න. එවිට සියල්ල ලැබේවි. සියල්ලම ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධකර ඇති නිසාය. අතහැරීමෙන් ලැබෙන මේ සුන්දර අත්දැකීම ඔබ ඔබේත් අත්දැකීම කරගන්න. භව ගින්නෙන් නිවී යන්න.

භික්ෂුව මේ සටහන් තබන්නේ ඔබේ තෘප්තිය සඳහා නොවේ. අවබෝධය සඳහාය. මේ ඝෝර, කටුක, භයානක සංසාරය සත්ත්වයා දුක සොයාගෙන යන ගමනේ කැඩපතකි. දයාබර පිංවත! මේ කැඩපතින් ඔබ ඔබේ මුහුණ බලන්න. ඔබට පෙනෙන්නේ ඔබේම මුහුණ නම් ඔබ සතුටු වෙන්න. ඔබට පෙනුණේ පෙරේතයකුගේ පෙරේතියකගේ මුහුණ නම් ඔබ වහාම අප්‍රමාදීවන්න. ප්‍රමාදය දුකට හේතුවනු ඇත. භික්ෂුවට වරක් දර්ශනය වූ කිසිම ප්‍රේතයෙක්, ප්‍රේතියක් නැවත දර්ශනය වී නොමැත. සමහර විට පිං ගැනීමට හැකි ප්‍රේතයන් මෙසේ දර්ශනය වී පිං අනුමෝදන්ව ප්‍රේත ලෝකයෙන් චුතවනවාදැයි භික්ෂුව නොදනී.

ප්‍රේතයන්ගේ අධ්‍යාත්මය තුළ යටපත්වී ගිය කුසල ශක්තියක් ඇත. එම යටපත්වූ කුසල් ශක්තිය යම් අවස්ථාවලදී මතුකර ගැනීමට ප්‍රේතයාටද හැකිය. තන්හාවෙන්, රුස්කරමින්, ගොඩ ගසාගනිමින්, දිවා, රාත්‍රී නිදි නොලබා ඔබ වෙහෙසෙන්නේද ඉහත නුවරට නැගම් යෑම සඳහාමය. ඔබට පුළුවන් ඔබ ගැන ස්වයං පරීක්ෂණයක් කරගන්න. සමාජයේ හුග දෙනෙකුට තිබෙන ප්‍රශ්නයක් තමයි පිනක් කරගන්න තිබෙන අවිවේකය. විවේකය නැති නිසා සමහරු පොහොය දවසට පන්සලට යන්නේ නැහැ.

ගෙදර, බුදුන් වඳින්නේ නැහැ. පෝයට සිල් සමාදන් වන අම්මලා තාත්තලා ගෙදර දරුවන්ගේ ප්‍රශ්න ලෙඩ රෝග ඇතිවුනොත්, මුණුබුරා අසනීප වුනොත්, බලාගන්න කෙනෙක් නැති වුනොත් සිල්ගන්න එන්නේ නැහැ. රජකාරී, වගකීම්, ව්‍යාපාර නිසා හටගත් අවිවේකයෙන් තමන්ගේ ගෙදර තිබෙන පිංකමට නොයන අයත් ඉන්නවා. තණ්හාව බඳාගැනීම හැර වෙන මොකුත් මෙහි නැහැ. පිංකමෙන් ලැබෙන පිනට වඩා සැපයක් ඔවුන් සොයනවා. මේ අය හදිසියේ මියගියහොත් ඔබ හිතනවාද විවේකයෙන් පණයාවී කියලා. පණ යන්නේ අවිවේකයෙන්මයි. ඒ කියන්නේ ගැටෙන සිතෙන්මයි. ප්‍රතිඵලය ප්‍රතිසන්ධිය සතර අපායයි. ඔබට බැරිනම් දින කීපයක් ඔබේ දේපල, ව්‍යාපාර, අඹු සැමියන්, දුවා දරුවන්, වගකීම් අතහැර නිදහසේ දුර බැහැරක, වන්දනාවක, හුදකලාවේ යන්න මේවායින් මිදිලා. මේවා අතහැරලා දින කිහිපයක් හුදකලාවේ සිටින්න. ඔබ ස්ථිර වශයෙන් දැනගන්න ඔබ මියයන මොහොතේත් ඔබට බැරිවෙනවා මේවා අතහැරගන්න. මැරෙන මොහොත අතිවේගවත් සිත් ඇතිවෙන නැතිවෙන මොහොතක්. ඔබව කම්පනය වන මොහොතක්. ඔබ සූදානම් නොවී සිටියොත් ගැටෙන සිත ඊළඟ ප්‍රතිසන්ධිය අල්ලා ගන්නේ ප්‍රේත ලෝකයමය. පිං කළා කියා වැඩක් නැත. අතහැරීම පුරුදු කොට තිබිය යුතුය. මැරෙන මොහොතේ ඇතිවන තණ්හා සිතිවිලි අතහැරීමට අවබෝධය තිබෙන්නට ඕනේය. භික්ෂුව දුටු ප්‍රේත ලෝකයේ භික්ෂුව එවැනි චරිතයකි. පිං කිරීම නිසා විකෘති නොවූ ප්‍රේත ශරීරයත්, තණ්හාව නිසා ප්‍රේත ජීවිතයත් ඔහුට ලැබී ඇත. ප්‍රේත ලෝකයට තණ්හාව බැසගත්තද කළ පිංකම් නිසා ලස්සන ශරීරයක් ලැබීය.

එක් මහත්මයෙක් භික්ෂුවට තමන් ගැන මෙසේ ප්‍රකාශයක් කළේය. 'ස්වාමීන් වහන්ස මම දැන් ව්‍යාපාරවලින් නිදහස් වෙලා ගොඩක් විවේකයෙන් ඉන්නේ. හැම සතියකම වන්දනාවේ යනවා. දඹදිව වන්දනා කිරීමට කිහිප වතාවක්ම ගියා. බුරුමය, තායිලන්තය යන රටවලටත් වන්දනාවේ ගියා. තව රටවල් හුගකට යන්න බලාපොරොත්තුවෙන් සිටිනවා. එහි බෞද්ධ සිද්ධස්ථාන වඳින්න ස්වාමීන් වහන්සේ මට ආශිර්වාද කරන්න. 'එම රටවලට යන්න ලැබේවා' කියලා' භික්ෂුවට ඔහු ප්‍රකාශ කළා. බලන්නකෝ එම මහත්මයා පිංකම් කරගැනීම සඳහා ව්‍යාපාර අතහැරලා කරන පිංකම්වල ස්වරූපය. ඔහු ව්‍යාපාරිකයෙක් කියන තැනින් මිදිලා ඔහු සංචාරකයෙක් වෙලා. අපූරු තෝරාගැනීමක්. මේකට තමයි මෝහය කියන්නේ. ඔහු භික්ෂුවගෙන් විමසුවා මෙවැනි පිංකම් කිරීමෙන් ලැබෙන විපාක මොනවාද කියලා. භික්ෂුව මෙහෙම කිව්වා 'ඔබ බලාපොරොත්තු තබාගෙන සිටින්නේ

තව හුඟක් බෞද්ධ රටවලට සංචාරයේ යන්න. පිං කරගැනීම සඳහා. ඔබ මියයන මෙහොතේ ඔබට මෙම බලාපොරොත්තුව සිහිවුනොත් ඔබ නියත වශයෙන්ම සංචාරක පක්ෂියෙක් වෙනවා. මොකද ඔබ කැමති සංචාරයට නිසා. ඔබේ කැමැත්ත පරලොවදී ස්ථිරවම ඔබට ලැබෙනවා. ඔබ මියයන මොහොතේ ඔබ ඔය වන්දනාවේ ගොස් කරගත්ත මහා පිංකමක් ඔබේ මතකයට ආවොත් ඔබ ස්ථිර වශයෙන්ම සශ්‍රීක මිනිස් හෝ දිව්‍ය ආත්මයක් ලබනවා. ඔබ මියයන මොහොතේ ඔබේ සිතේ ඇතිවන හැම සිතිවිල්ලකම අනිත්‍ය වශයෙන් දැක්කොත් ඒ දකින්නේ ධර්මය නිසා නියත වශයෙන් ඔබ මාර්ගඵල ලාභී දෙවියන් බඹුන්, අතර උපතක් ලබනවා. ඔබ මියයන මොහොතේ ඔය ගිය වන්දනා ගමන්, කළ පිංකම් මතක් නොවී ඔබට පෙර අතහැරදමූ ව්‍යාපාර දේපළ, වස්තුව මතක් වුවොත් ඔබ ස්ථිර වශයෙන්ම ප්‍රේත ලෝකයේ උපතක් ලබනව. භික්ෂුව ඔහුට අනුශාසනා කළා, "ඔබ දක්ෂවෙන්න ඔබ කැමැති දෙය තෝරාගන්න කියලා." භික්ෂුව දන්නේ නැහැ ඔහු මොන දෙයට කැමැති වුනාද කියලා. හැබැයි එක දෙයක් නම් දන්නවා. එදායින් පස්සේ ඔහු භික්ෂුව සමග අමනාප බව. මේක තමයි ලෝකයේ ස්වභාවය. හුඟක් අය කැමැති බොරු කියලා හරි ඔහුව ඔසවා තබනවාට. ඔවුන් යන ගමනට ලකුණු දෙනවාට.

යක්ෂයා නොව ධර්මය දකින්න

භව ගමනේ නවාතැන්පළවල්වල ස්වභාවය විවිධත්වයෙන් පිරී පවතී. මේ විවිධත්වය ගොඩනැගී ඇත්තේ සත්ත්වයා කරන ලද කුසල් අකුසල් මතය. දිව්‍ය, මනුෂ්‍ය, ප්‍රේත ලෝකයන් මෙන්ම යක්ෂයින්ගේ ලෝකයද අපූරුය.

යක්ෂයන්ද මේ මනුෂ්‍ය ලෝකය තුළම ජීවත්වන පිරිසකි. යක්කු, යක්ෂණියන් වශයෙන් දෙකොටසක් ඇති බව අසා ඇතත් භික්ෂුව දැක ඇත්තේ යකුන් පමණක්ය. යක්ෂණියන් දර්ශනය වී නොමැත.

යකුන්ගේ ලෝකය පැහැදිලිව කොටස් දෙකකි. සම්‍යක්දෘෂ්ටික යකුන් සහ මිථ්‍යාදෘෂ්ටික යකුන් වශයෙනි. සම්‍යක්දෘෂ්ටික යකුන් වැඩි වශයෙන් පන්සල්, ආරණ්‍ය, පැරණි පුදබිම්, කැලයේ හුදෙකලා භික්ෂූන් වසන ප්‍රදේශ අසලද, මිථ්‍යාදෘෂ්ටික යකුන්-සොහොන්, අඳුරු ගුහා, ගල්ලෙන්, කැලයේ අඳුරු ප්‍රදේශ, දිය අගල්, නාන තොටවල් ආදිය ආශ්‍රයේද ජීවත් වෙයි.

යකුන් අඳුරට ප්‍රියය. ඒ ඔවුන්ගේ පෙර කර්මය නිසාය. ඔවුන්ද ඕලාරික කයක් සහිත, එම කය ඇසුරුකොට ආයතන හය පිහිටි සත්ත්වයෙකි. යක්ෂයාද සතර මහා ධාතූන්ගෙන් සැදුණ ඕලාරික කයක් සහිත, නිරතුරුවම ඇතිවන නැතිවන සිතක් සහිත සත්වයෙකි.

භික්ෂුවක් එක්තරා කැලෑබද ආරණ්‍යයක කුටියක වැඩ සිටියදී රාත්‍රී දහයට පමණ සමාධිය තුළ පසුවන විට එකවරම එම භික්ෂුව ඉදිරියට අඩි 6ක්

පමණ උසැති සද්ධන්ත ශරීරයක් සහිත මනුෂ්‍ය ශරීරයේ ස්වභාවයෙන් යුත් යකෙක් දර්ශනය විය. යකාගේ ස්වභාවය, හැඩය හරියටම කළු ජාතික බොක්සිං ශූරයකු වැනිය. තද කළු පැහැති ශරීරරයකි. ශරීරයේ උඩ කොටස නිරාවරණය වී ඇත. යට කොටස දණහිස දක්වා ඇඳුමකින් වැසී ඇත. අත්වල ලොකු වළලු තිබුණි. කොණ්ඩය හිස පිරෙන්නට ගෙල තෙක් වැඩී තිබුණේය. හැබැයි කටේ දළ එහෙම තිබුනේ නැත. භික්ෂුව එයට පෙර යකෙක් දැක තිබුනේ නැත. යකා පිටුපස තව පිරිවරක්ද ඉන්නවා පෙනෙයි. සෙවනැලි වශයෙනුයි පිරිවර පෙනෙන්නේ. ඕලාරිකව. මහයකා හොඳට ප්‍රතාපවත් මනුෂ්‍යයෙක් වගේ භික්ෂුව ඉදිරියේ සිටිනවා. විනාඩි 5ක් පමණ භික්ෂුව යකා දෙස බලා සිටියේය. යකා සෙලවෙන්නේ නැහැ. එකම ඉරියව්වෙන් භික්ෂුව දෙස බලා සිටිනවා. භික්ෂුවට වඳින්නෙත් නැහැ. භික්ෂුව බියට පත්කිරීමේ උවමනාවකුත් නැහැ. භික්ෂුවට අගෞරවයක් කරන්නෙත් නැහැ. යකා භික්ෂුව දෙස අනිමිස ලෝචනයෙන් වගේ බලා සිටිනවා. භික්ෂුව එවිට යකාට පිං දුන්නේය. යක්ෂ රූපය දර්ශනයෙන් නොපෙනී ගියේය. ඒ යක්ෂ රූපය නැවත භික්ෂුවට දර්ශනය නොවිණි. ඔහු සම්‍යක්දෘෂ්ටික යකෙකි. ඔහුගේ ජීවිතය යකෙක් වුවද එය අඳුරු නැත. දුකක්ද නැත. බොහොම තේජස්, ප්‍රතාපවත්, පෞර්ෂවත් ස්වභාවයකුයි තිබෙන්නේ. ඒවා ලැබී තිබෙන්නේ පෙර ජාතියේ කරන ලද පිංකම් නිසාය. නමුත් පෙර මිනිස් ආත්මයක ඉපිද මැරෙන මොහොතේ අවසන් චුති සිත වෛරයක්, ක්‍රෝධයක්, යමක් ආරක්ෂා කිරීමේ කැමැත්තක් සමඟ ඇතිවූ නිසා යක්ෂ ආත්මයක ඉපැදිලා. ඒත් ඔහු දුකක් නොවෙයි විඳින්නේ. ඔහු තේජස් සහිතව යමක් ආරක්ෂා කරන සම්‍යදෘෂ්ටික යකෙක්.

භික්ෂුවට පසුව දැනගන්න ලැබුනා මෙම ආරණ්‍යයේ වසර 40කට පමණ පෙර අපවත්වූ නායක හිමිනම මෙම ආරණ්‍යයට ඉතාමත් ආදරය කළ, එය ආරක්ෂා කිරීමට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ බවක්. එම නායක හිමිගේ ආත්මගරුත්වය සම්බන්ධයෙන් ඇතිවූ ප්‍රශ්නයක් නිසා තමා විසින්ම ආරණ්‍යයේ තම කුටියේදී ගෙල වැළලාගෙන අපවත් වූ බවක්. මෙන්න මේ නායක හිමිනම තමයි මහා යක්ෂයෙක් වෙලා මෙම ආරණ්‍ය කුටියේදී රාත්‍රියේ භික්ෂුවට දර්ශනය වූයේ. හැබැයි එම භික්ෂුව අපවත් වීමට පෙරාතුව හොඳින් සීලය ආරක්ෂාකර ගත් නිසා, අපවත්වීමෙන් පසු සම්‍යක්දෘෂ්ටික ප්‍රතාපවත් යක්ෂ ආත්මයක් ලැබුවේය. අපවත්වන මොහොතේ තමාගේ කැමැත්ත වූයේ ආරණ්‍යය ආරක්ෂා කරගැනීමය. ඒ කැමැත්තට අනුරූපීවම ඊළඟ ප්‍රතිසන්ධිය නිර්මාණය විය. තමාගේ කැමැත්ත තමාට ලැබුණි. භික්ෂුව සමාධිය තුළින් එම යක්ෂයා දර්ශනය කළ

ගැනීමට උත්සාහ කළද මෙම යක්ෂයා එදායින් පසුව භික්ෂුවට දර්ශනය වීමට නොලැබුනේය. ඔහු නියත වශයෙන්ම භික්ෂුවගේ පින් අනුමෝදන්ව ඒ ක්ෂණයෙන්ම යක්ෂ ආත්මයෙන් මිදුන බව පසුව භික්ෂුව සාධක සහිතව ස්ථිරව දැනගත්තේය. එය භික්ෂුව විසින් කෙසේ දැනගත්තේ දැයි මේ මොහොතේ සටහන් නොකරමි. සැබැවින්ම මොහුට යක්ෂයෙක් යැයි කීම වැරදිය. මොහු යක්ෂ සේනාධිපතියෙකි. මොහු භික්ෂුව ඉදිරියට පැමිණ ඇත්තේ හේතු දෙකක් සහිතවය. ගෞරව කිරීමට සහ පින් ගැනීමටය. භික්ෂුවගේ භික්ෂු ජීවිතයේදී ඉතාමත් ලෙන්ගතුව ගෞරවනීය ලෙස භික්ෂුවට ගෞරව කළ සත්ත්වයා මෙම යක්ෂ සේනාධිපතියාය. මෙම දර්ශනය වීම සහ එහිදී භික්ෂුව අත්දුටු දේ සම්බන්ධයෙන් නැවත මෙසේ කියමි.

ඔබ සියල්ල අත්හරින්න. එවිට ඔබට සියල්ලම ලැබේවි. සියල්ලම ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධ කර ඇති නිසාය.

ඉහතින් සදහන් කළේ සම්‍යක්දෘෂ්ටික යක්ෂ සේනාධිපතියෙක් ගැනය. මේ මොහොතේ ඔහු යක්ෂ ආත්මයෙන් මිදී මනුෂ්‍ය, දිව්‍ය ලෝකයක හෝ එසේත් නැතිනම් සිය දිවි නසා ගැනීමට පෙර දුෂ්කර ආරණ්‍යයක භික්ෂුවක් ලෙස ප්‍රඥාව යම් ප්‍රමාණයකට වඩා තිබීම හේතුවෙන්, භික්ෂුවගේ අතහැරීමේ ස්වභාවයද දුටු නිසා ප්‍රඥාව මතුවී බ්‍රහ්ම ලෝකයට ගියා වීමටද පුළුවන. මේ ගැන භික්ෂුව ස්ථිරවම නොදනී, අනුමාන කළා පමණි. කෙසේ හෝ ඔහු සුගතිගාමී විය.

මිථ්‍යාදෘෂ්ටික යකුන්ගේ ස්වභාවය ඉහත යක්ෂ සේනාධිපතියාගේ ශරීර ස්වභාවයට වඩා වෙනස්ය. එකම එක අවස්ථාවක මිථ්‍යාදෘෂ්ටික යකෙක් වෙනත් ආරණ්‍ය භූමියකදී දර්ශනය විය. එම යකා ඉහත යක්ෂ සේනාධිපතියාට වඩා උසය. ශරීරය කළු පැහැතිය. ඇස් දෙක දොඩම් ගෙඩි දෙකක් සේ විශාලය. ඇස් රතුය. කොණ්ඩය අවුල්ව කැරළි ලෙස ගෙල දක්වා වැඩී ඇත. මහා රෞද්‍ර පෙනුමකින් යුක්තය. මෙම යකා තනිපංගලමේ භික්ෂුව ඉදිරියේ දර්ශනය විය. හේ තැතිගත් විලාසයෙන් නිසොල්මනේ භික්ෂුව දෙස බලාසිට අතුරුදන් වුණි. ඔහුගේ රෞද්‍ර පෙනුම නිසා ඔහු මිථ්‍යාදෘෂ්ටික යක්ෂයෙක් බව අනුමාන කරමි. මොහුද උඩුකය නිරාවරණය කරගෙන සිටියේය. දණ හිස දක්වා රෙදි කඩකින් වැසී තිබුණි. මෙම යක්ෂයන් කළු පැහැයෙන් යුක්ත වන්නේ පෙර සසර ක්‍රෝධය, වෛරය වැඩූ නිසාමය. තමා වැඩූ දෙය, තමා කැමැති කළ දෙය තමාටම ලැබේ. ලෝක ධර්මය එයයි.

ඉහත ආරණ්‍යයේදීම භික්ෂුවකට පැහැපත් වර්ණයෙන් යුත් යකෙක් දර්ශනය විය. එම යකාට පැහැපත් සිරුරක් තිබුණත් එය එල්ලාවැටෙන තරබාරු සිරුරකි. විශාල බඩ ගෙඩියක් සහිත ශරීරයේ උඩු කය නිරාවරණව තිබුණු අතර දණ හිස දක්වා රෙදි කඩක් තිබිණි. හිසකේ අවුල්ව වැඩී තිබුණු අතර අසරණ ස්වරූපයක් ඔහුගෙන් පළවිය. ඔහු යක්ෂ ආත්මයක ඉපැදුණද පැහැපත් ශරීරයක් ලැබුවේ කෙසේදැයි භික්ෂුව නොදනී. සමහර ආමිස පින්කම් කිරීම නිසා ප්‍රසන්න ශරීර පැහැයත්, අවසාන චුති සිත ක්‍රෝධය, වෛරය ඇතිවීම නිසා යක්ෂ ආත්මයත් ලැබුණා විය හැකිය.

යක්ෂයනුත් කණ්ඩායම් වශයෙන් සිටීමට ප්‍රිය පිරිසකි. ඒවායේ නායකයන් ඇත. මිථ්‍යාදෘෂ්ටික යකුන්, ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂූන්ට දැඩි ලෙස පීඩා කිරීමට උත්සාහ කරයි. භික්ෂුව දක්ෂ වෙන්න ඕනේ අතහැරීමේ ශක්තිය තුළින් මේ පාපකාරී බලවේග පරාජය කරන්න. අදක්ෂ වුනොත් කුටිය අතහැර යන්න වෙනවාය. භික්ෂුව බලවත් අවස්ථාවල, භික්ෂුවට සිව්පසය සපයන දායකයින්ව මෙම මිථ්‍යාදෘෂ්ටික යකුන් ග්‍රහණයට ගන්නේය. ඔවුන්ව ලෙඩ කරන්නේය. බිය ගන්වන්නේය. මේ හැම දෙයටම නොවරදින ඖෂධය ලොව්තුරා බුදු සමිඳුන් දේශනා කර තිබේ. ඒ තමයි ඇතිවන සිත අනිත්‍ය වශයෙන් දකින්න. එවිට ඔබ දකින්නේ යක්ෂයා නොව ධර්මයයි.

භික්ෂුව මොනම අවස්ථාවකදීවත් දෙවියන්, බඹුන්, ප්‍රේතයන්, යක්ෂයින් දකින්නට ආසා කළේ නැත. මෙම සියල්ලම අහම්බයෙන් දර්ශනය වූ දේවල්ය. මේ කිසිවක් කෙරෙහි භික්ෂුව ඇලුනේද, ගැටුනේද නැත. මේ සටහන් කියවා ඔබ දෙවියන් ප්‍රේතයන් යක්ෂයන් දැකීමට ආසා නොකරන්න. මන්ද දැකීමට සත්ත්වයෙක් ලෝකයේ නොමැති නිසාය. ඉහත සියළුම සත්ත්වයින්ට තිබුණේ සතර මහා ධාතුන්ගෙන් සැදුණු අනිත්‍යභාවයට පත්වන ඕලාරික කයක් සහ අනිත්‍යභාවයට පත්වන සිතක් පමණි. එහි ස්ථිර සත්ත්වයෙක් නොසිටියේය. මෙහි තිබුණේ ඵස්සය නිසා හටගන්නා වේදනාව පමණක්මය. සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හමු නොවේ. එනිසා ඔබ දිව්‍ය, බඹුන්, ප්‍රේත, යක්ෂයින් සොයා නොයන්න. එම රූප දකින්න ඇති ආශාව, දකින්න යැයි කියන සිත අනිත්‍ය වශයෙන් දැක අතහරින්න. එවිට ඔබ සොයාගෙන ඔබ නොසිතූ අයුරින් ඒ අය ඔබ ඉදිරියට එනු ඇත.

ඔබ මේ සටහන තැබූ භික්ෂුව කව්රුන්ද යන්න සෙවීමට වෙහෙස නොවන්න. ඔබ ඔබ ගැන සොයන්න. මේ භික්ෂුවද කිසිදා අනුන් සොයා ගිය කෙනෙකු නොවන බව තරයේ සිහි තබාගන්න. භික්ෂුව සෙවුවේ

තමාගේම ස්වභාවය බවත් තමාගේ ස්වභාවය ගැන සෙවීමේදී භික්ෂුවට අවබෝධ වූයේ ලෝකයේම ස්වභාවය බවත් ඔබද දකින්න. තමාත්, ලෝකයත් දෙකම නිර්මාණය කර දුන්නේ ඇති වෙමින් නැතිවෙන සිත බවත්, සිත අනිත්‍ය වශයෙන් අවබෝධකර නිරුද්ධ කළ මොහොතේ ලෝකයෙන් තමා නිවී යන බවත් දකින්න. මෙනෙහි කරන්න. අප්‍රමාදීව සුන්දර දහමක හිමිකරුවෙක් වන්න.

නැවත නැවතත් කියමි. ඔබ සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ලම ලැබේවී. ඔබට සියල්ලම ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධ කර ඇති නිසාය.

හොඳ තැන් සොයමින් යනවා වෙනුවට සෑම තැනම ඔබ සොඳින් සිටිනු මැන

නිවන් මග වඩන ඔබට මහා කැලයේ හුදෙකලාව සිටියද බියක්, තනිකමක්, තැතිගැනීමක්, දැනෙන්නෙ නැහැ. මන්ද, භික්ෂුව තමා තුළ තමා සිටින බව නොදකින නිසා, බියවෙන්න තැතිගන්න සත්ත්වයෙක් පුද්ගලයෙක් දකින්නේ නැහැ. අනුන්ගේ දේවල් ඔබ ඔබේ කරගන්න යන්නේ නැහැ. කැලයේ අතරමගදී ඔබට මනුෂ්‍යයෙක්, දඩයක්කරුවෙක්, සතෙක් මුණ ගැසුනද එය ඔබේ නොවන බැවින් ඔබ ඒ පුද්ගලයා හෝ සතාගේ හැසිරීම් ඉරියව් අතහරිනව. ඔබ තුළට ගන්නේ නැහැ. ඔබ නිවන් මග වඩන විට මොනම අවස්ථාවකදීවත් දෙවැනියෙක් හෝ දෙවැනියෙක්ගේ උපකාරය සොයන්න යන්න එපා. ඔබ දෙවැනියෙක්ගේ උපකාරයෙන් කැලය තුළ සිටියාට වැඩක් ප්‍රතිඵලයක් නැහැ. ඔබ දෙවැනියෙක්ගේ උපකාරය සොයයි නම් ඒ සොයන්නේ ඔබගේ ආරක්ෂාවට. ඒ කියන්නේ ඔබ තුළ ආරක්ෂාකරගන්න සත්ත්වයෙක් ඉන්නවා කියන එකයි.

සිත ඔබව මුලාකරන මෙවැනි සියුම් තැන් ඔබ පරාජය කරන්න. කොතරම් සතා සර්පයා සිටියද, මොනම අවස්ථාවකදීවත් දෙවැනියෙක් ගැන නොසිතා ඔබ තනියම කැලයට ඇතුළු වෙන්න. කුටිය සොයාගෙන අඩිපාරේ ඔබම යන්න. බියක් තැතිගැනීමක් දැනුණහොත් ඒ සිත අනිත්‍ය වශයෙන් දකින්න. එවිට බිය ඉවත්වෙලා යාවී. කය, සිත අතහැරදා ඔබ යන මේ ගමනේ ඔබට බාධා කරන්න කාටවත්ම බැහැ. එය අතහැරීම තුළ ඔබ ලබන ප්‍රතිලාභයක්.

භික්ෂුවක් කැලෑ මඟක් ඔස්සේ කුටියක් සොයාගෙන තනිවම වඩින විට එම කුඩා කුටියේ මාස තුනකින් පමණ භික්ෂුවක් වැඩ සිටලා නැහැ. දුෂ්කර කුටියක්. මෙහි භික්ෂුව ගතකළේ දින හතක් පමණයි. විදේශීය භික්ෂූන් වහන්සේ නමක් වැඩිය නිසා ඉවත්ව ගියා. භික්ෂුව කුටියට වැඩි විට කුටියේ ඇතුළත හතරෙන් පංගුවක් පමණ කොටසක් අඩියක් පමණ උසට තුඹස් බැඳලා. එහි ලෑලි ඇඳක් තිබුණා. ඒ ඇඳේ කකුල් දෙකකුත් තුඹසට බැඳිලයි තිබුණේ. තුඹස තිබියදීම භික්ෂුව සුවසේ රැය පහන් කළා. පසුව දා ගමේ ගිහි දරුවන් තිදෙනෙක් ඇවිත් තුඹස ඉවත් කළා.

මෙවැනි අභියෝගවලට කියන්නේ නිවන් මඟ කළමනා කියලයි. කය අතහැරීමේ ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවට මේවා හුඟාක් ප්‍රයෝජනවත්. හැබැයි ඔබ තුඹස දැකලා ගැටුනානම්, නයයි බයයි දෙකම සිත ඔබේ ළඟට ගේනවා. තුඹස දුටු සිත භික්ෂුව අතහැරිය නිසා නයයි බයයි දෙකම භික්ෂුවට අතහැරුණා. ඔබ තුඹස දුටු සිත නිත්‍ය වශයෙන් ගත්තා නම් නැති සර්පයිනුත් සිටිනවා ඔබට පේනවා.

ඔබ නිවීම සඳහා ප්‍රතිපදාවේ යෙදෙන විට සැලසුම් ඔස්සේ, පෙර සූදානම් වීම් ඔස්සේ පෙරට යන්න එපා. ඒ ඔබ රවටන මාර බලයක්. සැලැස්මක් හදන්නේ යමක් ගොඩනගන්නයි. ඔබ මේ යන්නේ ලෝකයේ හිස්බව දකින්නයි. සැලසුම් අතහරින්න. ඉදිරියට හමුවන තත්ත්වයට, ස්වභාවයට මුහුණ දෙන්න.

භික්ෂුවකට දුෂ්කර ආරණ්‍යයකදී වයස අවුරුදු 80ක පමණ වයෝවෘද්ධ, ඉතා ගුණ යහපත්, සත්පුරුෂ භික්ෂුවක් මුණගැසුණා. උන්වහන්සේ භික්ෂු ජීවිතයෙන් වසර 40ක්ම ගතකරලා තිබෙන්නේ චාරිකාවේ වඩිමින්. වස් කාලයේ පමණයි එක තැනක වැඩ ඉඳලා තිබෙන්නේ. උන්වහන්සේ ගතකර තිබූ ප්‍රතිපදාව නිසා භික්ෂුව සිතුවා උන්වහන්සේ හොඳ අවබෝධාත්මක භික්ෂුවක් වෙන්න ඇතිය කියලා. භික්ෂුව උන්වහන්සේගෙන් ඇසුවා ඇයි ඔබවහන්සේ එක ස්ථානයක් අල්ලාගෙන නොයිඳ මේ ආකාරයෙන් චාරිකාවේ හැසිරුණේ කියලා. එවිට උන්වහන්සේ කියනවා, මට අවශ්‍ය වුනා, මම ආසා කළා, මම ඉපදුන රට දැක බලාගන්න. ඒකයි මම චාරිකාවේ හැසිරුනේ කියලා. එම වචන ටික උන්වහන්සේගේ මුවින් පිටවෙනකොට භික්ෂුව උන්වහන්සේ තුළ දැක්කේ පුංචි සාමනේර හිමිනමක්.

බලන්න මොන අපරාධයක්ද කරගෙන තිබෙන්නේ, සංචාරකයෙක් බවට පත්වෙලා.

අපේ සිත අපව නිරතුරුවම රවට්ටනවා. ඔබ අධිෂ්ඨානයක ඉන්න ඕනේ සිත වැඩෙන සුදුසුම හුදෙකලා ස්ථානයක්, අරමුණ ජයගන්නා තෙක් ඇසුරු කරන්න. සිත ඔබව සංචාරකයෙක් කරන්න උපදෙස් දේවී. ඔබව ආරණ්‍යයෙන් ආරණ්‍යයට ඇවිද්දවාවී. ඔබ ප්‍රවේශම්වන්න. ඔබ යා යුතු ඊළඟ තැන සැලසුම් කරන්න යන්න එපා. ඔබට ඒවා අදාළ නැහැ. ඔබට තිබෙන්නේ හොඳින් නිවන් මඟ වැඩීමට සිත වැඩෙන ස්ථානයක රැඳෙන්නයි. ඉතිරි සියල්ල ඔබ අතහරින්න. කලබල වෙන්න, ආයාසයක් ගන්න එපා. ඊට වඩා සුදුසු ඔබට යායුතු තැනක් වේ නම්, සංඥා මඟින් නොසිතූ ආකාරයට ඔබට ඒවා දැනේවී. ඔබට තිබෙන්නේ අතහැරීම පමණයි. නිවීම දක්වා මඟ ඔබට ප්‍රඥාව විසින් මුණගස්වාවී. ඔබව රැගෙන යාවී. එසේ නොවුණ හොත් තෘෂ්ණාව විසින් ඔබව සංචාරකයෙක් කරාවී.

ඔබ හොඳ තැන් සොයමින් යන්න එපා. සෑම තැනකම ඔබ හොඳින් ඉන්න. ඔබ ඇසුරට හොඳ මිනිසුන් සොයමින් යන්න එපා. සැවොම සමඟ හොඳින් ඉන්න පුරුදුවෙන්න. ලෝකයේ හොඳයි, නරකයි තිබෙනවා මිස හොඳ පමණක් ඔබට සොයාගත නොහැකි බව දකින්න. ඔබ හොඳ පමණක් සොයන්නේ නම්, ඔබට සොයමින් සිටිනවා හැර ජීවිතයේ වෙන කාර්යයක් නොමැති වනු ඇත. මන්ද ඔබ සොයන්නේ නොමැති දෙයක් හෙයිනි. ඔබ අතහැරීමේ උපරිමය තුළ නිවන් මඟ වඩන්නෙක් නම් ඔබ කොතැනකට ගියද ආරණ්‍යයක් වේවා, පන්සලක් වේවා එතැන කැළඹුන තැනක් විය හැක. ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවට මාර බලවේග බියය. ඒ නිසා තම බලකොටුවට පැමිණි ධර්මයේ බලය පලවා හැරීමට පරිසරය ඇතිකරයි. ලෝකය තුළ අධර්ම බලවේගවල ශක්තිය වැඩිය. ඔබ ධර්මය අවබෝධ කරගැනීමට යන ගමන මදි පුංචිකම්, චෝදනා, පරීක්ෂාකිරීම්, නොසලකාහැරීම්, පීඩන, බාධාවලින් පිරුණු ගමනකි. ඔබ මේවා ඔබේ ගමනට ආශිර්වාදයක් කරගත යුතුය. මන්ද මේ සියල්ලම ලෝකයේ පවතින ධර්මතාවයන් වීමය. ඕනෑම පරිසරයකදී ඔබ 'හොඳින් ඉන්න' දක්ෂ වෙන්න.

සිහියෙන් බලන්න
දහම ඔබ අසලමය

ඔබ ජීවත් වන්නේ ධර්ම නිකේතනයක. ධර්ම කාන්තාරයක නොවෙයි. එහෙත් ඔබ ධර්මය සොයනවා. සැබැවින්ම ඔබ සොයනවා නම් සෙවිය යුත්තේ සැඟවුණ දෙයක්. නොපෙනෙන දෙයක්....

ඉන්ද්‍රියන් හයටම ඵස්සය වන මායිමේ ධර්මය තිබියදී ඔබ එය දකින්නේ නැහැ. ආලෝකය තුළ සිටිමින් ඔබ ආලෝකය සොයනවා. මොකද ඔබේ දෑස් අවිද්‍යාවෙන් වැසිලා. ඔබ ධර්මය සොයන්නේ නම් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැඩිය මඟ යන්න. උන්වහන්සේ ගිය මඟ අධ්‍යයනය කරන්න. සාරා සංඛ්‍යය කල්ප ලක්ෂ ගණනක් පෙරුම් පුරා පැමිණියද සිද්ධාර්ථ කුමරාට වයස අවුරුදු 29 වන තෙක් එතුමා ඉලක්ක කරගෙන පැමිණි පාරමී ගමනේ අරමුණ ගැන දැනීමක් හැඟීමක් නොදැනින. කුමරාට මෙම සංසාරික ඉව මතුවී එන්නේ සතර පෙර නිමිති දැකීමත් සමඟය. එතෙක් කුමරා ගත කළේ සිය පියා විසින් නිර්මාණය කරන ලද, සැලසුම් කරන ලද දුක නැති සමාජ පරිසරය තුළ කෙළිලොල් ජීවිතයක්ය. ධර්මය සොයාගෙන ගිහි ජීවිතයෙන් නික්මුණ කුමරා මුලින්ම කළේ සියල්ලම අතහැරීමය. යශෝධරාව, රාහුල කුමරු, රාජ සම්පත් සියල්ලම අතහැරියේය. ප්‍රථම අදියර එය විය. සියල්ල අතහැරලා කැලයටයි ගියේ. පරිසරයට, ස්වභාව ධර්මයට ගිහින් මොකද කළේ?

කුමරුන්ට කියවීමට පොත්පත්, ධර්ම පුස්තක, භාවනා පංති, ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා... මේවා තිබුණාද? ත්‍රිපිටකය තිබුණාද? ලෝකයේ තෙරුවන් පහළ වෙලා තිබුනේ නැහැ.

මෙවැනි පරිසරයක කුමරා ගිය මඟ කුමක්ද? ඔබ නිවි සැනසිල්ලේ සිතන්න. සිතමින් අවබෝධය ලබන්න. කුමරා කැළයට ගොස් බලාගෙන සිටියා පරිසරය, ස්වභාව ධර්මය දෙස. ඇතිවෙන නැතිවෙන සිතිවිලි දෙස. වෙන බලන්න දකින්න දෙයක් කැලයේ තිබුණේ නැහැ. කුමරා දැක්කා උදයට හිරු පායනවා. සවසට හිරු බැසයනවා. රාත්‍රියට සඳ පායනවා. උදේට සඳ බැසයනවා. වැස්ස වහිනවා. පායනවා. පින්න, සීතල, සුළඟ, වලාකුළු, දේදුණු එනවා යනවා. නියඟය එනවා, ගංවතුර එනවා. එකම දේ නැවත නැවත සිදුවනවා. ගස්වල දලුලනවා, කොළ බවට පත්වෙනවා, වියැලෙනවා, වැටෙනවා, නැවැත නැවැත ඒ දේම සිද්ධවෙනවා. මල් එනවා, ගෙඩි හැදෙනවා, ඒවා ඉදෙනවා, බිමට වැටෙනවා, පැළවෙනවා, පැළය ගසක් වෙනවා, එකම දෙය නැවත නැවතත් වෙනවා. හිස රැවුල කපනවා. එය නැවත නැවත සිද්ධ වෙනවා. කුසගිනි දැනෙනවා. ආහාර ගන්නවා. එය නැවත නැවත සිදුවෙනවා. ශරීරයේ හැම ස්වභාවයක්ම, පරිසරයේ හැම ස්වභාවයක්ම නිත්‍යභාවයේ නොපැවතී අනිත්‍යභාවයට පත්වෙනවා. බෝසත් කුමරුන් කැලයේ සිටිමින් දකින්න ඇත්තේ ඔය ස්වභාවයයි. වෙන දකින්න දෙයක් කැලයේ නැහැ. එහෙම නම් ඉහත පරාසය තුළ ධර්මයේ අර්ථය තිබෙන්න ඕනේ. සියල්ල අතහැරීම තුළ බෝසත් කුමරුන්ගේ සැහැල්ලු, නිකෙලෙස් සිත නිරතුරුවම සමාධිමත්ව තිබීම නිසා ඉහත ස්වභාවයන් ඉතා හොඳින් බෝසත් කුමරුන්ට පෙනෙන්නට, දැනෙන්නට ඇත. බෝසත් කුමරුන් සම්මා සම්බුද්ධ පදවිය අවබෝධ කරගන්නා මොහොත දක්වාම උන්වහන්සේ අවබෝධය ලැබුවේ ස්වභාව ධර්මය, පරිසරය තුළින්මය.

ස්වභාව ධර්මයත්, තමාගේ කයත්, සිතත් දෙස අත්හැරීමෙන් සමාධිමත් වූ සිතින් බැලීමේදී, අනිත්‍ය හැර වෙනත් ස්වභාවයක් මෙහි නොමැති බව උන්වහන්සේ දකින්නට ඇත. ඔය මඟ තමයි අපගේ ශාස්තෘන් වහන්සේ නිවීම සඳහා ගිය මඟ. අබුද්ධෝත්පාද කාලවලදී පහළවන පසේ බුදුරජාණන් වහන්සේලාද ධර්මය අවබෝධ කරගන්නේ ඉහත බුදුමඟ අනුගමනය කරමින්ය. ඔබේ අනිත්‍යභාවයට පත්වන සිත ඔබට දෙන සැප, කෙටි, දුර, කල්මරණ මාර්ග, සිතේ අනිත්‍යබව දකිමින් අතහරින්න. සැබෑ බුදුමඟ ඔබ ගමන් කරන්න. කිරි ගසකට ඇනීමේදී යම්සේ කිරි වැහේද, ඉහත බුදුමඟ ඔබ ගතහොත් නිවීම ඒකාන්තය. මන්ද එය බෝසතුන් වැඩි මඟ නිසාය. ධර්ම විනය දෙක යනුවෙන් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ හැඳින්වූයේද ඉහත මාර්ගයමය. ධර්මය යනු ස්වභාවධර්මයයි. විනය යනු සතියයි, සිහියයි. එහි අර්ථය 'සතියෙන් සිහියෙන් යුතුව ස්වභාව ධර්මය දෙස බලන්න' යන්නයි. ශාසනය තුළ මුල් දශක දෙක තුළදී, විනය පැනවීමකින් තොරව සංසරත්නය

භික්මුනේ උන්වහන්සේලා සතියෙන් යුක්තව ස්වභාවධර්මය දෙස බැලීම නිසාය. එහි ප්‍රතිඵලය ධර්මාවබෝධයයි. පසු කාලීනව සංසරත්නය සතියෙන් තොරව ස්වභාවධර්මය දෙස බැලීම නිසා සතිය සිහිය ඇති කිරීමට විනය පැනවීමට බුදුරජාණන් වහන්සේට සිදුවිය.

ඔබ දක්ෂ වෙන්න සතියෙන් සිහියෙන් යුතුව ස්වභාව ධර්මය දෙස බලන්න. එවිට ඔබ දකින්නේ ධර්මයේ ස්වභාවයයි. ධර්මයේ ස්වභාවය, වෙන දෙයක් නොවේ. අනිත්‍යය පමණමයි. ස්වභාව ධර්මයත්, ඔබත් දෙකක් නොව එකකි. දෙකම නිර්මාණය වී ඇත්තේ ඝණ, ද්‍රව, උණුසුම්, වායු ධාතුන්ගෙන්ය. මේවායේ ස්වභාවය අනිත්‍යයයි. ස්වභාව ධර්මයත් ඔබේ කයත් දෙකම ඉහත ධාතුන්ගෙන් සැදි නිර්මාණයන්ය. ඇසට නොපෙනෙන, ප්‍රඥාවෙන් පමණක් දැකිය හැකි, අතිශය ප්‍රවේගකාරී, මහා වේගයකින් අනිත්‍ය භාවයට පත්වන ඉහත ධාතුන්, අනිත්‍යතාවයට පත්වන වාරයක් පාසාම අවකාශ ධාතුවක්ද ඇතිකරවයි. එම අවකාශ ධාතුවද ධාතුන් ඇතිවන නැතිවන මොහොතක් පාසාම අනිත්‍යභාවයට පත්වේ. මේ සියල්ලම ශීල, සමාධි, මග ඉක්මවා ගොස් ප්‍රඥාවෙන් දකින ධර්මයෝය. ස්වභාව ධර්මය ලෙසත්, කය ලෙසත් අපි දකින්නේ විවිධත්වයෙන් යුතු හැඩයන්, වර්ණයන්, ස්වභාවයන් ලෙසින් එකිනෙකට වෙනස් ධාතු කොටස් හතර පමණකි.

ඇසේ අවිද්‍යාව නිසා එකිනෙක සම්මුති නාමයකින් හඳුන්වා ගනී. එහෙයින් ඔබ ස්වභාව ධර්මයත් කයත් එකගොඩකට දමන්න. මේවා ක්‍රියාත්මක භාවයට පත්වන සිත දෙස බලන්න. සිත තුළද ඔබ දකින්නේ අනිත්‍ය ස්වභාවය පමණක්මය.

බාහිර රූපත් අභ්‍යන්තර ආයතනත්, විඤ්ඤාණයත් එස්සය වීමෙන් සකස්වෙන ආගන්තුක සිත අයිති අනිත්‍යයටය. එහෙයින් මේ සියලු ධර්මයෝ අනිත්‍ය ධර්මයෝය.

ඔබ කළ යුත්තේ මේ සියල්ල දෙස සතියෙන්, සිහියෙන් යුක්තව බලා සිටීමම පමණකි. එවිට ඔබ තුළ නිරායාසයෙන්ම වැඩෙන්නේ සතර සතිපට්ඨානයයි. සතර සතිපට්ඨානය නිවන් මගේ නිවීමේ තීරක බලවේග යයි. කාය, චිත්ත, ධම්ම, වේදනා යනු ලෝකයයි. සතර සතිපට්ඨානය අවබෝධයෙන් දැකීම යනු ධර්මාවබෝධයයි. ලෝකාවබෝධයයි.

ඔබ සියල්ල අතහරින්න. අනිත්‍ය වූ රූපය දෙස අනිත්‍යවූ සිතෙන් බලා සිටින්න. එවිට ඔබට සියල්ල ලැබේවී. ඒ සියල්ල ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධ කර ඇති නිසාය.

අපායේ උපතක්

ප්‍රාණඝාතය කරමින් හරකුන් මරණ ලද මිනිසකු මරණින් පසු එම කර්ම විපාකය ගෙවන දර්ශනයක් මෙහි සටහන් කරමි.

මෙය නිරයේ දර්ශනයකි. හැබැයි එහි ගිනි දළු නොවීය. තිබුණේ අඩි 10ක පමණ උස කොටයකි. එහි හරකෙක් දිගේලි කොට බැඳ තිබිණි. ක්‍ෂණයකින් හරකා දිගේලි කර බැඳ තිබුණු කොටයේ මුදුනත නිරි සතෙක් ප්‍රතිසන්ධිය ලැබීය. එම නිරිසතාව භික්‍ෂුව සමාධියේදී දුටුවේ මිනිසකුගේ රූපකාය සහිතවය. නිරිසතාගේ ඕලාරික කය භික්‍ෂුවට සණ ස්වරූපයෙන් දර්ශනය විය.

විපාකය විඳීම පිණිස නිරයේ එම කොටය මුහුණත බදාගෙන සතුටින් එම සතා පහළවූ සැනින්, හරකා දෙස බලන එම නිරිසතා සතුටු සිනා පහළ කරනවා. මන්ද ඒ මොහොතේ හරකා සැපක් හැටියටයි නිරිසතා දකින්නේ. එහෙත් නිමේෂයකින් කොටයේ බැඳ තිබූ හරකා තියුණු උල් සහිත ත්‍රිශූලයක් වැනි කැපෙන ආයුධ දෙකක් අත් දෙකේ ඇති යෝධ යමපල්ලෙක් බවට පත්විය. හරකා ඉදිරි ගාත් දෙක ඔසවා යම පල්ලෙක් බවට පත්වෙද්දී නිරිසතා මරහඬින් කෑගසයි. තියුණු ආයුධ දෙකින් කොටයේ මුදුනත එල්ලී සිටින නිරිසතා දැඩි ලෙස ඇනුම් කයි. නිරිසතා බිමට පැනීමට උත්සාහ කළද එම උත්සාහය ව්‍යර්ථ විය. මන්ද නිරිසතා කනුවේ ඇලී තිබුණු ස්වභාවයක් භික්‍ෂුවට දර්ශනය විය. යම පල්ලා අත තිබූ ආයුධ දෙකින් ඇනීම නිසා ලෝකයේ සත්ත්වයෙකුට විඳිය හැකි

දරුණුම වේදනාව විඳිමින් නිරිසතා ලතෝනි දෙනවිට තවත් යම පල්ලන් දෙදෙනෙක් ආරක්‍ෂකයන් සේ ඊට නුදුරින් බලාසිටියේය. යමපල්ලාගේ ස්වභාවය අඩි 7ක් පමණ උසැති කළු පැහැති කාපිරි මිනිසෙක් සේ තොල්, ඇස් ලොකු රෞද්‍ර, උඩුකය නිරාවරණයවී ඇති, රෙදි කඩක් දණ හිස තෙක් දරූ අයෙකි. එම නිරයේ දර්ශනය එතෙකින් නිමා වුවද, භික්‍ෂුව සිතන්නේ මෙම නිරිසතා වේදනාවෙන් මියගොස් නැවතත් එම කොටයේම ඉපැදෙමින්, නැවත නැවතත් එම විපාකයම කල්ප ගණනාවක් විඳින බවයි.

නිරිසතා කොටය මත පහළවී එහි බැඳ තිබූ හරකා දකිද්දී නිරිසතා සතුටට පත්විය. ඒ මොහොතේම කර්මය විපාක දීම ඇරඹේ. මනුෂ්‍ය ලෝකයේ හරකෙක් මරන්නේ යම් සේද, ආයුධ උපයෝගී කරගෙන එම ආයුධවලින්ම හරකාට අනිමින්, කපමින් ඌව මස් කරන්නේ යම් සේද, එම නිරිසතාද හරක් වේශයෙන් පෙනී සිටි යමපල්ලාගේ ආයුධ දෙකෙහි ඇනී මරණයට පත්වේ. යමපල්ලා දැත් දෙකේ තියුණු උල් සහිත ත්‍රිශූල දෙක ඔසවා අල්ලාගෙන සිටීමේදී, නිරිසතා එල්ලීගෙන සිටින කොටය, ත්‍රිශූල දෙක මතට නැවෙමින් නැවත කෙළින්වෙයි. එම ක්‍රියාව සාමාන්‍ය වේගයෙන් සිදුවේ. නිරිසතාගේ අකුසල්වල බලවත් භාවය නිසාම, නිරිසතා පහලවූ කොටය යමපල්ලා අත ඇති ත්‍රිශූල දෙක මතට නැවීම සිදුවේ. එම ක්‍රියාව මනුෂ්‍ය අපට සිතාගත නොහැක. ත්‍රිශූල දෙක ඔසවාගෙන සිටින යමපල්ලා නිසොල්මන්ව සිටියදී, නිරිසතාම සිය කර්ම ශක්තිය නිසා ත්‍රිශූලයේ තියුණු තුඩුවල ඇණී කෑලි කෑලි වලට ශරීරය බිඳීයයි. නිරිසතා ත්‍රිශූලයේ ඇනී විනාශවන්නේ ස්වයංක්‍රීයවය. මේ ස්වයංක්‍රීය භාවය යනු අකුසල කර්මයේ බලවත්භාවයයි. ඔබට කිසිදු වරදක් නොකළ එළදෙනක් ඔබ පොරවකින් ගසා, මිටියකින් ගසා, තියුණු සැතකින් ගෙලකපා මරාදමන මොහොතේ, එම එලදෙනගේ සිතේ ඇතිවන ප්‍රශ්නාර්ථයම, එම නිරිසතා තුළද පහළවේ. මන්ද සියල්ල සිදුවන්නේ ස්වයංක්‍රීයවය. අකුසල් කර්මයන්ගේ බලවත් භාවය නිසාම ඒවා විපාක දීමේදී ඇතිවන වේගවත් භාවය සහ තියුණු භාවය මිනිස් සිතකට සිතා ගැනීමටවත් නොහැකි තරමට සංකීර්ණ ක්‍රියාවලියකි. කණුවේ දිගේලි කර තිබූ හරකා යම පල්ලෙක් වන්නේද, නිරිසතා පහළවූ කොටය යම පල්ලාගේ දෑතේ ඇති ත්‍රිශූල මතට පාත්වන්නේද අකුසල් කර්මයන්ගේ තියුණු භාවය නිසාමයි. එළදෙන කෲර ලෙස මරාදැමීමේදී එම සතා මරණ මිනිසා තුළ ඇතිවෙන වේගවත් අකුසල් සිත්වල වේගය විසින්ම ඉහත පරිදි ස්වයංක්‍රීයවම විපාක විඳීමේ ශක්තිය සකස්කොට ඇත. එළදෙන මැරුම් කෑවේද අකුසල කර්ම විපාකයක් නිසාය. නිරිසතා මැරුම් කන්නේද අකුසල් කර්ම විපාකයන් නිසාමය.

මෙසේ නිරිසතා කල්ප ගණනාවක් නැවත ඉපැදෙමින්, නැවැත මැරුම් කයි. කර්ම විපාකය ගෙවෙන තෙක් දුක බරපතලය. මෙහිදී නිරිසතා විඳින වේදනාව නිසා ඇතිවන සිත් වෛරය, ක්‍රෝධය, ගැටීම පදනම් කරගත් ඒවාය. එහෙයින් නිරයේ දුක තව තවත් වැඩිවෙමින් දුකෙන් දුකටම ඇදී යයි.

සතුන් වේදනාත්මකව මරා දමන, සතුන්ට දුක් දෙන ඔබත්, මේ ක්‍රියාවන් කිරීමට පෙර මොහොතක් සිතන්න. ඔබ අනුනට දෙන දුක කෲර වද හිංසා පොලියත් සමගම ඔබට ලැබේවි. ලෝක ධර්මය එතරම්ම සාධාරණය. ඔබ කැමති කළ දෙය, ඔබ ආසා කළ දෙය ඔබට ලබාදෙයි. මනුෂ්‍ය ලෝකයේ සිටියදී තමා කැමති කළේ, තමන් උදෙසා හෝ අනුන් උදෙසා හරක් මැරීමටයි. මෙය ඔබට විනෝදයක්, සතුටක් වූවාටද සැක නැත. ඔහු නිරයේ නිරි සතෙක් ලෙස ගවයා බැඳ සිටි කණුවේ මුදුනත පහළවන මොහොතේ, කණුවේ බැඳ සිටි ගවයා දැක සතුටට පත්වෙන්නේ, පෙර ආත්මයේ තමා කැමැති කළ මතක සංඥා නිසාය. ඒ නිමේෂයේදී නිරිසතා ලබන සතුට කර්ම විපාකයට පෙර මතකය අවදි කිරීමක් වැනිය.

ප්‍රාණඝාතයට සිත ඇතිවන මොහොතේම එම සිත අනිත්‍ය වශයෙන් දකින්න. එවැනි සිත් සංසාරයේ ඔබට මහා දුක් කන්දරාවක් උරුම කොට දුන් බව දකින්න. උතුම් මනුෂ්‍යයෙක් ලෙස ඉපිද, ප්‍රේත ලෝකයට, නිරයට යෑමට ලැජ්ජාව බය ඇතිකරගන්න. නිතර මෙම කර්ම විපාකයන් මනසින් අත්දකින්න. අප්‍රමාදීව ක්‍රියාත්මක වෙන්න.

ආශාවේ වියරුව — කැමැත්තේ මර ලතෝනිය

මනුෂ්‍ය ලෝකයේ නිලතලවලට, නිතර දේශන පැවැත්වීමට, සමිති-සමාගම්, දේශපාලන පදවි සඳහා තණ්හාවෙන් ක්‍රියාකරන පිංවතුනට දැනගැනීම පිණිස ප්‍රේත ලෝකයේ රැස්වීමක ස්වභාවය සටහන් කරමි.

මෙම රැස්වීමට ප්‍රේතයෝ සියයකට වැඩි සංඛ්‍යාවක් සහභාගි වූහ. මේ අතර සිවුරු දරාගත්, හිස මුඩු කළ ප්‍රේත භික්ෂූන්ද විය. මේ සියළු දෙනාම තරුණ සහ මැදිවියේ ප්‍රේතයෝ සහ ප්‍රේත භික්ෂූන්ය. මනුෂ්‍ය ලෝකයේ අයුරින් භික්ෂූන් ඉදිරිපෙළ ආසනවල නොසිටියේය. ප්‍රේත භික්ෂූන් සිටියේ ප්‍රේතයන් සමඟ කලවමේ අසුන් ගෙනය. සමහර ප්‍රේත භික්ෂූන් පසුපසම පේලියේද අසුන්ගෙන සිටියේය. ප්‍රේත ලෝකයේ තෙරුවන් ගැන හැඟීමක් නැති නිසා, ප්‍රේත ලෝකයේදී භික්ෂු ප්‍රේතයාද සාමාන්‍ය ප්‍රේතයෙක්මය.

මේ අය එකට රැස්වී ප්‍රේත රැස්වීම පවත්වයි. මේ රැස්වීම එකම ගාලගෝට්ටියකි. හැමෝම නායකයන් වීමට, හැමෝම දේශන පැවැත්වීමට, තම මතය දිනවීමට උත්සහ ගනී. අයෙකුට නිදහසේ කථා කිරීමට අනෙකා ඉඩ නොදේ. කිසිවෙකු තෘප්තියට පත් නොවේ. කිසිවෙකුත් සතුටට පත්නොවී, සැවොම දුක වේදනාව, බලාපොරොත්තු කඩවීම් උරුම කරගනිමින් රැස්වීම කඩාකප්පල් වේ. එකිනෙකාට බැන වදිමින් විසිර යති.

පෙර ආත්මවල අනුනට අවස්ථාව නොදී බලකාමයෙන් නිලතල දැරූ, නිලතලවලට ලෝභ කළ ගිහි පැවිදි පිංවතුන් කරගන්නා ලද කර්මවල

විපාකයන් විඳගන්නා අයුරු අපූරුයි නේද? මෙම කර්මය විඳින ප්‍රේතයින් තම ප්‍රේත ජීවිතය පුරාවට කරන්නේ රැස්වීම තැබීම සහ රැස්වීම් කඩාකප්පල් වීම නිසා දුකට පත්වීමය. පෙර අකුසල් ශක්තිය නිසා මේ අයට කිසිදාක ප්‍රේත රැස්වීම් සාර්ථක කර ගත නොහැක. රැස්වීම් කඩාකප්පල් වූ විට ප්‍රේතයන් එකිනෙකාට වෛරයෙන්, ක්‍රෝධයෙන් බැන වදිමින්, ඇනකොටා ගනිමින්, දත්මිටිකමින් සීසීකඩ විසිර යයි. තමන් නායකයා වීමට ඇති ආශාව නිසාම ප්‍රේත ලෝකයේදීද මේ අය මහා අකුසල් රැස් කරගෙන තව තවත් දුකට ඇදී යයි. ප්‍රේත ලෝකයේ ගතකරන සෑම නිමේෂයකදීම ඔවුන් රැස්කරන්නේ අකුසලයකි. එහෙයින් ඔවුනට සසර කල්ප ගණනාවකින් සුගතියක උපත ලැබීමට නොහැකිය.

ඔබ ගතකරන ඔය වටිනා මනුෂ්‍ය ජීවිතය ඔබගේ අදක්ෂ භාවය නිසා සතර අපායට වැටුනොත් ඔබේ අනාගතයද අඳුරින් අඳුරටමය. ඔබ භුක්ති විඳින මොන දෙයවත් තණ්හාවෙන් තොරව භුක්ති විඳින්න. අනුන්ගේ අකමැත්තෙන් භුක්ති නොවිඳින්න. බලහත්කාරයෙන්, බොරුවෙන්, නැති ගුණ පෙන්වමින්, තමාට වඩා සුදුසු අය සිටියදී ඔබ එය අයිති කරගැනීමට නොයන්න. ඔබ අසීමිත තණ්හාවෙන් මේවා අයිති කරගැනීමට ගියහොත් ප්‍රේත ලෝකයේ ප්‍රේත රැස්වීම් අංශයේ ඉපිද, නිතිපතා ඉහත ප්‍රේතයින් විඳින දුක විඳිය හැකිය. ප්‍රේත රැස්වීම් කඩාකප්පල් වී ගිය විට ප්‍රේතයින් හැසිරෙන්නේ හිස ගිනිගත් පුද්ගලයින්, වියරුවෙන් දඟලන්නා සේය. එය ඔවුන්ගේ තණ්හාවේ ස්වභාවයයි. ආශාවේ වියරුවයි. කැමැත්තේ මර ලතෝනියයි.

ලොව්තුරු බුදුරජාණන් වහන්සේගේ ධර්මය මේ දේවල් මොන තරම් පැහැදිලිව දේශනා කර තිබෙනවාද. මේ සියල්ල අත් දැකීමෙන් අත්දකිද්දී ලෝක ස්වභාවයන් පිළිබඳ ඥාණ දර්ශනයන් පහළවන කොට ඔබටත් දැනේවී ඔබ සැබෑ බුදු පුතෙක්ය කියලා.

සයනයේ ප්‍රේතිය

අමනුෂ්‍යයන්ගේ ලෝකය හරිම විවිධත්වයෙන් යුතුය. විවිධත්වය වශයෙන් අපි දකින්නේ නිරතුරුවම වෙනස්වන ස්වභාවයෙන් යුතු අනිත්‍යයයි. භික්ෂුවක් එක් අවස්ථාවක සමාධියෙන් පසුවන විට ගෙදරක වාසය කරන ප්‍රේතියක් දුටුවා. ඇය වයස 25 පමණ තරුණියකගේ ස්වභාවයෙන් යුතු බවයි භික්ෂුවට හැඟුණේ. ඇය අවිවාහක බවක්ද හැඟුණා. භික්ෂුව මුලින් දුටුවේ නිවසේ නිදන කාමරය. ඒ නිදන කාමරය බොහොම පිළිවෙලට තිබුණා. එහි ගුප්ත බවකුත් තිබුණා. නිදන කාමරයේ කිසිවෙක් සිටියේ නැහැ. හරිම පාළුවටයි පෙනුණේ. භික්ෂුවට දැනුනේ මෙය ඇය මනුෂ්‍ය ජීවිතයේදී පරිහරණය කළ කාමරය කියලා. නිදන කාමරයේ සයනය කළුපාට ඇඳ ඇතිරිල්ලක් එලා කොට්ටයක් සහිතව පිළිවෙළට තිබුණා. කිසිවෙක් කාමරයේ නැහැ. හරිම නිශ්චලයි.

නමුත් එක පාරටම අර සයනයේ එලා තිබූ ඇඳ ඇතිරිල්ල මෑත් කරගෙන තම ස්වරූපය සණ භාවයට පත්කර ගනිමින් තරුණ ප්‍රේතිය ඇඳෙන් නැගිට කාමරයෙන් එළියට ගියා. ක්ෂණයකින් නැවත කාමරයට ආවා. ඇඳ ඇතිරිල්ල පොරවාගෙන ඇය නැවත නිදාගත්තා. එහෙත් දැන් ඇඳේ කිසිවෙක් නැහැ. ඇඳ ඇතිරිල්ලත් හොඳට පිළිවෙළට නැවැත තිබෙනවා. ඒ කියන්නේ ප්‍රේතිය ඇඳ ඇතිරිල්ල යට සිටිනවා. කිසිවෙකුට පෙනෙන්නේ නැහැ. දකින්න බැහැ. කව්රුවත් හිතන්නේ නැහැ ඇඳ ඇතිරිල්ල යට ප්‍රේතියක් ඉන්නවා කියලා. බලන්න ඇය උපාදානය කරගත් ස්ථානය. ඔබට හිතන්න පුළුවන්ද?

ඔබ නිවසේ කාමරයේ සයනයේ ඇඳ ඇතිරිල්ල යට ප්‍රේතියක්, ප්‍රේතයෙක් සැතපී ඉන්නවා කියලා. ඉහත භික්ෂුවට ඇයව සඤ ස්වභාවයෙන් දර්ශනය වූ නිසා මේ ප්‍රේතියව දකගැනීමට හැකිවුනා. ගවුමක් ඇඳගෙනයි සිටියේ. තරුණියක් වුණත් ඇය මලානික, රෝගී ස්වභාවයෙන් යුත් ප්‍රේතියක්. භික්ෂුව ඇය දැක ඇත්තේ මලානික, මලමිනියක් ඇවිදින ස්වරූපයෙන්. මුහුණේ බිය මුසු හැඟීමක් තිබුණා. මගේ තැන, මගේ ස්ථානය අභිම්වේය කියන හැඟීමකින් වගේ මහත් තණ්හා සහගත සිතකින් ඇය කාමරයෙන් එළියට ගිය සැනින්ම නැවත කාමරයට පැමිණ, සයනයේ ඇඳ ඇතිරිල්ල ඇතුළට ගොස් ඇයගේ සන කයේ ස්වරූපය නැති කරගත්තා. ඇය මනුෂ්‍ය ජීවිතයේ එම නිවසේ ජීවත් වූ තරුණියක්. ඇය රෝගීව මියයන මොහොතේ තමන් අල්ලාගත් තැන ප්‍රේතියක් ලෙස නැවතත් ප්‍රතිසන්ධිය ලබන්නට ඇතැයි සිතන්නට පුළුවන්. බලන්නකෝ වාසනාවන්ත මනුෂ්‍ය දියණියකගේ අවාසනාවන්ත නැවත උපත මොන දුකක්ද කියලා. කවදා සැනසිල්ලක්, ගැලවීමක් ලබයිද කියලා. මේ ප්‍රේතිය ඇඳට නැග ඇඳ ඇතිරිල්ල යටට යන්නේ ඉඩෝරය දැඩි කාලයක වතුර වලක් දැක මී හරකෙක් යම් සේ තෘෂ්ණාවකින් එම වතුරවලට බසීද එම ස්වරූපයේ කැමැත්තකිනුයි. එලෙස ඇය ඇඳ ඇතිරිල්ල යටට ගොස් නිදා ගනී. එය ඇය ගත් උපාදානයේ බලවත්කමයි. මේවා පාඩමට ගෙන ඔබත් ස්ත්‍රී පුරුෂ වයස් භේදයකින් තොරව කුසල් දහම් වඩා ජීවිතයෙන් අතහැරීම පුරුදුකර මෙවැනි දුක් දෙන සතර අපායෙන් මිදෙන්නට අවශ්‍ය කරුණු කාරනා ජීවිතයට එකතුකර ගන්න.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනාකර වදාලා, මේ සසරින් ගැලවීයන්න නම් ඔබ මුළින්ම මේ සසර දුක්ඛිත බව, බියකරු බව, විෂම බව දකින්න ඕනේ කියලා, මෙම අත්දැකීම්වල ස්වභාවය අවබෝධයෙන් හඳුනාගෙන ලෝකයෙන් මිදෙන්න ඔබත් වීරිය වඩන්න. නිරතුරුව ඔබ මොන පිංකම් සිදුකළත් මොන ශීලයක් ආරක්‍ෂා කළත් අතහැරීම පුරුදු කරන්න. තමාගේ අඹුදරුවන්, ගේ දොර, ඉඩකඩම්, ව්‍යාපාර, යාන වාහන, තමාගේ නිදන කාමරය, සයනය පවා මගේ කර නොගන්න. ඒවා පරිහරණය කරන්න. භුක්ති විඳින්න. ඔබේ සැප උදෙසාද, අන්‍යයන්ගේ සැප සතුට උදෙසාද, ශාසනය උදෙසාද යොදවන්න. ඔබද සතුටුවෙන ගමන් ඒවා අනිත්‍ය බවත් 'මගේ ආච්චී සීයා, මගේ අම්මා තාත්තා මේ සියල්ල දමලයි, තියලයි මියගියේ. කිසිවක් රැගෙන ගියේ නැහැ. මම ද මේ කිසිවක් අරගෙන යන්නේ නැහැ' කියලා, ඉහත දේවල්වලට ඇති බැඳීම අල්ලාගැනීම අතහැර ඒවා භුක්ති විඳීමට පුරුදුවෙන්න. ඔබ ඒවා මගේ කර අල්ලාගත්තා යනු, තෘෂ්ණාවෙන් බැඳුනා යනු, අතහැර ගැනීමට බැරි වූවාය යනු අවාසනාවන්ත උපතක් නැවත ඔබ ඔබේ කරගැනීමකි.

සංසාරයක් පුරා වැරදුණු තැන...

ශීල, සමාධි, ප්‍රඥා යනු නිවීම උදෙසා ඔබ යා යුතු මාර්ගයයි. මෙයින් තොර ඔබට නිවීම උදෙසා මාර්ගයක් නොමැත. මේ නිවීම උදෙසා මාර්ගය මිස, ඵලයක් නම් නොවේ. මේ මාර්ගයේ ඔබ ගමන්කොට ඵල අවබෝධ කරගත යුතුය. එසේ නොවුනහොත් ඔබ තවත් සංචාරකයෙක් පමණක් වනු ඇත.

දිව්‍ය, මනුෂ්‍ය, සතර අපායද ඔබේ සංචාරයේ නවාතැන් වනු ඇත. අතීතයේ වැඩසිටි බුදුරජාණන්වහන්සේලාගේ ශාසන දස දහස් ගණනකදී අපි සංචාරකයන් සේ මේ ශීල, සමාධි, ප්‍රඥා මාර්ගයේ ගමන් කිරීම පමණක් කළ නිසා වර්තමානයේදීද මනුෂ්‍ය ලෝකය නැමැති නවාතැන්පොලේ තාවකාලික නැවතුමක් සකසාගෙන ඇත. ශීල සමාධි ප්‍රඥා මාර්ගය වඩමින් එහි ඵලයන් අවබෝධ කරගැනීමට උත්සුක නොවීම තවමත් ලෝකය තුළ, දුක තුළ සංචාරය කිරීමට හේතුවයි.

මෙසේ මාර්ගයේ ගමන් කළද, ඵලයන් අවබෝධ කරගැනීමට අපට නොහැකි වී ඇත්තේ අනුන්ගේ වරදින් නොව, අපගේ වරදිනි. දිනපතා ශීලයන් සමාදන්ව ජීවත්වන, මසකට වරක් අධිශීලයන් හි පිහිටා ජීවත්වන ලක්‍ෂ ගණනින් යුත් බෞද්ධ ජනතාව තමන් ශීල සමාධි ප්‍රඥා මාර්ගයේ ගමන් කරමින් මේ සංසාර භව ගමනින් එතෙරවීමට අප්‍රමාණ කැපවීම් කළද එහි ප්‍රතිඵල සාර්ථක බවක් නොපෙනේ.

කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් තොරව ධර්ම මාර්ගය වඩන සමහරු 'මගේ ශීලය, මගේ සමාධිය' යැයි දෘෂ්ටිගත වේ. තවත් සමහරු 'මා තුළ ශීලය සමාධිය ඇතැ'යි දෘෂ්ටිගත වේ. ශීලය සමාධිය වැඩීම, ආරක්ෂා කරගැනීම නිසා ලැබෙන ආනිසංශ හේතුවෙන් ලෝකයාගෙන් තමනට ලාභසත්කාර, වැඳුම් පිදුම්, සිව්පසය ලැබෙන විට ඒවාට ඇලීම හේතුවෙන් මුලාවට පත්වේ. මාන්නයෙන් අගතියට යයි. තමා තුළ ඇති ශීලය නිසා, සමාධිය නිසා ලෝකයා, දායකයා, බිරිඳ, ස්වාමියා, ඥාතියා තමන්ට ගරුකළ යුතුය, වන්දනා කළ යුතුයැයි සිතයි. ශීලයද, සමාධියද වැඩිය යුත්තේ අල්ලා ගැනීමට, මගේ කරගැනීමට නොව අත්දකිමින්, අවබෝධය ලබමින් අතහැරීමටය. දෘෂ්ටිගත වීම යනු අල්ලා ගැනීමකි. නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වන ලෝකය තුළ අල්ලාගැනීමට කිසිවක් නොමැති බව ධර්ම මාර්ගය වඩන්නා තේරුම්ගත යුතුය. සංසාරයක් පුරාවට ශීලය උදෙසා මේ කය වැසූ සුදුරෙදි ප්‍රමාණය සේම සමාධිය උදෙසා යටපත් කරගත් සිතුවිලි ප්‍රමාණය මෙතෙකැයි කියා ගණනකින් කිව නොහැක්කකි. එවන් අතීතයක් පසුකළ අපි මේ වටිනා ජීවිතයේදීද තවත් සිල් රෙදි ප්‍රමාණයක්, යටපත්කරගත් සිතිවිලි ප්‍රමාණයක් අතීතයට එකතුකොට ඒවායේ ආනුභාවයෙන් තවත් උපතක් කරා ගියහොත් අවාසනාවකි.

ඔබේ බලාපොරොත්තුව නැවතත් දිව්‍ය, මනුෂ්‍ය ලෝකයේ ආශ්චර්යමත් උපතක් නම්, එවැනි ආශ්චර්යමත් උපතක් ලැබ, මනුෂ්‍ය- දිව්‍ය ලෝකයකදී සද්ධර්මය අසා නිවන් අවබෝධ කරගැනීම නම්, මේ ආශ්චර්යමත් සිතිවිල්ල මාරයා විසින් ඔබට එලනු ලබන රනින් රිදියෙන් ගෙත්තම් කළ පාවඩයක්ම විය යුතුය. මේවාට ඔබ වශීවනු ඇත. ජීවමාන ලොව්තුරා බුදුරජාණන්වහන්සේ වැඩ නොසිටියද, හැම පන්සලකම, ආරණ්‍යයකම, ගෙදරකම, හැම හදවතකම දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් ශෝභාමත් වූ බුදුරුව නෙත ගැටෙද්දී, ධර්මරත්නය නිරතුරුවම ශ්‍රවණය කිරීමට ලැබෙද්දී, මහා සංඝරත්නය ජීවමානව වැඩ සිටින විටදී, අප ශීල සමාධි ප්‍රඥා මාර්ගයේ ගමන් කරන හුදු සංචාරකයෙක් පමණක් නොවී, එහි ඵලයන් අවබෝධ කරගැනීමට හැකිවුවහොත් එය අපගේ භාග්‍යයකි. එසේ නොවී, සම්මා සම්බුද්ධ ශාසනයත්, සද්ධර්ම ශ්‍රවණයත්, උත්තරීතර මනුෂ්‍ය ජීවිතයත්, කල්‍යාණමිත්‍ර සේවනයත් ලද මේ ආශ්චර්යමත් අවස්ථාවට වඩා අවස්ථාවක් තවත් උපතකදී බලාපොරොත්තු වීම, අපේක්ෂා සහගතවීම යනු දුකේ සිටිමින් තවත් දුකක්ම පැතීම විනා දුකින් එතෙරවීම නොවේ. සම්මා සම්බුද්ධ ශාසනයත්, එහි සැබෑ ප්‍රතිපදාවනුත් මොනතරම් වේගයකින් විකෘති භාවයට පත්වෙමින් පවතිනවාද යන්න අපට පෙනෙන කරුණකි.

ඔබ තෙරුවන් සරණ ගිය බෞද්ධයෙක් නම් ශීල සමාධි ප්‍රඥා මාර්ගයේ කොතැනක හෝ ඔබ සිටිනවා යැයි ඔබ අනුමාන කර ඇත. මෙය මෙම මාර්ගය වැඩීමේදී ඔබට ඇතිවන ශක්තියකි. නිවීමේ මාර්ගයේදී ඔබට හමුවන ශීලය, සමාධිය යන මංසන්ධි දෙක ඔබව නිරතුරුවම මුලාවට පත්කරවන මංසන්ධි දෙකකි. මේ මුලාවෙන් ඔබට ගැලවිය හැක්කේ, ශීලය සමාධිය වැඩීමේදී ඒවායේ අනිත්‍යභාවයද, ශිල සමාධිය වැඩීම තුළින් බලාපොරොත්තුවන්නේ ප්‍රඥාව වඩවාගනිමින් දුක් දෙන සසරින් එතෙරවීම සඳහා බව නිරතුරුවම සිහිකිරීමෙනි. ශීලයද, සමාධියද නිත්‍යභාවයෙන් අල්ලාගන්නා තාක් ඔබට ප්‍රඥාව නොවැඩේ. මන්ද ඔබ ශීලය තුළද, සමාධිය තුළද නිත්‍යභාවයක් දකිමින්ද, එහි ආශ්වාදය සැපයක් කොට දකිමින්ද අල්ලාගෙන සිටින හෙයිනි. ශීලයක හික්මීමෙන් බලාපොරොත්තු වන්නේ ඒ තුළින් සතිය සහ සිහිය දියුණු කරගනිමින් සතිය සහ සිහිය තුළින් චිත්ත සමාධිය ඇතිකර ගැනීමය. චිත්ත සමාධිය ඇතිකරගත් පසුව ඔබ කළයුත්තේ තමන් පසුවන්නේ පළවැනි ධ්‍යානයේද, දෙවැනි, තෙවැනි, හතරවැනි ධ්‍යානයේද යන්න සෙවීම නොවේ. සෙවීමට උත්සාහගැනීම නොවේ. එසේ සොයන්නට ගියොත් ඔබ සොයන්නේ අස්ථිර, අනිත්‍ය දෙයකි. ධ්‍යානයද නිරතුරුවම වෙනස්වන දෙයකි. වෙනස්වීම නිසා දුක ඇතිකරවන දෙයකි. මේ හේතුවෙන් මානසික ලෙඩුන් බවට පත්කරන දෙයකි. ස්ථිරභාවයේ නොපවතින දෙයක් තවදුරටත් අප සෙවීමට ගියොත්, සොයමින් සිටියොත් මේ සම්බුද්ධ ශාසනය තුළදීද අපට ධර්මය දැකීමේ මාර්ගය මගහැරී යනුඇත. සතර අපායෙන් මිදීමේ මග අපට අතහැරී යනු ඇත. අතීත සම්බුද්ධ ශාසන වලදී කරන ලද දෙයම වර්තමානයේදී කළ අවාසනාවන්තයෙක්ම වනු ඇත.

ශීල සමාධි ප්‍රඥා මාර්ගය වැඩීමේදී ශීලය නැමැති තුන්මං සන්ධියේදී සමාධිය දෙසට යන කෙළින් පාරද, දිව්‍ය මනුෂ්‍ය ලෝක සැප දෙන දකුණට හැරෙන පාරද, සතර අපායට වැටෙන වමට හැරෙන පාරද ඔබට මුණගැසෙනු ඇත. ඔබ මෙහිදී දක්ෂ විය යුතුය, සමාධිය දෙසට යන කෙළින් පාරේ ඔබේ ගමනාන්තයට යෑමට. ඔබ අදක්ෂ වුවහොත්, සැබෑ කළ්‍යාණ මිත්‍රයෙක්ගේ උපදෙස් ඔබට අහිමිවුවහොත් ශීලය නිසා සිහිය දියුණුකර ගැනීම වෙනුවට තමා රකින ශීලය නිසා ඇලීම ගැටීම ඇතිකර ගතහොත් ඔබ නියත වශයෙන්ම ශීල මංසන්ධියේදී සමාධිය දෙසට ඇති කෙළින් පාරේ නොයා දකුණට හෝ වමට හැරෙනු ඇත. ඔබ දක්ෂ ලෙස ශීල මංසන්ධියේදී නිවැරදි මග තෝරාගෙන සමාධිය දෙසට ඇති කෙළින් පාරේ ඉදිරියට ගියහොත් ඔබට සමාධි මංසන්ධියද මුණගැසෙනු ඇත.

එහිද තුන්මං සන්ධියකි. සමාධි මංසන්ධියෙන් කෙළින් පාර ප්‍රඥාව දෙසට, එනම් ගමනාන්තයට යන පාරය. දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම සැප දෙන දකුණට ඇති පාරද, සතර අපායට යන වමට හැරෙන පාරද ඇත. මෙහිදීද ඔබ ප්‍රඥාව දෙසට ඇති කෙළින් පාරේ ගමන් කිරීමට දක්ෂ විය යුතුය. මා තුළ සමාධිය ඇතැයිද, සමාධිය තුළ මා ඇතැයිද සමාධිය නිත්‍ය භාවයෙන් ගැනීම නිසා, සමාධිය නිසා ඇලීම සහ ගැටීම නිසා ගමනාන්තයට යෑම පසෙක තබා ඔබ දකුණට හෝ වමට හැරෙනු ඇත. සමාධිය තුළ ඇති සංසිඳීම, උපේක්ෂා සහගතබව නිසා මුලාවට පත්වන්නන් අපමණය.

තමා රකින ශීලය සහ සමාධිය නිසා තමා තුළ ලෝක ස්වභාවයන්ට ඇති ඇල්ම සහ ගැටීම සේම උපේක්ෂාව තුළද ඇත්තේ අනිත්‍ය පිළිබඳව ශූන්‍ය දැනීමකි. මෙහිදී ඔබ රකින ශීලය සමාධිය නිසා ඔබ තුළ වැඩෙන්නේ කෙලෙස් ගොඩකි. මමත්වයේ අස්වැන්නකි. තමා අනුනට වඩා සිල්වතෙක්ය, තමාගේ ශීලය සමාධිය ඉහළය, පිරිසිදුය යන මාන්නය, ඉහත ඇල්ම සහ ගැටීමට හේතුවයි. ඒ මෙන්ම අවංක නොවන ඕනෑම කෙනෙකුට දැනුවත්ව හෝ නොදැනුවත්ව සැඟවී සිටිය හැකි තැනකි ශීලය සහ සමාධිය. මේවා තමා විසින් තමා රවටවා ගැනීමේ ධර්මතාවයන්ය. ඔබ සැබෑ ලෙස ශීලය තුළ, සමාධිය තුළ හික්මුණ කෙනෙක් නම් ඔබ තුළින් මාන්නය, ලෝක ධර්මයන්ට ගැටෙන ස්වභාවය අවම විය යුතුය. ඔබ ගැන ඔබට ස්වයං පරීක්ෂණයක් කිරීමෙන් ඔබගේ ශීලයේ සමාධියේ ස්වභාවය ඔබටම හඳුනාගත හැකිය. ඔබ ස්වයං පරීක්ෂණයක් කර ඔබගේ ස්වභාවය යම් මොහොතක අවබෝධ කරගත්තද ඒ මොහොතේ ඔබ ලද නිගමනය ඊළඟ මොහොතේ ධන හො ඍණ භාවයට පත්වනු ඇත. මන්ද ශීලය හෝ සමාධියේ ස්වභාවය නිරතුරුවම අනිත්‍යභාවයට පත්වන නිසාය. එහෙයින් තමා මෙතැන සිටිනවා යැයි ස්ථිර නිගමනයකට පැමිණීමට කිසිවෙක්ට නොහැකිය. මන්ද, ස්ථිරභාවයේ පවතින දෙයක් ලෝකය තුළ නොමැති නිසාය.

ඔබ තුළ ඇති ලෝක ධර්මයන්ට ඇලීමේ ගැටීමේ ස්වභාවය සඟවා තැබීමට සමාධියට ඇත්තේ පුදුමාකර හැකියාවකි. මාර්ගඵල උන්මාදය ඇතිකරන ප්‍රධාන සතුරා සමාධියයි. සමාධිය වැඩීම නිසා ඇතිවන සංහිඳියාව නිසා, 'තමා අනාගාමීය, අරිහත්ය' යන මුලාවට පත්වූ පිංවත් චරිත අප්‍රමාණය. ලොව්තුරා බුදුරජාණන්වහන්සේට මල් පහන් පූජා නොකරන පිංවත් චරිත අපමණය. තමා හැමෝටම වඩා ශ්‍රේෂ්ඨය යන මනෝභාවය තුළ හැසිරෙන චරිත අපමණය. මේ සමාධියේ ගොදුරුය. ඉතාමත්ම පහසුවෙන්

සමාධියේද අනිත්‍ය භාවය වඩමින්, දකිමින් ප්‍රඥාව දෙසට යෑමට ඔවුනට හැකි වුවද සමාධි සැපයට ඇලීම නිසා එහි නිත්‍යභාවයක් දැකීම නිසා ඔව්හු අතරමග නතරවෙති. සමහර පිංවත් භික්ෂූන් වහන්සේලා දෑස් අඩවන් කොට ගෙන සංසුන් ඉරියව්වෙන් දාන ශාලාවේ දානය වළඳති. දාන ශාලාවේ සාමනේර හිමි නමකගෙන් කුඩා වරදක් වුවද ප්‍රතිචාරය කේන්ති යෑමය. මේවා සමාධිය තුළ සැඟවී ඇති මාරයෝය. අප පිළිබඳ අපි ස්වයං පරීක්ෂණ නොකිරීමේ ප්‍රතිඵලයි. ඔබ සම්පූර්ණ කළ, ශීලයත් සමාධියත් අනිත්‍ය බව දකිමින් නොවැඩීමේ ප්‍රතිඵලයයි. ලෝක ධර්මයන්ගේ අනිත්‍ය භාවය නොදැනීමේ ප්‍රතිඵලයයි. මෙවැනි පිංවතුන් සමාධි මංසන්ධියේ සිට ප්‍රඥාව දෙසට ඇති කෙළින් පාර මඟහැර මංමුලාවීම ඒකාන්තය. තමා කෙරෙහි තමා නිහතමානී නොවීම මීට හේතුවයි. අනුන්ගේ වරද දකින ඔබ, ඊට ප්‍රතිචාර දක්වන ඔබ, ඔබ තුළ ඇති වරද නොදකීම මෙයට හේතුවයි. එසේ ඔබතුළ ඇති වරද ඔබ නොදකින්නේ ඔබ තුළ ඇති මාන්නය නිසාය. මෙය සැගවී තිබුනේ සමාධිය තුලය.

නිරතුරුවම ඔබ කැමතිම අකමැතිම ස්වභාවයන් සොයාගොස් ඒවාට මුහුණ දෙන්න. අත් දකින්න. අත් විඳින්න. ඒවාට ඇලෙන්න ගැටෙන්න නොයන්න. මෙසේ ක්‍රියාත්මක වෙමින් ඔබේ ශීලයත්, සමාධියත් නිරතුරුවම ස්වයං පරීක්ෂණයට ලක්කරන්න. එවිට ඔබට පහසුවෙන් ප්‍රඥාවේ මඟට අවතීර්ණ වෙන්න පුළුවන්.

ශීලය සහ සමාධිය ඔබ විසින් ආරක්ෂා කරගත යුතු, වැඩිය යුතු දෙයකි. ශීලය ආරක්ෂා කරගත් තරමට ඔබ සිල්වත් වේ. සමාධිය වැඩූ තරමට ඔබගේ චිත්ත සමාධිය දියුණුවේ. එහෙත් ඔබ සමාධි මංසන්ධියෙන් ප්‍රඥාව දෙසට ගමන් කිරීමේදී ඔබ කළ යුත්තේ ආරක්ෂා කිරීම හෝ වැඩීම නොවේ. අතහැරීමය. ශීලය ආරක්ෂා කිරීම සහ සමාධිය වැඩීම නිසා ඔබ ඇති කරගත් චිත්ත ඒකාග්‍රතාවය ප්‍රයෝජනයට ගෙන සිතේ ස්වභාවය දැකීමය. පංච උපාදානස්කන්ධයේ ඇතිවීම නැතිවීම දැකීමය. ඇතිවෙමින් නැතිවෙමින් ගලාගෙන යන සිතේ ස්වභාවය දැකීමය. දකිමින් තමාට අයත් නැති ආගන්තුක සිත් අතහැරීමය. ශීල සමාධි මාර්ගය වඩන විට ඔබ කළේ ශීලය ආරක්ෂා කිරීමය, සමාධිය වැඩීමය. ඒ තුළින් චිත්ත සමාධිය ඇති කරගැනීමය. මෙසේ මං මුලාවීම්වලින් තොරව සුවසේ සමාධි මංසන්ධිය පසුකොට ප්‍රඥාව දෙසට ඇති කෙළින් පාරට අවතීරණ වීමට ඔබ දක්ෂ වුවහොත් ඉන් ඔබ්බට ඔබට ආරක්ෂා කිරීමට හෝ වැඩීමට දෙයක් නොමැත. ඔබ කළ යුත්තේ සමාධිමත් සිතින් සිත දෙස බැලීමය. සිත දෙස බලමින්

ඔබට ආගන්තුක, ඔබගේ වසඟයේ නොපවතින, නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වන, ඔබගේ අක්‍රීය කය ක්‍රියාත්මක භාවයට පත්කරවන, සිතේ ස්වභාවය දැකීමය. දකිමින් ඔබට අයිති නොමැති සිත අතහැරීමය. සිතක් අතහැරෙන මොහොතක් පාසා ඔබට කයේ වචනයේ ක්‍රියාත්මකභාවය අතහැරෙනු ඇත. අත්හැරෙන සෑම සිතක් පාසාම ඔබට අතහැරෙන්නේ දුකයි. ජාති, ජරා, ව්‍යාධි මරණ ඇති කරන ලෝකයයි. නිරතුරුවම ඔබ තුළින් ඔබව ස්වයං පරීක්ෂණයකට ලක් කරන්න. 'මම' කියන චරිතය හැම මොහොතකම පරාජය කර දමන්න. 'මගේ ශීලය, මගේ සමාධිය, මගේ ප්‍රතිපදාව, මගේ ශ්‍රද්ධාව'...... මේවායින් ඔබ හිස්වන්න. මම ගැන අඩුවෙන් කථා කරන්න. මගේ හැකියාවන් ගැන අඩුවෙන් කථා කරන්න. ඇති වෙමින් නැති වෙන සිතක් සකස් නොවුව හොත් මේ කය 'මම' මළකඳක් බව සිතන්න. අනිත්‍ය සංඥාවම වඩන්න. අනිත්‍යයට අයිති ලෝක ධර්මයන්ට නොඇලී, නොගැටී ප්‍රඥාව දෙසට ගමන් කිරීමට ඔබ දිරිමත් වන්න.

ඔබට හොඳ පැහැදිලි උදාහරණයක් දෙන්නම්. ඔබ පිටකොටුවෙන් බසයක නැග කතරගමට යනවායැයි සිතන්න. එවිට ඔබේ ගමනාන්තය කතරගම. එහෙත් ඔබ බස් රථයේ යන විට කළුතර බෝධීන් වහන්සේ, චෛත්‍යරාජයා, කළු ගඟ.... එහි අසිරිය දැකලා ඔබ බසයෙන් බැස ඉහත ස්වභාවයන්ට ඇලිලා කළුතර නතර වෙනවා. පදිංචි වෙනවා. ඔබට පුළුවන්ද කතරගමට යන්න. බැහැ නේද? ඔබ කළුතරට ඇලුනු නිසා එහි නතරවුනා. මෙහෙම කළුතර නතර වෙලා එහි අසිරිය විඳිමින් සිටින විට ඔබට සිහිය ඇති වෙනවා ඔබගේ ගමනාන්තය ගැන. එවිට ඔබ කළුතරට ඇති ආශාවෙන් මිදිලා නැවත කතරගම බසයක නැගලා ගාළු පාරේ ඉදිරියට යනවා. මෙහෙම යනකොට ඔබ තිස්සමහාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේ, තිසා වැව ආදිය දැකීම නිසා නැවතත් එම ස්වභාවයන්ට ආශාවෙන් තිස්සමහරාමයෙන් බසයෙන් බසිනවා. ඉහත ස්වභාවයන්ට ඇලීම නිසා ඔබ තිස්සමහරාමයේ නතරවෙනවා, පදිංචි වෙනවා. ඔබට පුළුවන්ද කතරගමට යන්න? බැහැ. අතරමග යමක් තණ්හාවෙන් අල්ලා ගැනීම නිසා ගමනාන්තයට නොයා ඔබ අතරමඟ නැවතිලා. නමුත් මාර්ගය පැහැදිළිව තිබෙනවා. අවශ්‍ය ප්‍රවාහන පහසුකමත් තිබෙනවා. එහෙත් ඔබ අතරමග ස්වභාවයන්ට ඇලීම නිසා, ඒවා අනිත්‍ය වශයෙන් දැක ඇතහැරීමට අදක්ෂ නිසා ඔබ ප්‍රමාදයට පත්වෙලා. එහෙම වීම ස්වභාවිකයි. කළුතරදීද, තිස්සමහාරාමයේදීද ඔබ විඳින්නේ සම්බුදු පහසයි. ඔබ තුළින් රැස්වන්නේ කුසල් සිත්ය. එහෙත් ඒවා අයිති ලෝකයටයි. අපි මේ කථා කරන්නේ ලෝකයෙන් එතෙරවීම සඳහා වැඩ පිළිවෙළයි. හොඳයි ඔබට

තිස්සමහාරාමයේදී නැවත ගමනාන්තය පිළිබඳව සතිය සිහිය ඇතිවෙලා ඔබ කතරගම බසයකට ගොඩ වුනොත්, කතරගමට තව බොහොම කෙටි දුරයි තිබෙන්නේ. නමුත් අදක්‍ෂ, හැමදෙයටම ඇලෙන පිංවතුන් මේ කෙටිදුර ගෙවාදමා ගමනාන්තයට නොයා අතරමඟ පදිංචි වෙනවා. මෙය පෘථග්ජන ස්වභාවයයි. මෙම ස්වභාවයෙන් ඔබට මිදිය හැක්කේ ප්‍රඥාව වඩවාගැනීමට උපකාර ධර්මයන් වන, නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වන ශීලය සහ සමාධිය අනිත්‍ය වශයෙන් දකිමින්, අත් විඳිමින්, අවබෝධය ලබමින්, අතහැරීමය. එසේ නොවඩන්නා නිවන් මගෙන් ඈතට ගිය ලෝකය තුළ සැරිසරන්නෙක් වීම අරුමයක් නොවේ. අතරමඟ නොනැවතී පෙරටම යන්න. හමුවෙන කිසිවෙක්, කිසිවක් මමත්වයෙන් නිත්‍ය භාවයෙන් නොගන්න. ඔබට ගමනාන්තය මුණගැසෙනු ඇත.

සැබෑ ලෙසම නිවන් මගේ හික්මෙන්නාට අතහැරීම යනු, අතහැරීමේ සීමාව යනු ආරණ්‍ය, පන්සල, කුටිය. සිව්පසය..... මේ ආදී භෞතික සම්පත් අතහැරීම පමණක් නොව, ඒවායෙන් මනින සීමාවක්, කඩුල්ලක් නොව, මේ ඉහළට ගන්නා හුස්ම පොද නැවත නාසයෙන් පහළට එන විට මේ ජීවිතය මරණයට, විනාශයට පත්වෙනවාය යන සීමාව මතකයේ තබාගන්න. නිරතුරුවම නාසයෙන් හුස්ම පොදක් ශරීරයට ආශ්වාසය කිරීමේදී එම හුස්ම පොද ශරීරයෙන් පිටකරන මොහොතේදී මරණය සිදුවේය යන ලෝකයේ සැබෑම ධර්මයට අනුව ඔබ සිතන්න පුරුදුවෙන්න. 'මම' වශයෙන් හඳුන්වාගන්නා මේ ආශ්චර්යමත් මිනිසාට මේ ලෝකය තුළ හුස්මක් ඉහළට ගෙන එය නැවත පහතට හෙලන තරම්වත් කාලයක් නිත්‍යභාවයෙන් අයිති නැති බව අවබෝධයෙන් දකින්න. ආශ්වාස කරන හුස්ම පොද ප්‍රාශ්වාස කරන මොහොත දක්වාමත්, නිත්‍යභාවයේ නොපවතින 'මම' මමත්වයෙන් නොගන්න. 'මගේ ශීලය, මගේ සමාධිය, මගේ විනය, මගේ ප්‍රතිපදාව, මගේ ජ්‍යෝෂ්ඨත්වය' ආශ්වාස ප්‍රාශ්වාස කරනා හුස්ම පොදක් තරම් වේලාවක් තරම්වත් නිත්‍යභාවයේ නොපවතින අරාජික ධර්මතාවයන් බව පිංවත් අපි නිරතුරුවම දකිමු. එසේ දකිමින් ශීල, සමාධි මාර්ගය සුවසේ මං මුලාවීම්වලින් තොරව පසුකොට, ලෝකයට අයිති දුක මගේ කරගෙන දුක් විඳින ලෝකයෙන් මිදීම පිණිස, ඔබට අයිති නැති ලෝකය ඔබේ කරගෙන, අවිද්‍යාවෙන් තෙමුණ, ඇතිවෙමින් නැතිවෙන, ඔබට ආගන්තුක සිත අවබෝධයෙන් දකිමින් අතහරින්න. ඔබට අතහැරෙන අතහැරෙන සිතක් පාසා, ලෝකය අතහැරීමට අවශ්‍ය ප්‍රඥාව ඔබ තුළ වැඩෙනු ඇත.

ඔබ මොන දෙයකට ඇලුනද එම ඇලීමේ ස්වභාවය තුළ ගැටීමද ඇත. ඔබ මෙහෙම සිතන්න. යමෙක් ශීලයට ඇලෙනවා, 'මා තුළ ශීලය තිබෙනවා. ශීලය තුළ මා සිටිනවා' කියලා දකිමින්, තමා ඉහළයයි අන්‍යයන් පහත් කොට දකිනවා. දුස්ශීල කොට දකිනවා. ඔහු මාළු නොකනවා පමණක් නොවෙයි, මාළු අනුභව කරන, මාළු විකුණන, මාළු උයන, මාළු අල්ලන, මාළු ඇතිකරන අය සමගත් ගැටෙනවා. ඒ විතරක් නොවෙයි මාළු දැලක්, මාළු බෝට්ටුවක් දැක්කත් ගැටෙනවා. ඇයි මේ ගැටීම? ශීලය කෙරෙහි අන්තවාදීව ඇලීම නිසයි මේ ගැටීම ඇති වුනේ. එහෙම නම් පිංවත් ඔබ මහ ලොකුවට ආරක්ෂා කරන ශීලය තුළ ඇලීමත් ගැටීමත් දෙකම දෝර ගලා යනවා. ඒ කියන්නේ ඔබ නිවීමේ මඟ දෙසට යනවා නොවෙයි. භවයට අවශ්‍ය සංස්කාර රැස් කරන්නෙක් බවට පත් වෙනවා. සමාධිය කෙරෙහි ඇලීමේදී තමා තුළ සමාධිය තිබෙන නිසා අන්‍යයන් සිනාසෙන කොට, හඬන කොට, ශබ්ද නගන කොට, ශබ්දයෙන් බණ පදයක් පිරිත් පදයක් කියන කොට ඒ හඬට ගැටෙනවා. ඇයි මේ ගැටීම...? තමා සමාධියට ඇලීම නිසයි. හොඳින් දකින්න ශීල සමාධි වේශයෙනුත් අපට නිවන්මඟ අවහිර කොට, භව මඟ විවෘත කර දෙන්නේද මාරයාමය. මාර ධර්මයන් හොඳින් අවබෝධයෙන් හඳුනාගෙන කළ්‍යාණමිත්‍ර ඇසුරකින් නිවී සැනසෙන්න.

කොහොමද...? ක්‍රෝධයේ අස්වැන්න

ක්‍රෝධය යනු මෛත්‍රියට වඩා ලෝකය තුළ පැතිර පවත්නා සත්ත්ව ස්වභාවයකි. මහ පෙළොවේ පස් අහුරක් දෝතට ගතහොත්, එම පස් මිටත් මහ පොළොවේ පසුත් අතර ඇති පරතරය යම් සේද ලෝකය තුළ මෛත්‍රිය සහ ක්‍රෝධයේ ස්වභාවය එසේමය. මනුෂ්‍ය ලෝකයේ සත්ත්වයා බෞද්ධ හෝ අබෞද්ධ වුවද යම් හෝ ආචාර ධර්ම පද්ධතිකයකින් හික්මෙන නිසා, දියුණු සිතීමේ ශක්තියක් ඇති නිසා සහ දියුණු කණ්ඩායම් හැඟීමක් ඇති නිසා ක්‍රෝධයේ ස්වභාවය දැඩිව ප්‍රකට නොවූවද තිරිසන් ලෝකයේ, ප්‍රේත ලෝකයේ, නිරයේ ජීවත්වන සත්ත්වයා තුළ නිරතුරුව වැඩෙන්නේ වෛරය සහ ක්‍රෝධයයි. ක්‍රෝධය, වෛරය යනු ඔවුන්ගේ කර්ම විපාකයයි. විපාකය නැමැති ඵලය ඔවුනට ලැබෙන්නේ ක්‍රෝධය සහ වෛරය නිසාය. අපි කැමැති දෙයම, අපි පුරුදු කළ දෙයම අපට ලබාදීම ලෝක ධර්මයේ ස්වභාවයයි. ඔය තිරිසන්, ප්‍රේත නිරයේ දුක් විඳින සත්ත්වයින් එම ලෝකවල කල්ප ගණන් දුක් විඳින්නේ තමන් නිසා නොව, අනුන් නිසා කරගත් අකුසල් නිසාය. ඔබ හොඳින් සිතා බලන්න. කෙනෙක් ඔබට ඔරවා බැලුවොත්, බැන්නොත්, ගැහුවොත් මදි පුංචි කමක් කළොත්, තමාගේ දෙයක් සොරා ගත්තොත්, ඔබව විවේචනය කළොත්, ඔබට වඩා ඉහළට යනවා දැක්කොත්.... මෙහෙම වෙනකොට ඔබ ඔහුගේ දෙය ඔබේ කරගෙන, ඔහුගේ ක්‍රියාව ඔබේ කරගෙන ඔබ තුළ වෛරය ක්‍රෝධය ඇතිකරගන්නවා. බලන්නකෝ අනුන් තුළ ඇතිවූ දෙයක් නිසා, අනුන් විසින් කළ ක්‍රියාවක් නිසා ඔබ විසින් ඔබ තුළ වෛරය ක්‍රෝධය

ඇති කරගත්තා වගේම එම පාප ධර්මයන් නිසා එහි විපාකයන් හැටියට තිරිසන්, ප්‍රේත, නිරයේ අවාසනාවන්ත ජීවිත ලබනවා. ඔබ කැමති කළේ ක්‍රෝධය වෛරය නම් සංසාරයේ එයම ලැබීම නියතයක්. මොකද ඔබ කැමති කළ දෙය නිසා.

එහෙම නම් ඔය සතර අපායේ දුක් විඳින සෑම සත්ත්වයෙක්ම ඔතැනට වැටුනේ අනුන්ගේ දෙය තමාගේ කර ගැනීමට යෑම නිසාමයි.

මා තුළත් මා නැති කළ, අනුන් තුළ මා දැකීම මේ අවාසනාවේ හේතුවයි.

ඔය සතර අපායේ දුක් විඳින සෑම සත්ත්වයෙක්ම ඔබ මම වගේම වටිනා මනුෂ්‍ය ජීවිත ගතකළ මනුෂ්‍යයන්මය. මමවත්, මගේවත් නොවන 'මම' ආරක්‍ෂා කරගැනීමට, ආත්ම ගෞරවය රැක ගැනීමට ගොස්, අපාදුක් විඳින අවාසනාවන්තයින්ය. මේ ලැබුණු මනුෂ්‍ය ජීවිතයේදී ඇති කරගත් ක්‍රෝධය වෛරය මරණින් මතු ප්‍රේත ලෝකයේ දැඩි ලෙස දුක් විඳින ප්‍රේතයින් දෙදෙනෙකුගේ අතිශය දුක්ඛිත ස්වභාවය පහත සඳහන් කරමි.

භික්‍ෂුවක් සමාධියෙන් පසු වෙද්දී ප්‍රේතයින් දෙදෙනෙකු දර්ශනය විය. භික්‍ෂුවගේ සමාධිමත් සිතට, ඕලාරික ස්වභාවයෙන් මනුෂ්‍ය රූපයෙන්ම සිටි ප්‍රේතයින් දෙදෙනා දර්ශනය විය. දෙදෙනාම මනුෂ්‍ය ලෝකයේදී තමන් හැඳ පැළඳි දිග කලිසම් සහ කමිසවලින් සැරසී සිටින ආකාරයෙන්ම සිටියහ. දෙදෙනාගෙන් එක් අයෙක් සිටියේ දැඩි වියරු ස්වභාවයෙන්ය. අනෙක් ප්‍රේතයා වෙතින් අහිංසක බවක් දිස්විය. වියරු ස්වභාවයෙන් යුත් ප්‍රේතයා තමා ඉදිරියේ සිටි අනෙක් ප්‍රේතයාගේ ගෙල පෙදෙසින් වියරුවෙන් මෙන් දැතින්ම අල්ලාගත්තේය. ගෙල පෙදෙස දැතින් අල්ලාගෙන වියරු ස්වභාවයෙන් තමාගේ හිසේ අනෙකාගේ හිස ගසාගත්තේය. මේ වියරුවේ ස්වභාවය ඉතාමත් බිහිසුනුය. එය එතරම්ම වේගවත්ය. ප්‍රේතයින් දෙදෙනා හිස්දෙක ගසාගත් වේගය නිසා හිස් දෙකම කුඩුවිය. මෙහිදී අහිංසක ස්වභාවයෙන් යුත් ප්‍රේතයා හිස කුඩුවී මිය යන මොහොතේ 'අනේ මගේ දුවේ' යනුවෙන් ශබ්දයෙන් විලාප හඬක් නැගීය. දෙදෙනාම ලැබූ ප්‍රේත ජීවිතයේදී අකුසලය විපාක දී චුතවිය. ඒ සැනින්ම නැවත එපරිද්දෙන්ම ප්‍රේත ලෝකයේම ප්‍රතිසන්ධිය ලබයි. නැවතත් පෙර සේම කර්ම විපාකය විපාක දී නැවත නැවත මැරෙමින් ඉපදෙමින් කල්ප ගණන් මේ වියරු මරණීය දුක අත්විඳියි. ප්‍රේත ලෝකයේදීද, තමා මනුෂ්‍ය ජීවිතයේදී වැඩූ වෛරය, ක්‍රෝධය නිසා හිස කුඩු පට්ටම් කරගෙන මියයන මොහොතේදී එක් අයෙකුට මතකයට ආවේ මනුෂ්‍ය ලෝකයේදී තමා උපාදානය කරගත් 'මගේ දුව' නැමැති සංඥාවයි.

මොවුන් දෙදෙනා ප්‍රේත ලෝකයේ උපත ලබන්නේද, මෙලෙස එකට මුණ ගැසෙන්නේද තමන් කළ කර්මය නිසාය. මෙහි මහා අවාසනාව වනුයේ මෙසේ ප්‍රේත ලෝකයේ ප්‍රතිසන්ධිය ලබා හිස්ගෙඩි දෙක වියරුවෙන් ගසාගෙන මරාගෙන නැවත ප්‍රේත ලෝකයේම ප්‍රතිසන්ධිය ලබා දෙදෙනා නැවත හමුවන මෙහොතේ දෙදෙනාටම තමන් මීට පෙර ප්‍රේත ලෝකයේ ඉපැදුණු බව හෝ හිස් ගෙඩි දෙක ගසා ගනිමින් මිය ගිය බවට සංඥාවක් දැනෙන්නේ නැති බවයි. එහෙත් දෙදෙනා නැවත මුණ ගැසෙද්දී වෛරයේ සංඥාව මතුවී විපාකය ක්‍රියාත්මකවෙයි.

මනුෂ්‍ය ලෝකයේ වෛරය ක්‍රෝධය වැඩීම නිසා ප්‍රේත ලෝකයේ දුක් විඳින අවාසනාවන්තයින් දෙදෙනෙකුගේ කථාවයි මෙය.

ඔවුන් දෙදෙනා මුණගැසෙන ආත්මයක් පාසාම ඔවුන් තුළ වැඩෙන්නේ වෛරය ක්‍රෝධය පමණකි. මරණ චේතනාව පමණකි. එහෙයින් ඔවුන් දෙදෙනා සෑම නිමේශයකදීම ප්‍රේත ලෝකයේදී රැස්කරන්නේ අකුසලයක්මය. නිරතුරුවම රැස් කරන පරපණ නැසීමේ අකුසලය නිසා ඔවුන් නැවත නැවත මීට වඩා දරුණු විපාක විඳිමින් නිරයට වැටෙනවා ඒකාන්තය. කල්ප සියක් කෝටි ගණනක් ගියද ඔවුනට එයින් ගැලවීමක් සිතීම විහිළුවකි. මනුෂ්‍ය ලෝකයේ ආශ්චර්යමත් මනුෂ්‍යයෙක්ව ඉපිද 'මම' කියන සංඥාව රැක ගැනීමට ගොස් මෙවැනි දුකක් උරුමකර ගැනීමට ඔබත් කැමතිද?

ඔබ ඇකමැති නම් මේ මොහොතේම ඔබ වෛරයෙන් ක්‍රෝධයෙන් මිදෙන්න උත්සාහ ගන්න. අනුන්ගේ දෙය ඔබ ඔබේ කර නොගන්න. අනුන්ගේ හිතේ හටගත්, ඔහුටවත් අයත්නැති සිතක් ඔබ ඔබේ කර නොග න්න. ක්‍රෝධය වෛරය සහිත සිත් ඔබ, ඔබට අයිති නැති අනිත්‍යයට අයිති දෙයක් බව සිතන්න. ඔබට අපා දුක් දෙන පාප මිතුරෙක්, ආගන්තුකයෙක් ඔබ ඔබේ කර නොගන්න. නපුරු විසකුරු සර්පයෙක් දැක ඔබ මග හැරයනවා සේ ඔබද නපුරු, විසකුරු සිත් ඇතිවුන කළ ඒවාට පැමිණි ලෙසින්ම යන්නට ඉඩ හරින්න. සිත ඔබේ කර නොගන්න. ඇතිවූ සිතේ නපුරු බව, විසකරු බව දකින්න. ඇති වෙමින් නැතිවෙන සිත සතියෙන් සිහියෙන් යුතුව ඔබ ඔබේ කළ්‍යාණ මිත්‍රයෙක් බවට පත්කර ගැනීමට වෙහෙස ගන්න.

අපි දැන් බලමු ඉහත ප්‍රේතයන් දෙදෙනා මොනවගේ කර්මයක් මනුෂ්‍ය ලෝකයේදී කළ නිසාද මෙම දුක්ඛිත විපාකයට මුහුණ දීමට සිදුවූයේ කියලා.

ඉහත භික්ෂුව අනුමාන කරනවා (නමුත් ස්ථිරවම කියන්න දන්නේ නැහැ) මෙහිදී හමුවන අහිංසක ස්වභාවයෙන් යුත් ප්‍රේතයා මනුෂ්‍ය ලෝකයේදී විවාහයක් කරගෙන බිරිඳ සහ එක් දරුවෙකු සමඟ ලස්සන පවුල් ජීවිතයක් ගත කළ කෙනෙක්. එකම දරුවා සුරතල් දියණියක්. මෙම ස්වාමි පුරුෂයා බිරිඳට සහ දියණියට දැඩිසේ ආදරය කළ අයෙක්. අවාසනාවකට ඔහුගේ ලස්සන අහිංසක පවුල් ජීවිතයට අසම්මත ප්‍රේමවන්තයෙක් හරස් වෙනවා වෙන්න පුළුවන්. මෙම අසම්මත ප්‍රේමවන්තයා බිරිඳට ඇති තණ්හාව නිසා ස්වාමි පුරුෂයා මරා දමා බිරිඳව තමන් අයිති කරගත්තා වීමටද පුළුවන්. අසම්මත පෙම්වතා අතින් මේ ස්වාමිපුරුෂයා මියයන මොහොතේ අවසාන සංඥාව උපාදානය ලෙසින් මතු වූයේ 'අනේ මගේ දුව' යන සංඥාවයි. ඔහුට දැනෙන්නට ඇති මගේ දුව අනාථ වෙයි, අසරණ වෙයි කියන හැඟීම. ඒ නිසා ඇතිවූ වෛරය. මේ සියල්ලම ඇතිවුනේ තණ්හාව නිසාමයි. තමාගේ ලෙයින් උපන් අහිංසක සුන්දර දියණිය, තමා මැරෙන මොහොතේ, විශේෂයෙන්ම බිරිඳද අසම්මත ප්‍රේමයක බැඳී ඒ හේතුවෙන් තමාව මරාදැමෙන මොහොතේදී, සුරතල් දියණියව මතකයට ඒම ඕනෑම පියෙකුට පොදු ධර්මතාවකි. අවසානයේදී යම් හේතුවක් නිසා අසම්මත ප්‍රේමවන්තයාද කව්රුන් අතින් හෝ මැරුම්කන්නට ඇත. එසේ නොමැතිනම් නීතිය ඉදිරියේ වරදකරු වී දඬුවම් ලබා මරාදමන්නට ඇත. දෙදෙනා තුළම එකිනෙකා කෙරෙහි, අනෙකා (අනුන් නිසා) ඇතිකරගත් වෛරය ක්‍රෝධය හේතුවෙන් ප්‍රේත ලෝකයේ උපත ලබා වෛරයේ දරුණු ස්වභාවය නිසා හිස් ගෙඩි දෙක වියරුවෙන් එකට ගසාගනිමින් විපාකයන් විඳී. මෙහිදී අහිංසක ප්‍රේතයාව වියරු වැටුණු ප්‍රේතයා විසින් අල්ලාගෙන ඔහුගේ හිස තමාගේ හිසෙහි ගසාගෙන පොඩිකොට දමා මියයන මොහොතේ 'අනේ මගේ දුවේ' යැයි අහිංසක ප්‍රේතයාගෙන් අඳෝනාවක් නැගෙන්නේ (එම හඬ ඉතාම අසරණ හඬකි. වේදනාත්මක හඬකි) තමා මනුෂ්‍ය ලෝකයේදී දුව ලෙසින් කැමැත්තෙන් ආශාවෙන් උපාදානය කරගත් සංඥාවේ බලවත්භාවය නිසාය.

ඔබ දැන් හොඳ සිහියෙන් යුතුව දකින්න. මෙහි එන අසම්මත පෙම්වතා කියන චරිතය තමා තුළ අන්සතු බිරිඳක් කෙරෙහි හටගත් තණ්හාවේ සිත අනිත්‍ය වශයෙන් දක්කා නම්, ඒ පාපකාරී සිත තමා වසඟයට, තමාගේ කර නොගත්තා නම් වර්තමානයේදී ඔහුට මේ දුක විඳින්නට සිදුවන්නේ නැහැ නේද?

තමා තුළ ඇතිවූ එක සිතක්, මොහොතකින් නැතිව යන එක සිතක් අනිත්‍ය වශයෙන් දක්නට තිබූ නොහැකියාව නිසා, ඒ සිත තණ්හාවෙන් තෙත්

කොට ක්‍රියාත්මක භාවයට පත් කිරීම නිසා, කල්ප ගණනාවක් අපාදුක් විඳින අවාසනාවන්තයෙක් වූවා නේද? සිතක් කියන්නේ මොහොතකින්, නිමේශයකින් වෙනස් වෙන දෙයක් වුවත්, අනිත්‍යභාවයට පත්වෙන දෙයක් වුවත් එම සිතට පුළුවන් ඔබව කල්ප ගණනක් දුක් විඳින සත්ත්වයෙක් බවට පත්කරන සංස්කාරයන් රැස්කර දෙන්නත්. සිත යනු දුක කියන්නෙත්, ලෝකය කියන්නෙත් ඒ නිසාමයි. ඇතිවී නැතිවී යන එක සිතක් අනිත්‍ය වශයෙන් නොදකින වාරයක් පාසාම ඔබ එම සිත නිසා දුකද ලෝකයද අයිති කරගන්නවා. සිතක් අනිත්‍ය වශයෙන් දකින මොහොතක් පාසාම ඔබ දුකද ලෝකයද අතහැර දමනවා.

මියගිය ඥාතියාට ඔබ සැබෑවින්ම හිතවත්ද

පවුලේ සාමාජිකයෙක් මිය ගියහම සත් දවසේ, තුන් මාසේ, අවුරුද්දේ මේ ආදී වශයෙන් ධර්ම දේශණා සාංඝික දානමය පිංකම් සිදුකිරීම සමාජයේ පවතින චාරිත්‍රයක්. වර්තමානයේ මෙම චාරිත්‍රයේ ගුණාත්මක බව පිරිහීම මෙලොව පරලොව සැම දෙනාගේම අවාසනාවක්. අප හිතමු ගෙදර ස්වාමි පුරුෂයා මැරිල ගිහින්, ප්‍රේතයෙක් වෙලා ඉපදුනාය කියල. ඇයි ඔහු ප්‍රේතයෙක් වෙලා ඉපදුනේ. මැරෙන මොහොතේ ඔහුගේ බිරිඳ දරුවන් ගේ දොර ඉඩ කඩම් කෙරෙහි තණ්හාව ඇති වුණ නිසයි ඊට ආශාවෙන් කැමත්තෙන් ගෙදරට ප්‍රේතයෙක් ලෙස උපාදානය ලැබුවා. හැබැයි ඔහු ජීවත්ව සිටියදී කුසල් දහම්ද වැඩූ අයෙක්. නමුත් මියයන මොහොතේ එම පිංකමක් සිහිකලා නම්, සිහිවුනා නම් නියත වශයෙන්ම ඔහුට සුගතිගාමී ජීවිතයක් ලබන්න තිබුන. ඔහුට බිරිඳ, දරුවන්, ගේදොර කෙරෙහි ඇතිවූ උපාදානය නිසා බැදීම් නිසා කුසල් සිත් යටපත්ව තණ්හාවෙන් තෙත් වුන සිතක් සකස් වුන නිසා තමා කැමති කල, ආශා කළ පරිදිම බිරිඳ දරුවන් සිටින නිවසේම ප්‍රේතයෙක් ලෙස ප්‍රතිසංධිය ලැබුවා. ඔහු කැමතිකල ස්වභාවය ඔහුට ලැබුණා. ඔබ හිතනවාද මේ ප්‍රේත ජීවිතය ඔහුට දුකක් කියලා. ඔහුට දුකක් නැහැ. ඔහු සැපයක් කියලාමයි මේ ප්‍රේත ජීවිතය විඳින්නේ. ඔහු කැමතිකල ප්‍රාර්ථනා කළ දෙයයි ඔහුට ලැබුනේ. ඔහුට අවශ්‍යනම් ඔහු පුහුණුකොට තිබුණානම් ඔහු කළ කුසල කර්මයක් සිහියට නගාගෙන මෙනෙහි කොට සුගතියක් ලබන්න අවස්ථාව තිබුනා. නමුත් ඔහු කැමති තැන ඔහුට ලැබුනා.

දැන් ගෙදර ප්‍රේතයෙක් වෙලා ඉන්න ස්වාමි පුරුෂයාට පිං දෙන්න සත් දවසේ හෝ තුන් මාසේ පිංකම කරනවා. නමුත් ඥාතීන් කිසිවෙක් දන්නෙ නැහැ මලගිය තැනැත්තා කොහේ ඉපදුනාද කියලා. නමුත් ඔහු ඉපදිලා ඉන්නෙ ගෙදරමයි. දැන් ගෙදර ධර්ම දේශනා පිංකමට සූදානම්. පිංකමට මහා පිරිසකට ආරාධනා කරල. ගෙදර ඇතුළෙ, වත්තෙ පිටියෙ හැම තැනම ඥාතීන්, හිතවතුන්. මේ අයට සංග්‍රහ කරන්න මුළු තැන්ගෙයි කෑම බීම හැදෙනවා, කට්ලට් බදිනවා, මාළු මස් උයනවා. කෑම මේසය පිළිවෙළ වෙනවා. සමහරු කාඩ් සෙල්ලමේ, තවත් සමහරු ආගිය තොරතුරු කථා කරනවා. තව සමහරුන්ගේ දුරකථන නාද වෙනවා. පුංචි දරුවො හඬනවා. දැන් ස්වාමින් වහන්සේ වැඩම කරල ධර්ම දේශණය පවත්වනවා. ගෙදර මුළුතැන්ගෙයි, කාමරවල, වත්තෙ පිටියේ කලබලයි. දැන් ඔබ හොඳින් හිතන්න පිංදෙන්න බලාපොරොත්තු වෙන ප්‍රේතයා ගෙදරම සිටිනවා. ඉහත ස්වභාවයෙන් ඔබ පිංකම් කළොත් මේ ප්‍රේතයා බණ දවසෙ සවස පටන්ම දැඩි ලෙස කලබල වෙලයි ගැටෙන සිතෙනුයි සිටින්නෙ. මගේ ගෙදරට මිනිස්සු එනවා. මගේ බිරිඳ සමග මිනිස්සු කතා කරනවා, හිනැහෙනවා, මගේ වත්තෙ මිනිස්සු, ගෙදර කාමරවල මිනිස්සු, මගේ බිරිඳ මට අහිමිවෙයිද? කවුරුහරි උදුරාගනීද? මගේ බිරිඳ මේ මොකද කරන්නෙ, මම මහන්සිවෙලා හරිහම්බ කළ මුදල් වියදම් කරනවා, මිනිස්සුන්ට කන්න දෙනවා. මෙහෙම සිතමින් තණ්හාවෙන් චංචල ස්වභාවයෙන් ගේ පුරා දුවනවා. ඇවිත් ඉන්න මිනිස්සු සල්ලි, රන් රිදී ගනිවී කියල එයා අල්මාරිය මුරකරනවා. මිනිස්සු ගෙනා තෑගි පාර්සල් මුරකරනවා. එයා මහා බියකින් පසුවෙන්නෙ. තමාගේ යැයි උපාදානය කොට ගත් දෙය අනුන් පරිහරණය කරන කොට එයාට ධර්ම දේශණයට සවන්දීල පිං ගන්න සිතක් චිත්ත විවේකයක් නැහැ. ප්‍රේතයා තණ්හාවෙන් බියෙන් අන්ධ වෙලයි මේ මොහොත ගත කරන්නේ. ධර්ම දේශනය ස්වාමින් වහන්සේ හමාර කරල පිං දුන්නත් ප්‍රේතයා ඒ වගක්වත් දන්නෙ නැහැ. ඔහු ප්‍රේත ස්වභාවයෙන් තමා උපාදානය කරගත් දෙය රැක ගැනීම උදෙසායි මුළු කාලයම වැය කලේ. ඔහු තුළින් තව තවත් අකුසල් රැස්වීමක් පමණයි සිදුවුනේ.

ඔබ මෙහෙම සිතන්න ඔබේ ගෙදර සාදයක් තිබෙනවා. කෑම මේසය ආහාරවලින් පිරිලා. ඔබේ ගෙදර සිටින කුඩා දරුවා මෙවැනි අවස්ථාවක මොකද කරන්නෙ සම වයසෙ දරුවන් සමග සෙල්ලම් කරනවා. හැමෝම අතේ සුරතල් වෙනවා. එයා ආහාර ගැන සිතන්නෙ නැහැ. මෙහෙම දඟලල ආහාර නොගෙනෙම නිදාගන්නවා. රසවත් කෑම මේසයක් තිබුනත්

දරුවා නිදා ගන්නෙ බඩගින්නේ. මේ වගේ ඔබ උපායශීලී නොවුන හොත් ප්‍රේත ආත්මයක් ලැබූ, පිං ගන්න පුළුවන් අයෙකුටත් පිං ගැනීම අහිමි වෙනවා. මෙහිදී ඔබ දක්ෂ වෙන්න ඕනේ, ප්‍රේතයාගේ සිත කලබල නොවන නොගැටෙන ස්වභාවයක් පරිසරය තුළ නිර්මාණය කරන්න. සාදයක් කියන්නෙ එකක්. පිංකමක් කියන්නෙ තව එකක්. මේ දෙකේ අරමුණු දෙකක් තිබෙන්නේ. සාදයකින් වැඩෙන්නෙ කාමය. පිංකමකින් වැඩෙන්නෙ කුසලයක්. වර්තමානයේ ධර්ම දේශනයයි, පාටියයි දෙකම එකටයි ගන්නේ. ධර්ම ශ්‍රවණය කරන පිංවතුන්ට ධර්මය ඇසෙන්නෙත් ආහාරවල සංඥාව සමගමය. මේ දෙක ඔබ පටලවා ගන්න එපා. පිංකමක් සිදුකිරීමට අවශ්‍යනම් අවශ්‍යම සද්ධර්මයට ගරු කරන පිංවත් ඥාතීන්ට, හිතවතුන්ට පමණක් ආරාධනා කරන්න. වත්ත පිරෙන්න නොවේ. ගෙදර සාලය පිරෙන්න. ඥාතීන්ට සංග්‍රහ කිරීමට අවශ්‍ය අත්‍යවශ්‍යම ආහාර පාන සවස හය වන කොට සුදානම් කොට අවසන් කරන්න. කුසල් වැඩෙන සංඥාවන් මිස, අනිත්‍ය ධර්මයන් වැඩෙන සංඥාවන් මිස, කාම සංඥාවලින් ඔබ මිදෙන්න. නිවස වත්ත හොඳින් පිරිසිදු කොට සම්බුදු පහන දල්වා, මල්, සුවඳ දුම් අල්වා, නිවස වත්ත පිටිය බුදු මැදුරක් කරගන්න. ස්වාමීන් වහන්සේගේ දෙපා දෝවනය කිරීම සඳහා ගොක් අත්තක් වියාගන්න. ගොක් අත්තක් භාවිතා කොට පහන් පැලක් සාදා නැවුම් පහනක් දල්වන්න. සුවඳ දුම් අල්ලන්න. මේ පහන් ආලෝකය මේ ඝන අන්ධකාරය දුරුවී ආලෝකය පතුරුවන්නා සේ මගේ ඥාතීන් පිං මඳව අඳුරේ සිටී නම් මේ පහන් ආලෝකය සේ පිනෙන් ආලෝකමත් වේවා! කියල ප්‍රාර්ථනා කරන්න. මේ ආලෝකය යම්සේ අනිත්‍ය භාවයට පත්වේද මෙලෙසින්ම මගේ මිය ගිය ඥාතීන්ටද අනිත්‍ය සංඥාවක් දැනේවා කියල ඔබ අනිත්‍ය වඩන්න. ඔබ සිතන්න යන්න එපා ගොක් අත්තක් කපනවා කියන්නේ පොල් වල්ලක් විනාශ කිරීමක් කියල. සමහරු එහෙම හිතලා මේ වටිනා සිරිත් සමාජයෙන් අහිමි කරනවා. පොල් වල්ලක් අපිට මිල කරන්න පුළුවන් රුපියල් පන්සියයක් කියලා. එහෙත් සමාජයට එකතුව තිබූ වටිනා සිරිත් මිල කරන්න බැහැ. අපි අදක්ෂ වෙලා තිබෙනවා වර්තමානයේ රුපියල් පන්සියයකට වටිනා ගුණ ධර්ම මිල කරන්න. ගොක් අත්තක් තුළ පිවිතුරුබව, නැවුම් බව, සෞභාග්‍යය අද අපේ ගෙදර පිං කමක් තිබෙනවාය කියන සංඥාව තිබෙනවා. මේවායෙන් අපේ සිත්ද ඥාතියාගේ සිත්ද නිසල වෙනවා. සමාධිමත් වෙනවා. ඔබ ගොක් අත්තක් කෙරෙහි පොල්වල්ලක්ය යන සංඥාව ඇති කර ගත්තොත්, ලෝභ සිතක් ඇති කර ගත්තොත්, එවැනි සිතකින් අනුන්ට දෙන්න පිනක් නම් රැස් වෙයිද? කියලා හිතන්න බැහැ. යමෙක් තුළ ගොක් අත්තක්, පොල්වල්ලක්,

පොල් ගසක් පමණක් නොව පොල් වත්තම මගේ කොට ගැනීම නිසා ඒවා තුළ නිත්‍යවූ වටිනාකමක් ඇතැයි දැකීම නිසා පොල් වත්තේම ප්‍රේතයෙක්ව ඉපදීම ලෝක ස්වභාවයව පවතිනවා.

ඉහත ආකාරයට ඔබේ නිවස වත්ත පිටිය ආගමික පරිසරයක්, චිත්ත සමාධිය වැඩෙන පරිසරයක් ලෙස සකස් කොට ගෙන ඥාතියාට පිංදීමට ඔබ උපක්‍රමශීලී විය යුතුය. ගෙදර බාහිර ක්‍රියාකාරකම් අවම වන තරමට ඥාතිප්‍රේතයාගේ සිත පිංකම කෙරෙහි රඳවා තබාගත හැකිය. එසේ නොවුනහොත් කෑම මේසයක් ගෙදරක තිබියදී කුසගින්නේ නිදාගත් දරුවා සේ පිංකම සිදු කළද ඥාතියා පිං නොගෙනම පිංකම අහවරවනු ඇත. එහෙයින් ඥාතියාගේ සිත ඇලෙන ගැටෙන ස්වභාවයෙන් තොරව පිං ගැනීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කොට ඥාති ප්‍රේතයාට ඔබ පරලොවින් උපකාර කරන්න.

වර්තමාන සමාජයේ අපි උත්සාහ ගන්නේ ජීවත්ව සිටින විට සතර අපායෙන් මිදීමට අවශ්‍ය කුසල් දහම් වැඩීම නොව, අනුන්ගේ පිං අවශ්‍ය නොවන සුගතියක ඉපදීමට පුහුණු වීම නොව, මිය ගිය පසු අනුන්ගේ පිනෙන් යැපෙන අවාසනාවන්තයෙක් වශයෙන් ජීවත්වීමටය. මිය යෑමටය. සමහරු මිය යන්නේ හත් දවසේ තුන් මාසේ පිංකම්වලට මුදල් වෙන්කොට තබාය. මෙසේ පිංවත් ඔබ ජීවත්ව සිටියදීම මගේ ඥාතියා මරණෙන් මතු මාව අසරණ කරාවී යන සංඥාව ඇති කරගෙන හමාරය. වර්තමානයේ ඔබ තුළ මිය ගිය පසු මගේ ඥාතියා මට පිං දෙයි, ඥාතීන්ගෙන් පිං ගනිමි වැනි සංඥා තිබෙනවානම් ඒවායින් වහාම ඉවත් වන්න, මිදෙන්න. එම සංඥා තුළින් ඉවත් වීම යනු ප්‍රේත ලෝකයෙන් ඔබ යම් ප්‍රමාණයට මිදුනා වන්නේය. සෑම මොහොතකම ඔබ ඔබ කෙරෙහි, ඔබ කරන ලද පිංකම් කෙරෙහි විශ්වාසය තබන්න. තමා රැකි ශීලයන් කෙරෙහි විශ්වාසය තබන්න. මේ උත්තම ධර්ම මාර්ගය ඔබට විවර කළ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ, ධර්ම රත්නය, සංඝ රත්නය කෙරෙහි විශ්වාසය තබන්න, සිහි කරන්න, මෙනෙහි කරන්න. ඉනුත් ඔබ්බට ගොස් මේ සියල්ල කෙරෙහි අනිත්‍ය සංඥාව පුරුදු කිරීමට ඔබ උත්සාහවන්ත වන්න. අනුන්ගෙන් නොයැපෙන සතර අපායෙන් මිදුන ධර්මයේ ආලෝකයේ හිමිකරුවෙක් ලෙස මේ උතුම් මනුෂ්‍ය ජීවිතයෙන් ඔබ අධිෂ්ඨානය ඇති කරගන්න.

අවසාන මෙහෙයුම

නිවන් අවබෝධය ලබාගැනීම සඳහා සැබෑ මධ්‍යම ප්‍රතිපදාවේ හික්මෙමින්, තුන් සිවුරත්-පාත්‍රයත් දරමින් හුදෙකලාව නිවන් මෙහෙයුමේ යෙදෙන භික්ෂුව ලෝකයේ ස්වභාවය අවබෝධකර ගැනීම, එසේ නොමැති නම් නිවීම, එක ක්ෂණයකින් ලබන අත්දැකීමක් නොවේ.

එය මෙහෙයුමක අවසාන ප්‍රතිඵලයයි.

මෙම මෙහෙයුමට යන කාලය ඔබගේ දක්ෂතාව මත, ඔබගේ අතහැරීම මත තීරණය වන්නකි. ඔබ අවසාන නිවන් මෙහෙයුමට අවතීර්ණ වන්නේ අවසාන තීරණයක් අරගෙනය. එම තීරණය 'එක්කෝ නිවීම, නැති නම් මරණය' යන්නයි. මෙම අධිෂ්ඨානය ඔබ ගතයුතු වන්නේ අවංකවමය. එම බලාපොරොත්තු දෙකෙන් තොර වෙන බලාපොරොත්තුවක් භික්ෂුවට නොමැත. තම අරමුණ සහ සටන ලෝකයාට සඟවමින් ක්‍රියාත්මක විය යුතුය. තුන්සිවුරත්, පිණ්ඩපාතයෙන් ලබාගන්නා ආහාර වේලත් හැර, පැරසිටමෝල් පෙත්තක්වත් කුටිය සමීපයේ නොමැත. 'එක්කෝ නිවීම, එක්කෝ මරණය' නැමැති අධිෂ්ඨානය පැහැදිලිය. අවසන් මෙහෙයුමේ යෙදෙන භික්ෂුව යුද බිමේ සටන් කරන සෙන්පතියෙක් වැනිය. ඔහු සෙන්පතියෙක් වුවද පසුපස සැඟවී සටන මෙහෙයවන්නෙක් නොව, මහා සංග්‍රාමයක, සටන් පෙරමුණේම සිටින්නෙකි.

ඔබ මෙසේ සිතන්න. උතුරු-නැගෙනහිර යුද මෙහෙයුම් ඔබට මතකයි නේද? විවිධ නම්වලින් යුත් මෙම මෙහෙයුම් පටන් ගැනීමට පෙර, සේනාවිධායකයා කරන්නේ අවශ්‍ය යුද ආම්පන්න සියල්ල රැස්කරගන්නා එකයි. ආයුධ, ගුවන් යානා, බෝම්බ, කාලතුවක්කු, පාබල හමුදා, මිසයිල, යුධ නැව්....

මේ සියල්ල යුද්ධය පටන්ගත් සැනින්, සුදුසු තැන්වල සුදුසු ආකාරයෙන් යොදවලා සතුරු බලමුළු බිඳ දැමීමයි කළේ. යුද ගුවන් යානයෙන් ගහන්න අවශ්‍ය තැන්වලට, යුද ගුවන් යානයෙන් ගහනවා. මිසයිලයෙන් ගහන්න අවශ්‍ය තැනට මිසයිලයෙන් ගහනවා. බෝම්බ අවශ්‍ය තැනට බෝම්බ දමනවා....

මේ වගේම තමයි නිවන් මෙහෙයුමත්. අවසන් නිවන් මෙහෙයුමට අවතීර්ණවුවාට පසු ඔබ හරියටම සෙන්පතියෙක් වගෙයි. පරම සතුරාවන ඔබව සසරට බැඳ දමන සිත ගැන අවධානයෙන්මයි සිටින්නේ. සිතට එන සෑම සිතිවිල්ලක්ම ඔබ අනිත්‍ය වශයෙන් දකිනවා. ඇතිවන සෑම සිතකටම ඔබ පහරදෙනවා. මොන ආයුධයෙන්ද ඔබ පහරදෙන්නේ. 'අනිත්‍යය' කියන ආයුධයෙන්. අනිත්‍යයෙන් පහරදෙන විට ඔබ තුළ වැඩෙන්නේ හා අවබෝධ වන්නේ සතර සතිපට්ඨානයයි. පටිච්චසමුප්පාදයයි. චතුරාර්ය සත්‍යයයි. පංච උපාදාන ස්කන්ධයමයි. සප්ත බොජ්ජංග ධර්මතාවයනුයි. මේ ආයුධ ඔබ අමුතුවෙන් රැස්කළ යුතු නැහැ. ඔබට වැඩෙන ප්‍රඥාව තුළ මෙම ආයුධ ඔබ තුළ රැස්වෙනවා. ඔබ සමාධියේ ඉහළම තලයකදී, ප්‍රඥාව විසින් ලබාදෙන ඥාන දර්ශනයන් නුවණින් යුතුව දකිමින් අවබෝධය ලබනවා. සෑම සිතක්ම අනිත්‍ය වශයෙන් දකිනවා. විවෘත කොට බලනවා. අවබෝධය ලබනවා. ප්‍රඥාවෙන් මුවහත් වෙමින් ඉදිරියට යනවා. මේ වන විට ආහාර, නින්ද, කයේ පහසුව ආදී මේ අවශ්‍යතා ඔබගෙන් ගිලිහිලා. ඔබ 'එක්කෝ නිවීම. නැතිනම් මරණය' කියන අධිෂ්ඨානය කරාම යනවා. නිවන් මෙහෙයුම දැඩිව ක්‍රියාකාරී වෙන්නේ රාත්‍රී, උදය කාලයට. නින්ද එන්නේ නැහැ. නින්දත්, නොනින්දත් අතර ස්වභාවයක් තිබෙන්නේ. ඇවිදිමින්, හිඳගනිමින්, සැතපෙමින්... මේ ආදී සෑම ඉරියව්වකදීම සිත තම පාලනයෙන් ඉවතට යන්න දෙන්නේ නැහැ.

මේ වන විට මාරයා විවිධ උපක්‍රම යොදනවා. තමා ගිහි ජීවිතයේදී ආශා කළ රූප, රස, හැඩ රුව මවලා පෙන්නනවා. සුරූපී රූපකායවල්, බ්‍රහ්ම සංඥා.. මහා රාත්‍රියේ සිතට ගේනවා. ඒත් දැන් ඔබ දක්ෂයි මාරයා හඳුනා ගන්න. ඔබ මෙහිදී මාරයා රැගෙන එන රූප 'අසුභය' නැමැති ආයුධයෙන් සුණු විසුණු කර දමනවා.

අවසාන මෙහෙයුමේදී මාරයා ඔබට ඔබ ආසා කළ කාන්තා රුවක් සිහි ගන්වනවා යැයි සිතන්න. සමහර විට ඇය සුරූපී නිළියක් විය හැකියි. එවිට ඔබ එම රූපයට මෙහෙම කරනවා. මනසින් ඇයව නිරුවත් කරනවා. ඇයගේ ශරීරය කපාගෙන, විනිවිද යමින් මනසින් එය විවෘත කරනවා. ඇගේ ශරීරය තුළ තිබෙන සම්, මස්, බොකු බඩ වැල්, අසූචි, මුත්‍රා, රුධිරය, සෙම්, සොටු, වමනය, මනසින් පොලිතින් උරයක දමා ඇගේ ඇට සැකිල්ල මත එල්ලනවා. මෙසේ එල්ලා ඇයව මනසින් ඇවිද්දවනවා. පෘථග්ජන සිත කාමයට ගාල්කරන සුරූපී රූපයක යථාර්ථය හොඳින් දකිමින් ඇටසැකිල්ල තව තවත් මනසින් ඇවිද්දවනවා. මාරයාව කම්පා කරවනවා. මේ වන විට ඔබට අට්ඨික සංඥාව හොඳින් අවබෝධයෙන් වැටහෙනවා. ඔබට පුළුවන්කම තියෙනවා ඕනෑම රූපයක් අට්ඨික සංඥාවෙන් දකින්න. එනිසා ලෝකයේ සුරූපීම රූපය සිතට ආවාද, එය අතහරින ස්වභාවයේ ඔබ සිටිනවා. මේ වන විට මාරයා දන්නවා ඔහුට ඔබව අතහැරෙන්නයි යන්නේ කියලා.

ඔබ ගිහි ජීවිතය තුළ සිටියදී ඔබ ප්‍රියකළ මනුෂ්‍ය ලෝකයේ ස්වභාවයන් පිළිබඳ රූප දූන් ඔබේ සිතට එනවා. ඔබ මේ සිතිවිලි විවෘතකර අනිත්‍ය වශයෙන් දකිනවා. ඔබට මෙහෙම සිතක් ඇතිවන්න පුළුවන්. මේ රටේ පාලකයා වුණොත් මහා සැපයක් බව. ඔබ එසේ නොවන බව අනිත්‍ය වශයෙන් දකිනවා. හිටපු පාලකයන් මියගිය අසරණ ස්වභාවය, අවසාන කාලයේදී ඔවුන් පත්වූ රෝගී ස්වභාවය, බලය පිරිහී ගිය පසු ඔවුන් අත්විඳි මානසික වේදනාවන්, බලය අහිමිවූ පසු ජනතාව ඔවුන්ගෙන් ඈත්වූ අයුරු. බෝම්බවලට අසුවී විනාශවී ගිය පාලකයන්....

අනාගතයේ පාලකයන්ටද ඉහත ස්වභාවයන් පොදුය යන්න ප්‍රඥාවෙන් දකිනවා. ලෝකයේ බලවත්ම පාලකයා දක්වාද, ලෝකයේ විශාලම ධනපතියා දක්වාද, ලොව සුරූපීම කාන්තාව, පිරිමියා දක්වාද, අතීත-අනාගත-වර්තමාන වශයෙන් දකිමින් අවබෝධය ලබනවා. ඔබට වැඩෙන ප්‍රඥාව විසින් ඔබට මේ අනිත්‍යාවබෝධය ලබාදෙමින් නිවන් මෙහෙයුමේ පෙරට යවනවා. මෙහෙම ඔබ අවබෝධය ලබනකොට මනුෂ්‍ය ලෝකයට ඇති කැමැත්ත පිළිබඳ සංඥා ඔබෙන් බැහැර වෙනවා. ඔබ තුළ මේ අවබෝධාත්මකව වැඩුනේ ධම්මානුපස්සනාවයි. සතර සතිපට්ඨාන ධර්මතාවයන් වැඩීමෙන් මුවහත්වන ඔබේ ප්‍රඥාව විසින්, ඔබට පෙනෙන දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක අනිත්‍ය වශයෙන් විනිවිද දකිනවා. මේ වන විට ඔහුට දෙවියෝද, බ්‍රහ්මයෝද වඳිනා බව ඔහු සමාධිය තුළින්

දකිනවා. දෙවියන්ද, බ්‍රහ්මයන්ද ඔහුට වඳින්නේ ඔහු දෙවියන්ද බ්‍රහ්මයන්ද ඉක්මවාගිය කෙනෙක් නිසා බව ඔහු දැනගන්නවා. ඔහු එහිදී දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක මනසින් පීරමින් එහි නිත්‍යවූ සැපයක් ඇතැයිද යන්න සොයානවා. ඔහු පැහැදිළිවම දකිනවා දිව්‍ය, බ්‍රහ්ම සැපද අනිත්‍ය බව. ඔහු බොහොම සියුම්ව දිව්‍ය ලෝක නිරීක්‍ෂණය කරනවා. මනසින් ඔහු දකිනවා, කාම සම්පත් විඳින දෙවියන්, දිව්‍යාංගනාවන්. සැප පිරිහී, පිං පිරිහී අපාගාමීවන දෙවියන්, දිව්‍ය ලෝකයේ දිව්‍ය තලවල කළ පිං වල ස්වභාවය නිසා ඇති පංති පරතරය. දිව්‍ය සැපයට ගිජුවී, දිව්‍ය ලෝකවලින් චුතවීමට සිදුවූ විට දෙවියන් ශෝකවන, හඬාවැටෙන ස්වභාවය. සක්දෙව් රජුද පිරිහී නැවතත් සතර අපායට වැටෙන ස්වභාවය ප්‍රඥාව තුළින් ඔහු දකිනවා. එවිට දිව්‍ය ලෝකයට ඇති කැමැත්ත, ආශාව පිළිබඳ සංඥා ඔහුගෙන් බැහැර වෙනවා.

ඊළඟට ඔහු බ්‍රහ්ම ලෝකයට සිත මෙහෙයවමින් බලනවා. ඔහු දකිනවා ප්‍රභාශ්වර සුදු සිල් ඇඳුමෙන් සැරසුන, උතුරු සළුවක් පොරවාගත් බ්‍රහ්මයන් එකලාව සක්මනේ යෙදෙමින් එරමිනියා ගොතාගෙන සමාධිය වඩන ස්වභාවය. ඒ අයත් දුක තුළ සිටිමින් සැප සොයනවා. බ්‍රහ්මයින්ද සැපයි කියමින් විඳින්නේ අනිත්‍ය භාවයට පත්වන සමාධි සැපය බව භික්‍ෂුව ප්‍රඥාවෙන් දකිනවා. බ්‍රහ්ම ලෝකයේ ඉහළම තලයක් තිබෙනවා, එහි බ්‍රහ්මයින් කල්ප ගණන් එකම ස්වභාවයෙන්, එකම ඉරියව්වෙන් එරමිණිය ගොතාගෙන සමාධිය වඩනවා. ගල් රූප වගෙයි. ඉඳිකටු තුඩක්වත් ගැසීමට තරම් ඉඩක් නොතබා බ්‍රහ්ම ලෝකය පීරා බලනවා එහි නිත්‍ය වූ කිනම් හෝ සැපයක් පවතිනවාද කියා. බ්‍රහ්ම ලෝකයේ අනිත්‍ය ස්වභාවයද දැකීම නිසා එයට ඇති කැමැත්ත සහ සංඥා ඔහුගෙන් ඉවත් වෙනවා.

මේ සියල්ලම රූපවාහිනී තිරයක රූප ඇතිවෙමින් දිවෙන ආකාරයට පෙනි පෙනී ඔහුට අවබෝධය ලබා දෙනවා. දැන් ඔබ ආයාසයක්, වෙහෙසක් ගතයුතු නැහැ. ප්‍රඥාවේ තීව්‍ර භාවය නිසා මේ සියල්ල සිද්ධ වෙනවා. මෙය අත්විඳීමෙන්ම ඔබ දැකීම ආශ්චර්යයක්. මේ සියල්ලම ඔබට පහළවෙන ඥානයන් විය යුතුය. මෙම ඥානයන් විසින් මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම ලෝකවල ස්වභාවය ඔබට අවබෝධ කොට දෙනු ඇත. නිවන් මෙහෙයුමේ ඔබ දැන් සිටින්නේ දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම ලෝකවලට ඇති කැමැත්ත, ඒවායේ බැස ගැනීමට ඇති තෘෂ්ණාව සහමුලින්ම ඔබෙන් ඉවත් වෙලාය. රූපවාහිනී තිරයක රූප පහළවන්නා සේ ඔහුට ඔහුගේ අතීත ජීවිතවල ස්වභාවයන් සතර අපායට වැටී විඳි දුක් පීඩාවන්, තිරිසන් සතුන් ලෙස ඉපිද විඳි අනන්ත

අප්‍රමාණ දුක්, අතීත ජීවිතවලදී ලැබූ රාජරාජ මහාමාත්‍ය පදවි, අනුභව කළ සැපසම්පත්, දිව්‍ය සැප.... මේවා ඔහුට දර්ශනය වනු ඇත. මේ ඔහු දකිමින් සිටින්නේ අවසාන දර්ශන පෙළයි. දැන් ඔබට මෙතෙක් ජීවිතයේ නොලද දෙයක් දැනෙනු ඇත. මහා වෙනසක ඉවක් දැනෙනවාය. මේ හැම අදියරකදීම ඔබට සප්ත බොජ්ජංග ධර්ම වැඩෙනවාය. ඉහත ධර්මයන් වැඩෙන්න වැඩෙන්න ඔබ තව තවත් ජව සම්පන්න වන්නේය. වීර්යයෙන් පෙරට යන්නේය. මෙලොව ජීවත්වන සත්ත්වයෙක් ඉලක්කය කරා හඹායෑමේ වීර්යය, වේගය, උපරිමයෙන් ක්‍රියාත්මකවන අවස්ථාව තමයි නිවන් මෙහෙයුමේදී නිවීම උදෙසා හඹායෑමේ ස්වභාවය. මරණයටවත් ඔහුව නවත්වන්න බැහැ. මොකද ඔහු මේ වන විට දන්නවා තමන් මේ මෙහෙයුමේදී මැරුණහොත් තමා මැරෙන්නේ ධර්මය අවබෝධ කරගත් අරිහත් උත්තමයෙක් වශයෙන් බව. ඔහුට මේ සංඥාව නිවනේ අවසාන මෙහෙයුමට අවතීර්ණ වීමේදීම දැනෙනවා. ඒකයි ඔහු 'එක්කෝ නිවීම, නැතිනම් මරණය' කියන අධිෂ්ඨානයට දැඩිව එන්නේ. ඔහු දන්නවා මේ දෙකෙන් කොයික සිදුවුණත් ඔහු සසර දුක නිවාගන්නා බව. එය ඔහු දකින්නේ ප්‍රඥාවේ තීව්‍ර භාවය නිසාය. හැබැයි ඔහු දෙස බලා බාහිර කිසිවෙකුටවත් ඒ ගැන සිතාගන්න බැහැ. හොඳයි, එම භික්ෂුව නිවන් මෙහෙයුමේදී හුදෙකලා කුටිය තුළදීම අපවත් වුවහොත් මිනිසුන් කියාවී එම භික්ෂුව මානසික රෝගියෙක්, ගුරුවරයෙක්-පන්සලක්-ආරණ්‍යයක් නොමැති අනාථයෙක්, අභිගුණ්ඨියෙක්....... කියලා. ලෝකයේ ස්වභාවය මෙහෙමයි. ලෝකයා එහෙම කිව්වත් උන් වහන්සේ අපවත් වූයේ නැත. පිරිනිවන් පෑවාමය. පිරිනිවී ගියාමය. එය දන්නේ පිරිනිවී ගිය උන්වහන්සේ පමණක්මය. ලෝකයා කුමන අදහසක් දැරුවද උන්වහන්සේට ඉන් ඵලයක් නොමැත. ලෝකයාගේ ස්වභාවය අදහස් ප්‍රකාශ කිරීමයි. උන්වහන්සේ මරණය වනවිට මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම ලෝක සංඥා අනිත්‍ය වශයෙන් අවබෝධකර එම ලෝකවලට බැසීමට ඇති තෘෂ්ණාව නිරුද්ධ කරදමා තිබුණ නිසා නැවත උපාදානයක් කරගැනීමට තෘෂ්ණාවක් නොමැත. අවසාන සිතට අල්ලා ගැනීමට, බැසගැනීමට තැනක්, කැමැත්තක් නොමැති නම් එම සිත නිවීයෑම ස්වභාවයයි. ආශ්චර්යමත් ධර්මයක අවසාන ඵලය ලෝකය අතහැරීමය. ලෝකයෙන් මිදීමය. ලෝකයෙන් එතෙර වීමය. ඔබ ලොව දරුණුතම යුදබිමේ නිරායුධ සෙන්පතියෙක් ලෙස ලෝකය ජයගන්න. ඔබ දිග්විජය කළ ලෝකය, ගෙල එතුන සර්පකුණක් සේ විසිකර දමන්න. ලෝකය බදාගත් ලෝකයාට ඔබ පරමාදර්ශයක් වන්න. බදාගත් තැන, රැස්කළ තැන, ගොඩගසාගත් තැන ඇත්තේ සැපක්

නොව දුකක්ම බව දකින්න. එම දුකේ නිර්මාණකරු අනිකෙකු නොව, තමාගේ සිතම බව දකින්න. නිර්මාණකරු ඔබ නම් එහි ප්‍රදර්ශකයාද, ප්‍රතිචාර ලබන්නාද, ප්‍රතිලාභ ලබන්නාද ඔබම විය යුතුය. දුක නිර්මාණය කරන සිත අවබෝධයෙන් හඳුනාගෙන තණ්හාව නිරුද්ධකර දුකෙන් ඔබ අත්මිදෙන්න. නිවීමේ මෙහෙයුමේ යෙදෙනවිට ඔබට දැනේවී මේ අතහැරීම නිසා ඔබව රෝගියෙක් වන බව, ආහාර මඳ බව, ලේ අඩුවීම, ක්ලාන්තය, ඇස් පෙනීම දුර්වල වීම, වළඳන කිවුල් ජලයේ හුණු මිශ්‍රවීම නිසා ඇතිවන වකුගඩු මුත්‍රා රෝග, දත්මුල් දියවීම, සන්ධි වේදනා...... ඔබ මේ හැම සිතක්ම අතහරින්න. මේවායින් තොරව ඔබට කවදාකවත් නිවීම ලබන්න බැහැ. කුණු වෙන, මැරෙන, ගඳ ගහන කය මරා දමා ඔබ නිවී යන්න. මැරෙන කය අයිති සතර මහා ධාතූන්ට නිසා එය කුණු වෙමින්, ගඳ ගසමින්, සතුන්ට අහරක් වෙමින් සතර මහා ධාතූන්ටම එකතුවේවි.

ගෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

ISBN 978-955-7887-01-2
9 789557 887012

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

මිල රු. 135 /-